වාර්ෂික වාර්තාව | 2023



ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව



වාර්ෂික වාර්තාව
2023

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව

අන්තර්ගතය

සභාපතිතුමාගේ පණිවුඩය 1
අප ගැන 2
කොමිෂන් සභාව සහ විධායක කළමනාකාරිත්වය 8
විධායක නිලධාරීන් 14
අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ සමාලෝචනය 17
තිරසාර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කරලීමේ වැඩසටහන 2023 20
විදුලි සංදේශ සංඛ්‍යාලේඛන සහ තොරතුරු 21
අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව 24
බලපත්‍ර කළමනාකරණය 24
ජාල 26
සංඛ්‍යාත වර්ණාවලි කළමනාකරණය 30
තරඟකාරිත්ව අංශය 32
අනුකූලතා සහ විමර්ශන 37
ප්‍රතිපත්ති සහ ජාත්‍යන්තර සබඳතා 40
නීති කටයුතු 47
විශේෂ ව්‍යාපෘති 48
පාලන සහ ආයතනික කටයුතු 50
තොරතුරු තාක්ෂණය 54
මූල්‍ය 55
අභ්‍යන්තර විගණනය 57
අපගේ සේවක පැතිකඩ 59
විගණන කමිටු යාවත්කාලීන කිරීම 60
ආයතනික පාලනය 64
මූල්‍ය ප්‍රකාශනය 67
විගණකාධිපතිගේ වාර්තාව 92
අතිරේක තොරතුරු 98
වසර 10ක මූල්‍ය ප්‍රගතිය 99
කෙටි යෙදුම් ලැයිස්තුව 100

මෙම වාර්තාව මාර්ගගතව බැලීමට QR කේතය පරිලෝකනය කරන්න.
https://www.trc.gov.lk/

සභාපතිතුමාගේ පණිවුඩය

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ (TRCSL) 2023 වසරේ වාර්ෂික වාර්තාව වෙනුවෙන් පණිවුඩයක් එවීමට ලැබීම පිළිබඳව මම සතුටු වෙමි. අපේ රටේ පවත්නා තීරණාත්මක ආර්ථික තත්ත්වය හමුවේ මෙම වසර තුළ දී සැලකිය යුතු අභියෝගවලට මුහුණ පෑමට සිදු විය. එනමුත් මෙම අභියෝගාත්මක තත්ත්වයන් මධ්‍යයේ වුව ද විදුලි සංදේශ කර්මාන්තයේ දියුණුව සහ ධනාත්මක කාර්යසාධනය සටහන් කිරීමට ලැබීම ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සභාපතිවරයා වශයෙන්, මට ඉමහත් සතුටට කරුණකි.

මෑත වසර වලදී ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ ක්ෂේත්‍රයේ ස්ථාවර වර්ධනය මෙන්ම ශක්තිමත් භාවය පෙන්නුම් කර ඇත. එමඟින් නාගරික සහ ග්‍රාමීය ප්‍රදේශ කරා අත්‍යවශ්‍ය සන්නිවේදන සේවා සපයමින් රටේ සමාජ-ආර්ථික උන්නතිය උදෙසා තීරණාත්මක කාර්යභාරයක් ඉටු කිරීමට හැකි විය . විදුලි සංදේශ කර්මාන්තය ස්ථාවර සහ ජංගම විදුලි සංදේශ සේවා දෙඅංශය, මෙන්ම අන්තර්ජාල සම්බන්ධතාව සහ ඩිජිටල් විසඳුම් වලින් සමන්විත වේ.

ශ්‍රී ලංකාව සතුව ශක්තිමත් විදුලි සංදේශ අංශයක් පවත්නා අතර, ආසන්න වශයෙන් ජංගම දුරකථන ග්‍රාහකයින් මිලියන 28.9 ක්, ස්ථාවර ග්‍රාහකයින් මිලියන 3.5 ක් සහ අන්තර්ජාල සේවා ග්‍රාහකයින් මිලියන 22.8 ක් ඇත. 2023 වසර අවසන් වන විට ජංගම සහ ස්ථාවර දුරකථන ව්‍යාප්තිය පිළිවෙලින් 131.5% සහ 15.9% ලෙස පැවතුනි. මෙයින් පෙනී යන්නේ ජංගම දුරකථන ක්ෂේත්‍රය ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ වෙළඳපොලේ ප්‍රධාන නියමුවා වශයෙන් අඛණ්ඩව ක්‍රියාත්මක වන බවයි. එය ජංගම දුරකථන ක්‍රියාකරු සමාගම් අතර දැඩි තරඟකාරිත්වය සහිතව සැලකිය යුතු ප්‍රවර්ධනයන් සහ නවෝත්පාදනයන් ඇතිකරලීමට හේතු වී ඇත. ඉහළ සම්ප්‍රේෂණය අඛණ්ඩව පවත්වාගෙන යාම පිණිස ජංගම දුරකථන ග්‍රාහකයන් සංඛ්‍යාව පුරෝකථනය කර ඇති අතර එය ස්මාර්ට්ෆෝන් ව්‍යාප්තිය, වැඩිදියුණු කළ ජාල යටිතල පහසුකම් සහ දැරිය හැකි දත්ත සැලසුම් හේතුවෙන් වැඩිදියුණු වී ඇත.

2023 වසර පුරා, රට තුළ අන්තර්ජාල සම්බන්ධතාව පුළුල් කිරීමේ දී ශ්‍රී ලංකාව ප්‍රශංසනීය ප්‍රගතියක් අත්කරගෙන ඇත. ඩිජිටල් අන්තර්ගයන්ට පහසුකම් සලසමින් සහ ඩිජිටල් සේවා භාවිතය කරා නැඹුරු කරවමින් අන්තර්ජාල සේවා ව්‍යාප්තිය ක්‍රමිකව වර්ධනය කර ඇත. 5G තාක්ෂණය හඳුන්වාදීමත් සමඟ, ශ්‍රී ලංකාවේ අන්තර්ජාලය වැඩිදියුණු කිරීමෙන් අපේක්ෂා කෙරෙන්නේ අධිවේගී දත්ත, අවම ප්‍රමාදය නිසැක කරමින් සහ නව තාක්ෂණයන්ගේ වර්ධනයට සහායවෙමින් සුවිශේෂී වූ පරිවර්තනයක අත්දැකීම් ලබා දීමයි. මෙම වසරේ දී මූල්‍යමය වශයෙන්, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වාර්තා කළ ආදායම රු. මිලියන 48,236 ක්, වන අතර ඒකාබද්ධ අරමුදල සඳහා ප්‍රේෂණය කරන ලද මුදල රු. මිලියන 44,055 කි.

රජයේ නීති , රීති ප්‍රකාරව, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව මහජනතාව උදෙසා අඛණ්ඩ සේවාවන් සහතික කරමින් එහි කාර්යයන් බාධාවකින් තොරව ක්‍රියාත්මක කර ඇත. හිතකර ප්‍රතිපත්ති සහිතව ඩිජිටල් පරිවර්තනය සඳහා වූ රජයේ කැපවීම, තාක්ෂණික දියුණුව සහ නැඟී එන තාක්ෂණයන් පුළුල් ලෙස භාවිත කිරීමට හේතු වනු ඇත. කෙසේ වෙතත්, ග්‍රාමීය ප්‍රදේශවලට දැරිය හැකි ප්‍රවේශයක් සහතික කිරීම, සයිබර් ආරක්ෂාව සහ නියාමන රාමු කලමනාකරණය වැනි අභියෝග තිරසාර වර්ධනය කෙරෙහි අවධානය යොමු කිරීමේ දී ඉතා වැදගත් ය.

සමාලෝචිත වසර තුළ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව ලබා දුන් දායකත්වය අගය කරන අතරම, ඉදිරි ගමනේ දී, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් රටේ නියාමන ක්‍රියාකාරකම් ශක්තිමත් කිරීම මෙන්ම ඩිජිටල්කරණය සහතික කිරීමේ උපායමාර්ග ක්‍රියාත්මක කළ යුතුව ඇත. මෙහිලා කැප වූ විදුලි සංදේශ කර්මාන්තයේ පාර්ශවකරුවන්ට මගේ හෘදයාංගම ස්තුතිය පුදකර සිටිමි. තවද, ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ ක්ෂේත්‍රය උදෙසා අගනා සේවාවක් සැපයීමෙහි ලා සිය කැපවීම අඛණ්ඩව ලබාදෙන කොමිෂන් සභා සාමාජිකයින්ට මෙන්ම ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සමස්ථ කාර්යමණ්ඩලයට මාගේ ස්තුතිය පිරිනමමි.

තාක්ෂණ අමාත්‍යාංශයේ ලේකම්
ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සභාපති

අප ගැන

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL), 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත, හා පසුව සංශෝධනය කරන ලද, 1996 අංක 27 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධන) පනත යටතේ ස්ථාපනය කරන ලද රාජ්‍ය ව්‍යවස්ථාපිත ආයතනයක් වේ. මෙම වාර්තාවේ පනත යන්නෙන් 1996 අංක 27 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධන) පනතින් සංශෝධිත 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත හැඳින්වෙන අතර කොමිෂන් සභාව යන්නෙන් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව හැඳින්වේ.

1996 අංක 27 දරන පනතින් සංශෝධිත 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත අනුව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL) යනු රටේ විදුලි සංදේශ නියාමන කටයුතු මෙහෙයවීමේ රාජ්‍ය බලධරයා වේ. ඒ අනුව පාරිභෝගිකයින්ගේ සහ දුරකථන ක්‍රියාකරු සමාගම්වල යහපත නිසැක කරමින් මෙරටේ විදුලි සංදේශ සේවා නංවාලීමට පනත මඟින් කොමිෂන් සභාවට බලය පවරා ඇත.



දර්ශනය

“විද්‍යාත්මක හා නියාමන විශිෂ්ටතාව මඟින් දියුණුවෙමින් ඉදිරියට යන විදුලි සංදේශ කර්මාන්තයේ විශ්වීය නියාමකයකු වශයෙන් පිළිගැනීමට ලක්වීම.”



මෙහෙවර

“කුසලතාවයෙන් පිරිපුන් සදාචාර සම්පන්න ශ්‍රම බලංකායක් මඟින් තරඟකාරී වෙළඳපලෙහි සාධාරණත්වය හා යුක්තිය ප්‍රවර්ධනය කිරීමෙන් පිළිගත හැකි ගුණාත්මක බවකින් හා දැරිය හැකි මිලකින් යුක්ත සේවාවක් දීප ව්‍යාප්තව කලට වේලාවට ලබාදීමට වග බලා ගැනීම”



අපගේ වටිනාකම්

- **වගවීම:** අපගේ ප්‍රතිපත්ති උපදෙස් සහ කාර්යයන් සම්බන්ධයෙන් වගකීම භාර ගැනීම.
- **විනිවිදභාවය:** අපගේ කාර්යයන් පසුපස පවත්නා තාර්කිකත්වය පැහැදිලි කිරීමට සූදානම් ව සිටීම.
- **වෘත්තීයභාවය:** කොමිෂන් සභාවේ විදුලි සංදේශ නියාමනය පිළිබඳ අපගේ එදිනෙදා කටයුතුවල දී ප්‍රශස්ත වෘත්තීමයභාවයක් ප්‍රදර්ශනය කිරීම සහ අඛණ්ඩ ස්වයං-වැඩිදියුණුව සාක්ෂාත් කර ගැනීම.
- **අඛණ්ඩතාව:** අපගේ පාරිභෝගිකයින්ගේ සහ පාර්ශ්වකරුවන්ගේ යහපත උදෙසා සදාචාරාත්මකව, කාර්යක්ෂමව සහ ඵලදායි ලෙස කාර්යයන් ඉටු කිරීම මඟින් කාර්යසාධනය ක්‍රියාවට නැංවීම.

මෙහෙවර ප්‍රකාශනය අර්ථ නිරූපනය කිරීම

ශ්‍රී ලංකාවේ දිගු කාලීන සන්නිවේදන අවශ්‍යතාවයන් සපුරාලීම සහතික කරනු වස් සාධාරණත්වය, තරඟකාරීත්වය සහ ආයෝජන දිරිගන්වන නියාමන පරිසරයන් නිර්මාණය කිරීම උදෙසා සියළුම පාර්ශවකරුවන් සමඟ ස්වාධීන, විවෘත සහ පාරදෘශ්‍ය ආකාරයෙන් ක්‍රියා කිරීම තුළින් සියළුම පරිභරණය කරන්නන්ට සාධාරණ, යුක්තිසහගත සහ දැරිය හැකි මිල ගනන් යටතේ වැඩිදියුණු සහ ගුණාත්මක බවෙන් ඉහළ සන්නිවේදන තාක්ෂණ සේවා සැපයිය හැකි බව සහතික කිරීම.

කොමිෂන් සභාව

කොමිෂන් සභාව සාමාජිකයන් පස් දෙනෙකුගෙන් සමන්විත වන අතර කොමිෂන් සභාව අයත් වන තාක්ෂණ අමාත්‍යාංශයේ ලේකම්වරයා නිල බලයෙන්ම ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සභාපතිවරයා වේ.

එමෙන්ම අධ්‍යක්ෂ ජනරාල්වරයා, ප්‍රධාන විධායක නිලධාරියා වන අතර කොමිෂන් සභා සාමාජිකයෙකු ද වේ. සෙසු සාමාජිකයින් තිදෙනා පිළිවෙලින් නීති, කළමණාකරන, මූල්‍ය ක්ෂේත්‍රවල විශිෂ්ඨතාවක් ලබා ඇත්තාවූ තැනැත්තන් වේ.

අරමුණු

විදුලි සංදේශ පනත ප්‍රකාරව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් සාක්ෂාත් කළ යුතු අරමුණු පහත දැක්වේ.

- ශ්‍රී ලංකාවේ ජාතික සහ අන්තර්ජාතික විදුලි සදේශ සේවාවක් සැපයීම සඳහා සියලුම සාධාරණ ඉල්ලීම් ඉටු කළ හැකි වන පරිදි විශ්වාසනීය හා කාර්යක්ෂම සේවාවක්, (එවැනි සේවාවක් සැපයීම ප්‍රායෝගික නොවන අවස්ථාවල හැර) හදිසි සේවා, පොදු දුරකථන කුටි සේවා, නාමාවලි තොරතුරු සේවා, සමුද්‍රීය සේවා, ග්‍රාමීය සේවා සහ වෙනත් ප්‍රදේශවල ජාතික යහපත පිණිස අවශ්‍ය යයි සළකනු ලබන සේවා ඇතුළුව, සපයනු ලබන බවට වග බලා ගැනීම.
- සෑම ක්‍රියාකරුවෙකුගේම බලපත්‍රයේ සඳහන් කර ඇති සේවාවන් සපයනු ලැබීම නිසැක කිරීම සඳහා එකී සෑම ක්‍රියාකරුවෙකුටම අවශ්‍ය තාක්ෂණික, මූල්‍ය සහ කළමණාකරන සම්පත් ඇති බවට සහ ඔවුන් විසින් ඒවා යොදා ගනු ලබන බවට වග බලා ගැනීම.
- අය කරනු ලබන ගාස්තු සහ සපයනු ලබන විදුලි සංදේශ සේවාවන් මෙන්ම විදුලි සංදේශ උපකරණවල තත්ත්වය හා විවිධත්වය සම්බන්ධයෙන් පාරිභෝගිකයින්ගේ, ගැනුම්කරුවන්ගේ සහ වෙනත් පාර්ශ්විකරන්නන්ගේ සම්බන්ධතාවන් හා පොදුවේ මහජන යහපත ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම.
- විදුලි සංදේශ සේවා හා සම්බන්ධ වාණිජ කටයුතු වල නිරත තැනැත්තන් අතර ඵලදායී තරහකාරිත්වයක් පවත්වාගෙනයාම සහ ප්‍රවර්ධනය කිරීම මෙන්ම ඒ තැනැත්තන්ගේ කාර්යක්ෂමතාව සහ පිරිමැසුම්දායක බව ප්‍රවර්ධනය කිරීම.
- අභ්‍යන්තර සහ ජාත්‍යන්තර විදුලි සංදේශ පහසුකම් පිළිබඳව සීඝ්‍ර සහ අඛණ්ඩ සංවර්ධනයක් ප්‍රවර්ධනය කිරීම.
- අනවශ්‍ය ප්‍රමාදයන් හෝ බාධාවන් හෝ අවහිරතාවයන්ගෙන් තොරව විශ්වාසදායක සහ කාර්යක්ෂම සේවාවක් සැපයීමේ තම වගකීම ඉටු කිරීමට ක්‍රියාකරුවන්ට හැකිකම ඇති බවට නිසැක කිරීම.
- විදුලි සංදේශ සහ ඒ හා සම්බන්ධ ක්ෂේත්‍ර ගැන නව තාක්ෂණික ක්‍රම වැඩි දියුණු කිරීම සහ ඒ ක්‍රම භාවිත කිරීම.
- ශ්‍රී ලංකාවෙන් පිටත සිය ව්‍යාපාරික ස්ථාන ඇති විදුලි සංදේශ සේවා බහුල වශයෙන් පාර්ශ්විකරන්නන් ශ්‍රී ලංකාව ඇතුළත ව්‍යාපාරික ස්ථාන පිහිටුවීම සහ ජාත්‍යන්තර සංක්‍රාන්ති සේවා සඳහා ශ්‍රී ලංකාව යොදා ගැනීම ප්‍රවර්ධනය කිරීම පිණිස දිරි ගැන්වීම.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ වගකීම්

රජයේ ප්‍රධාන ආයතනයක් වන ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ ක්ෂේත්‍රය පිළිබඳ ජාතික නියාමන නියෝජිතායතනය වන අතර කොමිෂන් සභාවේ ප්‍රධාන අරමුණ වන්නේ වර්ධනය වන තරහකාරී වෙළඳපලේ උද්ගත වන අභියෝග වලට ප්‍රතිචාරව මහජන යහපත ආරක්ෂා කර, නියාමන ක්‍රියාවලිය ස්ථායී ලෙස ශක්තිමත් කරමින් විදුලි සංදේශ කර්මාන්තයේ තිරසාර සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සහ මහජන යහපත ආරක්ෂා කිරීමයි.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් විදුලි සංදේශ සේවා නොසපයන නමුත් කාර්යක්ෂමව හා ක්‍රමවත්ව විදුලි සංදේශ සේවා සැපයීමෙහිලා විදුලි සංදේශ ක්‍රියාකරු සමාගම් දිරිගන්වයි. එමෙන්ම ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ ජාල පහසුකම් විශ්වීය මට්ටමට වැඩිදියුණු කිරීම පිණිස සියළුම විදුලි සංදේශ ක්‍රියාකරු සමාගම් වලට සහාය වේ.

ප්‍රධාන වගකීම් පහත දැක්වේ:

- පනතේ විධිවිධාන සහ දුරකථන ක්‍රියාකරු සමාගම් වලට නිකුත් කළ බලපත්‍ර කොන්දේසි බලාත්මක කිරීම.
- බලපත්‍රලාභී ක්‍රියාකරුවන් අතර නිදහස් සහ සාධාරණ තරහකාරිත්වයක් පවත්වා ගැනීමට දිරි ගැන්වීම.
    - දුරකථන ක්‍රියාකරු සමාගම් මහජන යහපත සලසන්නේද යන්න නිශ්චය කිරීම සහ අපක්ෂපාතී ලෙස හිතකර ක්‍රියාවන්හී නිරතවීම සඳහා තරහකාරිත්වය පිරික්සීම.
    - ජාල හා සේවා අතර අන්තර් සම්බන්ධතාවය ඇති කිරීමට වග බලා ගැනීම.
    - විවෘත ප්‍රවේශය, අවහිරතා නැති කිරීම සහ විනිවිද පෙනෙන බලපත්‍ර ක්‍රියාවලියක් ඇති කිරීමට හැකි වන පරිදි පොදු නීති රාමුවක් සකස් කිරීම.
- මිල

  පොදු මහජනතාවට දුරකථන ක්‍රියාකාර සමාගම්වල මිල දරාගත හැකිද යන්න බව සැලකිල්ලට ගෙන සාධාරණ මිල සහතික කිරීම.

- පාරිභෝගික ආරක්ෂාව

  මහජනතාව සහ පාරිභෝගිකයන් විසින් ඉදිරිපත් කරන පැමිණිලි පිළිබඳව විමර්ශන පැවැත්වීමේදී සවන් දීමට ඇති කැමැත්ත, සන්නිවේදනය සහ මහජන සහභාගීත්වය දිරිගැන්වීම සහ මහජන සුරක්ෂිතතාවය ඇති කිරීම.

- සමාජ නියාමනය
    - විශ්වීය ප්‍රවේශය/සේවා
    - ග්‍රාමීය ප්‍රජාව, වැඩිහිටි ජනතාව සහ විවිධ අවශ්‍යතා සහිත පුද්ගලයන්ට විශ්වීය ප්‍රවේශ/සේවා සැපයීමට වග බලා ගැනීම.
    - හදිසි අවස්ථාවකදී ක්‍රියා කිරීම සඳහා පූර්ව සූදානමින් සිටීම.
    - විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ට විදුලි සංදේශ සේවා සැපයීම.
- අඩු පහසුකම් සහ සීමිත සම්පත් නියාමනය කිරීම
    - සංඛ්‍යාත වර්ණාවලි කළමණාකරනය (Spectrum Management)
    - අංකනය (Numbering)
    - නීත්‍යානුකූල අවසරය ලබාදීම (Right of Way)

- අවකාශ පරාස (Space Segment)
- අන්තර් සම්බන්ධතාවය (Interconnection)
- ජාත්‍යන්තර සම්බන්ධතා මධ්‍යස්ථාන වලට ප්‍රවේශවීම(Access to International Landing Stations)
- ප්‍රධාන ජාතික ජාල වලට ප්‍රවේශවීම (Access to Backbone)

- ගුණාත්මක විදුලි සංදේශ සේවා

  පාරිභෝගිකයා සෑහීමකට පත්වන ආකාරයෙන් අවශ්‍යතාවයන් සපුරාලන ලෙස සාධාරණ හා දරාගත හැකි පරිදි ඉහළ ගුණාත්මක භාවයකින් යුතුව විදුලි සංදේශ සේවා සැපයීමට වගබලා ගැනීම.

- යහපාලනය ප්‍රවර්ධනය කිරීම

  ස්වාභාවික යුක්තියේ මූලධර්ම පිලිපදිමින් කාලෝචිත තීරණ ලබාදීම, මහජන සහභාගීත්වය දිරිගැන්වීම හා විනිවිද පෙනෙන තීරණ ක්‍රියාවලියක් ඇති කිරීමට වග බලා ගැනීම.

- සාධාරණ සහ ඒකපාර්ශවීය නොවූ තීරණ ලබාදීමට වග බලා ගැනීම.
- සිවිල් සමාජය නවීන තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණයෙන් හෙබි දැනුවත් සමාජයක් බවට ගොඩනැංවීමට සහායවීම.
- ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය (ITU) සහ අදාල ජාත්‍යන්තර සංවිධාන විසින් විදුලි සංදේශ උපකරණ සහ තාක්ෂණික ප්‍රමිතීන් සම්බන්ධයෙන් පනවන නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීමට සියළුම විදුලි සංදේශ ක්‍රියාකරුවන් හා එක්ව කටයුතු කිරීමට වග බලා ගැනීම.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ කාර්යයන්

ඉහත අරමුණු සාක්ෂාත් කිරීම පිණිස ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව පහත සඳහන් නියාමන කාර්යයන් ඉටු කිරීමෙහිලා නිරත වේ.

- බලපත්‍ර සඳහා අයදුම් කිරීමේ පටිපාටිය සහ බලපත්‍ර ප්‍රදානය කිරීම
  - පනතේ 17 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකාව තුළ විදුලි සංදේශ ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම සඳහා බලපත්‍රය. පනතේ 17 වන වගන්තියට අනුකූලව කොමිෂන් සභාවේ නිර්දේශය මත අමාත්‍යවරයා විසින් දෙන ලද බලපත්‍රයක් යටතේ හැර කිසිම තැනැත්තකු විසින් ශ්‍රී ලංකාව තුළ විදුලි සංදේශ ක්‍රමයක් ක්‍රියාත්මක නොකළ යුතුය. කෙසේවුවද පනතේ 20 වන වගන්තියේ බලපත්‍ර ආදියෙන් නිදහස් කිරීම සඳහන් කර ඇත.
  - පනතේ 22 වන වගන්තිය යටතේ ගුවන් විදුලි සංඛ්‍යාත හා ගුවන් විදුලි සංඛ්‍යාත විමෝචන උපකරණ පාවිච්චි කිරීම සඳහා බලපත්‍රය. විදුලි සංදේශ පනතේ 22 (1) වගන්තිය ප්‍රකාරව කිසියම් තැනැත්තකු විසින් තත් කාර්යය සඳහා කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද බලපත්‍රයක් යටතේ හැර යම් ගුවන් විදුලි සංඛ්‍යාතයක් හෝ යම් ගුවන් විදුලි සංඛ්‍යාත විමෝචන උපකරණයක් ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවේ දේශීය ජල තීරයේ යම් කොටසක හෝ ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලද යම් නැවක හෝ ගුවන් යානයක පාවිච්චි නොකළ යුතුය.
  - පනතේ 21 වන වගන්තිය යටතේ වෙළඳ බලපත්‍ර. පනතේ 21 (1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් නිකුත්කළ බලපත්‍රයක් යටතේ හැර කිසිම තැනැත්තකු විසින් යම් විදුලි සංදේශ උපකරණයක් වෙළඳාමක් වශයෙන් නිශ්පාදනය කිරීම, ආනයනය කිරීම, විකිණීම, විකිණීම පිණිස ඉදිරිපත් කිරීම, ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීම, පැවරීම, කුලියට දීම, බදුදීම, ක්‍රියාකර පෙන්වීම, නඩත්තු කිරීම හෝ අළුත්වැඩියා කිරීම සිදු නොකළ යුතුය.

- අයක්‍රම නියාමනය කිරීම
  - පනතේ 5 (ඔ) වගන්තියේ නියමයන් ප්‍රකාරව කොමිෂන් සභාවට ඇති බලතල අනුව අමාත්‍යවරයා විමසා ආණ්ඩුවේ ප්‍රතිපත්තිය සහ ක්‍රියාකරුවන් විසින් සපයනු ලබන විදුලි සංදේශ සේවාවන් සම්බන්ධයෙන් ක්‍රියාකරුවන්ගේ අවශ්‍යතා සැළකිල්ලට ගනිමින් අයක්‍රම හෝ අයක්‍රම තීරණය කිරීමේ ක්‍රම නිශ්චය කිරීම.
  - පනතේ 5 (1) ප්‍රකාරව අන්තර්ජාල ගාස්තු අනුමත කිරීම/නිශ්චය කිරීම.
- විදුලි සංදේශ පනත (ඒ යටතේ වූ නීති සහ රීති ඇතුලත්ව) සහ බලපත්‍රලාභී ක්‍රියාකරුවන්ගේ බලපත්‍රවල අනුකූලතාවය පිරික්සීම සහ සහතික කිරීම.
- ශ්‍රී ලංකාවේ ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලිය නිසි ලෙස පාවිච්චි කිරීමට වගබලා ගැනීම මෙන්ම පිරික්සීම සහ ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලිය කළමණාකරනය කිරීම.
- පාරිභෝගික පැමිණිලි සහ විමර්ශන/පරීක්ෂණ පැවැත්වීමට ප්‍රතිචාර දැක්වීම.

  පනතේ 9(1) වගන්තිය ප්‍රකාරව ක්‍රියාකරුවකු විසින් සපයනු ලබන විදුලි සංදේශ සේවා පිළිබඳව විදුලි සංදේශ සේවා දායකයකු හෝ මහජනයා අතුරින් කෙනෙකු හෝ විසින් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් කරනු ලැබූ විට අවශ්‍යයයි කොමිෂන් සභාව සලකන විමර්ශනයක් කොමිෂන් සභාවට පැවැත්විය හැකි අතර කාරණයට අදාල අවස්ථානුගත කරුණු අනුව ගත යුතු ප්‍රතිකර්ම යෙදීමටද සැලැස්විය යුතුය. පනතේ 9(2) වගන්තිය අනුව යම් විමර්ශනයක් පැවැත්වීමේදී, පනතේ 9(1) ප්‍රකාරව කොමිෂන් සභාව විසින් ඒ පැමිණිල්ලට හේතු වූ නිමිත්ත හෝ කාරණය නිරවද්‍ය කිරීම සඳහා අවශ්‍යයයි පෙනී යන පරිදි එවැනි ක්‍රියාමාර්ග ගන්නා ලෙස එකී දුරකථන ක්‍රියාකාර සමාගම් වලට නියම කළ හැකි අතර අවශ්‍යයැයි හැඟෙන පරිදි මූල්‍යය වන්දි ගෙවන ලෙසද නියම කළ හැකිය.

- විදුලි සංදේශ සේවාවල ගුණාත්මකභාවය සහ විවිධත්වය සම්බන්ධයෙන් මහජනතාවට තොරතුරු සැපයීම සහ මහජන ක්‍රියාවලීන් සහ ප්‍රසිද්ධ විභාග පැවැත්වීමේදී ඔවුන්ගේ සහභාගීත්වය දිරි ගැන්වීම.
- විදුලි සංදේශ ක්ෂේත්‍රයට සම්බන්ධ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ/ ජාත්‍යන්තර හා විදේශීය ආයතනවල කටයුතු වලදී ශ්‍රී ලංකා රජය නියෝජනය කිරීම.
- කොමිෂන් සභාව විසින් නියෝග, උපදෙස් හා තීරණ නිකුත් කිරීම.

  කොමිෂන් සභාව නියෝග, උපදෙස් සහ තීරණ නිකුත් කිරීම සම්බන්ධයෙන් විනිවිද පෙනෙන ප්‍රතිපත්තියක් අනුගමනය කර ඇත. ප්‍රසිද්ධ විභාග සහ සෙසු සමුළු වලට සහභාගීවන සහ ඒවා නියෝජනය කරන විදුලි සංදේශ ක්ෂේත්‍රයේ ක්‍රියාකරුවන්ට, පාරිභෝගිකයින්ට සහ වෙනත් ඒ සම්බන්ධ උනන්දුවක් දක්වන පාර්ශවයන්ට වැඩි අවස්ථාවක් ලබා දෙනු ලැබේ.
- විදුලි සංදේශ උපකරණ සහ මාදිලි අනුමැතිය සඳහා තාක්ෂණික ප්‍රමිතීන් සඳහන් කිරීම.

අන්තර් අංශ සහයෝගිතාව

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ කාර්යයන් ඉටු කිරීම සඳහා අංශ/ඒකක කිහිපයක් තිබේ. 2023 වර්ෂයේ අංශ/ඒකකවල ප්‍රධාන කාර්යයන් සහ කාර්ය සාධනය මෙම වාර්තාවේ අදාළ අංශවල විස්තර කර ඇත. නිශ්චිත අංශයක්/ඒකකයක් යටතේ යම් යම් ක්‍රියාකාරකම් ලැයිස්තුගත කර ඇතත්, එම ක්‍රියාකාරකම් වෙනත් අංශ/ඒකකවල සහය ඇතිව එම නිශ්චිත අංශය/ඒකකය විසින් සිදු කර ඇති බව විශේෂයෙන් සඳහන් කළ යුතුය.

බලපත්‍ර කළමනාකරණ අංශය

ජාතික යහපැවැත්ම සඳහා අත්‍යවශ්‍ය යැයි සැලකෙන විදුලි සංදේශ සේවා සඳහා වන සියලුම සාධාරණ ඉල්ලීම් සපුරාලමින් ශ්‍රී ලංකාව තුළ විශ්වාසනීය සහ කාර්යක්ෂම ලෙස දේශීය සහ ජාත්‍යන්තර විදුලි සංදේශ සේවා සැපයීම ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් සහතික කළ යුතුය. බලපත්‍රලාභී ක්‍රියාකරු සමාගම් විසින් 1996 අංක 27 දරන පනතින් සංශෝධිත 1991 අංක 25 දරන විදුලි සංදේශ පනතේ 17 වැනි වගන්තියේ විධිවිධාන වලට අනුකූලව සේවා සැපයීම සහතික කරයි. පනතේ ඉහත සඳහන් කර ඇති වගන්තිය ප්‍රකාරව, පද්ධති බලපත්‍රයක අධිකාරිය යටතේ මිස, ශ්‍රී ලංකාව තුළ කිසිදු පුද්ගලයෙකු පොදු විදුලි සංදේශ ක්‍රමයක් ක්‍රියාත්මක නොකළ යුතුය. මහජන අදහස් හා කොමිෂන් සභාවේ නිර්දේශයට යටත්ව අමාත්‍යවරයා විසින් විධිමත් ලෙස විදුලි සංදේශ පද්ධති බලපත්‍ර ප්‍රදානය කරයි.

ජාල අංශය

විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ජාල අංශය විසින් ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන රාජ්‍ය සහ පෞද්ගලික විදුලි සංදේශ ජාල ආශ්‍රිත සේවා නියාමනය කරයි. පොදු විදුලි සංදේශ ජාල සඳහා ජාතික අංකන සැලැස්ම කළමනාකරණය කිරීම, සංඥා කේත පැවරීම, ජංගම ජාල සංකේත අංක පැවරීම, object identifiers පැවරීම (OID - ජාල කළමනාකරණයේ දී උපකරණ , සේවා හෝ පද්ධති සංරචක අනන්‍ය ලෙස හඳුනාගැනීමට යොදා ගැනේ), විදුලි සංදේශ යටිතල පහසුකම් ව්‍යාප්ත කිරීමට පහසුකම් සැලසීම, විදුලි සංදේශ උපකරණ අලෙවිකරුවන්ට බලපත්‍ර ලබා දීම, මාදිලි අනුමැති සහතික නිකුත් කිරීම සහ ජාල උපකරණ සඳහා රේගු නිෂ්කාශනය, ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ ජාල වෙත නව තාක්ෂණයන් හඳුන්වා දීමට කටයුතු කිරීම ජාල අංශයේ විෂය පථය යටතේ ඇති ක්ෂේත්‍ර වේ.

සංඛ්‍යාත වර්ණාවලි කළමනාකරණ අංශය

ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලිය යනු ස්වභාවික , සීමිත සම්පතක් වන අතර , එය සමාජයීය ජීවන තත්ත්වය සහ ආර්ථික වර්ධනය නැංවීමෙහි ලා යොදාගනිමින් , අත්පත් කරගත් ප්‍රතිලාභ උපරිම කිරීමට සුදුසු ලෙස කළමනාකරණය කළ යුතුය. ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත මඟින් නියම කර ඇති සියළුම සංඛ්‍යාත වර්ණාවලිය ආශ්‍රිත කරුණු සම්බන්ධයෙන් සිය වගකීම් ඉටු කිරීමට සහ සීමිත ජාතික සම්පතක් ලෙස ගුවන්විදුලි සංඛ්‍යාත වර්ණාවලිය කාර්යක්ෂමව කළමනාකරණය කිරීමේ බලතල කොමිෂන් සභාව සංඛ්‍යාත වර්ණාවලි කළමනාකරණ අංශයට පවරා ඇත. ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතේ 10(අ) වගන්තිය යටතේ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL) ශ්‍රී ලංකාවේ ගුවන්විදුලි සංඛ්‍යාත වර්ණාවලියේ භාවිතය සහ ස්ථාවර වන්ද්‍රිකා කක්ෂයට අදාළ කරුණු කළමනාකරණය සහ පාලනය සිදු කරන අතර , ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලි භාවිතය අවලංගු කිරීමට හෝ අත්හිටුවීමට හෝ එවැනි සංඛ්‍යාත භාවිතය තහනම් කිරීමට අවශ්‍ය යැයි හැඟෙන විට බලය ක්‍රියාත්මක කරන ශ්‍රී ලංකාවේ එකම නීත්‍යානුකූල අධිකාරිය වේ. ගුවන් විදුලි සන්නිවේදන සේවා භාවිතා කරන්නන් සඳහා බලපත්‍ර නිකුත් කිරීම, ගුවන්විදුලි සංඛ්‍යාත වර්ණාවලිය සංරක්ෂණය කිරීම සහ ගුවන්විදුලි සන්නිවේදන ස්ථාපනයන් මඟින් ඇතිවන විද්‍යුත් චුම්බක බාධා අවම කිරීම පිණිස නීතිරීතිවලට අනුකූලව ක්‍රියාත්මක කිරීම සඳහා පනතේ 22 වැනි වගන්තිය යටතේ කොමිෂන් සභාවට බලය පවරා ඇත.

තරහකාරිත්ව අංශය

පාරිභෝගිකයින්ගේ සහ දුරකථන ක්‍රියාකරු සමාගම්වල අවශ්‍යතා සපුරාලන කාර්යක්ෂම, පරිපූර්ණ විදුලි සංදේශ සේවාවක් සැපයීම සඳහා තරහකාරිත්ව අංශය නියාමන ක්‍රියාකාරකම් සිදු කරයි. මෙම අංශය විසින් විදුලි සංදේශ කර්මාන්තය තුළ සාධාරණ ගාස්තු සහ ගුණාත්මක සේවා පවත්වාගෙන යන අතරම, අයක්‍රම කරුණු සහ අන්තර් සම්බන්ධතා සේවා නියාමනය කිරීම, කර්මාන්ත තොරතුරු ප්‍රකාශයට පත් කිරීම, ක්‍රියාකරු කාර්ය සාධනය විශ්ලේෂණය කිරීම, සහ අදාළ පාර්ශ්වයන්ට අවශ්‍ය උපදෙස් ලබා දීම සිදු කරයි. සේවා නොලබන සහ අඩු පහසුකම් සහිත ප්‍රදේශවලට විදුලි සංදේශ පහසුකම් සැපයීම සඳහා දුරකථන ක්‍රියාකරු සමාගම් ප්‍රවර්ධනය කිරීම මෙන්ම විදුලි සංදේශ බද්ද, ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරුවන්ගේ බද්ද, සෙලියුලර් කුලුනු බද්ද, ජංගම කෙටි පණිවිඩ සේවා බද්ද සහ සෙස් බද්ද එකතු කිරීම ද අංශයේ සේවාවන්ට ඇතුළත් ය. විදුලි සංදේශ ක්ෂේත්‍රය පිළිබඳ ප්‍රවීන දැනුමැති විදේශීය විශේෂඥයින් දුරකථන ක්‍රියාකරු සමාගම්වල ව්‍යාපෘති සඳහා අත්‍යවශ්‍ය වන අතර එවැනි වෘත්තිකයන්ගේ වීසා බලපත්‍ර සැකසීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කෙරේ.

අනුකූලතා සහ විමර්ශන අංශය

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ එක් ප්‍රධාන අරමුණක් වන්නේ ශ්‍රී ලංකාව තුළ විශ්වාසනීය හා කාර්යක්ෂම ජාතික සහ ජාත්‍යන්තර විදුලි සංදේශ සේවා සැපයීම සහතික කිරීමයි. මෙම කාර්යය සඳහා, විශ්වාසනීය, කාර්යක්ෂම සහ ගුණාත්මක විදුලි සංදේශ සේවාවක් සැපයීම පිණිස විදුලි සංදේශ සේවා සපයන්නන් සිය නියාමන වගකීම්වලට අනුකූලව කටයුතු කරන බව සහතික කිරීම සඳහා නියාමන ක්‍රියාමාර්ග ගත යුතුය. මේ සඳහා කර්මාන්තය පිළිබඳ අඛණ්ඩ නිරීක්ෂණය, විමර්ශනය සහ බුද්ධි තොරතුරු සහ සුදුසු නියාමන ක්‍රියාමාර්ග බලාත්මක කිරීම අවශ්‍ය වේ. පාරිභෝගික පැමිණිලි ආශ්‍රිත කටයුතු සිදු කිරීම සහ ඔවුන්ගේ ගැටලුවලට සාධාරණ විසඳුම් ලබාදීම පාරිභෝගික තෘප්තිය සහ පාරිභෝගික දැක්ම වැඩිදියුණු කිරීමට හේතු වේ. මෙම වගකීම් මෙහෙයවනු ලබන්නේ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අනුකූලතා සහ විමර්ශන අංශය විසිනි.

ප්‍රතිපත්ති සහ ජාත්‍යන්තර සබඳතා අංශය

ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත ප්‍රකාරව, පොදුවේ විදුලි සංදේශ සේවා සැපයීමට අදාළ ප්‍රතිපත්තිමය කරුණු සම්බන්ධයෙන් රජයට උපදෙස් දීමේ බලය ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සතු වන අතර , ප්‍රතිපත්ති හා ජාත්‍යන්තර සම්බන්ධතා අංශය විසින් විදුලි සංදේශ රෙගුලාසි ආශ්‍රිත කරුණු සම්බන්ධයෙන් ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය (ITU) හෝ ඊට අනුබද්ධ ආයතන සම්බන්ධීකරණය කිරීමේ වගකීම දරයි. පනතේ දක්වා ඇති එක් අරමුණක් වන්නේ විදුලි සංදේශ සහ ඒ ආශ්‍රිත ක්ෂේත්‍රවල නව තාක්ෂණික ක්‍රම දියුණු කිරීම සහ භාවිතය පිළිබඳ පර්යේෂණ ප්‍රවර්ධනය කිරීමයි. ප්‍රතිපත්ති සහ ජාත්‍යන්තර සබඳතා අංශයට පර්යේෂණ අධ්‍යයනයන් සිදු කිරීම සඳහා දේශීය විශ්වවිද්‍යාල/පර්යේෂණ ආයතනවලට සහය වීමට කොමිෂන් සභාව විසින් බලය ලබා දී ඇත. විදුලි සංදේශ අංශයේ සංවර්ධනය උදෙසා ජාත්‍යන්තර ප්‍රශස්ත භාවිතයන් ප්‍රවර්ධනය කිරීමෙහි ලා ජාත්‍යන්තර සහ දේශීය වැඩසටහන්/ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම පිණිස සම්බන්ධ වීමට ද මෙම අංශයට පැවරී ඇත. ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය (ITU), ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමය (APT) සහ දකුණු ආසියානු විදුලි සංදේශ නියාමකයින්ගේ සංගමය (SATRC) වැනි විදුලි සංදේශ නියාමන ක්‍රියාකාරකම් සඳහා වගකිව යුතු ජාත්‍යන්තර ආයතනවල සම්බන්ධීකරණ කේන්ද්‍රස්ථානය වශයෙන් ප්‍රතිපත්ති සහ ජාත්‍යන්තර සබඳතා අංශය ක්‍රියා කරයි. ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය (ITU), ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමය (APT) සහ දකුණු ආසියානු විදුලි සංදේශ නියාමකයින්ගේ සංගමයේ (SATRC) සභාය ඇතිව මෙම අංශය නියාමනය, සම්බන්ධීකරණය සහ ආංශික සංවර්ධනය වැනි පුළුල් පරාසයක කටයුතු සිදු කරයි.

නීති අංශය

සියලුම නෛතික සහ නියාමන ගැටළු සම්බන්ධයෙන් කොමිෂන් සභාව වෙත උපදෙස් ලබා දීමේ දී නීති අංශය වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. මෙම අංශය විසින් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව පාර්ශවකරුවෙකු වන සියලුම නඩු සම්බන්ධ කළමනාකරණ කටයුතු සිදු කරයි. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ නියාමන කාර්යයන් ඉටු කිරීමේ දී නීති අංශයේ කාර්යභාරය අවශ්‍ය කෙරේ. 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ සංශෝධිත පනත සහ වෙනත් සෘජුව ඒ හා සම්බන්ධ නීතිරීති ප්‍රකාරව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව මඟින් සිදුකරන නියාමන ක්‍රියාකාරකම් වලදී නීතිමය උපදෙස් ලබාදීමේ වගකීම නීති අංශය සතු වේ.

විශේෂ ව්‍යාපෘති අංශය

විශේෂ ව්‍යාපෘති අංශය විසින් ජාතික අවශ්‍යතාවයන් සඳහා වන ව්‍යාපෘති සහ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ වගකීම දරයි. අවශ්‍ය යටිතල පහසුකම් සපයමින් විදුලි සංදේශ ක්ෂේත්‍රය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම මෙම අංශය ප්‍රධාන වශයෙන් සිදු කරයි. තවද, විදුලි සංදේශ ක්ෂේත්‍රයේ නව තාක්ෂණයන් හඳුන්වා දීමට හැකි වන පරිදි පර්යේෂණ ව්‍යාපෘති සිදු කිරීම ද මෙම අංශයේ සේවාවන්ට ඇතුළත් වේ.

පාලන සහ ආයතනික කටයුතු අංශය

සමස්ථ ආයතනයේ නිසි ක්‍රියාකාරිත්වය උදෙසා මෙම අංශයේ කාර්යභාරය ඉතා වැදගත් වන අතර , එහි විෂය පථය කාර්යයන් සහ වගකීම් රැසකින් සමන්විත වේ. මෙම අංශය මානව සම්පත් පරිපාලනය, කළමනාකරණය සහ සංවර්ධනය මෙන්ම ආයතනික කටයුතු සඳහා ද වගකිව යුතුය.
ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ක්‍රියාකාරකම් සැලසුම් කිරීම සහ අධීක්ෂණය කිරීම, සේවකයින්ට සිය සේවා ප්‍රමිතීන් වැඩිදියුණු කිරීම සඳහා හිතකර භෞතික පරිසරයක් පවත්වාගෙන යාම හා නිර්මාණය කිරීම සහ ආයතනය තුළ මෙන්ම සෙසු ආයතන සම්බන්ධීකරණය කිරීම දක්වා මෙම අංශයේ විෂයය පථය පුළුල් වේ. තවද, මෙම අංශය විසින් කාර්ය මණ්ඩලය සඳහා කාර්යාල අවශ්‍යතා සහ පහසුකම් සැපයීම, කාර්ය මණ්ඩලයේ සුභසාධනය සහතික කිරීම, පුස්තකාල පහසුකම් සැපයීම සහ ආයතනයේ වැදගත් සිදුවීම් මාධ්‍ය ආවරණය කිරීම කළමනාකරණය කරයි.

මූල්‍ය අංශය

කොමිෂන් සභාවේ සියලුම අධීක්ෂණ කටයුතු ඇතුළත් මූල්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් මූල්‍ය අංශය විසින් වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. ආදායම් එකතු කිරීම, ආදායම් සහ වියදම් වාර්තා කිරීම, අරමුදල් කළමනාකරණය සහ ආදායම් - වියදම් නිසි ලෙස වාර්තා කිරීම ප්‍රධාන කාර්යයන් වේ. එපමණක් නොව, මුදල් පාලනය සහ වියදම් කිරීමට අමතරව, විශේෂයෙන්ම මූල්‍ය රෙගුලාසිවලට අදාළ නීති රීති, චක්‍රලේඛ සහ කොමිෂන් සභා තීරණ වැනි ව්‍යවස්ථාපිත අවශ්‍යතා ක්‍රියාත්මක කිරීම ද කාර්යයන් අතර වේ. එසේම, රජය සහ අනෙකුත් පාර්ශවකරුවන් විසින් වැදගත් තීරණ ගැනීමට මහ පෙන්වන බැවින් නිවැරදි මූල්‍ය වාර්තා තබා ගැනීම සහ නඩත්තු කිරීම මූල්‍ය අංශයේ ප්‍රධාන වගකීම වේ. සියලුම රාජ්‍ය ආයතන මෙන්ම, ගනුදෙනුවල නිරවද්‍යතාවය සහ පරිපූර්ණ බව සම්බන්ධයෙන් මතයක් ප්‍රකාශ කිරීම සඳහා මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම මෙන්ම ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය විසින් ප්‍රකාශයට පත් කරන ලද පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම, ගිණුම්කරණ ප්‍රමිති සහ සංකල්ප සමඟ අදාළ සියලුම මූල්‍ය ප්‍රතිපත්ති සහ රජයේ මූල්‍ය රෙගුලාසි ප්‍රකාරව මූල්‍ය පටිපාටි වලට අනුකූලවීම සහතික කිරීමට ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව ද නීතියෙන් බැඳී සිටී. මූල්‍ය අංශය ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ මූල්‍ය පරිපාලනය, පිරිවැය පාලනය සහ ඵලදායී හා කාර්යක්ෂම උපායමාර්ගික තීරණ ගැනීමේ කටයුතුවල ද නිරත වේ.

තොරතුරු තාක්ෂණ අංශය

තොරතුරු තාක්ෂණ (IT) අංශය අත්‍යවශ්‍ය පාර්ශවකරුවන් අතර හිතකර සේවා පරිසරයක් සැපයීම සඳහා අවශ්‍ය මෘදුකාංග, විසඳුම් සහ භාවිතාවන් ඒකාබද්ධ කරමින් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව තුළ ඩිජිටල් පරිවර්තනය ක්‍රියාත්මක කිරීම ආරම්භ කර ඇත. මෙමඟින් ආයතනයේ අභ්‍යන්තර හා බාහිර ක්‍රියා පටිපාටි ක්‍රමවත් කරන අතර කාර්ය මණ්ඩලයට මෙන්ම පාරිභෝගිකයින්ට තාක්ෂණයෙන් උපරිම ප්‍රයෝජන ගැනීමට අවස්ථාව සැලසේ.
තොරතුරු තාක්ෂණ අංශය විසින් තොරතුරු තාක්ෂණය උපායශීලී ලෙස භාවිත කරමින් ඩිජිටල් ව්‍යාපාරවලට සේවා අවස්ථා සැලසීමට උපකාරී වන අතරම, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ක්‍රියාකාරකම්වල සඵලතාවය සහ කාර්යක්ෂමතාව සහ මෙහෙයුම් වැඩිදියුණු කිරීම සහතික කරයි. කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ හැකියාවන් ශක්තිමත් කිරීම සහ වත්මන් තාක්ෂණය සහ එය භාවිත කරන ආකාරය පිළිබඳ ඔවුන්ගේ දැනුම වැඩිදියුණු කිරීම පිණිස අදාළ වැඩසටහන් ඉදිරිපත් කරයි.

අභ්‍යන්තර විගණන අංශය

අභ්‍යන්තර විගණනය යනු උපාය මාර්ග, අරමුණු සහ අවදානම් සලකා බලන; පාලනය, අවදානම් කළමනාකරණය සහ පාලන ක්‍රියාවලිය වැඩිදියුණු කිරීමේ ක්‍රම ඉදිරිපත් කිරීම දිරිගන්වන; සහ වෛෂයිකව අදාළ සහතිකය සපයන; ආයතනයට සහ එහි පාර්ශවකරුවන්ට වටිනාකමක් එකතු කිරීම අරමුණු කරගත් ස්වාධීන ක්‍රියාකාරකමකි.
එය දත්ත සහ ව්‍යාපාරික ක්‍රියාවලීන් පිළිබඳ ක්‍රමානුකූල විශ්ලේෂණ සහ තක්සේරු කිරීම් මත පදනම්ව අවබෝධය සහ නිර්දේශ ලබා දෙමින් ආයතනයක පාලනය, අවදානම් කළමනාකරණය මෙන්ම කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමේ උත්ප්‍රේරකයක් ලෙස ක්‍රියා කරයි.
අඛණ්ඩතාව සහ වගවීම සඳහා වූ කැපවීමත් සමඟ, සංවිධානයක් තුළ අභ්‍යන්තර විගණනයේ විෂය පථය පුළුල් වේ. මෙහෙයුම්වල කාර්යක්ෂමතාවය, මූල්‍ය වාර්තාකරණයේ විශ්වසනීයත්වය, වංචා වැළැක්වීම සහ විමර්ශනය කිරීම, වත්කම් ආරක්ෂා කිරීම සහ නීති රීතිවලට අනුකූල වීම වැනි ක්ෂේත්‍ර ඊට ඇතුළත් විය හැකිය.

කොමිෂන් සභාව සහ විධායක කළමනාකාරිත්වය



මහාචාර්ය නිරංජන් ගුණවර්ධන
සභාපති

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය නිරංජන් ගුණවර්ධන මහතා මොරටුව විශ්වවිද්‍යාලයට අනුයුක්තව සේවය කරන මහාචාර්යවරයෙකු වන අතර දැනට එහි උපකුලපති, ශ්‍රී ලංකා රජයේ තාක්ෂණ අමාත්‍යාංශයේ ලේකම් සහ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සභාපති ලෙස කටයුතු කරයි. ඔහු වරලත් ඉංජිනේරුවරයකු වන අතර, ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ ආයතනික සාමාජිකයෙක් සහ ශ්‍රී ලංකා ව්‍යාපෘති කළමනාකරුවන්ගේ ආයතනයේ (IPMSL) සාමාජිකයෙක් ද වේ.

ඔහු මොරටුව විශ්වවිද්‍යාලයෙන් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය ලබා ගත් අතර එක්සත් රාජධානියේ “Loughborough Technology”විශ්වවිද්‍යාලයෙන් විද්‍යාපති උපාධිය සහ ආචාර්ය උපාධිය ලබා ගත්තේය. මහාචාර්ය ගුණවර්ධන මහතා මොරටුව විශ්වවිද්‍යාලයේ නියෝජ්‍ය උපකුලපති, පීඨාධිපති (ව්‍යාපාර පීඨය) සහ අන්තර් විෂය අධ්‍යයන අංශයේ ප්‍රධානියා ලෙස ද කටයුතු කර ඇත. ඔහු එක්සත් රාජධානියේ බ්‍රිස්ටල් හි බටහිර එංගලන්ත විශ්වවිද්‍යාලයට අනුබද්ධ කොළඹ උසස් අධ්‍යාපන ආයතනයක් වන “Northshore College of Business and Technology” හි නිර්මාතෘ සහ අධ්‍යක්ෂවරයෙකි.



ඩී.එම්.එම්. දිසානායක මහතා
අධ්‍යක්ෂ ජනරාල්

මධුශංක දිසානායක මහතා ඉතාමත් කාර්යශූර වෘත්තිකයකු වන අතර දැනට ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ලෙස කටයුතු කරයි. විවිධ ක්ෂේත්‍රයන්හි හසල වෘත්තීමය පළපුරුද්දකින් හෙබි මධුශංක මහතා රාජ්‍ය පරිපාලනය, නීතිය සහ තොරතුරු පද්ධති විෂයයන් සම්බන්ධයෙන් නායකත්වය සහ කෘතහස්ත භාවය පෙන්නුම් කර ඇත.

ජනාධිපති ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරයා වශයෙන් මධුශංක මහතා ජනාධිපතිවරයාට විවිධ කටයුතුවලදී උපදෙස් දීම සහ සහාය වීම, ජනාධිපති ලේකම් කාර්යාලයේ නිසි ක්‍රියාකාරිත්වයට දායක වීම වැනි තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරන අතර, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ලෙස ඔහු නියාමන ව්‍යාපෘති අධීක්ෂණය හා මෙහෙයවීම කරමින් අතර, විදුලි සංදේශ ක්ෂේත්‍රයේ කර්මාන්ත ප්‍රමිතීන් සහ රෙගුලාසි වල අනුකූලතාවය සහතික කරයි. ඔහු ශ්‍රී ලංකා අධිකරණ අමාත්‍යාංශයේ හිටපු අධ්‍යක්ෂ (ප්‍රතිසංස්කරණ) සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් මෙන්ම ශ්‍රී ලංකා අග්‍රාමාත්‍ය කාර්යාලයේ හිටපු සහකාර ලේකම් විය.

මධුශංක දිසානායක මහතාගේ අධ්‍යාපනික සහ වෘත්තීය ගමන්මග තුළ ඔහුගේ කැපවීම විද්‍යාමාන වන අතර ශ්‍රී ලංකාවේ විවිධ ක්ෂේත්‍ර උදෙසා සැලකිය යුතු දායකත්වයක් ලබා දීම පිණිස නීතිය, තොරතුරු පද්ධති සහ රාජ්‍ය පරිපාලනය වැනි විවිධ විෂයයන් සම්බන්ධයෙන් නිපුණතාවය අත් කර ගෙන ඇත. ඔහු නීති උපාධිය - එල්.එල්.බී, මෙල්බර්න් විශ්ව විද්‍යාලයේ කළමනාකරණ තොරතුරු පද්ධති, සහ තොරතුරු පද්ධති පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය, කොළඹ විශ්ව විද්‍යාලයේ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය, සහ කර්ටින් විශ්ව විද්‍යාලයේ පරිගණක පද්ධති සහ ජාලකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය ලබා ඇත.



අසංක බිමල් රාජසිංහ මහතා
කොමිෂන් සභා සාමාජික

අසංක බිමල් රාජසිංහ මහතා තාක්ෂණ ක්ෂේත්‍රයේ දක්ෂ වෘත්තිකයෙකි, දැනට ශ්‍රී ලංකාවේ බස්නාහිර පළාතේ කොළඹ සීමාසහිත n-able පුද්ගලික සමාගමේ ප්‍රධාන විධායක නිලධාරියා ලෙස සේවය කරයි. වසර 15කට අධික වෘත්තීමය පළපුරුද්දක් ඇති අසංක මහතා විවිධ ක්ෂේත්‍රවල එකිනෙකට වෙනස් භූමිකාවන්හි නායකත්වය සහ ප්‍රවීණත්වය පෙන්නුම් කර ඇත.

සීමාසහිත n-able පුද්ගලික සමාගමේ ප්‍රධාන විධායක නිලධාරියා වශයෙන් අසංක මහතා තාක්ෂණ ක්ෂේත්‍රයේ නවෝත්පාදනය සහ ප්‍රවර්ධනය උදෙසා උපාය මාර්ගික මහ පෙන්වීම සහ නායකත්වය ලබා දෙමින් සමාගමේ මෙහෙයුම්වල ප්‍රධානියා ලෙස කටයුතු කරයි. ප්‍රධාන විධායක නිලධාරියා වීමට පෙර, අසංක මහතා එහි මෙහෙයුම් ප්‍රධානියා ලෙස කටයුතු කළ අතර, එහිදී ඔහු සමාගමේ දෛනික කටයුතු අධීක්ෂණය සහ ප්‍රශස්ත කිරීමෙහිලා තීරණාත්මක කාර්යභාරයක් ඉටු කළ අතර, ඔහු Critical Infra BU සමාගමේ හිටපු සාමාන්‍යාධිකාරී, සීමාසහිත Enterprise Technology (පුද්ගලික) සමාගමේ හිටපු ප්‍රධාන ගිණුම් කළමනාකරු, Getz Pharma සමාගමේ හිටපු ප්‍රාදේශීය කළමණාකරු, මෙන්ම Ceylinco IT Solutions සමාගමේ හිටපු අභ්‍යාසලාභී සහ මෘදුකාංග ක්‍රමලේඛක වේ. අසංක බිමල් රාජසිංහ මහතා අයර්ලන්ත ජාතික විශ්ව විද්‍යාලයේ කළමනාකරණ තොරතුරු පද්ධති පිළිබඳ විද්‍යාවේදී (BSc) උපාධිය ද ජාතික ව්‍යාපාර කළමනාකරණ ආයතනයේ දත්ත සන්නිවේදනය සහ මෘදුකාංග සංවර්ධනය පිළිබඳ ඩිප්ලෝමාව ද ලබා ඇත.



නන්දසිරි පොන්නම්පෙරුම මහතා
(FCA, MBA (Fin), FCMA)
කොමිෂන් සභා සාමාජික

නන්දසිරි පොන්නම්පෙරුම මහතා ගණකාධිකරණ ක්ෂේත්‍රයේ අද්විතීය පළපුරුද්දකින් හෙබි වෘත්තිකයකු වන අතර, දැනට ශ්‍රී ලංකාවේ කොළඹ පිහිටි පොන්නම්පෙරුම සහ සමාගමේ (PONNAMPERUMA & Co.- වරලත් ගණකාධිකරණ ආයතනයේ) කළමනාකාර හවුල්කරු ලෙස සේවය කරයි. දශක දෙකකට වැඩි කාලයක් පුරා විහිදුණු කීර්තිමත් වෘත්තීමය ජීවිතය තුළ, නන්දසිරි මහතා ආයතනයේ සාර්ථකත්වය සහ වර්ධනය උදෙසා වැදගත් කාර්යභාරයක් ඉටු කර ඇත.

කළමණාකාර හවුල්කරු වශයෙන් ඔහුගේ කාර්යභාරය මත නන්දසිරි පොන්නම්පෙරුම මහතා පොන්නම්පෙරුම සහ සමාගමේ මෙහෙයුම් කටයුතු ඉටු කරමින් සමාගමට නායකත්වය සහ උපාය මාර්ගික මගපෙන්වීම ලබාදෙයි. ඔහුගේ මගපෙන්වීම යටතේ, සමාගම වරලත් ගණකාධිකාරී ක්ෂේත්‍රයේ කීර්තිමත් ආයතනයක් වශයෙන් දියුණු වෙමින් ස්ථාපිත වී ඇත.

නන්දසිරි පොන්නම්පෙරුමගේ අධ්‍යාපනික ජයග්‍රහණ, අතර ඔහු වරලත් ගණකාධිකාරීවරයකු මෙන්ම, ඔහු FCA, MBA-USQ (මූල්‍ය), FCMA, and FMAAT යන උපාධි ලබා ඇත.



එරුෂ කාලිදාස මහතා
කොමිෂන් සභා සාමාජික

නීතිඥ එරුෂ කාලිදාස මහතා, නීතිය ඉගැන්වීමේ වෘත්තීමය පළපුරුද්ද සහිත ශ්‍රේෂ්ඨාධිකරණයේ සහ අභියාචනාධිකරණයේ සිවිල් නීතිය පිළිබඳ නීතිඥවරයකි. ප්‍රායෝගික දැනුම බෙදා ගැනීම නීතිය පිළිබඳ වඩා හොඳ අවබෝධයක් ලබාගැනීමෙහි ලා දිරිමත් කරන බව ඔහු තරයේ විශ්වාස කරන අතර කළමනාකරණයේ න්‍යායික දැනුම සමඟින් ඔහුගේ ප්‍රායෝගික දැනුම බෙදා ගැනීමට අපේක්ෂා කරයි.

එරුෂ මහතා සීමාසහිත TEAM Libertas (පුද්ගලික) සමාගමේ අධ්‍යක්ෂවරයෙකු, නීති උපදේශකයකු සහ උපදේශකයෙකු ලෙසද කටයුතු කරයි.

නීතිය පිළිබඳ ගුරු උපදේශකවරයකු වශයෙන් ඔහු 2004 සිට 2007 දක්වා කාලය තුළ ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ උපදේශකයෙකු වූ අතර ශ්‍රී ලංකා නීතිඥ සංගමය විසින් පවත්වන ලද 'ඵලදායී උපදේශන නීතිඥ ඩිප්ලෝමා පාඨමාලාව' පිළිබඳ කථිකාචාර්යවරයෙකි.

වෘත්තියෙන් නීතිඥවරයකු වන එරුෂ මහතා බුද්ධිමය දේපළ නීතිය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව, ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ උසස් නීති අධ්‍යයන ඒකකය, එක්සත් රාජධානියේ ස්ටැෆර්ඩ්ෂයර් විශ්වවිද්‍යාලයේ ජාත්‍යන්තර ව්‍යාපාර නීතිය පිළිබඳ නීතිපති උපාධිය, සහ කැලණිය විශ්වවිද්‍යාලයේ විද්‍යාවේදී උපාධිය ලබා ඇත.



එම්.කේ. ජයන්ත මහතා
අධ්‍යක්ෂ / මූල්‍ය

ජයන්ත මහතා 2013 වසරේ දී ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සේවයට එක් වී ඇත. ඔහු ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් වාණිජවේදී උපාධිය ලබා ඇති අතර, ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සාමාජිකයකු, එක්සත් රාජධානියේ වරලත් රාජ්‍ය මූල්‍ය ගණකාධිකරණ ආයතනයේ ආශ්‍රිත සාමාජිකයකු, ශ්‍රී ලංකාවේ සහතිකලත් කළමනාකරණ ගණකාධිකරණ ආයතනයේ සාමාජිකයකු, එක්සත් රාජධානියේ පිරිවැය සහ විධායක ගණකාධිකරණ ආශ්‍රිත සාමාජිකයකු ද වේ. තවද ජයන්ත මහතා ඇමරිකා එක්සත් ජනපදයේ හොනොලුලු විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ද ලබා ඇත.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව හා සම්බන්ධ වීමට පෙර, ජයන්ත මහතා ශ්‍රී ලංකාවේ කීර්තිමත් නිෂ්පාදන, වෙළඳ සහ සේවා ආයතන රැසක සමූහ මූල්‍ය පාලක, මූල්‍ය කළමනාකරු සහ පරිපාලන සහ ප්‍රධාන මූල්‍ය නිලධාරී වැනි ජ්‍යෙෂ්ඨ තනතුරු හොබවමින් පෞද්ගලික අංශයේ වසර 17 කට වැඩි මූල්‍ය සහ පරිපාලන පළපුරුද්දක් අත්කරගෙන ඇත.



එම්.ජේ.එස්. රවිසිංහ මහතා
අධ්‍යක්ෂ / පාලන සහ ආයතනික කටයුතු

ජගත් රවිසිංහ මහතා 2023 වසරේ අප්‍රේල් මාසයේ දී ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ පාලන හා ආයතනික කටයුතු අධ්‍යක්ෂවරයා වශයෙන් පත් කරන ලදී. ඔහු ආයතනයේ පාලන, ආයතනික කටයුතු සහ මානව සම්පත් සංවර්ධන කාර්යයන් හී වගකීම දරයි. රවිසිංහ මහතා වසර 19 ක පළපුරුද්දක් ඇති ශ්‍රී ලංකා පරිපාලන සේවයේ පළමු පන්තියේ නිලධාරියෙකු වන අතර ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභා පාලක මණ්ඩලය විසින් කොමිෂන් සභාව සඳහා තෝරාගෙන ඇත.

ඔහු පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ භෞතික විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී (BSc) උපාධිධාරියකු වන අතර පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ද ජපානයේ ටෝකියෝ හි ප්‍රතිපත්ති අධ්‍යයන උපාධි ආයතනයෙන් (GRIPS) රාජ්‍ය පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ද ලබා ඇත.

රවිසිංහ මහතා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨයේ ගණිත අංශයේ තාවකාලික ප්‍රදර්ශක (demonstrator) /උපදේශකවරයකු ලෙස සිය වෘත්තීය ජීවිතය ආරම්භ කළේය. පසුව, ඔහු 2004 ජූලි මාසයේ දී ශ්‍රී ලංකා පරිපාලන සේවයට බැඳුණි. ඔහු සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවට අනුයුක්තව සහකාර කොමසාරිස් පාලන, නියෝජ්‍ය කොමසාරිස් සමෘද්ධි සහ නියෝජ්‍ය කොමසාරිස් සංවර්ධන යන තනතුරු දැරීය. ඉන්පසුව, ඔහු ආගමන හා විගමන දෙපාර්තමේන්තුවට අනුයුක්තව සහකාර පාලක ප්‍රසම්පාදන, සහකාර පාලක ගමන් බලපත්‍ර සහ නියෝජ්‍ය පාලක ගමන් බලපත්‍ර යන තනතුරු දැරීය. ඉන් අනතුරුව වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයට අනුයුක්තව අධ්‍යක්ෂ සංවර්ධන, වැවිලි අධීක්ෂණ හා කළමනාකරණ අංශයේ අධ්‍යක්ෂ, පොල් වගා කිරීමේ මණ්ඩලයේ වැඩබලන සාමාන්‍යාධිකාරී, තේ පර්යේෂණ මණ්ඩලයේ වැඩබලන සභාපති, තේ ශක්ති අරමුදලේ වැඩබලන ප්‍රධාන විධායක නිලධාරී වශයෙන් කටයුතු කළේය.ඉන් පසුව, ඔහු පාලන සහ ආයතනික කටයුතු අධ්‍යක්ෂ වශයෙන් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සේවයට එක් විය.



තරලිකා ලිවේරා මහත්මිය
අධ්‍යක්ෂ / අනුකූලතා සහ විමර්ශන (වැඩබලන)

තරලිකා ලිවේරා මහත්මිය 1994 වසරේදී ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව, විදුලි සංදේශ අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලය ලෙස පැවති අවධියේ ඉංජිනේරුවරියක (II පන්තියේ II ශ්‍රේණියේ) ලෙස සේවයට සම්බන්ධ වූ අතර විදුලි සංදේශ නියාමන ක්ෂේත්‍රය පිළිබඳව වසර 29 කට අධික පුළුල් පළපුරුද්දකින් හෙබි නිලධාරිනියකි. වර්තමානයේ දී ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ - අනුකූලතා සහ විමර්ශන (වැඩබලන) තනතුර හොබවයි.

ඇය පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ විද්‍යුත් සහ ඉලෙක්ට්‍රොනික විද්‍යා ගෞරව උපාධිය සහ එක්සත් රාජධානියේ Sheffield Hallam විශ්වවිද්‍යාලයෙන් ඉලෙක්ට්‍රොනික හා විදුලි සංදේශ පශ්චාත් උපාධිය ලබාගෙන ඇත.

ලිවේරා මහත්මිය වෘත්තියෙන් වරලත් ඉංජිනේරුවරියක් (CEng) වන අතර එක්සත් රාජධානියේ ඉංජිනේරු කවුන්සිලයේ ලියාපදිංචි වී ඇත. ඇය එක්සත් රාජධානියේ ඉංජිනේරු සහ තාක්ෂණ ආයතනයේ සාමාජිකාවක් වන අතර ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ ද ආශ්‍රිත සාමාජිකයෙකි. ඇය දකුණු ආසියාවේ ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංසදයේ උප සභාපතිත්වය දරන අතර ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ "අධ්‍යයන කණ්ඩායම - 1" හි බ්‍රෝඩ්බෑන්ඩ් අධ්‍යයනය පිළිබඳ උප වාර්තාකරු ලෙස ද කටයුතු කර ඇත. ඇයගේ වෘත්තීය ජීවිතය තුළ, විදුලි සංදේශ ප්‍රතිපත්ති සහ නියාමනය පිළිබඳ පුළුල් ජාතික හා ජාත්‍යන්තර අත්දැකීම් ලබා ඇති අතර, උපායමාර්ගික තීරණ ක්‍රියාත්මක කිරීමට ඇයගේ එම අත්දැකීම් කොමිෂන් සභාවට බෙහෙවින් ප්‍රයෝජනවත් වී ඇත.



කේ.එස්.එම්. විශාඛා මෙනවිය
අධ්‍යක්ෂ / ජාල (වැඩබලන)

කේ. එස්. එම්. විශාඛා මෙනවිය 1994 වසරේදී ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව, විදුලි සංදේශ අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලය වශයෙන් පැවතුන අවධියේ ඉංජිනේරුවරියක වශයෙන් එහි සේවයට සම්බන්ධ වී ඇත. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ විදුලි සංදේශ සහ නියාමන ක්ෂේත්‍රයේ වසර 29කට අධික පළපුරුද්දක් ඇය සතු වේ. ඇය දැනට ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ - ජාල (වැඩබලන) වශයෙන් කටයුතු කරන අතර ප්‍රතිපත්ති හා ජාත්‍යන්තර සබඳතා අංශයේ අධ්‍යක්ෂ (වැඩබලන) තනතුර ද දරා ඇත. එමෙන්ම ඇය ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ වර්ණාවලි කළමනාකරණ සහ ජාල අංශවල නියෝජ්‍ය අධ්‍යක්ෂ සහ සහකාර අධ්‍යක්ෂ තනතුරු වල සේවය කර ඇත.

ඇය 1993 වසරේ දී පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ විද්‍යුත් සහ ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු විද්‍යා ගෞරව උපාධිය ලබා ගත්තාය. එමෙන්ම ඇය මොරටුව විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පශ්චාත් උපාධිධාරිනියක වන අතර එක්සත් රාජධානියේ ඉංජිනේරු සහ තාක්ෂණ ආයතනයේ (IET) වරලත් ඉංජිනේරුවරියක් සහ එක්සත් රාජධානියේ ඉංජිනේරු කවුන්සලයේ වරලත් සමාජිකාවක් ද වේ.

ඇය සංඛ්‍යාත වර්ණාවලි කළමනාකරණ අංශයේ වසර 16කට වැඩි කාලයක් සේවයේ නිරත වෙමින් ගුවන්විදුලි සන්නිවේදනය පිළිබඳ අත්දැකීම් සම්භාරයක් ලබා ඇති අතර මෙම කාලය තුළ අංශය විසින් මෙහෙයවන ලද ප්‍රධාන ව්‍යාපෘති රැසකට දායක වී ඇත. එමෙන්ම ඇය වසර 10 අධික කාලයක් ජාල අංශයේ සේවය කරමින් අංකන සහ ජාලකරණ ක්ෂේත්‍රය පිළිබඳ පුළුල් දැනුමක් ලබා ඇත. ඇය දැනට දුරකථන අංකය වෙනස් නොවී ජාල අතර මාරුවීමේ ක්‍රමය ක්‍රියාත්මක කිරීමේ ව්‍යාපෘතියේ අභ්‍යන්තර කමිටු සාමාජිකාවක් ලෙස එම ව්‍යාපෘතියට දායක වේ.



ඊ.එන්.පී.කේ. රත්නපාල මහතා
අධ්‍යක්ෂ / වර්ණාවලි කළමණාකරන (වැඩබලන)

ශ්‍රී ලාංකීය විදුලි සංදේශ නියාමන ක්ෂේත්‍රයේ වෘත්තීය ඉංජිනේරුවකු ලෙස වසර 29 කට අධික වෘත්තීය ජීවිතය තුළින්, නිහාල් රත්නපාල මහතා ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලි කළමනාකරණය පිළිබඳ පුළුල් පළපුරුද්දක් අත්කරගෙන ශ්‍රව්‍ය සහ දෘශ්‍ය විකාශන සේවා ඇතුළු ගුවන් විදුලි සන්නිවේදන ක්ෂේත්‍රයේ ප්‍රධාන ප්‍රවර්ධනයන් සඳහා දායක වී ඇත.

ඔහු පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් ඉංජිනේරු ගෞරව උපාධිය සහ මොරටුව විශ්වවිද්‍යාලයේ ඉලෙක්ට්‍රොනික හා විදුලි සංදේශ පශ්චාත් උපාධිය ලබාගෙන ඇත. ඔහු ඉංජිනේරු කවුන්සලයේ (එක්සත් රාජධානිය) ලියාපදිංචි වරලත් ඉංජිනේරුවකු වන අතර ඉංජිනේරු හා තාක්ෂණ ආයතනයේ (එක්සත් රාජධානිය) සාමාජිකයෙකි. එමෙන්ම ඔහු ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ ද සාමාජිකයකු වේ.

ඔහු 1994 වසරේ සිට ජාත්‍යන්තර සංවිධාන රැසකින් විදුලි සංදේශ ක්ෂේත්‍රය පිළිබඳ පුළුල් දැනුම මෙන්ම පළපුරුද්ද ලබාගෙන ඇති අතර ස්විස්ටර්ලන්තයේ ජිනීවාහි ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය විසින් පවත්වන ලද ලෝක ගුවන් විදුලි සන්නිවේදන සමුළුවේ ශ්‍රී ලංකා නියෝජිත පිරිසේ සාමාජිකයෙකු වශයෙන් ද වෙනත් කලාපීය නියාමන ක්‍රියාකාරකම් වලදී ද ශ්‍රී ලංකාව නියෝජනය කර ඇත.



ඉන්ද්‍රජිත් හඳපාන්ගොඩ මහතා
අධ්‍යක්ෂ / තරඟකාරිත්ව (වැඩබලන)

ඉන්ද්‍රජිත් හඳපාන්ගොඩ මහතා 1994 වසරේදී ශ්‍රී ලංකා Blue-Chip සමාගම් සමූහයේ විධායක නිලධාරිවරයෙකු ලෙස සිය වෘත්තීය ජීවිතය ආරම්භ කරන ලද අතර 1998 වසරේදී ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ මධ්‍යම කළමනාකාරිත්වයට එක් විය. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ආර්ථික කටයුතු අංශයේ සහ තරඟකාරිත්ව අංශයේ වසර 24 ක සේවා කාලය තුළ ඔහු අන්තර් සම්බන්ධතාවය, අයක්‍රම, බලපත්‍ර, ආවේක්ෂණ යනාදී ප්‍රධාන නියාමන කාර්යයන් මෙහෙයවා ඇත. 2002 වසරේදී ඔහු ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර විදුලි සංදේශ සේවා ප්‍රතිපත්ති ලිහිල් කිරීමේ උපායමාර්ග සකස් කිරීමේ උපදේශන ක්‍රියාවලිය සම්බන්ධීකරණය කරන ලද අතර එම උපායමාර්ග ක්‍රියාත්මක කිරීම සඳහා දායක විය. ඉන්ද්‍රජිත් මහතා 2000, 2001 සහ 2002 වසර වලදී ශ්‍රී ලංකා ටෙලිකොම්හි අයක්‍රම තුලනය කිරීමේ ක්‍රියාවලිය මෙහෙයවන ලදී. ඔහු 2003 වසරේදී විදුලි සංදේශ ක්ෂේත්‍රයට අන්තර්සම්බන්ධතා රීති හඳුන්වාදීම සහ 1999 සහ 2010 වසර වලදී අන්තර්සම්බන්ධිය තීරණ නිකුත් කිරීමේ දී ප්‍රධාන කාර්යභාරයක් ඉටු කළේය. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් පවත්වන ලද එවැනි ප්‍රසිද්ධ විභාග දෙකකදී ඔහු මහජන විමර්ශන කමිටුවේ සාමාජිකයෙකු ලෙස කටයුතු කළේය. ඔහු විදුලි සංදේශ ක්ෂේත්‍රය ආශ්‍රිත සියලුම බදු / අයබදු රැස්කිරීමේ ප්‍රධානියා වශයෙන් කටයුතු කරන අතර මුදල් අමාත්‍යාංශය සමග එක්ව එම බදු ආශ්‍රිත කරුණු මෙහෙයවයි. සිය ජාල සංවර්ධන ව්‍යාපෘති සඳහා විදේශීය විශේෂඥයින්ගේ සේවය ලබා ගැනීමට අවශ්‍ය ක්‍රියාකරු සමාගම් විසින් ඉදිරිපත් කරන ලද වීසා ඉල්ලීම් ලිපි ඇගයීමට ලක් කර එම වීසා නිකුත් කිරීම සඳහා ආගමන හා විගමන දෙපාර්තමේන්තුවට නිර්දේශ ලිපි නිකුත් කරන ලෙස රේඛීය අමාත්‍යාංශයට නිර්දේශ කරයි. වර්තමානයේ ඔහු පාරිභෝගික පැමිණිලි ආරාවුල් නිරාකරණය කිරීමේ අභ්‍යන්තර කමිටුවේ (ICRCC) සභාපතිත්වය දරයි.

ඉන්ද්‍රජිත් මහතා 2008 වසරේදී දකුණු ආසියානු විදුලි සංදේශ නියාමකයින්ගේ සංගමයේ අන්තර්ජාල සම්මුති (IP) පාදක සේවා වල බිල්පත් සහ අයක්‍රම පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායමේ කණ්ඩායම් නායකයෙකු ලෙස දායක විය. එමෙන්ම ඔහු 2010/2011 වසර වලදී දකුණු ආසියානු විදුලි සංදේශ නියාමකයන්ගේ සංගමයේ ජාල සහ සේවා පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායමේ සභාපති විය. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව නියෝජනය කරමින් ඉන්ද්‍රජිත් මහතා ඉන්දියාව, පාකිස්තානය සහ ශ්‍රී ලංකාවේ පැවති දකුණු ආසියානු විදුලි සංදේශ නියාමකයින්ගේ රැස්වීම් වලට සහභාගි වූ අතර විදුලි සංදේශ ක්ෂේත්‍රයට අදාළ විවිධ විෂය කරුණු සම්බන්ධයෙන් ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ අධ්‍යයන කණ්ඩායම් රැස්වීම්වලට ක්‍රියාකාරීව සහභාගී විය. ඔහුගේ වෘත්තීය ජීවිතය තුළ එක්සත් රාජධානියේ Coventry හි Cable and Wireless College විසින් පවත්වන ලද විදුලි සංදේශ කළමනාකරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව ඇතුළු දේශීය සහ ජාත්‍යන්තර ආයතන මඟින් විදුලි සංදේශ ක්ෂේත්‍රය ආශ්‍රිත පුළුල් දැනුමක් සහ පුහුණුවක් ලබා ගත්තේය.

ඔහු ශ්‍රී ලංකා වරලත් වෘත්තීය කළමනාකරුවන්ගේ (CPM) සාමාජිකයකු වන අතර ශ්‍රී ලංකා ආර්ථික සංගමයේ (SLEA) යාවජීව සාමාජිකයෙකි. ඉන්ද්‍රජීත් මහතා පිළිවෙලින් කොළඹ විශ්ව විද්‍යාලය (ශ්‍රී ලංකාව) සහ Flinders විශ්වවිද්‍යාලය (දකුණු ඕස්ට්‍රේලියාවෙන්) යන විශ්ව විද්‍යාලවලින් ව්‍යාපාර පරිපාලනය (MBA) සහ රාජ්‍ය පරිපාලනය (MPA) පශ්චාත් උපාධි දෙකක් ලබා ඇති අතර ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යාව (ගෞරව) උපාධිධාරියෙකි.



රුවනි ගුණරත්න මහත්මිය
අධ්‍යක්ෂ / නීති කටයුතු (වැඩබලන)

වෘත්තියෙන් නීතිඥවරියක් වන රුවනි ගුණරත්න මහත්මිය කොළඹ විශ්ව විද්‍යාලයෙන් නීතිවේදී උපාධිය ලබා ඇත.

ඇය දැනට වැඩබලන අධ්‍යක්ෂ (නීති කටයුතු) තනතුර දරන අතර කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ රාජකාරි ඉටු කරයි.

ඇය නියෝජ්‍ය අධ්‍යක්ෂවරියක වශයෙන් නීති අංශයේ ද සේවය කරන අතර කොමිෂන් සභාවේ විවිධ නීතිමය කටයුතු මෙහෙයවයි. ඊට අමතරව, ආයතනික නීතිමය ගැටළු විධිමත් කිරීම සඳහා ඇය වැදගත් නීතිමය දායකත්වයක් සපයයි.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ වසර 25 ක පළපුරුද්ද සමඟින් නීති ක්ෂේත්‍රයේ වසර 29 කට වැඩි අත්දැකීම් ඇය සතුවේ. ඇය ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් පවත්වන ලද ප්‍රසිද්ධ විභාග දෙකක සාමාජිකාවක් ලෙස කටයුතු කළාය. ඇය කොමිෂන් සභාවේ පාරිභෝගික පැමිණිලි නිරාකරණය කිරීමේ කමිටුවේ සහ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ (ප්‍රධාන) සාමාජිකාවකි.



එල් ගනේෂමූර්ති මහතා
අධ්‍යක්ෂ / බලපත්‍ර කළමනාකරණ (වැඩබලන)

එල්. ගනේෂමූර්ති මහතා පුද්ගලික ආයතනවල විවිධ තනතුරු දරා ඇති අතර 1997 වසරේ දී ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව හා සම්බන්ධ විය. ඔහු ශ්‍රී ලංකා පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් විදුලි හා ඉලෙක්ට්‍රොනික විද්‍යාවේදී (ඉංජිනේරු) උපාධිය සහ ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනයෙන් තොරතුරු කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධිය ලබා ගන්නා ලදී. ඔහු ඉංජිනේරු හා තාක්ෂණ ආයතනයේ (IET) සාමාජිකයෙකි. ඔහුට පරිගණක හා විදුලි සංදේශ ක්ෂේත්‍රයේ වෘත්තිකයෙකු වශයෙන් වසර 30කට අධික පළපුරුද්දක් ඇත. ඔහු 1993 වසරේ දී ශ්‍රී ලාංකීය පුද්ගලික සමාගමක පරිගණක ඉංජිනේරුවරයෙකු ලෙස සිය වෘත්තීය ජීවිතය ආරම්භ කර ඉංජිනේරු කළමනාකරු තනතුර දක්වා උසස් විය. ඔහු 1997 දී කොන්ත්‍රාත් පදනම මත ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ජාල අංශයේ ඉංජිනේරුවරයෙකු ලෙස සම්බන්ධ වූ අතර පසුව ඔහුට සහකාර අධ්‍යක්ෂවරයෙකු ලෙස ස්ථිර තනතුරක් ලැබුණි. බලපත්‍ර කළමනාකරණ අංශයේ වැඩබලන අධ්‍යක්ෂවරයා ලෙස පත්වීමට පෙර ඔහු නියෝජ්‍ය අධ්‍යක්ෂ ලෙස උසස් කරන ලදී. විදුලි සංදේශ ක්‍රියාකරු බලපත්‍ර සැකසීම සහ නිකුත් කිරීම, සංඛ්‍යාත වර්ණාවලිය සැලසුම් කිරීම, කළමනාකරණය කිරීම, සම්බන්ධීකරණය කිරීම, බලපත්‍ර නිකුත් කිරීම සහ එහි කොන්දේසි බලාත්මක කිරීම, ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ සම්මුතීන් සහ ගුවන්විදුලි රෙගුලාසි ප්‍රතිපාදන මත පදනම්ව සංඛ්‍යාත ප්‍රතිපාදන වගුව යාවත්කාලීන කිරීම සහ නඩත්තු කිරීම වැනි ක්ෂේත්‍රවල ඔහුට පුළුල් පළපුරුද්දක් ඇත. ගෝලීය සමුද්‍රීය හදිසි ආරක්ෂණ පද්ධතිය පිළිබඳ විභාගය පැවැත්වීම සහ සාර්ථක අපේක්ෂකයින් සඳහා සහතික නිකුත් කිරීම ඔහුගේ රාජකාරිය භාරව පවතී. ඔහු ශ්‍රී ලංකාව වෙනුවෙන් ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය සහ ආසියා ශාන්තිකර විදුලි ප්‍රජාව විසින් විශේෂයෙන් සංවිධානය කරන ලද ජාත්‍යන්තර සහ කලාපීය සංසද කිහිපයක්ම නියෝජනය කළේය.



ඉංජිනේරු ජේ.ඒ.එස්. ගුණනන්දන
අධ්‍යක්ෂ / විශේෂ ව්‍යාපෘති (වැඩබලන)

ඉංජිනේරු ජේ.ඒ.එස්. ගුණානන්දන මහතා විදුලි සංදේශ ක්ෂේත්‍රය පිළිබඳ මනා දැනුමකින් හෙබි පළපුරුදු වෘත්තිකයෙකි. ඔහු 1994 දී ශ්‍රී ලංකාවේ මොරටුව විශ්වවිද්‍යාලයෙන් උපාධිය ලබා පෞද්ගලික අංශයෙන් සිය වෘත්තීය ජීවිතය ආරම්භ කළ අතර එහිදී එම වසර හතරක කාලය තුළ වටිනා අත්දැකීම් ලබා ගත්තේය. 1998 වසරේ දී ඔහු ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සේවයට එක් වී සහකාර අධ්‍යක්ෂ තනතුර භාර ගත්තේය.

ඉගෙනීම සඳහා වූ අඛණ්ඩ කැපවීම තුළින්, ඉංජිනේරු ගුණානන්දන මහතා ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනයෙන් තොරතුරු කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා ගනිමින් සිය පශ්චාත් උපාධි අධ්‍යාපනය හැදෑරීය. ඔහු එම ආයතනයෙන්ම විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ලබා ගනිමින් සිය අධ්‍යාපනික ජයග්‍රහණ ඉදිරියට ගෙන ගියේය.

ඉංජිනේරු ගුණනන්දන මහතා කීර්තිමත් වරලත් ඉංජිනේරුවෙකු වන අතර ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය, ශ්‍රී ලංකා ඉංජිනේරු සභාව සහ ඉංජිනේරු තාක්ෂණ ආයතනය ඇතුළු කීර්තිමත් ආයතන රැසක ආයතනික සාමාජිකත්වය දරයි. දැනට ඔහු ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ, විශේෂ ව්‍යාපෘති (වැඩබලන) වශයෙන් සේවය කරන අතර විදුලි සංදේශ ක්ෂේත්‍රයට නවමු අත්දැකීම් සහ ප්‍රවීණතාවයන් රැසක් ගෙන එයි.

විදුලි සංදේශ ක්ෂේත්‍රයේ වසර 30ක් පුරා විහිදුණු අනිවිශේෂ වාර්තාව සමඟින්, ඉංජිනේරු ගුණානන්දන මහතා ශ්‍රී ලංකාවේ නියාමන පරිසරය නිර්මාණය කිරීම සහ වැඩිදියුණු කිරීම සඳහා ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි.



එස්.ඒ.ආර්. කමලනයනා මහත්මිය
අධ්‍යක්ෂ / ජාල (වැඩබලන)

එස්.ඒ.ආර්. කමලනයනා මහත්මිය 2001 වසරේ දී ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සේවයට එක් වූ අතර ශ්‍රී ලංකා මොරටුව විශ්වවිද්‍යාලයෙන් ඉලෙක්ට්‍රොනික හා විදුලි සංදේශ පිළිබඳ විද්‍යාවේදී ඉංජිනේරු උපාධිය ලබා ඇත. ඇය වරලත් ඉංජිනේරුවරියක වන අතර ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ ආයතනික සාමාජිකාවක්, ශ්‍රී ලංකා ඉංජිනේරු කවුන්සිලයේ ආයතනික සාමාජිකාවක්, සහ ඇමරිකා එක්සත් ජනපදයේ විදුලි හා ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු ආයතනයේ සාමාජිකාවක් ද වේ.

ඇය සංඛ්‍යාත වර්ණාවලි කළමනාකරණ අංශයේ සහකාර අධ්‍යක්ෂ සහ නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරුවල සේවය කර ඇති අතර ඇය ගුවන්, සමුද්‍රීය, පෞද්ගලික ජංගම ගුවන්විදුලි (PMR) සහ ජංගම සේවා භාරව සිටියාය. දැනට ඇය ජාල අංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ/යටිතල පහසුකම් සංවර්ධන තනතුර දරයි. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ විවිධ අංශවල විවිධ තනතුරුවල වසර 22 ක සේවා පළපුරුද්දක් ඇති අතර විදුලි සංදේශ ජාලයන්හි යටිතල පහසුකම් සංවර්ධනය කිරීමෙහිලා නායකත්වය සැපයීම සඳහා ශක්තිමත් කළමනාකරණ සහ තාක්ෂණික කුසලතා ඇය සතුය.

ඉංජිනේරු ඒස්.ඒ.ආර්. කමලනයනා මහත්මිය ශ්‍රී ලංකා ටෙලිකොම් අනුබද්ධිත ශ්‍රී ලංකා ටෙලිකොම් (සේවා) ලිමිටඩ් හි සිය වෘත්තීය ජීවිතය ආරම්භ කළ අතර රට තුළ මෙතෙක් සිදු කරන ලද විශාලතම ටෙලිකොම් යටිතල පහසුකම් ව්‍යාපෘතිය වන 150K ටෙලිකොම් සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම පිළිබඳ ප්‍රධාන ඉංජිනේරු තනතුරක් දැරීය.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ වසර 22 කට වැඩි කාලයක් පුරා දිවෙන ඇයගේ වෘත්තීය ජීවිතය තුළ, ඇය නියෝජ්‍ය අධ්‍යක්ෂ සහ සහකාර අධ්‍යක්ෂ ලෙස වර්ණාවලි කළමනාකරණ අංශයේ සහ ජාල අංශයේ සේවය කර ඇත. 2023 වර්ෂයේදී ඇය වැඩබලන අධ්‍යක්ෂ / ප්‍රතිපත්ති සහ ජාත්‍යන්තර සබඳතා තනතුර දැරුවාය.

ඉංජිනේරු එස්.ඒ.ආර්. කමලනයනා මහත්මිය ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ (ITU) ලෝක ගුවන්විදුලි සංදේශ සමුළුවේදී (WRC) ශ්‍රී ලංකාව නියෝජනය කර ඇත. ඇයගේ වෘත්තීය ජීවිතය තුළ ඇය ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමය (APT) සහ අනෙකුත් ජාත්‍යන්තර සංවිධානවල රැස්වීම්, වැඩමුළු සහ පුහුණු වැඩසටහන්වලට සහභාගී වීමෙන් විදුලි සංදේශ නියාමන අංශය පිළිබඳ පුළුල් දැනුමක් ලබා ඇත.



ආර්.ආර්. සමන් කිත්සිරි මහතා
අභ්‍යන්තර විගණක

කිත්සිරි මහතා 2014 වසරේ දී ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සේවයට එක් විය. ඔහු ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ උපාධිය සහ කැලණිය විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ලබා ඇත. ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ සහ ශ්‍රී ලංකා සහතික ලත් කළමනාකාරීත්ව ආයතනයේ ආශ්‍රිත සාමාජිකයෙකු වන අතර, එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ උසස් ඩිප්ලෝමාධාරියෙකි.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව හා සම්බන්ධ වීමට පෙර, කිත්සිරි මහතා ශ්‍රී ලංකාවේ බොහෝ පිළිගත් නිෂ්පාදන, වෙළඳ සහ සේවා ආයතනවල සමූහ ගණකාධිකාරී, අභ්‍යන්තර විගණක සහ මූල්‍ය කළමනාකරු වැනි ජ්‍යෙෂ්ඨ තනතුරු දරමින් අභ්‍යන්තර විගණනය, මූල්‍ය සහ බදු සම්බන්ධයෙන් වසර 16 කට වැඩි පළපුරුද්දක් ලබා ඇත.

විධායක නිලධාරීන්

බලපත්‍ර කළමනාකරණ

එල්. ගනේෂමූර්ති මහතා
අධ්‍යක්ෂ (වැඩබලන)
නියෝජ්‍ය අධ්‍යක්ෂ

ටී.ජී. ප්‍රේමරත්න මහතා
සහකාර අධ්‍යක්ෂ

ආර්. සුතර්ශන් මහතා
සහකාර අධ්‍යක්ෂ

ජාල

කේ.එස්.එම්. විශාඛා මෙනෙවිය
අධ්‍යක්ෂ (වැඩබලන)
නියෝජ්‍ය අධ්‍යක්ෂ

එස්.ඒ.ආර්. කමලනයනා මහත්මිය
නියෝජ්‍ය අධ්‍යක්ෂ

අයි.එම්. ජවුසි මහතා
නියෝජ්‍ය අධ්‍යක්ෂ

එස්.ඩබ්.එම්.ආර්.එල්.බී. සේනාධීර මහතා
සහකාර අධ්‍යක්ෂ (වැටුප් රහිත නිවාඩු)

ඩබ්.එම්.එන්.ජේ. විජේරත්න මහතා
සහකාර අධ්‍යක්ෂ

එස්.බී. බුලත්ගම මහතා
සහකාර අධ්‍යක්ෂ

ඩී.එම්.එස්.ඒ. දිසානායක
සහකාර අධ්‍යක්ෂ

එච්.පී.එස්. රත්නායක මහත්මිය
සහකාර අධ්‍යක්ෂ

ඒ.පී. මුහන්දිරම්ගේ මහත්මිය
ජ්‍යෙෂ්ඨ විදුලි සංදේශ නිලධාරි

අනුකූලතා සහ විමර්ශන

තරලිකා ලිවේරා මහත්මිය
අධ්‍යක්ෂ (වැඩබලන)
නියෝජ්‍ය අධ්‍යක්ෂ

එච්.පී.එච්.එම්. පතිරණ මහත්මිය
නියෝජ්‍ය අධ්‍යක්ෂ

ඩී.එන්. විජේසිංහ මහතා
සහකාර අධ්‍යක්ෂ

ටී.ඩී.එච්. කුමාරසිරි මහත්මිය
සහකාර අධ්‍යක්ෂ

එම්.එච්.ඒ.ආර්. ජයසේන මහත්මිය
සහකාර අධ්‍යක්ෂ

වයි. මතනන් මහතා
සහකාර අධ්‍යක්ෂ

ආර්.පී.සී.එස්. ජිනදාස මහත්මිය
පරිපාලන නිලධාරී

ප්‍රතිපත්ති හා ජාත්‍යන්තර සම්බන්ධතා

එස්.ඒ.ආර්. කමලනයනා මහත්මිය
අධ්‍යක්ෂ (වැඩබලන)

ජී.සී.පී. මොරගොඩ මහත්මිය
නියෝජ්‍ය අධ්‍යක්ෂ (වැඩබලන)

ටී.ජී.ජේ. රවීන්ද්‍ර මහතා
සහකාර අධ්‍යක්ෂ

තරහකාරිත්ව

එච්.ඩබ්ලිව්.කේ. ඉන්ද්‍රජීත් මහතා
අධ්‍යක්ෂ (වැඩබලන)
නියෝජ්‍ය අධ්‍යක්ෂ

ශ්‍රියානි මාවැල්ලගේ මහත්මිය
නියෝජ්‍ය අධ්‍යක්ෂ

සී.එන්. පලිහවඩන මහතා
නියෝජ්‍ය අධ්‍යක්ෂ

එස්.කේ.ටී.අයි. ප්‍රභාත් මහතා
සහකාර අධ්‍යක්ෂ

ජී.සී.එස්. ප්‍රනාන්දු මහතා
සහකාර අධ්‍යක්ෂ

නීති

ආර්.එස්. ගුණරත්න මහත්මිය
අධ්‍යක්ෂ (වැඩබලන)
නියෝජ්‍ය අධ්‍යක්ෂ

ජී.සී.පී. මොරගොඩ මහත්මිය
නියෝජ්‍ය අධ්‍යක්ෂ

එල්.එස්.පී. රොද්‍රිගු මෙනෙවිය
නියෝජ්‍ය අධ්‍යක්ෂ

අයි.එන්. මැතිව් මහතා
සහකාර අධ්‍යක්ෂ

සංඛ්‍යාත වර්ණාවලි කළමනාකරණ

ඊ.එන්.සී.කේ. රත්නපාල මහතා
අධ්‍යක්ෂ (වැඩබලන)
නියෝජ්‍ය අධ්‍යක්ෂ

එම්.සී.එම්. ෆාරුක් මහතා
නියෝජ්‍ය අධ්‍යක්ෂ (වැටුප් රහිත නිවාඩු)

ජේ.ඒ.එස්. ගුණානන්දන මහතා
නියෝජ්‍ය අධ්‍යක්ෂ

එස්.ඊ. වාකිෂ්ට මහතා
නියෝජ්‍ය අධ්‍යක්ෂ

එම්.පී. ගුණසිංහ මහතා
නියෝජ්‍ය අධ්‍යක්ෂ

ඩබ්.ඒ.ඩී.ටී. මධුශංක මහතා
සහකාර අධ්‍යක්ෂ (වැටුප් රහිත නිවාඩු)

ජී.එච්.පී. ඉමාලි ප්‍රශාන්තිකා මහත්මිය
සහකාර අධ්‍යක්ෂ

එම්.ඊ.ජේ.එස්. මුනසිංහ මහතා
සහකාර අධ්‍යක්ෂ

ටී.එම්.ජේ. පෙරේරා මහතා
සහකාර අධ්‍යක්ෂ

අයි.යූ. විජේසිංහ මහතා
සහකාර අධ්‍යක්ෂ

ජේ.එල්.සී.ඩී. ලියනගේ මහත්මිය
පරිපාලන නිලධාරී

ටී.පී.ටී. ප්‍රනාන්දු මහතා
ජ්‍යෙෂ්ඨ විදුලි සංදේශ නිලධාරී

ඩී.එස්.එස්. ජයවර්ධන මහත්මිය
ජ්‍යෙෂ්ඨ විදුලි සංදේශ නිලධාරී

විශේෂ ව්‍යාපෘති

ජේ.ඒ.එස්. ගුණානන්දන මහතා
අධ්‍යක්ෂ (වැඩබලන)

මූල්‍ය

එම්.කේ. ජයන්ත මහතා
අධ්‍යක්ෂ

එල්.ඩී. ජයවික්‍රම මෙනෙවිය
සහකාර අධ්‍යක්ෂ

ඩී.පී.සී.යූ.කේ. හේමපාල මහතා
සහකාර අධ්‍යක්ෂ

අභ්‍යන්තර විගණන

ආර්.ආර්. සමන් කිත්සිරි මහතා
අභ්‍යන්තර විගණක

ඩී.බී.එන්. ප්‍රියදර්ශනී මහත්මිය
අභ්‍යන්තර විගණන නිලධාරී

තොරතුරු තාක්ෂණ

තරලිකා ලිවේරා මහත්මිය
අධ්‍යක්ෂ (රාජකාරී ආවරණ)

එම්.සී.එම්. ෆාරුක් මහතා
අධ්‍යක්ෂ (වැඩබලන) (වැටුප් රහිත නිවාඩු)

පාලන හා ආයතනික කටයුතු


එම්.ජේ.එස්. රවිසිංහ මහතා
අධ්‍යක්ෂ

එච්.පී.එච්.එම්. පතිරණ මහත්මිය
නියෝජ්‍ය අධ්‍යක්ෂ (වැඩබලන)

වයි.එස්.පී.පී ගුණරත්න මහතා
සහකාර අධ්‍යක්ෂ

කේ.එස්.එන්. විජේරත්න මහතා
සහකාර අධ්‍යක්ෂ

ශ්‍යාමිලා රත්නායක මෙනෙවිය
පරිපාලන නිලධාරී


කොමිෂන් සභාව (සාමාජිකයන් 5 - සභාපති, පත් කළ සමාජිකයන් 3 සහ අධ්‍යක්ෂ ජනරාල්)
අධ්‍යක්ෂ ජනරාල් 01
අතිරේක අධ්‍යක්ෂ ජනරාල් - සංඛ්‍යාත වර්ණාවලි කළමණාකරන, ජාල සහ තාක්ෂණ 01
අතිරේක අධ්‍යක්ෂ ජනරාල් - ආර්ථික සහ නීති කටයුතු 01
අතිරේක අධ්‍යක්ෂ ජනරාල් - පාලන, ආයතනික කටයුතු සහ මූල්‍ය 01
අධ්‍යක්ෂ තොරතුරු තාක්ෂණ 01
අධ්‍යක්ෂ වර්ණාවලි කළමණාකරන 01
අධ්‍යක්ෂ බලපත්‍ර කළමණාකරන 01
අධ්‍යක්ෂ ප්‍රතිපත්ති සහ ජාත්‍යන්තර සම්බන්ධතා 01
අධ්‍යක්ෂ ජාල සහ නව සේවා 01
අධ්‍යක්ෂ ව්‍යාපෘති සහ පර්යේෂණ 01
අධ්‍යක්ෂ තරඟකාරිත්ව 01
අධ්‍යක්ෂ අනුකූලතා 01
අධ්‍යක්ෂ නීති කටයුතු 01
අධ්‍යක්ෂ පාලන සහ ආයතනික කටයුතු 01
අධ්‍යක්ෂ මූල්‍ය 01
නි. අධ්‍යක්ෂ ස. අධ්‍යක්ෂ තොරතුරු තාක්ෂණ 02
නි. අධ්‍යක්ෂ ස. අධ්‍යක්ෂ වර්ණාවලි කළමණාකරන 11
නි. අධ්‍යක්ෂ ස. අධ්‍යක්ෂ බලපත්‍ර කළමණාකරන 02
නි. අධ්‍යක්ෂ ස. අධ්‍යක්ෂ - ප්‍රතිපත්ති සහ ජා-සම්බන්ධතා 02
නි. අධ්‍යක්ෂ ස. අධ්‍යක්ෂ ජාල සහ නව සේවා 09
නි. අධ්‍යක්ෂ ස. අධ්‍යක්ෂ ව්‍යාපෘති සහ පර්යේෂණ 02
නි. අධ්‍යක්ෂ ස. අධ්‍යක්ෂ තරඟකාරිත්ව 05
නි. අධ්‍යක්ෂ ස. අධ්‍යක්ෂ අනුකූලතා 05
නි. අධ්‍යක්ෂ ස. අධ්‍යක්ෂ නීති කටයුතු 04
නි. අධ්‍යක්ෂ ස. අධ්‍යක්ෂ පාලන සහ ආයතනික කටයුතු 03
නි. අධ්‍යක්ෂ ස. අධ්‍යක්ෂ මූල්‍ය 03
අභ්‍යන්තර විගණක 01
කොමිෂන් සභා ලේකම් 01
පරිපාලන නිලධාරි 01 ජ්‍යෙෂ්ඨ වි. සං නිලධාරි - 05
ජ්‍යෙෂ්ඨ වි. සං නිලධාරි 04
පරිපාලන නිලධාරි 01
පරිපාලන නිලධාරි 01
අභ්‍යන්තර විගණන නිලධාරි 01
පරිගණක වැඩසටහන් සම්පාදක 02
සංඛ්‍යාන නිලධාරි 02
පරිභෝගික සම්බන්ධතා නිලධාරි 06
ප්‍රකාශන නිලධාරි- 01 භාෂා පරිවර්තක - 02
වි.සං. නිලධාරි 08
වි.සං. නිලධාරි 02
වි.සං. නිලධාරි 01
වි.සං. නිලධාරි 09
වි.සං. නිලධාරි 01
වි.සං. නිලධාරි 01
වි.සං. නිලධාරි 01
සංවර්ධන නිලධාරි 01
සංවර්ධන නිලධාරි 01
සංවර්ධන නිලධාරි 02
සංවර්ධන නිලධාරි 02
සංවර්ධන නිලධාරි 08
සංවර්ධන නිලධාරි 06
සංවර්ධන නිලධාරි 06
සංවර්ධන නිලධාරි 04
සංවර්ධන නිලධාරි 04
සංවර්ධන නිලධාරි 04
සභාපති/ අධ්‍යක්ෂ ජනරාල් ලේකම් 02
පුස්තකාලයාධිපති 02
තොරතුරු තාක්ෂණ සහකාර 02
තො.තා. සහකාර 05 කළමණාකරන සහකාර 08
තො.තා. සහකාර 01 කළමණාකරන සහකාර 01
තො.තා. සහකාර 01 කළමණාකරන සහකාර 02
තො.තා. සහකාර 02 කළමණාකරන සහකාර 05
තො.තා. සහකාර 01 කළමණාකරන සහකාර 04
තො.තා. සහකාර 01 කළමණාකරන සහකාර 03
තො.තා. සහකාර 02 කළමණාකරන සහකාර 05
තො.තා. සහකාර 01 කළමණාකරන සහකාර 03
තො.තා. සහකාර 02 කළමණාකරන සහකාර 18
තො.තා. සහකාර 01 කළමණාකරන සහකාර 07
විගණන සහකාර 03 කළමණාකරන සහකාර 03
කළමණාකරන සහකාර 01
විදුලි කාර්මික - 01 වීඩියෝ කැමරා ක්‍රියාකරු 01 ඡායාරූප ශිල්පී 01 වී.සංස්කරණ ශිල්පී 01
පියදුරු 21 ආලෝක ශිල්පී 01 ස.කැමරා ශිල්පී 01 ස.සංස්කරන ශිල්පී 01
කාර්යාල කාර්ය සහයක 01
කාර්යාල කාර්ය සහයක 08
කාර්යාල කාර්ය සහයක 01
කාර්යාල කාර්ය සහයක 01
කාර්යාල කාර්ය සහයක 04
කාර්යාල කාර්ය සහයක 01
කාර්යාල කාර්ය සහයක 01
කාර්යාල කාර්ය සහයක 02
කාර්යාල කාර්ය සහයක 01
කාර්යාල කාර්ය සහයක 06 උද්‍යාන කම්කරු 02
කාර්යාල කාර්ය සහයක 02
කාර්යාල කාර්ය සහයක 01
කාර්යාල කාර්ය සහයක 01
නි. අධ්‍යක්ෂ/ස. අධ්‍යක්ෂ මූල්‍ය විමර්ශන ඇතුළුව
නි. අධ්‍යක්ෂ/ස. අධ්‍යක්ෂ නාක්ෂණික විමර්ශන ඇතුළුව

අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ සමාලෝචනය

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ (TRCSL) 2023 වසරේ වාර්ෂික වාර්තාව වෙනුවෙන් මා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සමාලෝචනය ඉදිරිපත් කරන්නේ ඉමහත් අභිමානයෙනි. නවෝත්පාදනයන් ප්‍රවර්ධනය කිරීම සහ නියාමන ස්ථායිතාවය සහතික කිරීම පිණිස අපගේ කැපවීම පවත්වා ගනිමින් ශීඝ්‍රයෙන් වෙනස් වන තාක්ෂණික පරිසරයක් තුළ සංචලනය වූ බැවින්, මෙම වසරේ දී ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ විෂයය පථය විකාශනයේ වැදගත් පරිච්ඡේදයක් සනිටුහන් විය. ගෝලීය ආර්ථික අභියෝග මධ්‍යයේ වුවද, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව ඩිජිටල් යටිතල පහසුකම් ව්‍යාප්ත කිරීම, නැගී එන තාක්ෂණයන් වැලඳ ගැනීම සහ ජාතියේ ඩිජිටල් පරිවර්තනය උදෙසා තිරණාත්මක ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම අඛණ්ඩව සිදු කර ඇත. අනාගත අවස්ථා ප්‍රයෝජනයට ගැනීම පිණිස ශ්‍රී ලංකාව ස්ථානගත කරමින් විදුලි සංදේශ අංශයේ පවත්නා නම්‍යශීලී සහ අනුවර්තනය වීමේ හැකියාව, මෙලෙස අප ලද ජයග්‍රහණ මගින් පිළිබිඹු වේ.

විදුලි සංදේශ කර්මාන්තය

ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ ක්ෂේත්‍රය තුළ ජංගම දුරකථන ග්‍රාහකයින්ගේ 2.8% ක පහත වැටීමක් පෙන්නුම් කර ඇති අතර, සමස්ත ග්‍රාහකයින් සංඛ්‍යාව මිලියන 28.98 ක් විය. ස්ථාවර දුරකථන ග්‍රාහකයින්ගේ ද සුළු අඩුවීමක් දක්නට ලැබුණි. කෙසේ වෙතත්, දකුණු ආසියාවේ ඉහළම ජංගම දුරකථන ඝනත්වය ශ්‍රී ලංකාවේ වාර්තා වන අතර එය 131.5% කි. එමෙන්ම ස්ථාවර දුරකථන ඝනත්වය 15.9% ක් පමණ වේ. ජාතියේ ඩිජිටල් පරිවර්තන මාර්ග සිතියමට සහාය වීම පිණිස වැඩි භූගෝලීය ආවරණයක් අවශ්‍ය වුව ද, පුළුල් කලාප දත්ත සේවා දායකත්වය මිලියන 22.85 දක්වා වර්ධනය විය. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් බදු සහ ගාස්තු වශයෙන් කර්මාන්තයෙන් රැස් කර ගන්නා ලද මුදල රු. මිලියන 24,680 කි. ප්‍රධාන නියාමන සැලසුම් අතර අන්තර් සම්බන්ධතා ගාස්තු අඩු කිරීම, අයක්‍රම යෝජනා අනුමත කිරීම සහ තරඟකාරී පරිසරයක් සහතික කිරීම ඇතුළත් විය.

වර්ණාවලි කළමනාකරණය

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් ජාතික සංඛ්‍යාත වෙන් කිරීමේ වගුව (NFAT) යාවත්කාලීන කරන ලද අතර, ගුවන්විදුලි සංඛ්‍යාත භාවිතයේ විනිවිදභාවය සහතික කිරීම පිණිස වගුව පොදුවේ සැමටම ප්‍රසිද්ධ කර ඇත. මෙම යාවත්කාලීන වගුව පරිශීලකයින්ට ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ (ITU) කලාප 3 ප්‍රතිපාදන මත පදනම්ව සංඛ්‍යාත කලාප පරිශීලනය කිරීමට සහාය වේ.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් ආධුනික ගුවන්විදුලි ක්‍රියාකරුවන් සහතික කර , 5G පරීක්ෂණ සම්ප්‍රේෂණය සඳහා පහසුකම් සලසා දී 5G ජාල ව්‍යාප්ත කිරීම උදෙසා ඉතා වැදගත් පියවරක් ගන්නා ලදී. මීට අමතරව, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් විශේෂයෙන්ම හාරති එයාර්ටෙල් සහ ඩයලොග් ආසියාටා සමාගම් ඒකාබද්ධ කිරීම සහ දැනට පවතින නඩු විභාග කිහිපයක් හේතුවෙන් ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලිය නැවත වෙන් කිරීම පිණිස දුරකථන ක්‍රියාකරු සමාගම් සමඟ එක්ව වැඩ කටයුතු ආරම්භ කර ඇත.

නියාමන ප්‍රතිසංස්කරණ

- **ගුවන්විදුලි ප්‍රවේශ ජාල බෙදාගැනීම:** ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් ගුවන් විදුලි ප්‍රවේශ ජාල බෙදාගැනීම, තරඟකාරීත්වය සහ යටිතල පහසුකම් කාර්යක්ෂමතාව ප්‍රවර්ධනය කිරීම පිණිස මිල නියමයන් හඳුන්වා දීම සිදු කරන ලදී. එමෙන්ම ජංගම සහ ස්ථාවර දුරකථන ක්‍රියාකරු සමාගම් සඳහා තොග සේවා මිල රෙගුලාසි ද ස්ථාපිත කරන ලදී.
- **ගුවන්විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ (RTTE) රීති:** උසස් තාක්ෂණයන් භාවිත කිරීම සවිබලගැන්වීම මගින් නවෝත්පාදන සහ ව්‍යවසායකත්වය ප්‍රවර්ධනය කරමින් වර්තමාන වෙළඳපල තත්ත්වයන්ට අනුගත වන පරිදි ගුවන්විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ (RTTE) රීති සංශෝධන කර ඇත.
- **ඒකාබද්ධ බලපත්‍රකරණ රාමුව:** සේවාව සහ තාක්ෂණය කේන්ද්‍රගතවීම ඉලක්ක කර ගනිමින් ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය සමඟ සහයෝගීව ඒකාබද්ධ බලපත්‍ර රාමුවක් සකස් කරන ලදී. මහජන උපදේශනය මගින් පූර්ව අවශ්‍යතා හඳුනාගෙන ඇති අතර ඒවා සාකච්ඡා කෙරෙමින් පවතී. නව බලපත්‍ර අලුත් කිරීමේ මාර්ගෝපදේශ සකස් කර ඇති අතර ඒවා ප්‍රසිද්ධ කිරීමේ අපේක්ෂාවෙන් පසුවේ.
- **විදුලි සංදේශ පනත සංශෝධනය කිරීම:** ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් නව තාක්ෂණයන්ට අවකාශ සැලසීම පිණිස බලපත්‍ර විෂය පථය පුළුල් කිරීම හා තරඟකාරීව සංඛ්‍යාත වර්ණාවලිය පැවරීම, කර්මාන්ත තරඟකාරිත්වය ඇති කිරීම මෙන්ම යටිතල පහසුකම් බෙදාගැනීමේ රෙගුලාසි හඳුන්වා දෙමින් 2024 වන විට විදුලි සංදේශ පනත සංශෝධනය කිරීමේ කටයුතු නිම කිරීමට සැලසුම් කරයි.

විදුලි සංදේශ යටිතල පහසුකම් සහ ඇංකනය

මුහුදු සංදාම කේබල් භූගත මධ්‍යස්ථාන සහ කුලුනු ඇතුළු විදුලි සංදේශ යටිතල පහසුකම් පුළුල් කිරීම ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් අධීක්ෂණය කරන ලදී. 2023 වසර අවසන් වන විට ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ කුලුනු සංඛ්‍යාව නව ඉදිකිරීම් 373 ඇතුලත්ව 8,450 ක් වූ අතර අනුමත නොකළ කුලුනු 149 ක් අනුමැතියට ඉදිරිපත් කරන ලදී. මීට අමතරව, ජංගම - ජංගම දුරකථන අතර මෙන්ම ස්ථාවර - ස්ථාවර දුරකථන ජාල අතර මාරුවීමේ හැකියාව නිසැක කරමින් සීමාසහිත ලංකා නම්බර් පෝට්බිල්ටි සමාගම (Lanka Number Portability Services Ltd) සමඟ එක්ව ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණයෙන් යුතුව පවතින දුරකථන අංකය වෙනස් නොවී ජාල අතර මාරුවීමේ සේවාව හඳුන්වා දීමට ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව අපේක්ෂා කරයි.

- **ගමට සන්නිවේදනය ව්‍යාපෘතිය:** ආර්ථිකමය පසුබෑම් බලපෑවද, විදුලි සංදේශ ජාල පුළුල් කිරීම සඳහා කඩිනම් ප්‍රතිපූරණ ක්‍රියාවලිය සහ වැඩිදියුණු ශ්‍රී.ල.වි.ස.නි.කොං.සභා ආයෝජන සහිතව මෙම ව්‍යාපෘතිය ප්‍රතිසංස්කරණය කෙරෙමින් පවතී.
- **කොළඹ නෙළුම් කුලුන ව්‍යාපෘතිය:** මෙම මධ්‍යගත විකාශන මධ්‍යස්ථානය මගින් මේ වන විට ගෘහස්ථ විකාශන සේවා, අවන්හල්, සාප්පු සවාරි සහ නැරඹුම් මැදිරි යනාදී වශයෙන් වාණිජකරණයට යොමු වෙමින් එහි ප්‍රගතිය අඛණ්ඩව පවත්වාගෙන යයි.

නියාමන අනුකූලතාව

සේවා තත්ත්ව (QoS) ප්‍රමිතීන්ට අනුකූල වීම සහතික කිරීම සඳහා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් දුරකථන ක්‍රියාකරු සමාගම්වල මාසික වාර්තා 84ක් සුපරීක්ෂාකාරීව සමාලෝචනය කරන ලදී. එමෙන්ම හඬ සහ පුළුල් කලාප දත්ත සේවා යන දෙ අංශය කෙරෙහි ම අවධානය යොමු කරමින් ජාල විගණන 20ක් සිදු කරන ලද අතර සේවා තත්ත්වය වැඩිදියුණු කිරීම පිණිස දුරකථන ක්‍රියාකරු සමාගම් සමඟ සාකච්ඡා කිරීමට පහසුකම් සලසා ඇත. තවද, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් ග්‍රාහක අනන්‍යතා මොඩියුලපත් (SIM) ලියාපදිංචි කිරීමේ මාර්ගෝපදේශ පිළිපැදීම තහවුරු කිරීම සඳහා විගණන 16ක් සිදු කරන ලද අතර අයක්‍රම පැකේජ යාන්ත්‍රණයන් පිළිබඳ පරීක්ෂණ 53ක් සිදු කරන ලදී.

අපරාධ විමර්ශන වලදී ඇමතුම් වාර්තා සහ හිමිකාරිත්වය පිළිබඳ තොරතුරු විශ්ලේෂණය කිරීමෙන් නීතිය ක්‍රියාත්මක කරන ආයතනවලට සහාය වීම උදෙසා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වැදගත් කාර්යභාරයක් ඉටු කරන ලදී. වගකීම් සහගත විදුලි සංදේශ භාවිතය ප්‍රවර්ධනය කිරීම සඳහා විශේෂයෙන් පාසල් සිසුන් ඉලක්ක කර ගනිමින් මහජනතාව දැනුවත් කිරීමේ ව්‍යාපාර පවත්වමින්, නීති විරෝධී කේබල් රූපවාහිනී සේවාවන්ට එරෙහිව ද කොමිෂන් සභාව පියවර ගත් අතර සයිබර් හිරිහැර ආශ්‍රිත පැමිණිලි 846ක් නිරාකරණය කර ඇත. මීට අමතරව, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් නියාමන අනුකූලතාවය පවත්වාගෙන යාම අරභයා සිය අවශ්‍ය සහයෝගය ලබා දෙමින් අපරාධ විමර්ශනවලට අදාළ අධිකරණ නියෝග 550කට අධික ප්‍රමාණයක් සම්බන්ධයෙන් කටයුතු කර ඇත.

ආයතනික කළමනාකරණය

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව මුළු වසර පුරා කාර්ය මණ්ඩල නිපුණතා සංවර්ධනය කෙරෙහි ප්‍රමුඛතාවය දක්වමින්, සේවකයින් හය දෙනෙකුට උසස්වීම් ලබා දුන් අතර කොන්ත්‍රාත් සේවකයින් දෙදෙනෙකුගේ සේවය ස්ථීර කරන ලදී. විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් සහකාර අධ්‍යක්ෂවරුන් 14 දෙනෙකු බඳවා ගැනීමත් සමඟ ම, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් සහ අධ්‍යක්ෂ යන තනතුරුවල සියලුම පුරප්පාඩු පිරවීමට ද පියවර ගෙන ඇත. එසේම, 2024 වර්ෂය තුළ දී විදුලි සංදේශ නිලධාරීන් බඳවා ගැනීමට සැලසුම් කර ඇත. කොමිෂන් සභාව විසින් දේශීය හා විදේශීය පුහුණු අවස්ථා 39 කට පහසුකම් සලසා දී ඇති අතර, එමගින් කාර්ය මණ්ඩලයට සිය රාජකාරියන්හි විශිෂ්ට කුසලතාවය දැක්වීමට අවශ්‍ය නිපුණතාවය සහ දැනුම ලබා ගැනීම නිසැක විය.

පරිශීලක අත්දැකීම් වැඩිදියුණු කිරීම පිණිස ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභා වෙබ් අඩවිය ප්‍රතිනිර්මාණය කිරීම සහ තොරතුරු සහ සයිබර් ආරක්ෂණ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා පරිගණක හදිසි ආපදා සංසදය (CERT) සමඟ සංදේශයක් සකස් කර අවසන් කිරීම, එමඟින් සංවේදී තොරතුරු ආරක්ෂා කිරීම සහ ආයතනයේ ඩිජිටල් යටිතල පහසුකම් ශක්තිමත් කිරීමට ක්‍රියා කිරීම තුළින් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සිය ඩිජිටල්කරණ ප්‍රයත්නවල සැලකිය යුතු ප්‍රගතියක් ලබා ඇත.

මූල්‍යමය වශයෙන්, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් ආදායම් බදු රෙගුලාසිවලට අනුකූල වීම සහතික කරමින් 2023 වාර්ෂික අයවැය සහ මූල්‍ය ප්‍රකාශන සාර්ථකව සකස් කර ඉදිරිපත් කරන ලදී. අදාළ සියලු බදු එකතු කර දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට සහ රජයේ ඒකාබද්ධ අරමුදලට කඩිනමින් ප්‍රේෂණය කරන ලදී. අලාභ හා වංචා වැලැක්වීම සඳහා පවත්වනු ලබන විශේෂ විගණන සමඟ අභ්‍යන්තර විගණන පාලනය, අවදානම් කළමනාකරණය සහ නියාමන අනුකූලතාව කෙරෙහි අවධානය යොමු කරන ලදී.

ජාත්‍යන්තර සබඳතා

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් තාක්ෂණික සහාය ලබා ගැනීම, ව්‍යාපෘති සඳහා සහාය ලබා ගැනීම සහ ධාරිතා වර්ධනය සඳහා ශිෂ්‍යත්ව අවස්ථා ලබා ගැනීම පිණිස ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය (ITU) සහ ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමය (APT) ඇතුළු ගෝලීය නියාමන ආයතන සමඟ ශක්තිමත් සම්බන්ධීකරණයක් පවත්වාගෙන යන ලදී.

2023 දෙසැම්බර් මාසයේ දී, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් 5G ඇතුළුව වැඩිදියුණු පුළුල් කලාප දත්ත සේවා සඳහා සංඛ්‍යාත වර්ණාවලිය වෙන් කිරීම පිළිබඳ උපදේශන පත්‍රිකාවක් ප්‍රකාශයට පත් කරන ලදී. එමෙන්ම, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව ඩිජිටල් සංවර්ධන ප්‍රතිපත්ති මෙහෙයුම් (DPO) රාමුව යටතේ ලෝක බැංකුව සමඟ සමීපව කටයුතු කරමින්, පුළුල් කලාප දත්ත සම්බන්ධතාව ප්‍රවර්ධනය සහ ඩිජිටල් ආර්ථිකය වැඩි දියුණු කිරීම සිදු කරන ලදී.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් දකුණු ආසියානු විදුලි සංදේශ නියාමන සංගමයේ (SATRC) සංඛ්‍යාත වර්ණාවලිය පිළිබඳ 2 වැනි කාර්ය කණ්ඩායම් රැස්වීම වැනි ජාත්‍යන්තර රැස්වීම් කිහිපයකට සත්කාරකත්වය සැපයූ අතර, වසර පුරා අනෙකුත් ප්‍රධාන ජාත්‍යන්තර සම්මන්ත්‍රණ සහ වැඩමුළු මෙන්ම බංග්ලාදේශයේ ඩකා හි පැවති දකුණු ආසියානු විදුලි සංදේශ නියාමන සංගමයේ (SATRC) වාර්ෂික රැස්වීම වෙනුවෙන් ශ්‍රී ලංකාව නියෝජනය කරන ලදී.

නිගමනය

ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ ක්ෂේත්‍රය නවීකරණය කිරීම, නියාමන රාමුව වැඩි දියුණු කිරීම, තරහකාරිත්වය වැඩිදියුණු කිරීම මෙන්ම රටේ ඩිජිටල් පරිවර්තනය ප්‍රවර්ධනය කිරීම උදෙසා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව දරන ප්‍රයත්නයන් මෙම වාර්තාවෙන් විග්‍රහ කෙරේ.

ගරු තාක්ෂණ අමාත්‍යවරයා, ගරු තාක්ෂණ රාජ්‍ය අමාත්‍යවරයා, කොමිෂන් සභාවේ සභාපති ඇතුළු කොමිෂන් සභා සාමාජිකයින්, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභා කාර්ය මණ්ඩලය මෙන්ම විදුලි සංදේශ ක්ෂේත්‍රයේ සියලුම පාර්ශවකරුවන් ලබාදුන් අගනා සහය වෙනුවෙන් ඔවුන්ට මාගේ ප්‍රණාමය පිරිනමන අතර, එළඹෙන 2024 වසර වඩාත් ඵලදා යී වූ වසරක් වේවා යි ප්‍රාර්ථනා කරමි.

මධුශංක දිසානායක
අධ්‍යක්ෂ ජනරාල්

තිරසාර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කරලීමේ වැඩසටහන 2023

වර්තමානයේ දී සංවර්ධනය පිළිබඳව පවත්නා ගෝලීය අවබෝධය සමෘද්ධිය ඇති කරන, ආර්ථික අවස්ථා සලසන, පරිසරය ආරක්ෂා කරන සහ සමාජ යහපැවැත්ම ප්‍රවර්ධනය කරන තිරසාර සංවර්ධනයක් කරා මෙහෙයවයි. මෙම සන්දර්භය තුළ, තිරසාර සංවර්ධන ඉලක්ක (SDGs) සාක්ෂාත් කර ගැනීමේ ප්‍රධාන සවිබලගන්වන්නා ලෙස විදුලි සංදේශ/තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය (ICTs) සැලකේ.

ගෝලීය අන්තර් සම්බන්ධතාවය ආශ්‍රිත තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය ව්‍යාප්ත කිරීමෙහි ලා එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් සම්මත කරන ලද තිරසාර සංවර්ධන ඉලක්ක තුලින් මානව දියුණුව වේගවත් කිරීමට සහ තොරතුරු හා සන්නිවේදන සේවා ව්‍යාප්ති විෂමතාවය අවම කිරීමට සුවිශාල හැකියාවයක් පවතී. විදුලි සංදේශ/තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශයේ තිරසාර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීම වේගවත් කිරීම පිණිස අපි 2023 වසරේ අපගේ ක්‍රියාකාරී සැලසුම්වල තිරසාර සංවර්ධනය ඉලක්කගත වැඩසටහන් ඇතුළත් කළෙමු.

ඉලක්කය / අරමුණ	ඉලක්ක	දර්ශක	ප්‍රගතිය
SDG 9 කර්මාන්ත, නවෝත්පාදන සහ යටිතල පහසුකම්	9.1-ආර්ථික සංවර්ධනය සහ මානව යහපැවැත්ම වෙනුවෙන් සියලු දෙනාටම ලබාගත හැකි සහ ප්‍රවේශ විය හැකි වීම අවධානයට ගෙන කලාපීය සහ ජාතික දේශසීමාවන් අතර සිදුකරන යටිතල පහසුකම් ද ඇතුළත්ව ගුණාත්මක වශයෙන් ඉහළ විශ්වාසදායී තිරසර සහ ආපදාවන්ට ඔරොත්තු දෙන යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.	ඒකාබද්ධ බලපත්‍රය සඳහා බලපත්‍ර සැකිල්ල සකස් කිරීම	90%
		දුරකථන අංකය වෙනස් නොවී ජාල අතර මාරුවීමේ ක්‍රමය ක්‍රියාත්මක කිරීම (Number Portability)	54%
	9.5-විද්‍යාත්මක පර්යේෂණ වැඩිදියුණු කිරීම. විශේෂයෙන්ම සංවර්ධනය වෙමින් පවත්නා රටවල් ඇතුළු සියලු රටවල කර්මාන්ත අංශයන්හි තාක්ෂණික ධාරිතාවන් ඉහළ නැංවීම. 2030 වන විට නවෝත්පාදනය දිරිගැන්වීම සහ පර්යේෂණ හා සංවර්ධන කාර්යයන්හි නියුතු ශ්‍රමිකයන් සංඛ්‍යාව ජනගහනයට සාපේක්ෂව ප්‍රමාණිකව ඉහළ නැංවීම සහ රාජ්‍ය අංශයේ සහ පෞද්ගලික අංශයේ පර්යේෂණ සහ සංවර්ධනය සඳහා වූ වියදම් වැඩි කිරීම.	ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල සහ පර්යේෂණ ආයතනවල සහාය ඇතිව පර්යේෂණ සහ සංවර්ධනය කටයුතු සිදු කිරීම	70%

ඉලක්කය / අරමුණ	ඉලක්ක	දර්ශක	ප්‍රගතිය
SDG 17 තිරසර සංවර්ධනය සඳහා පාර්ශවකරණයන්	17.6-විද්‍යාව තාක්ෂණය සහ නවෝත්පාදනය වෙනුවෙන් උතුරු-දකුණු, දකුණු-දකුණු සහ ත්‍රිකෝණාත්මක කලාපීය සහ අන්තර්ජාතික සහයෝගීතාවය ඉහළ නැංවීම සහ විශේෂයෙන්ම එක්සත් ජාතීන්ගේ මට්ටමේ දැනට පවත්නා යාන්ත්‍රණ අතර සහයෝගීතාවය වැඩි දියුණු කිරීමෙන් සහ ජගත් මට්ටමේ තාක්ෂණ පහසුකම් සැලසීමේ යාන්ත්‍රණයක් මඟින් එකිනෙකා සමග එකඟ වූ කොන්දේසි අනුව දැනුම බෙදාහදා ගැනීම ඉහළ නැංවීම.	17 වන වගන්තියේ මාර්ගෝපදේශ සංශෝධනය කිරීමේ ප්‍රගතිය	100%
	17.8-2017 වන විට අවම වශයෙන් සංවර්ධනය වී ඇති රටවල් සඳහා තාක්ෂණ බැංකු සහ විද්‍යාව, තාක්ෂණය සහ නවෝත්පාදන ධාරිතාවන් ගොඩනැංවීමේ යාන්ත්‍රණ පූර්ණ වශයෙන් ක්‍රියාත්මක කිරීම සහ විශේෂයෙන් තොරතුරු තාක්ෂණ සහ සන්නිවේදන තාක්ෂණයන්හි නව තාක්ෂණය භාවිතා කිරීම වැඩිදියුණු කිරීම.	5G සඳහා වර්ණාවලිය පැවරීම සම්පූර්ණ කිරීම	80%
		ඉදිරි වසර 5 සඳහා සංඛ්‍යාත වර්ණාවලිය මාර්ග සිතියම සකස් කර අවසන් කිරීම	100%
		ගමට සන්නිවේදනය ව්‍යාපෘතිය අවසන් කිරීම	14.93%
		පාසල් සඳහා අන්තර්ජාල පහසුකම් ලබාදීමේ ව්‍යාපෘතිය (School Fiber Project) අවසන් කිරීම	66%

විදුලි සංදේශ සංඛ්‍යාලේඛන සහ තොරතුරු

29.8 මිලියන
සෙලෙයුලර් ජංගම දුරකථන

3.8 මිලියන
ස්ථාවර ප්‍රවේශ දුරකථන

131.5%
ජනගහනයෙන් සෙලියුලර් ජංගම දුරකථන

15.9%
ජනගහනයෙන් ස්ථාවර ප්‍රවේශ දුරකථන



20.3 මිලියන
ජංගම බ්‍රෝඩ්බෑන්ඩ් සේවා (3G/4G)


2.6 මිලියන
ස්ථාවර බ්‍රෝඩ්බෑන්ඩ් සේවා

22.0 මිලියන
2023 වසර මැද භාගයේ ජනගහනය


26
පද්ධති බලපත්‍ර

පද්ධති බලපත්‍ර සංඛ්‍යාව	26
ස්ථාවර ප්‍රවේශ දුරකථන දායකවීම් (හඬ පමණි)	954,848
ස්ථාවර ප්‍රවේශ දුරකථන දායකවීම් (හඬ සහ දත්ත)	1,352,893
ස්ථාවර ප්‍රවේශ දුරකථන දායකවීම් (දත්ත පමණි)	1,204,018
මුළු ස්ථාවර ප්‍රවේශ දුරකථන දායකවීම්	3,511,759
ස්ථාවර ප්‍රවේශ දුරකථන ඝනත්වය (පදිංචිකරුවන් 100 දෙනෙකුට)	15.9
සෙලෙයුලර් ජංගම දුරකථන දායකවීම් (හඬ පමණි)	6,471,229
සෙලෙයුලර් ජංගම දුරකථන දායකවීම් (හඬ සහ දත්ත)	21,406,052
සෙලෙයුලර් ජංගම දුරකථන දායකවීම් (දත්ත පමණි)	1,109,080
මුළු සෙලෙයුලර් ජංගම දුරකථන දායකවීම්	28,986,361
සෙලෙයුලර් ජංගම දුරකථන ඝනත්වය (පදිංචිකරුවන් 100 දෙනෙකුට)	131.5
ස්ථාවර බ්‍රෝඩ්බෑන්ඩ් සේවා දායකවීම්	2,556,911
ජංගම බ්‍රෝඩ්බෑන්ඩ් සේවා දායකවීම් (3G, 4G)	20,307,262

පද්ධති බලපත්‍ර සංඛ්‍යාව




ජංගම සහ ස්ථාවර ප්‍රවේශ හඬ දුරකථන ග්‍රාහක වර්ධනය




*පහසුවෙන් සැසඳීම් සඳහා ජංගම සහ ස්ථාවර දත්ත ග්‍රාහකයින් ඇතුළත් කර නොමැත.


ස්ථාවර අධිවේගී අන්තර්ජාල සේවා සහ ජංගම අධිවේගී අන්තර්ජාල සේවා දායකත්වයන්





දුරකථන ව්‍යාප්තිය




විදුලි සංදේශ බදු




සෙස්
5.9 බිලියන
5.7 බිලියන
5.5 බිලියන
5.3 බිලියන
5.1 බිලියන
4.9 බිලියන
4.7 බිලියන
4.5 බිලියන
2019
2020
2021
2022
2023
සෙස්


ජංගම හා ස්ථාවර ප්‍රවේශ ක්‍රියාකරු සමාගම්වල එක් පරිහරණය කරන්නෙකුගෙන් ලැබෙන සාමාන්‍ය ආදායම
50,000
40,000
30,000
20,000
10,000
0
2019
2020
2021
2022
2023
ස්ථාවර
ජංගම


ඒකාබද්ධ අරමුදල සඳහා ප්‍රේෂණ
45.0 බිලියන
40.0 බිලියන
35.0 බිලියන
30.0 බිලියන
25.0 බිලියන
20.0 බිලියන
15.0 බිලියන
10.0 බිලියන
5.0 බිලියන
.0 බිලියන
2019
2020
2021
2022
2023
ඒකාබද්ධ අරමුදල සඳහා ප්‍රේෂණ

* තාවකාලික දත්ත

අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව

බලපත්‍ර කළමනාකරණය

නීතිමය රාමුව

1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධිත) පනත ප්‍රකාරව ("පනත") ශ්‍රී ලංකාවේ ජාතික හා අන්තර්ජාතික විදුලි සංදේශ සේවාවක් සැපයීම සඳහා සියළුම සාධාරණ ඉල්ලීම් ඉටු කළ හැකි වන පරිදි ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් විශ්වාසනීයව සහ කාර්යක්ෂමව සේවා සැපයිය යුතු අතර විදුලි සංදේශ පද්ධති ක්‍රියාකරුවන් විසින් විදුලි සංදේශ පද්ධති ස්ථාපිත කර ක්‍රියාත්මක කර එවැනි සේවාවන් සපුරා ලිය යුතුය.

පනතේ 17 වැනි වගන්තිය ප්‍රකාරව, කොමිෂන් සභාවේ නිර්දේශය මත අමාත්‍යවරයා විසින් ලබා දෙන බලපත්‍රයක් යටතේ හැර කිසිදු තැනැත්තෙකු විසින් එවැනි විදුලි සංදේශ පද්ධතියක් ක්‍රියාත්මක නොකළ යුතුය. 19 වන වගන්තියට අනුකූලව, පනතේ 17 වගන්තිය යටතේ බලපත්‍රයක් නොමැතිව විදුලි සංදේශ පද්ධතියක් ක්‍රියාත්මක කරන තැනැත්තෙකු වරදකරුවකු වේ.

තවද, පනතේ 18 වැනි වගන්තියට අනුව, ඕනෑම බලපත්‍ර කොන්දේසියක් සංශෝධනය කරන ලෙස කොමිෂන් සභාව විසින් අමාත්‍යවරයා වෙත නිර්දේශ කරයි.

පනතේ 18 අ වගන්තිය ප්‍රකාරව, විදුලි සංදේශ ක්‍රමය සම්බන්ධයෙන්, බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති විදුලි සංදේශ ක්‍රියාකරුවකු විසින්, කොමිෂන් සභාවේ පූර්ව අනුමැතිය නොලබා, ගාස්තුවක් හෝ ත්‍යාගයක් ගෙවීම මත, ව්‍යාපාරයක ආකාරයෙන්, පණිවුඩ යැවීමේ හෝ ලබා ගැනීමේ කාර්යය සඳහා ඒ විදුලි සංදේශ ක්‍රමය භාවිත කිරීමට වෙනත් යම් තැනැත්තකුට අවසර දෙනු නොලැබිය යුතුය. විදුලි සංදේශ ක්‍රියාකරුවකු විසින් ඒ සඳහා ඉල්ලීමක් කරනු ලැබූ විට, ක්‍රියාකරු වෙත අවසර පත්‍රයක් නිකුත් කිරීමෙන් කොමිෂන් සභාව විසින් අනුමැතිය දෙනු ලැබිය යුතු අතර අවසර පත්‍රය එහි සඳහන් නියමයන් හා කොන්දේසි වලට යටත් විය යුතුය.

පනතේ 20 වන වගන්තියට අනුකූලව, විදුලි සංදේශ ක්‍රමය ක්‍රියාත්මක කරන තැනැත්තා පදිංචිව සිටින ස්ථානයට අනුරූප ප්‍රදේශයක මායිම් ඉක්මවා ව්‍යාප්ත වන අවස්ථාවක, එම ක්‍රියාත්මක කිරීමට අදහස් කරනු ලබන විදුලි සංදේශ ක්‍රමයේ වර්ගය සඳහා කොමිෂන් සභාවෙන් බලපත්‍රයක් ලබා ගත යුතුය.

නිකුත් කරන ලද බලපත්‍ර වර්ග

ශ්‍රී ලංකාවේ වර්තමාන බලපත්‍ර පාලනය පහත පරිදි වේ;

අ) පහසුකම් පාදක කරගත් විදුලි සංදේශ ක්‍රියාකරු සමාගම් (FBO) - ජාල පහසුකම් හිමිකර ගැනීමට සහ සේවා සැපයීමට විදුලි සංදේශ ක්‍රියාකරු සමාගමට අවසර ලැබේ.

ආ) පහසුකම් පාදක කර නොගත් විදුලි සංදේශ ක්‍රියාකරු සමාගම් (NFBO) - ජාල පහසුකම් හිමිකර ගැනීමට ක්‍රියාකරුවන්ට අවසර ඇත, නමුත් සීමිත සම්පත් පවරනු නොලබන අතර එම සම්පත් පහසුකම් පාදක කරගත් දුරකථන ක්‍රියාකරු සමාගම් (FBOs) සමඟ බෙදාගත යුතුය.

ඇ) පහසුකම් සැපයුම්කරුවන් - දුරකථන ක්‍රියාකරු සමාගම් වලට ජාල පහසුකම් ලබා ගැනීමට හැකි නමුත් පාරිභෝගිකයන් සඳහා සේවා සැපයීමට අවසර නොලැබේ. විදුලි සංදේශ ක්‍රියාකරු සමාගම් සහ විකාශන සමාගම් වලට පමණක් සම්බන්ධතා පහසුකම් සැපයිය හැකිය.

බලපත්‍ර නිකුත් කිරීම සඳහා ඉහත සියලුම බලපත්‍රවල පාලනය පනතේ 17 වැනි වගන්තිය යටතේ ක්‍රියාවට නංවා ඇති අතර අවශ්‍ය විටෙක පනතේ 18 අ වගන්තිය අනුව අවශ්‍ය වෙනස් කිරීම් සිදු කර නිකුත් කරනු ලැබේ. බොහෝ බලපත්‍ර (අ) කාණ්ඩය යටතේ නිකුත් කෙරේ. (ආ) කාණ්ඩය යටතේ නිකුත් කරන ලද බලපත්‍ර තුනක් සහ (ඇ) කාණ්ඩය යටතේ නිකුත් කරන ලද බලපත්‍ර තුනක් ඇත.

වර්තමානයේ සේවා බලපත්‍ර ලබා දීමේ ක්‍රම

- තනි කාණ්ඩ අවසරය (උදා: DTH)
- බහුවිධ කාණ්ඩ අවසරය (බොහෝ බලපත්‍ර)

සියල්ල තනි පුද්ගල බලපත්‍ර වන අතර කාණ්ඩ බලපත්‍ර නිකුත් කර නොමැත.

බලපත්‍ර රාමුව

වෙළඳපල වර්ධනය සහ සමාජයේ යහපැවැත්ම වැඩිදියුණු කිරීම සඳහා හිතකර පරිසරයක් සැපයීම සඳහා, කොමිෂන් සභාව තාක්ෂණ සහ සේවා කේන්ද්‍රගතවීම අපේක්ෂා කරයි. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව ද මේ සම්බන්ධයෙන් පහත ලක්ෂණ සලකා බලයි.

- විවෘත ප්‍රවේශය
- තරහකාරිත්වය ප්‍රවර්ධනය කිරීම
- සේවා තත්ත්ව
- නව තාක්ෂණය ව්‍යාප්ත කිරීම
- කාර්යක්ෂමතාව සහ අභිසාරීත්වය
- යටිතල පහසුකම් සහ සීමිත සම්පත් බෙදාගැනීම

බහු සේවා කාණ්ඩ වලට අවසර ලබාදීමේ ක්‍රමය අනුව විවිධ ජාල කාණ්ඩ යටතේ දැනට මුළු බලපත්‍ර 25 ක් බලාත්මක වේ:

- ස්ථාවර දුරකථන ක්‍රියාකරු සමාගම් ("ස්ථාවර") - බලපත්‍ර 3
- ජංගම දුරකථන ක්‍රියාකරු සමාගම් ("ජංගම") - බලපත්‍ර 4
- බාහිර ප්‍රවේශ ක්‍රියාකරු සමාගම් ("EGO") - බලපත්‍ර 6
- කේබල් විබෙදුම් ජාල ක්‍රියාකරු සමාගම් ("CDN") - බලපත්‍ර 3
- දත්ත සන්නිවේදන ක්‍රියාකරු සමාගම් ("දත්ත") - බලපත්‍ර 1
- පහසුකම්-පාදක කර නොගත් අන්තර්ජාල සේවා සැපයුම්කරුවන් ("ISP") - බලපත්‍ර 3

- සෘජු-ගෘහස්ථ චන්ද්‍රිකා විකාශන සේවා සැපයුම්කරුවන් ("DTH") - බලපත්‍ර 3
- චන්ද්‍රිකා සේවා සපයන්නන් ("චන්ද්‍රිකා ") - බලපත්‍ර 1
- බද්දට ගත් දුරකථන සේවා - බලපත්‍ර 1

සියලුම බලපත්‍ර පිළිබඳ සම්පූර්ණ විස්තර ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභා වෙබ් අඩවියෙන් ලබා ගත හැකිය.

ඉහත බලපත්‍ර 25 මඟින්, පහත දැක්වෙන විවිධ වර්ගයේ සේවාවන් සැපයීමට අවසර ඇත:

- පොදු දුරකථන කුටි සේවා
- බැක්හෝල් (Backhaul) සේවා
- දත්ත සන්නිවේදන සේවා
- ෆැක්ස් මේල් සේවා
- ජාත්‍යන්තර රූපවාහිනී සම්ප්‍රේෂණ සේවා
- සමුද්‍රීය සේවා
- ජාල ප්‍රවේශ සේවා
- ඊළඟ පරම්පරාවේ ජාල (NGN) සේවා
- ජාත්‍යන්තර සමුද්‍රීය චන්ද්‍රිකා (INMARSAT) ඇතුළු චන්ද්‍රිකා සේවා.
- හඬ තැපැල් සේවාව
- හඬ දුරකථන සේවා
- රැහැන් රහිත අනුකූලතා (Wi-Fi) සේවා
- මයික්‍රෝවේව් හෝ ඔප්ටිකල් ජාලයේ අතිරික්ත ධාරිතාව වෙනත් බලපත්‍රලාභී දුරකථන ක්‍රියාකරු සමාගම් වෙත බදු දීමේ සේවා
- දත්ත සේවා ඇතුළු පරිපථ ස්විචිකරණ දත්ත කෙටි පණිවුඩ සේවා (SMS), ව්‍යුහගත නොකරන ලද අතිරේක දත්ත සේවා (USSD), රැහැන් රහිත යෙදුම් සම්මුති සේවා (WAP), බහු මාධ්‍ය පණිවුඩ සේවා (MMS), පොදු පැකට් රේඩියෝ සේවා (GPRS) ජංගම සන්නිවේදනය සඳහා වන ගෝලීය පද්ධති පරිණාමය පිණිස වැඩිදියුණු කළ දත්ත සේවා (EDGE), සහ සෙලියුලර් ආශ්‍රිත දත්ත සේවාවල අනාගත වර්ධනයන්
- ජංගම සන්නිවේදනයේ ගෝලීය පද්ධති (GSM) - පාදක සේවාව සඳහා ස්ථානීය - පාදක සේවා සහ ජංගම සන්නිවේදනයේ ගෝලීය පද්ධති - පාදක සේවාවන්හි අනාගත වර්ධනයන් ඇතුළත් වේ.
- අභ්‍යන්තර යෙදුම් සඳහා රැහැන් රහිත අනුකූලතාවය (Wi-Fi) පදනම් වූ දත්ත සන්නිවේදන සේවා
- රූපවාහිනී සම්ප්‍රේෂණ සේවා
- අතථ්‍ය පුද්ගලික ජාල (VPN) සේවා
- අන්තර්ජාල සේවා
- ස්විචිකරණ සහ ස්විචිකරණ නොවන දත්ත සන්නිවේදන සේවා
- ටෙලෙක්ස්
- විද්‍යුත් තැපෑල
- ගුවන් ප්‍රවාහන කර්මාන්තයට අදාළ දත්ත සැකසුම් සේවා.
- SITAFAX - යටතේ හඳුන්වා දෙන ලද බහු - ලිපින සහ බහු - පිටපත් ශක්‍යතාව සේවා
- කේබල් ටීවී සේවා
- කණ්ඩායම් ඇමතුම් සේවා
- ප්‍රමුඛතා ඇමතුම් වෙන් කිරීමේ සේවා (Priority calls over-ride)
- සමුද්‍රීය / නාවික යාත්‍රා ඇමතුම් සේවා
- සංවෘත පරිශීලක කණ්ඩායම
- බද්දට ගත් දුරකථන සේවා (සීමිත)
- දේශීය හා විදේශීය දුරකථන ක්‍රියාකරු සමාගම් සඳහා අභ්‍යවකාශ වස්තුවක් ගොඩ බස්සවන කෘතිම චන්ද්‍රිකා ආශ්‍රිත සේවා
- අභ්‍යවකාශ වස්තු භාවිත කිරීම, නඩත්තු කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පාලනය කිරීම ආශ්‍රිත පාලන, අධීක්ෂණ සහ පරීක්ෂණ ක්‍රියාකාරකම් සේවා
- ජාත්‍යන්තර සංක්‍රමණ සේවා
- මනු වාර්තා කිරීම (Telemetry), පිරික්සීම (Tracking) සහ උපදෙස් හා විධාන ලබාදීමේ (TT&C) සේවා
- ස්ථානගත කිරීමේ (සත්කාරක) සේවා
- සමුද්‍රීය සම්බන්ධතා සේවා

පනත ප්‍රකාරව 2023 වසරේ දී, පහත සඳහන් බලපත්‍ර අලුත් කිරීම් සිදු කර ඇත.

- සීමාසහිත මොබිටෙල් (පුද්ගලික) සමාගම - ජංගම සේවාව
- ඩයලොග් ආසියාටා පී.එල්. සී - ජංගම සේවාව
- සීමාසහිත ඩයලොග් බ්‍රෝඩ්බෑන්ඩ් නෙට්වර්ක් (පුද්ගලික) සමාගම - අන්තර්ජාල සේවාව
- සීමාසහිත මොබිටෙල් (පුද්ගලික) සමාගම - ජාත්‍යන්තර සේවාව
- ඩයලොග් ආසියාටා පී.එල්. සී - ජාත්‍යන්තර සේවාව
- සීමාසහිත ටාටා කම්‍යුනිකේෂන්ස් ලංකා (පුද්ගලික) සමාගම - ජාත්‍යන්තර සේවාව
- සීමාසහිත ආස්ක් කේබල් විෂන් (පුද්ගලික) සමාගම - කේබල් රූපවාහිනී සේවාව
- සීමාසහිත ට්‍රයිමාස් මීඩියා නෙට්වර්ක් (පුද්ගලික) සමාගම - කේබල් රූපවාහිනී සේවාව
- සීමාසහිත සුපීරිසැට් (පුද්ගලික) සමාගම - සැටලයිට් සේවාව

පනත ප්‍රකාරව, නව බලපත්‍රයක් ලබා දීම පිණිස පහත බලපත්‍රය 2023 වසරේ දී සකස් කර ඇත.

- සීමාසහිත ප්‍රීසැට් ලංකා (පුද්ගලික) සමාගම - ටෙලිපෝට් සේවාව (චන්ද්‍රිකාවන් හෝ භූ කේන්ද්‍රීය තාක්ෂණයන් සම්බන්ධ කරන මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියාකරන චන්ද්‍රිකා ගොඩබිම් මධ්‍යස්ථාන සේවා)

අංශයේ කාර්යසාධනය

පනතේ දක්වා ඇති විධිවිධාන ප්‍රකාරව ශ්‍රී ලංකාව පුරා සිටින ආයතනික ගනුදෙනුකරුවන්ගේ සහ පාරිභෝගිකයින්ගේ ශීඝ්‍රයෙන් වෙනස් වන අවශ්‍යතා සපුරාලීම පිණිස දුරකථන ක්‍රියාකරු සමාගම් වලට දැරිය හැකි සහ පුළුල් ලෙස ලබා ගත හැකි සේවාවන් සංවර්ධනය කිරීමට හැකි වන පරිදි ජාත්‍යන්තර ප්‍රශස්ත භාවිතයන් ක්‍රියාත්මක කරන

ශක්තිමත් නියාමන රාමුවක් ස්ථාපිත කිරීම අත්‍යවශ්‍ය වේ.

රට කේන්ද්‍රීය ඩිජිටල් ආර්ථිකයක් කරා ඉදිරියට යාම සහ බලපත්‍ර රාමුව තුළ පිළිබිඹු වන සම්ප්‍රදායික සේවා කාණ්ඩ ක්‍රම ක්‍රමයෙන් යල් පැන යාම දුරකථන ක්‍රියාකරු සමාගම් වලට පමණක් නොව පාරිභෝගිකයින්ට ද එකසේ බලපාන බැවින්, වඩාත් පරිපූර්ණ සහ තිරසාර බලපත්‍ර රාමුවකට අනුගත වීමේ අවශ්‍යතාවයක් පවතී. විදුලි සංදේශ කර්මාන්තයේ තිරසාර බව සැලකිල්ලට ගනිමින් රට තුළ සමාජ - ආර්ථික සංවර්ධනය සාක්ෂාත් කර ගැනීමෙහි ලා නව බලපත්‍ර රාමුවකට ක්‍රමිකව සංක්‍රමණය වීම කළමනාකරණය කළ යුතු වේ.

තාක්ෂණය සහ සේවා ඒකාබද්ධ කිරීම සහ ආන්තික භාවය අඩු, වත්මන් සහ අනාගත ප්‍රතිපත්තිමය වරප්‍රසාද පිළිබිඹු කරන බලපත්‍ර අඩු කාණ්ඩ ප්‍රමාණය, ඒකාබද්ධ බලපත්‍ර භාවිතය (බහු සේවා සඳහා තනි බලපත්‍රයක්) සහ සරල කළ හා වඩා කාර්යක්ෂම පරිපාලනය සැලකිල්ලට ගනිමින් බලපත්‍ර රාමුව සකස් කරනු ලැබේ.

සේවා සහ ජාල කාණ්ඩ අනුව වර්තමාන තනි ක්‍රියාකරු බලපත්‍ර විධිමත්ව ඒකාබද්ධ කිරීම මෙම මූලධර්ම ක්‍රියාත්මක කිරීමේ පළමු පියවර වේ. දෙවන පියවර වන්නේ කේන්ද්‍රීය හෝ ඒකාබද්ධ බලපත්‍ර ක්‍රමවේදයක් හඳුන්වා දීමයි.

ඒකාබද්ධ බලපත්‍ර තන්ත්‍රයක් හඳුන්වා දීමට පෙර, ප්‍රධාන සමාගම් වලින් කුඩා පරිමාණ දුරකථන ක්‍රියාකරු සමාගම් ආරක්ෂා කිරීම සහ සමස්ථ වෙළඳපල ඒකාධිකාරය හෝ ද්විත්ව වෙළඳපල තත්ත්වයන් වෙත තල්ලු වීම වැළැක්වීම සඳහා විශේෂ නියාමන ආරක්ෂණ ක්‍රම ක්‍රියාත්මක කළ යුතුය. අත්‍යවශ්‍ය පූර්ව අවශ්‍යතා ලෙස සාධාරණව සංඛ්‍යාත වර්ණාවලිය පැවරීමේ ප්‍රතිපත්තිය සහ සාධාරණ යටිතල පහසුකම් බෙදාගැනීමේ මාර්ගෝපදේශය සකස් කිරීම අවශ්‍ය වේ. මේවා අදාළ අංශය මඟින් ක්‍රියාත්මක කළ යුතු අතර 2023 වසරේ දී සංඛ්‍යාත වර්ණාවලිය පැවරීමේ නීති සකස් කර ඇත.

දුරකථන ක්‍රියාකරු සමාගම්වල ශක්‍යතාවය පුළුල් කිරීම සහ මහජනතාවට ප්‍රයෝජන ගත හැකි තාක්ෂණික අභිසාරීතාවයෙන් මෙහෙයවනු ලබන වෙළඳපල නවෝත්පාදනයන් නිර්මාණය කිරීම පිණිස බලපත්‍ර කළමනාකරණ අංශය විසින් නව බලපත්‍ර රාමුවක් සඳහා මාර්ග සිතියමක් සැකසීමේ ව්‍යාපෘතියක් ආරම්භ කර ඇත. නව බලපත්‍ර රාමුවක් සැකසීමට පහසුකම් සැලසීම සඳහා ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ (ITU) විශේෂඥයෙකු විසින් උපදේශන පත්‍රිකාවක් සකස් කර ඇත. ඒ අනුව, ස්ථාවර/ජංගම සේවා සඳහා ඒකාබද්ධ බලපත්‍ර ආකෘති පද්ධති වර්ගවල නියමයන්, කොන්දේසි සහ නිර්වචන සකස් කරමින් පවතී.

පනතේ 17 වැනි වගන්තිය යටතේ බලපත්‍ර නිකුත් කිරීම, අලුත් කිරීම සහ වෙනස් කිරීම සඳහා මාර්ගෝපදේශ සහ ක්‍රියා පටිපාටි නියම කරමින් ගැසට් පත්‍රයක් (2006.03.10 දින අංක 1435/20) ප්‍රකාශයට පත් කර ඇත. කෙසේ වෙතත්, මෙම මාර්ගෝපදේශවල, බලපත්‍ර අලුත් කිරීම සඳහා වෙනම රීති නොමැති බැවින්, අලුත් බලපත්‍ර නිකුත් කිරීමේදී යොදා ගන්නා ක්‍රියා පටිපාටියම බලපත්‍රය අලුත් කිරීම සඳහා ද අනුගමනය කළ යුතු අතර, එය බලපත්‍ර අලුත් කිරීමේ ක්‍රියාවලියේ දී අවභිරතා ඇති කරයි. තවද, බලපත්‍රය ප්‍රත්‍යාදිෂ්ට කිරීම සහ බලපත්‍රය පැවරීම වැනි කරුණු ආවරණය කිරීම පිණිස ගැසට් පත්‍රය යොදා ගත යුතුවේ.

එබැවින් එම මාර්ගෝපදේශවලට අවශ්‍ය සංශෝධන යෝජනා කිරීම සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කමිටුවක් පත් කරන ලදී. කමිටුව විසින් බලපත්‍ර නිකුත් කිරීම, අලුත් කිරීම, අවලංගු කිරීම, වෙනස් කිරීම සහ හිමිකාරිත්වය පැවරීම සම්බන්ධයෙන් නව මාර්ගෝපදේශ කෙටුම්පත් ඉදිරිපත් කර ඇති අතර, එම මාර්ගෝපදේශ කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී.

රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා මාර්ගෝපදේශ රජයේ මුද්‍රණාලය වෙත ඉදිරිපත් කර ඇත.

ඒ හා සමානව, බලපත්‍රයේ 17 වන වගන්තිය ප්‍රකාරව ජාල අනුමැතිය ලබා ගැනීම අත්‍යවශ්‍යය අවශ්‍යතාවයක් වන අතර, එය මීට පෙර බලපත්‍රයේ නිසි පරිදි සඳහන් කර නොමැත. එබැවින්, මෙහෙයුම් පද්ධතියේ/සේවාවේ සමීක්ෂණ මත පදනම්ව මෙය ක්‍රියාත්මක කිරීමට පියවර ගෙන ඇත.

ජාල

අංකනය සහ නව සේවා

විදුලි සංදේශ ජාලවල ක්‍රියාකාරිත්වය සඳහා අවශ්‍ය අංකනය කිරීමේ සම්පත හිඟ සම්පතකි. ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ කර්මාන්තයේ ජාතික අංකකරණ සැලැස්මට අනුකූලව මෙම සම්පත කළමනාකරණය කිරීමේ වගකීම ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සතු වේ. රටෙහි විදුලි සංදේශ ජාල සඳහා පවතින අංකන සම්පත් භාවිතා කිරීම සඳහා වන රාමුව සහ මාර්ගෝපදේශ අංකනය කිරීමේ සැලැස්ම මඟින් දක්වා ඇත. අංකනය යනු හිඟ සම්පතකි; එබැවින් එය කාර්යක්ෂමව කළමනාකරණය කළ යුතුය. විදුලි සංදේශ අංශයේ නව වර්ධනයන් සහ වර්තමාන ප්‍රවණතා මත රඳා පවතින කර්මාන්තයේ ඉල්ලීම් අනුව අංකකරණ සැලැස්ම වරින් වර සංශෝධනය කෙරේ. මෙම කාර්යයට අදාළ ක්‍රියාකාරකම්වල සාරාංශයක් පහත දැක්වේ.

- ජාතික අංකකරණ සම්පත කළමනාකරණය කිරීම
- රාජ්‍ය සහ පෞද්ගලික ආයතන සඳහා කෙටි සංකේත අංක වෙන් කිරීම
- කෙටි සංකේත අංක ආශ්‍රිත කාරණා සම්බන්ධයෙන් විදුලි සංදේශ ක්‍රියාකරු සමාගම් සම්බන්ධීකරණය කිරීම
- විදුලි සංදේශ ක්‍රියාකරුවන්ට ජාත්‍යන්තර සහ ජාතික සංඥා සංකේත අංක සහ ජාල සංකේත අංක වෙන් කිරීම
- Object Identifiers වෙන් කිරීම
- දුරකථන අංකය වෙනස් නොවී ජාල අතර මාරුවීමේ ක්‍රමය ක්‍රියාත්මක කිරීම
- ගාස්තු රහිත අංකන පද්ධතිය ක්‍රියාත්මක කිරීම
- IPv6 මාර්ග සිතියම සකස් කිරීම

- නීතිවිරෝධී ජාත්‍යන්තර ඇමතුම් අවසන් කිරීම් වැලැක්වීම සඳහා අන්තර්ජාල සම්මුති (VOIP) මාර්ග, සම්මුති සහ යෙදුම් අවහිරතා ඉවත් කිරීමට විදුලි සංදේශ දුරකථන ක්‍රියාකරු සමාගම් වලට අනුමැතිය නිකුත් කිරීම.

දුරකථන අංකය වෙනස් නොවී ජාල අතර මාරුවීමේ හැකියාව ක්‍රියාත්මක කිරීම

ජංගම දුරකතනයකින් තවත් ජංගම දුරකථනයකට සහ ස්ථාවර දුරකථනයකින් තවත් ස්ථාවර දුරකථනයකට දුරකථන අංකය වෙනස් නොවී ජාල අතර මාරුවීමේ හැකියාව ක්‍රියාත්මක කිරීමට සහ අවශ්‍ය රෙගුලාසි සහ මාර්ගෝපදේශ සකස් කිරීමට කොමිෂන් සභාව ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන ඇත. ජාල අංශයේ නායකත්වය යටතේ අභ්‍යන්තර කමිටුව විසින්, දුරකථන අංකය වෙනස් නොකර ජාල අතර මාරුවීම සඳහා අවශ්‍ය රීති සහ මාර්ගෝපදේශ සකස් කරමින් සිටී. දුරකථන අංකය වෙනස් නොකර ජාල අතර මාරුවීමේ ක්‍රමය සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා ඊට අදාළ කටයුතු සාකච්ඡා කිරීම පිණිස පොදු ස්විචිකරණ දුරකථන ජාල ක්‍රියාකරු සමාගම්වල නියෝජිතයන්ගෙන් සහ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක් ස්ථාපනය කරන ලදී. දුරකථන කර්මාන්තයේ නියැලවූවන් සමඟ කළ සාකච්ඡා මත පදනම්ව සුදුසු මෙහෙයුම් සහ තාක්ෂණික ආකෘතියක් තීරණය කර ඇත. සියලුම බලපත්‍රලාභී ස්ථාවර සහ ජංගම දුරකථන ක්‍රියාකරු සමාගම්වල සාමාජිකයින්ගෙන් සමන්විත 'සීමාසහිත ලංකා දුරකථන අංකය වෙනස් නොවී ජාල අතර මාරුවීමේ සේවා සමාගම' (Lanka Number Portability Services Ltd.) නමින් ඇපකර සමාගමක් දුරකථන අංකය වෙනස් නොවී ජාල අතර මාරුවීමේ මෙහෙයුම් සඳහා ස්ථාපනය කරන ලදී. දුරකථන අංකය වෙනස් නොවී ජාල අතර මාරුවීමේ හැකියාව සාර්ථකව ක්‍රියාත්මක කිරීම පිණිස ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සහ දුරකථන ක්‍රියාකරු සමාගම් වැඩිදුර පියවර ගනිමින් සිටී. එමෙන්ම, 17 වන වගන්තිය ප්‍රකාරව Lanka Number Portability Services Ltd. විසින් බලපත්‍රයක් සඳහා අයදුම් කර ඇත.

ගාස්තු රහිත අංකන පද්ධතිය

වාණිජමය ආයතනවල සිය ව්‍යාපාරයන් සඳහා ගාස්තු රහිත අංක යොදා ගැනීමේ ඉහළ ඉල්ලුමක් පවතී. එබැවින් මෙම සේවාව ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු ජාල අංශය විසින් ආරම්භ කරන ලදී. ජාත්‍යන්තර භාවිතයන්ට අනුකූලව, මෙම සේවාව සඳහා අංක 800 මට්ටමක් හඳුනාගෙන ඇත. ගාස්තු රහිත අංකයක් 800 XXX XXXX යනාදී වශයෙන් 800 මට්ටමේ ඉලක්කම් 10 අංකයක් වනු ඇත. පොදු ස්විචිකරණ ජාල ක්‍රියාකරුවන් සඳහා සංඛ්‍යා පරාස ඒවායේ පවතින ලක්ෂණ සැලකිල්ලට ගනිමින් හඳුන්වා දී ඇත. ගාස්තු රහිත අංක පරාස සඳහා සුදුසු ගාස්තු තීරණය කිරීම පිණිස පත් කරන ලද අභ්‍යන්තර කමිටුව, අයකිරීමේ ව්‍යුහය සකස් කර අවසන් කර ඇත. මෙම අංකවලට ලැබෙන ඇමතුම් සමඟ සම්බන්ධ අයක්‍රම සම්පූර්ණ වූ පසු මෙම පරාසයේ අංක කොටස් දුරකථන ක්‍රියාකරු සමාගම් වෙත නිකුත් කළ හැක. අංක කොටස් නිකුත් කිරීමේ මාර්ගෝපදේශය ද අවසන් කර ඇත.

අන්තර්ජාල යෙදුම් ජාල ඔස්සේ හඬ සම්ප්‍රේෂණ (VOIP) අවහිරතා ඉවත් කිරීම

දුරකථන ක්‍රියාකරු සමාගම් වලින් ලබා ගන්නා අන්තර්ජාල සම්බන්ධතාවල අන්තර්ජාල යෙදුම් ජාල ඔස්සේ හඬ සම්ප්‍රේෂණ කිරීමේ මාර්ග යෙදුම් සහ භාවිත අවහිරතා ඉවත් කිරීමට ඉල්ලා සිටින පාර්ශ්වයන්ට ජාල අංශය විසින් අවශ්‍ය අනුමැතිය ලබා දෙයි. නීතිවිරෝධී ආකාරයෙන් ජාත්‍යන්තර දුරකථන ඇමතුම් අවසන් කිරීම වැලැක්වීමේ පූර්ව ආරක්ෂණ ක්‍රියාමාර්ගයක් වශයෙන් මෙය සිදු කෙරේ. මෙලෙස අනුමැතිය ලබා දීමේ දී භාවිත කරන මාර්ගෝපදේශය ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභා වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කර ඇත.

IPv6 මාර්ග සිතියම සකස් කිරීම

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් ශ්‍රී ලංකාව තුළ බලපත්‍රලාභී අන්තර්ජාල සේවා සපයන්නන්ගේ IPv6 සූදානම සහ IPv6 සඳහා මාරුවීමේ ප්‍රගතිය පිළිබඳ තත්ව පරීක්ෂණයක් සිදු කරන ලදී. ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ විශේෂඥ සේවා සහාය ලබාදීමේ වැඩසටහන යටතේ බඳවා ගන්නා ලද ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ විශේෂඥයකු විසින් IPv6 සඳහා සාර්ථකව මාරුවීම සඳහා අවශ්‍ය මාර්ගෝපදේශ සහ උපාය මාර්ග ඇතුලත් කෙටුම්පත් සකස් කළේය. දුරකථන ක්‍රියාකරු සමාගම් දිරිමත් කිරීමට සහ ඔවුන් නිසි ලෙස IPv6 වෙත සංක්‍රමණය වීම සහතික කිරීම පිණිස ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් මෙම මාර්ග සිතියම අනුගමනය කළ යුතුය.

යටිතල පහසුකම් ව්‍යාප්ත කිරීම

ජාල අංශය විසින් සිදු කරනු ලබන ප්‍රධාන කාර්යයන් වන්නේ තඹ හෝ ඔප්ටිකල් ෆයිබර් ජාල, මුහුදු යට කේබල් මධ්‍යස්ථාන සහ විදුලි සංදේශ ඇන්ටෙනා කුලුනු වැනි විදුලි සංදේශ යටිතල පහසුකම් ව්‍යාප්ත කිරීමට පහසුකම් සැලසීමයි. විදුලි සංදේශ ක්‍රියාකරු සමාගම් විසින් ඉහත සඳහන් කළ භෞතික යටිතල පහසුකම් භාවිතයෙන් පවතින ජාල පුළුල් කිරීමට හෝ නව සේවා හඳුන්වා දීමට අවසර ඉල්ලා සිටී. ජාල අංශය අනෙකුත් අදාළ රාජ්‍ය ආයතන සමඟ සම්බන්ධීකරණයෙන් අදාළ අනුමැතිය ලබා දෙමින් ඔවුන්ට පහසුකම් සපයයි.

විදුලි සංදේශ ක්ෂේත්‍රයේ තිරසාර සංවර්ධනයක් පවත්වා ගනිමින් පාරිසරික බලපෑම්, සෞඛ්‍ය සහ ආරක්ෂිත ගැටලු, ජාතික ආරක්ෂාව සහ මහජන අවශ්‍යතා සම්බන්ධ කරුණු පිළිබඳව නිසි සැලකිල්ලක් දක්වයි. මෙම කටයුතු සම්බන්ධයෙන් අංශය විසින් සිදු කරනු ලබන රාජකාරී සාරාංශගත කර ඇත.

- ආරක්ෂක අමාත්‍යාංශය, මධ්‍යම පරිසර අධිකාරිය, නාගරික සංවර්ධන අධිකාරිය, සිවිල් ගුවන් සේවා අධිකාරිය, සහ ශ්‍රී

ලංකා ආයෝජන මණ්ඩලය වැනි රාජ්‍ය ආයතන සමඟ විදුලි සංදේශ යටිතල පහසුකම් ව්‍යාප්ත කිරීමට අදාළ කරුණු සම්බන්ධීකරණය කිරීම.

- ඇන්ටෙනා ව්‍යුහ කළමනාකරණ පද්ධතිය (ASMS) වෙත ඉදිරිපත් කරන ඇන්ටෙනා ව්‍යුහයන් ඉදිකිරීම පිළිබඳ අයදුම්පත් සම්බන්ධයෙන් කටයුතු කිරීම.
- ඇන්ටෙනා ව්‍යුහ කළමනාකරණ පද්ධතියේ (ASMS) ඇති දත්ත සමඟ දුරකථන ක්‍රියාකරු සමාගම්වල ගුවන් අඩවි ලැයිස්තුව ප්‍රතිසන්ධාන කිරීම.
- අනුමත නොකළ කුලුනු විධිමත් කිරීම පිණිස දුරකථන ක්‍රියාකරු සමාගම් ඉදිරිපත් කරන නව අයදුම්පත් සඳහා අදාළ රජයේ බලධාරීන්ගේ නිර්දේශ ලබා ගැනීම සහ අනුමැතිය ලබා දීම සම්බන්ධයෙන් කටයුතු කිරීම.
- දැනට පවතින කුලුනු සහ වැඩබිම් ස්ථාන පිළිබඳ විස්තර සැලකිල්ලට ගනිමින්, ගමට සන්නිවේදනය ව්‍යාපෘතිය යටතේ විදුලි සංදේශ කුලුනු ඉදිකිරීම පිණිස හඳුනාගෙන ඇති ස්ථාන සඳහා නිර්දේශ ලබාදීම.
- රටේ විදුලි සංදේශ සේවා ව්‍යාප්ත නොවූ ප්‍රදේශවලට විදුලි සංදේශ සේවා සැපයීම මඟින් මෙම ජාතික ව්‍යාපෘතිය නියමිත වේලාවට ක්‍රියාත්මක කිරීම සහතික කරමින් ගමට සන්නිවේදනය ව්‍යාපෘතියේ කුලුනු අයදුම්පත් සම්බන්ධයෙන් කටයුතු කිරීම.
- සීමිත ප්‍රදේශයන් හී, විශේෂයෙන් 4G තාක්ෂණ සහ 5G පරීක්ෂණ කටයුතු සඳහා විදුලි සංදේශ ආවරණය වැඩිදියුණු කිරීමෙහි ලා විදුලි සංදේශ ඇන්ටනා ස්ථාපනය කිරීම පිණිස දැනටමත් ඉදිකර ඇති බහුකාර්ය ලාම්පු කුලුණු (MPLP) බෙදාගැනීම සඳහා ලැබෙන අයදුම්පත් සම්බන්ධයෙන් කටයුතු කිරීම.
- බලපත්‍රලාභී විදුලි සංදේශ ක්‍රියාකරු සමාගම් වලට ඔවුන්ගේ යටිතල පහසුකම් ව්‍යාප්ත කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී පහසුකම් සැලසීම.
- විදුලි සංදේශ කුලුනු ආශ්‍රිත ගැටළු සම්බන්ධයෙන් මහජන පැමිණිලි මෙහෙයවීම.
- විදුලි සංදේශ කුලුනු ආශ්‍රිත ගැටළු මහහරවා ගැනීම සඳහා මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
- විදුලි සංදේශ යටිතල පහසුකම් ව්‍යාප්ත කිරීම සම්බන්ධයෙන් පුද්ගලයන්/සංවිධාන විසින් ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති යෝජනා අධ්‍යයනය කිරීම, නිර්දේශ ඉදිරිපත් කිරීම සහ වාර්තා ඉදිරිපත් කිරීම.
- රජයේ ඉඩම්වල ඉදිකර ඇති විදුලි සංදේශ කුලුනු සඳහා දුරකථන ක්‍රියාකරු සමාගම් සහ දිස්ත්‍රික් ලේකම්වරුන් අතර දිගුකාලීන බදු ගිවිසුම් ක්‍රියාත්මක කිරීම පිණිස දිස්ත්‍රික් ලේකම්වරුන් (DS) සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.
- අවදානමට ලක්විය හැකි කුලුනු වැඩබිම්වල විකිරණ මට්ටම් මැනීම සඳහා පරීක්ෂණ සිදු කිරීම.

වෙළඳ බලපත්‍ර සහ මාදිලි අනුමැතිය

වෙළඳ බලපත්‍ර ලබා දීම

විදුලි සංදේශ පනතේ 21 වන වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද බලපත්‍රයක අවසරය යටතේ හැර කිසිම තැනැත්තකු විසින් ශ්‍රී ලංකාව තුළ කිසියම් විදුලි සංදේශ උපකරණයක් හෝ ගුවන් විදුලි සන්නිවේදන උපකරණයක් නිෂ්පාදනය කිරීම, ආනයනය කිරීම, විකිණීම, විකිණීම පිණිස ඉදිරිපත් කිරීම, ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීම, කුලියට දීම, බදු දීම, ක්‍රියාකර පෙන්වීම, නඩත්තු කිරීම හෝ අළුත්වැඩියා කිරීම සිදු නොකළ යුතුය. වෙළඳ බලපත්‍රය යනු ඉහත සඳහන් ක්‍රියාකාරකම් සිදු කිරීම සඳහා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් බලය පැවරීමයි. වෙළඳ බලපත්‍ර නිකුත් කිරීමට අදාළව සිදුකරනු ලබන කාර්යයන් පහත දැක්වේ.

- වෙළඳ බලපත්‍ර පිළිබඳ අයදුම්පත් සම්බන්ධයෙන් කටයුතු කිරීම සහ අයදුම්කරු විසින් අවශ්‍ය කොන්දේසි සපුරා ඇති බවට සහතික වීමෙන් පසු බලපත්‍ර නිකුත් කිරීම.
- වෙළඳ බලපත්‍ර පාලන තන්ත්‍රය කළමනාකරණය කිරීම
- වෙළඳ බලපත්‍ර සම්බන්ධ විමර්ශන සඳහා පොලිසිය/අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුව (CID) වැනි ආයතන වලට සහාය වීම.

කේබල් රූපවාහිනී සේවා සපයන්නන්ගේ මෙහෙයුම් අධීක්ෂණය කිරීම

1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ සංශෝධිත පනතේ 17 වැනි වගන්තිය යටතේ නිකුත් කරන ලද පද්ධති බලපත්‍රයේ 22 වැනි පරිච්ඡේදය ප්‍රකාරව, එසේ කිරීමට උපදෙස් දෙන්නේ නම්, දුරකථන ක්‍රියාකරු සමාගම විසින් කොමිෂන් සභාව වෙත තාක්ෂණික, වාණිජ සහ වෙනත් තොරතුරු සැපයීමට බැඳී සිටී.

විදුලි සංදේශ පනතේ 17 වන වගන්තිය යටතේ ජාල අංශය විසින් බලපත්‍රලාභී කේබල් රූපවාහිනී ජාලවලට අදාළ ඉහත තොරතුරු කාර්තුමය වශයෙන් රැස් කරයි.

මාදිලි අනුමැතිය සහ උපකරණ නිෂ්කාශනය

විදුලි සංදේශ පනතේ 5(ට) වගන්තිය ප්‍රකාරව විදුලි සංදේශ පද්ධතියකට සම්බන්ධ කළ හැකි විදුලි සංදේශ උපකරණ මාදිලි අනුමත කිරීමේ වගකීම ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වෙත පවරා ඇත. ඒ අනුව, 5(ට) වගන්තියේ පවරා ඇති රාජකාරී ක්‍රියාත්මක කිරීමේදී, කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද විදුලි සංදේශ උපකරණ සම්බන්ධ කරන ලෙස ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් පනතේ 17 වැනි වගන්තිය ප්‍රකාරව නිකුත් කර ඇති පද්ධති බලපත්‍රයේ උපලේඛන 2 හි සියලුම දුරකථන ක්‍රියාකරු සමාගම් වලට නියම කර ඇත.

එබැවින්, දුරකථන උපකරණ, ෆැක්ස් යන්ත්‍ර, PABX (පුද්ගලික ස්වයංක්‍රිය ශාඛා හුවමාරුව), මොඩම් සහ රැහැන් රහිත දුරකථන වැනි ඕනෑම පාරිභෝගික පරිශ්‍ර උපකරණයක් විදුලි

සංදේශ ජාලයකට සම්බන්ධ කිරීම සඳහා මාදිලි අනුමැතිය අවශ්‍ය වේ. දුරකථන ක්‍රියාකරු සමාගම්, වෙළෙන්දන් හෝ පුද්ගලයන් විසින් ආනයනය කරන ලද පාරිභෝගික පරිශ්‍ර උපකරණ හෝ දේශීයව නිෂ්පාදිත උපකරණ සඳහා මාදිලි අනුමැතිය ලබා ගැනීම අවශ්‍ය වේ.

ජාල අංශය විසින් මාදිලි අනුමැති ක්‍රියා පටිපාටි සිදු කිරීම, රැහැන්ගත පර්යන්ත ජාල උපකරණ සඳහා මාදිලි අනුමැති නිකුත් කිරීම සඳහා වගකීම දරයි.

තවද, ජාල අංශය විසින් සියලුම ජාල ආශ්‍රිත උපකරණ ආනයනය කිරීම සඳහා රේගුව / ආයෝජන මණ්ඩලය / ආනයන පාලක වෙත බලය පැවරීමේ ලිපි නිකුත් කිරීම සඳහා වගකීම දරයි. මේ සම්බන්ධයෙන් සිදු කරන ලද කාර්යයන් පහත දැක්වෙන පරිදි සාරාංශ ගත කර ඇත.

- අනුමත ලිපි නිකුත් කරමින් විදුලි සංදේශ උපකරණ නිෂ්කාශනය කිරීම සඳහා ආයෝජන මණ්ඩල ආනයන පාලක, රේගු දෙපාර්තමේන්තුව වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම.
- ජාල උපකරණ ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ නිර්දේශ සහ මාර්ගෝපදේශවල දක්වා ඇති තාක්ෂණික ප්‍රමිතීන්ට අනුකූල බව සහතික කිරීම.
- විදුලි සංදේශ ආශ්‍රිත කරුණු සම්බන්ධයෙන් පොලිසිය/ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව (CID) යනාදී ආයතන සිදු කරන විමර්ශන සඳහා අවශ්‍ය සහාය ලබා දීම.
- රාජ්‍ය ආයතනවල සහ රාජ්‍ය සංස්ථාවල තාක්ෂණික ඇගයීම් කමිටු (TECs) සඳහා සහභාගී වීම සහ තාක්ෂණික විදුලි සංදේශනය ආශ්‍රිත යෙදවුම් සැපයීම.

කාර්යසාධනය

ජාල අංශය මඟින් සිදු කරනු ලබන ක්‍රියාකාරකම් වලට අදාළ සංඛ්‍යාලේඛන පහත වගුවේ දැක්වේ.

විස්තර	2022	2023
නිකුත් කරන ලද මුළු වෙළඳ බලපත්‍ර සංඛ්‍යාව	756	900
අනුමත කරන ලද සමුච්චිත කුලුනු සංඛ්‍යාව	8077	8450
ලැබුණු මුළු කුලුනු පැමිණිලි සංඛ්‍යාව	125	196
නිරාකරණය කරන ලද මුළු කුලුනු පැමිණිලි සංඛ්‍යාව	125	196
සිදු කරන ලද මුළු තාක්ෂණික විමර්ශන සංඛ්‍යාව (කුලුනු ආශ්‍රිත)	12	52
කුලුනු ආශ්‍රිත මුළු අධිකරණ නඩු සංඛ්‍යාව	0	01
ලබා දී ඇති මුළු නව මාදිලි අනුමැතීන් සංඛ්‍යාව	0	0
මුළු ආනයන නිෂ්කාශන නිකුත් කිරීම් සංඛ්‍යාව	2286	2752
මුළු තනි නිෂ්කාශන සංඛ්‍යාව	35	41
නිකුත් කරන ලද සමුච්චිත නව කෙටි කේත අංක සංඛ්‍යාව	8	13

අංකනය

කෙටි සංකේත අංක වෙන් කිරීම

මහජනතාවට සහ පාරිභෝගිකයින්ට ක්ෂණික දුරකථන ඇමතුම් ලබා ගැනීමේ අවශ්‍යතාවයක් පවතින විට කෙටි සංකේත අංක ආයතන වෙත වෙන් කරනු ලැබේ. ආයතනයේ ස්වභාවය අනුව එක් එක් රාජ්‍ය හා පෞද්ගලික අංශය සඳහා කෙටි සංකේත අංක දෙකක් හඳුන්වා දී ඇත. රාජ්‍ය ආයතන සඳහා ඉලක්කම් හතරකින් සමන්විත 19xx පරාසය ද ඒ හා සමානවම පෞද්ගලික අංශයේ ආයතන සඳහා ඉලක්කම් හතරකින් සමන්විත 13xx පරාසය ද වෙන් කර ඇත.

2023 වසරේ දී වෙන් කරන ලද සංකේත අංක

රාජ්‍ය අංශයේ ආයතන

2023 වසරේ දී, 19xx පරාසයේ කෙටි සංකේත අංක හයක් (6) රාජ්‍ය අංශයේ ආයතන වෙත පවරන ලදී. ආයතන සහ ඒවාට අදාළ කෙටි සංකේත අංක පහත වගුවේ දක්වා ඇත.

ආයතනය	කෙටි සංකේත අංකය
කොළඹ මහ නගර සභාව	1916
ශ්‍රී ලංකා වරාය අධිකාරිය	1984
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව	1901
මිනුම් ඒකකය, ප්‍රමිති සහ සේවා දෙපාර්තමේන්තුව	1902
ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය	1958
මාර්ග සංවර්ධන අධිකාරිය	1968

පුද්ගලික අංශයේ ආයතන

2023 වසරේ දී, 13xx පරාසයේ කෙටි සංකේත අංක හතක් (07) පුද්ගලික අංශයේ ආයතන සඳහා වෙන් කරන ලදී. ආයතන සහ ඒවාට අදාළ කෙටි සංකේත අංක පහත වගුවේ දක්වා ඇත.

ආයතනය	කෙටි සංකේත අංකය
ජාතික සර්වෝදය ශ්‍රමදාන සංගමය	1318
ෆාරා කන්ස්ට්‍රක්ෂන් ඇන්ඩ් මේන්ටේනන්ස් ප්‍රයිවට් ලිමිටඩ්	1336
හේමාස් කැපිටල් හොස්පිටල්ස් ප්‍රයිවට් ලිමිටඩ්	1353
සම්පත් බැංකුව පීඑල්සී	1332
මහින්ද්‍රා අයිඩියල් ෆිනෑන්ස් පීඑල්සී	1363
එලායන්ස් ෆිනෑන්ස් සමාගම පීඑල්සී	1321
සෙලින්කෝ ජෙනරල් ඉන්ෂුවරන්ස් ලිමිටඩ්	1334

යටිතල පහසුකම් ව්‍යාප්ත කිරීම

විදුලි සංදේශ කුලුනු ඉදිකිරීම

බහුකාර්ය පහන් කණු 89ක් බෙදා හැරීම ඇතුළුව 2023 වසරේ දී ඉදිකරන ලද නව කුලුනු 373 ද සහිතව ඉදිකරන ලද සමුච්චිත විදුලි සංදේශ කුලුනු සංඛ්‍යාව 8450 දක්වා වැඩි විය.

යටිතල පහසුකම් ව්‍යාප්තිය පිළිබඳ පැමිණිලි මෙහෙයවීම

විදුලි සංදේශ කුලුනුවල තාක්ෂණික ගැටළු ආශ්‍රිතව මහජනතාව විසින් කරන ලද පැමිණිලි සම්බන්ධයෙන් ජාල අංශය 2023 වසරේ දී තාක්ෂණික විමර්ශන 52 ක් සිදු කරන ලදී. 2023 වසරේ දී පැමිණිලි එකසිය අනූහයක් (196) ලැබී ඇති අතර, ඒ සියලුම පැමිණිලි සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගන්නා ලදී.

අනුමත නොකළ කුලුනු ප්‍රතිසන්ධානය

මෙම වසරේ දී ඇන්ටෙනා ව්‍යුහ කළමනාකරණ පද්ධතියේ දත්ත සමඟ දැනටමත් ක්‍රියාත්මක වන දුරකථන ක්‍රියාකරු සමාගම්වල ගුවන් අඩවි ලැයිස්තුව අඛණ්ඩව ප්‍රතිසන්ධානය කරන ලදී. ජංගම දුරකථන ක්‍රියාකරුවන් පස් දෙනෙකු සඳහා මෙම ප්‍රතිසන්ධාන ක්‍රියාවලිය අවසන් කර ඇති අතර, අනුමත නොකළ කුලුනු විධිමත් කිරීම සඳහා අලුතින් අයදුම්පත් ඉදිරිපත් කරන ලෙස ඔවුන්ගෙන් ඉල්ලා සිටින ලදී. ඒ අනුව, අදාළ රාජ්‍ය ආයතනවල නිර්දේශ මත දැනටමත් ඉදිකර ඇති අනුමත නොකළ කුලුනු කිහිපයක් සඳහා අනුමැතිය ලබා දී ඇත.

එක් දුරකථන ක්‍රියාකරු සමාගමක දත්ත ප්‍රතිසන්ධාන ක්‍රියාවලිය සිදු කෙරෙමින් පවතී.

වෙළඳ බලපත්‍ර ලබා දීම

2023 වර්ෂයේදී විවිධ වර්ගයේ විදුලි සංදේශ උපකරණ වෙළෙන්දන් සඳහා වෙළඳ බලපත්‍ර 900 ක් නිකුත් කරන ලදී.

මාදිලි අනුමැතිය සහ උපකරණ නිෂ්කාශනය

ජාල අංශය විසින් ජාල ආශ්‍රිත උපකරණ ආනයනය කිරීම සඳහා මාදිලි අනුමැතිය ලබාදීම සහ නිෂ්කාශන ලිපි නිකුත් කිරීමට අදාළව කරන ලද ඉල්ලීම් සම්බන්ධයෙන් කටයුතු කිරීමෙහි ලා අංශය වෙත පැවරී ඇති නියාමන කාර්යයන් අඛණ්ඩව සිදු කරන ලදී.

විස්තරය	2023 වසරේ දී නිකුත් කරන ලද නිෂ්කාශන සංඛ්‍යාව
උපකරණ නිෂ්කාශනය	2752
මාදිලි අනුමැතිය ලබා දීම	-

සංඛ්‍යාත වර්ණාවලි කළමනාකරණය

ඉදිරි වසර 5 සඳහා සංඛ්‍යාත වර්ණාවලි මාර්ග සිතියම

විදුලි සංදේශ ක්ෂේත්‍රයේ අඛණ්ඩ පරිණාමයක් දක්නට ලැබෙන අතර, වර්තමානයේ දී පස්වන පරම්පරාවේ ජංගම තාක්ෂණය (5G) මඟින් ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරනු ලබයි. 4G මඟින් ජංගම බ්‍රෝඩ්බෑන්ඩ් සේවා සැපයීම සඳහා කැපවී සිටින අතර, 5G මඟින් අතිශය විශ්වාසනීය වේගවත් සන්නිවේදනය (Ultra Reliable Low Latency Communications) සහ දැවැන්ත යාන්ත්‍රික මාදිලියේ සන්නිවේදනය (massive Machine Type Communications) වැනි වැඩිදියුණු කළ පාරිභෝගික ජංගම බ්‍රෝඩ්බෑන්ඩ් සේවාවලින් (eMBB) ඔබ්බට වැඩිදියුණු වූ අවස්ථාවන් සලසයි. 5G හි සුවිශේෂී ගුණාංගය වන්නේ සමාජීය සහ කාර්මික ක්ෂේත්‍රයේ අවස්ථා වෙනුවෙන් පහසුකම් සැලසීමයි. මෙමඟින් සිදු වන්නේ ජංගම සේවා සඳහා වන සමස්ථ ගෝලීය ඉල්ලුම තවදුරටත් අඛණ්ඩව පවත්වාගෙන යන අතර, ජංගම සේවා සක්‍රීය කිරීම සඳහා අවශ්‍ය සම්පතක් වන සංඛ්‍යාත වර්ණාවලිය ප්‍රයෝජනයට ගැනීම නිසැක කිරීම සඳහා සංඛ්‍යාත වර්ණාවලිය කළමනාකරණය කිරීමේ ආයතන මත වගකීම පැවරීමයි.

පැහැදිලි ආවරණය සහ වේගය සැලකිල්ලට ගෙන 5G සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා විවිධ පරාසයන් පහළ, මැද සහ මිලිමීටර් තරංග (lower, middle, and mmWave) ඔස්සේ අඛණ්ඩව සංඛ්‍යාත වර්ණාවලිය බෙදා හැරීම අවශ්‍ය වේ. ඊට සමගාමීව, තාක්ෂණික අළෙවිකරුවන් සහ සේවා සපයන්නන් විසින් සිය පවතින සංඛ්‍යාත වර්ණාවලි සම්පත් වැඩිදියුණු කිරීම සඳහා කැපවීමෙන් නව උපාය මාර්ග ගවේෂණය කරයි. වැඩිදියුණු කළ ඇන්ටෙනා තාක්ෂණය, සංඛ්‍යාත වර්ණාවලිය ප්‍රතිසංස්ථාපනය කිරීම, සංඛ්‍යාත වර්ණාවලිය ඒකාබද්ධ කිරීම සහ සක්‍රීයව සංඛ්‍යාත වර්ණාවලිය බෙදාහැරීම ක්‍රියාත්මක කිරීම මෙයට ඇතුළත් ය. වෙනස්වන අවශ්‍යතා සපුරාලීම පිණිස සංඛ්‍යාත වර්ණාවලියේ කාලානුරූපී බව සහතික කිරීම සහ රෙගුලාසි වෙනස් කිරීමේ අවශ්‍යතාවයක් පවතී.

මෙම කරුණු මඟින් අවධාරණය කරන්නේ සංඛ්‍යාත වර්ණාවලි කළමනාකරණ ප්‍රයත්නයන් ක්‍රමානුකූලව සහ විනිවිදභාවයෙන් මෙහෙයවීම සඳහා රාමුවක් ස්ථාපනය කිරීමේ අවශ්‍යතාවයයි. මෙය 2023 සිට 2028 දක්වා සිදුකිරීමට නියමිත වර්ණාවලිය බෙදාහැරීමේ අනාගත සැලැස්ම සහ වර්ණාවලිය ආශ්‍රිත ප්‍රතිපත්ති පිළිබඳ ඉදිරි සමාලෝචනය වන සංඛ්‍යාත වර්ණාවලිය පිළිබඳ ප්‍රධාන සැලැස්මේ අරමුණ වේ. මෙම සැලැස්ම ශ්‍රී ලංකාවේ සන්දර්භයට අදාළ වන ජාත්‍යන්තර ප්‍රශස්ත භාවිතයන් ඒකාබද්ධ කිරීම මඟින් සකස් කර ඇත. මෙම සංඛ්‍යාත වර්ණාවලි මාර්ග සිතියම සකස් කර ඉදිරි වසර පහ සඳහා (2024-2029) ප්‍රකාශයට පත් කරන ලදී.

මෙම සංඛ්‍යාත වර්ණාවලි මාර්ග සිතියම ප්‍රකාශයට පත් කිරීම මඟින් සංඛ්‍යාත වර්ණාවලිය භාවිතා කරන්නන්ට සංඛ්‍යාත වර්ණාවලි භාවිතය සහ පැවැත්ම පිළිබඳ පුළුල් අවබෝධයක් ලබා දෙන අතර වාණිජමය ක්‍රියාකරුවන්ට ජාල ආයෝජන සැලසුම් කිරීමේදී සහාය වේ. කර්මාන්තයේ ශීඝ්‍ර සහ අඛණ්ඩ පරිවර්තනය හඳුනාගැනීම අවශ්‍ය වන අතර මෙම සැලැස්ම මඟින් ක්ෂේත්‍රයේ විනිවිදභාවය සහ ස්ථායිභාවය ලබා දීම අරමුණු කරගෙන ඇති අතර, තිරසාරභාවයේ වැදගත්කම සහතික කිරීම සඳහා වරින් වර සමාලෝචනයක් (සෑම වසර තුනකට වරක්) සිදු කිරීම අවශ්‍ය කෙරේ.

ජාතික සංඛ්‍යාත වෙන් කිරීමේ වගුව (NFAT)

ජාතික සංඛ්‍යාත වෙන්කිරීමේ වගුව (NFAT) ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ (ITU) ගුවන්විදුලි රීතිවල 5 වැනි වගන්තිය ප්‍රකාරව ජාත්‍යන්තර සංඛ්‍යාත වෙන්කිරීම් මත සැකසෙන අතර කලාපීය ප්‍රතිපාදන සමඟ ද අනුකූල වේ. ගුවන්විදුලි රීති සාමාන්‍යයෙන් සෑම වසර තුනකට වරක් පවත්වනු ලබන ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ ලෝක ගුවන්විදුලි සන්නිවේදන සමුළුවේ (WRC) දී සංශෝධනය කරනු ලැබේ. ජාත්‍යන්තර සංඛ්‍යාත වෙන්කිරීමේ වගුව (NFAT) මඟින් ශ්‍රී ලංකාවේ සියලුම සංඛ්‍යාත පරාස සහ එම පරාස සඳහා වෙන් කර ඇති සේවාවන් සඳහන් කරයි. ජාතික සංඛ්‍යාත වෙන් කිරීමේ වගුව (NFAT) සකස් කර ප්‍රකාශයට පත් කර ඇත.

ගුවන්විදුලි සංඛ්‍යාත වර්ණාවලි බලපත්‍ර රීති (RFSL)

බලපත්‍රයක් යනු ගුවන්විදුලි සන්නිවේදන උපකරණ ක්‍රියාත්මක කිරීමට හෝ ගුවන්විදුලි සන්නිවේදනයක් ක්‍රියාත්මක කිරීමට ප්‍රදානය කරනු ලබන ඒකපාර්ශ්වික අවසරයක් වන අතර එය කොන්ත්‍රාත්තුවක් හෝ ද්විපාර්ශ්වික ගිවිසුමක් ලෙස නොසැලකිය යුතුය. පනතේ 22(2)(ආ) වගන්තිය යටතේ බලපත්‍රය ලබා දීමෙන් පරිශීලක කාණ්ඩය නිදහස් කර ඇත්නම් මිස ගුවන්විදුලි උපකරණ භාවිතය සඳහා අදාළ ගාස්තුව ගෙවීමෙන් පසු බලපත්‍රයක් ලබා ගැනීම අවශ්‍ය කෙරේ. ගුවන්විදුලි සංඛ්‍යාත වර්ණාවලි බලපත්‍ර රීති (RFSL) ජාත්‍යන්තර විදුලි සංදේශ මාර්ගෝපදේශ වලට අනුකූලව සකස් කර අවසන් කර ඇති අතර ඒවා දැනට මුද්‍රණ මට්ටමේ පවතී.

5G උපදේශන පත්‍රිකාව පාර්ශවකරුවන්ගේ අදහස් ලබා ගැනීම සඳහා ප්‍රකාශයට පත් කරන ලදී.

2022 වසරේ දී මුහුණ දුන් ආර්ථික පසුබැම්ම ශ්‍රී ලංකාව අත්විඳිමින් සිටී. 5 වන පරම්පරාවේ (5G) ජංගම තාක්ෂණ ඇතුළුව වැඩිදියුණු වූ බ්‍රෝඩ්බෑන්ඩ් සේවා යටිතල පහසුකම් ඒකාබද්ධ කිරීම, වත්මන් සේවාවන් වැඩිදියුණු කිරීම, නව භාවිත අවස්ථා හඳුන්වා දීම සහ රට ලාභදායී ආයෝජන ස්ථානයක් ලෙස හුවා දැක්වීම මඟින් මෙම ප්‍රතිසාධන ක්‍රියාවලිය උදෙසා සැලකිය යුතු දායකත්වයක් සැපයිය හැකිය. එසේ වුවද, ශ්‍රී ලාංකීය විදුලි සංදේශ ක්‍රියාකරු සමාගම් ආර්ථික දුෂ්කරතා හේතුවෙන් ඉහළ ගිය පිරිවැය සහ පාරිභෝගික ඉල්ලුම / වියදම් අඩුවීමට මුහුණ දී සිටිති. පවතින ආර්ථික වාතාවරණය තුළ 5G සේවා සඳහා ඇති ඉල්ලුමේ අඩුවීම සහ නව වර්ණාවලිය සඳහා ඔවුන් යටත් විය හැකි අධික වර්ණාවලි ගාස්තු, විශේෂයෙන් එය වෙන්දේසියක් හරහා ලබා ගන්නේ නම්, සම්බන්ධයෙන් ඔවුන් අවධානය යොමු කර ඇත.

වත්මන් වෙළඳපල පරිසරය සහ වෙළඳපලේ වඩාත් හිතකර තත්ත්වයක් ඇති කිරීමේ හැකියාව, 4G සහ 5G සේවා සඳහා පවත්නා වත්මන් සහ අනාගත ඉල්ලුම (ස්ථාවර සහ ජංගම යන දෙකම) මෙන්ම ලබා දී ඇති වෙළඳපල තත්ත්වයන් තුළ 5G සේවා ව්‍යාප්ත කිරීම සඳහා ප්‍රශස්ත ඉදිරි මාර්ගය සහ වර්තමානයේ දී සංඛ්‍යාත වර්ණාවලිය පැවරීමේ අසමතුලිතතාවයන් සහ ඒවා විසඳන්නේ කෙසේද යන්න සඳහා වන යෝජනා, සහ අදහස් ලබාදෙන ලෙස ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව පාර්ශවකරුවන්ගෙන් ඉල්ලා සිටී. උපදේශන පත්‍රිකාවේ තවදුරටත් විස්තර කර ඇති පරිදි, විවිධ සංඛ්‍යාත පරාසවල අවශ්‍ය සංඛ්‍යාත වර්ණාවලිය කෙරෙහි අවධානය යොමු කරමින්, සිය වර්තමාන සංඛ්‍යාත වර්ණාවලි ඉල්ලුම සහ ඉදිරි වසර දහය සඳහා ඔවුන්ගේ සැලසුම් ප්‍රකාශ කරන ලෙස දුරකථන ක්‍රියාකරු සමාගම් වලට ආරාධනා කෙරේ.

සංඛ්‍යාත බලපත්‍ර නිකුත් කිරීම

සේවා කාණ්ඩය	වර්ෂය	
	2022	2023
ස්ථාවර සේවාව	45	43
විකාශන සේවාව (රූපවාහිනී සහ ගුවන්විදුලිය)	44	30
දත්ත / ගුවන් විදුලි ටෙලිමෙට්‍රි සේවාව	24/33	28/19
සෙලෙයුලර් සේවාව (ජංගම ක්‍රියාකරුවන්)	05	04
ගුවන් සේවා		
(i) ගුවන් යානා මධ්‍යස්ථාන	71	75
(ii) ගුවන් යානා ජංගම	08	11
සමුද්‍රීය සේවා		
සමුද්‍රීය ජංගම	834	1192
නාවික මධ්‍යස්ථාන	71	110
පුද්ගලික ජංගම ගුවන් විදුලි සේවාව	143	300
ආධුනික ගුවන් විදුලිය	66	52

ලැබුණු පැමිණිලි සහ මෙහෙයවන ලද විමර්ශන කටයුතු

සේවාව	ලැබුණු පැමිණිලි සංඛ්‍යාව	
	2022	2023
රූපවාහිනී සහ ශබ්ද විකාශනය	3	1
වෙනත් සේවා	14	17

නිෂ්කාශන ලිපි නිකුත් කිරීම

සේවා කාණ්ඩය	වර්ෂය	
	2022	2023
සංකේත විබෙදුම් බහුවිධ ප්‍රවේශ (CDMA) ඇතුළු ස්ථාවර සේවාව	650	464
විකාශන සේවාව (රූපවාහිනී සහ ගුවන්විදුලිය)	50	40
සෙලෙයුලර් ජංගම සේවා		
(i) බෙදාහැරීමේ බලපත්‍ර	5340	5858
(ii) ජංගම ක්‍රියාකරුවන්	1695	1602
(iii) පුද්ගලික ජංගම ගුවන් විදුලිය	69	38
දත්ත සේවාව/ ගුවන්විදුලි ටෙලිමෙට්‍රි	12/1	28/0
චන්ද්‍රිකා සේවාව	86	84
ආධුනික ගුවන්විදුලි	15	32
අඩු බල උපාංග	1840	1311

(i) වෙළඳ බලපත්‍රලාභීන්	887	1051
(ii) තනි පාරිභෝගිකයන්	953	260
සමුද්‍රීය සන්නිවේදනය	87	65
නාවික මධ්‍යස්ථාන		

* තාවකාලික දත්ත

තරඟකාරිත්ව අංශය

ග්‍රාහක පදනම

2023 දෙසැම්බර් 31 වන දිනට ජංගම සහ ස්ථාවර ප්‍රවේශ ග්‍රාහක පදනම 32,639,669 කි. 2022 වර්ෂයේ පෙන්නුම් කළ ප්‍රවණතාවයෙන් පසුව, 2022 වසරට සාපේක්ෂව සෙලෙයුලර් ජංගම දුරකථන ක්‍රියාකරු සමාගම්වල ග්‍රාහක පදනම 2.6% කින් අඩුවීමක් පෙන්නුම් කර ඇත. 2022 වසරේ දී ස්ථාවර ප්‍රවේශ දුරකථන ක්‍රියාකරු සමාගම්වල ග්‍රාහක පදනමේ සුළු වැඩි වීමක් පෙන්නුම් කළේය. කෙසේ වෙතත්, ස්ථාවර ප්‍රවේශ ක්‍රියාකරු ග්‍රාහක පදනමේ 7% ක අඩුවීමක් පෙන්නුම් කරන ලද අතර, එය 2022 වසරට සාපේක්ෂව මුළු ග්‍රාහක පදනමේ 3.1% ක අඩුවීමකට තුඩු දෙන ලදී.


වර්ගය	2022 මිලි.	2023 මිලි.	% වෙනස
ජංගම	29.8	29.1	-2.6%
ස්ථාවර	3.8	3.6	-7.0%
එකතුව	33.6	32.6	-3.1%

දුරකථන ක්‍රියාකරු සමාගම්වල ආදායම

2023 වසරේ දී සමස්ථ ග්‍රාහක පදනම අඩු වුවද, කර්මාන්තයේ ආදායම 1.02% වැඩිවීමක් පෙන්නුම් කරමින් මිලියන 307.7 සිට මිලියන 315.5 දක්වා සුළු වශයෙන් වැඩි විය. මෙම වැඩිවීමට ප්‍රධාන හේතුව වූයේ 2022 සැප්තැම්බර් මාසයේ දී කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද දුරකථන අයකුම 20% කින් වැඩිවීමයි.

කර්මාන්තය	2022 රු. මිලි.	2023* රු. මිලි.
ජංගම	170,516	172,368
ස්ථාවර	137,157	143,184
එකතුව	**307,673**	**315,552**

* විගණනය නොකළ



දුරකථන ක්‍රියාකරු සමාගම්වල ලාභය

ස්ථාවර ප්‍රවේශ දුරකථන ක්‍රියාකරු සමාගම්වල ලාභය 2022 වසර දක්වා ඉහළ ගොස් ඇති අතර 2023 වර්ෂයේදී කැපී පෙනෙන ලෙස අඩු වී ඇති බව පහත වගුවේ දැක්වේ. පහත වගුව ප්‍රකාරව ජංගම දුරකථන ක්‍රියාකරු සමාගම් 2023 වසරේ දී රුපියල් මිලියන 746 ක අලාභයක් වාර්තා කර ඇත. පෙර වර්ෂය හා සසඳන විට 2023 වර්ෂයේ දී ජංගම දුරකථන ක්‍රියාකරු සමාගම්වල පාඩුව රු. බිලියන 54.8 සිට බිලියන 0.7 දක්වා බෙහෙවින් අඩු වී ඇත.

කර්මාන්තය	2022 රු. මිලි.	2023* රු. මිලි.
ජංගම	(54,803)	(746)
ස්ථාවර	11,492	4,949
එකතුව	**(43,311)**	**4,203**

* විගණනය නොකළ

ජංගම සහ ස්ථාවර ප්‍රවේශ ක්‍රියාකරු සමාගම්වල එක් පරිහරණය කරන්නෙකුගෙන් ලැබෙන ආදායමේ සාමාන්‍යය (ARPU)


ජංගම දුරකථන ක්‍රියාකරු කාණ්ඩය සඳහා 2023 වර්ෂය සඳහා එක් පරිහරණය කරන්නෙකුගෙන් ලැබෙන ආදායමේ සාමාන්‍යය (වසරකට) රුපියල් 5,933 ක් වූ අතර එය 2022 වසරේ එක් පරිහරණය කරන්නෙකුගෙන් ලැබෙන ආදායමේ සාමාන්‍යය හා සසඳන විට 3.8% ක වැඩිවීමක් පෙන්නුම් කරයි. ස්ථාවර ප්‍රවේශ ක්‍රියාකරු කාණ්ඩය ද පසුගිය වසරට සාපේක්ෂව 12.3% ක වර්ධනයක් පෙන්නුම් කරයි.

කාණ්ඩය	2022	2023	% වෙනස
ජංගම	5,717	5,933	3.8%
ස්ථාවර ප්‍රවේශ	35,524	39,904	12.3%

විදුලි සංදේශ කර්මාන්තයේ ආයෝජන

පහත ප්‍රස්ථාරයෙන් 2021 සිට 2022 වසර දක්වා ජංගම සහ ස්ථාවර ප්‍රවේශ දුරකථන ක්‍රියාකරු සමාගම් විසින් කරන ලද නව ආයෝජන නිරූපණය කෙරේ. [ආයෝජනවලට දේපළ, පිරියත සහ උපකරණ, අස්පෘශ්‍ය වත්කම්, සහ ක්‍රියාත්මක වෙමින් පවතින වැඩවල එකතුව ඇතුළත් වේ]. 2021 වසර හා සන්සන්දනය කිරීමේ දී 2022 වසරේ කර්මාන්ත ආයෝජනය රු. බිලියන 112 සිට බිලියන 162 දක්වා වැඩි වී ඇත.

කර්මාන්තය	2021 රු. මිලි.	2022* රු. මිලි.
ජංගම	58,680	86,184
ස්ථාවර	53,763	75,630
එකතුව	112,443	161,814



සෘජු රැකියා අවස්ථා


විදුලි සංදේශ කර්මාන්තය සෘජු හා වක්‍ර රැකියා අවස්ථා රාශියක් උත්පාදනය කර ඇති අතර, පසුගිය වසර දෙක තුළ ස්ථාවර ප්‍රවේශ දුරකථන ක්‍රියාකරු සමාගම් සහ ජංගම දුරකථන ක්‍රියාකරු සමාගම්වල සෘජු රැකියා අවස්ථා පහත වගුවේ දැක්වේ. 2020 වසරේ අග භාගයේ සිට ආරම්භ වන රටේ ආර්ථික පරිහානිය හේතුවෙන් කර්මාන්තයේ සෘජු රැකියා අවස්ථා ක්‍රමයෙන් අඩුවෙමින් පවතී.

වර්ගය	රැකියා සංඛ්‍යාව	
	2022	2023
ජංගම	7,516	7,076
ස්ථාවර	4,235	3,491
එකතුව	**11,751**	**10,567**

සේවා භාවිතය


සන්නිවේදන නාලිකාවක් හරහා ගෙන යන දේශීය සහ ජාත්‍යන්තර පණිවුඩවල මිනිත්තු ගණන

පහත ප්‍රස්ථාරයේ දැක්වෙන්නේ පසුගිය වසර කිහිපය තුළ දේශීය සහ ජාත්‍යන්තර ඇමතුම් මිනිත්තු ගණන වන අතර සෑම වසරකම දේශීය මිනිත්තු ගණන වැඩි වී ඇත. කෙසේ වෙතත්, මුළු මිනිත්තු ගණන වැඩි වී ඇතත්, ජාත්‍යන්තර මිනිත්තු ගණනේ අඩුවීමක් පෙන්නුම් කරයි.



දත්ත භාවිතය

ජංගම සහ ස්ථාවර ප්‍රවේශ විදුලි සංදේශ අංශ විසින් 2022 වසරට සාපේක්ෂව සිය දත්ත භාවිතයේ වර්ධනයක් පෙන්නුම් කර ඇති අතර එය 15.9% කර්මාන්ත වර්ධනයකි. ජංගම දුරකථන අංශයේ වර්ධනය ස්ථාවර දුරකථන අංශයේ වර්ධනයට වඩා සැලකිය යුතු ලෙස වර්ධනය වී ඇත.



සමාජ මාධ්‍ය භාවිත කරන්නන් (ජංගම)

ලොව පුරා බොහෝ රටවල මෙන් ශ්‍රී ලංකාවේ සන්නිවේදන ක්ෂේත්‍රයේ ද සමාජ මාධ්‍ය ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. පහත වගුවට අනුව, ෆේස්බුක්, යූ ටියුබ් සහ වට්ස්ඇප් ශ්‍රී ලාංකිකයන්ගේ ජනප්‍රියම සමාජ මාධ්‍ය යෙදුම් වේ. 2023 දෙසැම්බර් 31 අවසන් වන විට ඉහත කී යෙදුම් තුන සඳහා මුළු දායකත්වයන් මිලියන 44.4 ක් පමණ විය. එය මුළු සමාජ මාධ්‍ය භාවිතා කරන්නන්ගෙන් 60% ක් පමණ නියෝජනය කරයි. කෙසේ වෙතත්, 2022 වසර හා සසඳන විට, ඉන්ස්ටග්‍රෑම් භාවිතා කරන්නන් 81.5% කින් වැඩි වී ඇති අතර, 2023 වසර අවසාන වන විට ස්නැප්චැට් හී 52.3% ක වැඩිවීමක් පෙන්නුම් කරයි. තවද, එමඟින් 2022 වසරට සාපේක්ෂව 2023 වර්ෂයේදී 25% කින් සමස්ත සමාජ මාධ්‍ය භාවිතා කරන්නන්ගේ වැඩි වීමක් පෙන්නුම් කරයි.

මාධ්‍යය	පරිශීලකයින් සංඛ්‍යාව		% වෙනස
	2022 මිලි.	2023 මිලි.	
ෆේස්බුක්	12.9	14.1	9.7%
යූ ටියුබ්	12.8	13.9	8.7%
වට්ස්ඇප්	13.4	16.5	23.2%
වයිබර්	4.6	4.8	5.6%
ඉමෝ	2.3	3.2	39%
ඉන්ස්ටග්‍රෑම්	3.8	6.9	81.5%
ස්නැප්චැට්	4.1	6.2	52.3%
ටික්ටොක්	6.3	8.3	32%
එකතුව	**59.3**	**74.1**	**24.9%**

ජංගම දුරකථන / ජංගම සන්නිවේදන (ජාලයක දත්ත ප්‍රවාහයට යොදා ගන්නා) උපකරණ

1980 දශකයේ අග භාගයේ සිට ශ්‍රී ලංකාව තුළ ජංගම විදුලි සංදේශ සේවා ලබා ගත හැකි විය. එහි ආරම්භයේ දී ඇනලොග් තාක්ෂණය හරහා සේවාවන් සපයන ලදී. 1990 ගණන්වල මැද භාගයේදී ජංගම තාක්ෂණය ඇනලොග් සිට ඩිජිටල් තාක්ෂණයට මාරු කරන ලද අතර එය GSM (ජංගම සන්නිවේදනය සඳහා ගෝලීය පද්ධතිය) ලෙස හඳුනා ගන්නා ලදී. ජංගම සන්නිවේදනය සඳහා වූ ගෝලීය පද්ධතිය 2 වන පරම්පරාව මඟින් (GSM 2nd Generation - 2G) දුරකථන ක්‍රියාකරු සමාගම් වලට ඔවුන්ගේ ජංගම පාරිභෝගිකයින් සඳහා කෙටි පණිවුඩ සේවා (SMS) සහ පොදු පැකට් ගුවන්විදුලි සේවා (GPRS) වැනි හඬ සහ මූලික දත්ත සේවා සැපයීමට සහාය වේ. කෙසේ වෙතත්, ජංගම සන්නිවේදනය සඳහා වූ ගෝලීය පද්ධති (GSM) තාක්ෂණයේ දියුණුව සහ තෙවන පරම්පරාව (3G) සහ සිව්වන පරම්පරාව (4G) ජාල හඳුන්වාදීමත් සමඟ ජංගම බ්‍රෝඩ්බෑන්ඩ් සේවාවන් ජනප්‍රිය විය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, පාරිභෝගිකයින් ස්මාර්ට් ෆෝන්, ටැබ්, ඩොංගල් වැනි වඩාත් නවීන සහ ජංගම උපකරණ වෙත මාරු විය. 2023 දෙසැම්බර් 31 වැනි දිනට ජංගම දුරකථන ජාලවලට සම්බන්ධ කරන ලද සන්නිවේදන උපකරණ පිලිබඳ විස්තර පහත වගුවේ දැක්වේ. 2022 වසරට වඩා 8.9%ක වැඩිවීමක් පෙන්නුම් කරමින් මුළු සන්නිවේදන උපකරණ සංඛ්‍යාවෙන් 64.9%ක කොටසක් ස්මාර්ට් ෆෝන් සහ ටැබ් වලින් ආවරණය වන බව අවධාරණය කෙරේ.

වර්ගය	උපකරණ සංඛ්‍යාව		% වෙනස
	2022 මිලි.	2023 මිලි.	
මූලික/ විශේෂාංග දුරකථන	8.5	8.1	-5.1%
ස්මාර්ට් දුරකථන/ ටැබ්	15.9	17.3	8.9%
ඩොංගල්/ රවුටර්	0.3	0.3	6.3%
වෙනත්	1.0	1.0	0.6%
එකතුව	**25.6**	**26.6**	3.9%

ජංගම දුරකථන ග්‍රාහකයින්ගේ පළාත් ව්‍යාප්තිය (VLR පදනම)

නිදහසේ චලනය වීමේ හැකියාව (සංචලනය) ජංගම තාක්ෂණයේ අන්තර්ගත අංගයක් වන බැවින්, පාරිභෝගිකයින්ට අදාළ පාර්ශව සමඟ සම්බන්ධතා ඇති ව ලොව පුරා ගමන් කළ හැකිය (ජංගම

සෙලෙයුලර් ජාලයක් තිබේ නම්). මෙම නිදහසේ වලනය වීමේ හැකියාව හේතුවෙන්, දී ඇති භූගෝලීය ප්‍රදේශයක් සඳහා නිශ්චිතව ග්‍රාහකයින් සංඛ්‍යාව ලබා ගැනීම දුෂ්කර ය. ජංගම දුරකථන ක්‍රියාකරුවන්ගේ පළාත් ව්‍යාප්තිය (VLR) අනුව 2023 දෙසැම්බර් අවසානයේ එක් එක් පළාතේ ජංගම දුරකථන ග්‍රාහකයින් සංඛ්‍යාව පහත වගුවෙන් දැක්වේ. ජංගම දුරකථන ග්‍රාහකයින්ගෙන් 37%ක් බස්නාහිර පළාත තුළ වාර්තා වී ඇති අතර, ඒ අනුව බස්නාහිර පළාත වැඩිම ජංගම දුරකථන ඝනත්වය පෙන්නුම් කරන අතර ඌව පළාත අඩුම ජංගම දුරකථන ඝනත්වය පෙන්නුම් කරයි.

පළාත	ග්‍රාහකයින් සංඛ්‍යාව (මිලි.) සහ %		ජංගම දුරකථන ඝනත්වය %
බස්නාහිර	7.6	37%	123.2
දකුණ	2.2	11%	81.7
මධ්‍යම	2.3	11%	83.2
ඌව	0.9	4%	62.1
නැගෙනහිර	1.3	7%	74.6
උතුරු මැද	1.3	6%	90.3
වයඹ	2.2	11%	85.7
උතුර	1.0	5%	89.2
සබරගමුව	1.5	8%	74.1
මුළු එකතුව	**20.3**	**100%**	**92.3**

සටහන: ජංගම දුරකථන ඝනත්වය ගණනය කිරීම සඳහා ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත් කරන ලද 2023 වසර මැද (ඇස්තමේන්තු ගත) ජනගහන තොරතුරු සලකා බලා ඇත.

ස්ථාවර ප්‍රවේශ ග්‍රාහකයින්ගේ පළාත් ව්‍යාප්තිය

පහත වගුව ප්‍රකාරව, ස්ථාවර ප්‍රවේශ දුරකථන සම්බන්ධතාවලින් 50%ක් බස්නාහිර පළාතේ පාරිභෝගිකයන් වෙත ලබා දී ඇත. බස්නාහිර පළාතේ ස්ථාවර ප්‍රවේශ දුරකථන ඝනත්වය 28.0% කි. ඌව, නැගෙනහිර සහ උතුරු මැද පළාත්වල අඩුම දුරකථන ඝනත්වයක් පෙන්නුම් කරයි.

පළාත	ග්‍රාහකයින් සංඛ්‍යාව (මිලි.) සහ %		ස්ථාවර දුරකථන ඝනත්වය %
බස්නාහිර	1.7	50.5 %	123.2
දකුණ	0.3	9.5%	81.7
මධ්‍යම	0.3	9.9%	83.2
ඌව	0.1	3.3%	62.1
නැගෙනහිර	0.1	4.2%	74.6
උතුරු මැද	0.1	3.4%	90.3
වයඹ	0.3	9.3%	85.7
උතුර	0.1	3.7%	89.2
සබරගමුව	0.2	6.3%	74.1
එකතුව	**3.4**	**100%**	**92.3**

ස්ථාවර ප්‍රවේශ තාක්ෂණයන්

දැනට, ශ්‍රී ලංකාවේ පුරවැසියන්ට ස්ථාවර ප්‍රවේශ දුරකථන සේවා සැපයීම පිණිස දුරකථන ක්‍රියාකරුවන් තිදෙනෙකුට බලපත්‍ර ලබා දී ඇති අතර, ස්ථාවර දුරකථනවල මුළු පාරිභෝගික පදනමෙන් 13.7%ක් තඹ රැහැන් සහ රැහැන් රහිත බහුවිධ ප්‍රවේශ තාක්ෂණය (CDMA) හරහා සපයනු ලබන හඬ දුරකථන සේවා වශයෙන් සපයයි. බොහෝ පාරිභෝගිකයින් විසින් විවිධ ප්‍රවේශ තාක්ෂණයන් හරහා සපයනු ලබන හඬ සහ දත්ත සේවා දෙකම පරිභෝජනය කරයි. ෆයිබර් සහ රැහැන් රහිත තාක්ෂණය (LTE) පාරිභෝගිකයින් අතර වඩාත් ජනප්‍රිය වෙමින් පවතින්නේ එවැනි තාක්ෂණයන් බ්‍රෝඩ්බෑන්ඩ් සේවා සඳහා සහාය වන බැවිනි. ස්ථාවර ප්‍රවේශ දුරකථන සේවා වර්ග සහ එවැනි තාක්ෂණයන් යටතේ ඇති සම්බන්ධතා ගණන පහත වගුවේ විස්තර කෙරේ.

වර්ගය	සම්බන්ධතා සංඛ්‍යාව		% වෙනස
	2022 මිලි.	2023 මිලි.	
කොපර් සම්බන්ධතා (Copper Line)	0.56	0.48	-14.8%
අසමමිතික සංඛ්‍යාංක ග්‍රාහක රැහැන (ADSL)	0.29	0.24	-16.7%
ෆයිබර් (Fiber)	0.42	0.44	3.9%
සංකේත විබෙදුම් බහුවිධ ප්‍රවේශ (CDMA)	0.09	0.05	-95.0%
දිගු දුර පරිණාමය (LTE)	2.28	2.12	-6.9%
වෙනත්	0.22	0.22	-0.3%
එකතුව	**3.86**	**3.50**	**-9.2%**

විදුලි සංදේශ බදු (TL)


ශ්‍රී ලංකා රජය විසින් විදුලි සංදේශ බද්ද 2011 දී විදුලි සංදේශ කර්මාන්තය සඳහා "තනි අනුපාත බද්දක්" ලෙස හඳුන්වා දෙන ලදී. මුලදී, බදු අනුපාතය සේවා සැපයීමේ වටිනාකම මත 20% ක් විය. 2013 වසර ආරම්භයේදී අන්තර්ජාල සේවා සඳහා 10%ක සහනදායී විදුලි සංදේ අනුපාතයක් පනවන ලදී. රට පුරා බ්‍රෝඩ්බෑන්ඩ් සේවා ප්‍රවර්ධනය කිරීම සඳහා අනෙකුත් විදුලි සංදේශ සේවා සඳහා විදුලි සංදේශ බදු ගාස්තුව නොවෙනස්ව පැවතුනි. 2014 ජනවාරි මාසයේදී විදුලි සංදේශ බදු අනුපාතය 20% සිට 25% දක්වා වැඩි කරන ලද අතර අන්තර්ජාල සේවා සඳහා විදුලි සංදේශ බදු අනුපාතය 10% ලෙස නොවෙනස්ව පැවතුනි. පසුව, 2017 සැප්තැම්බර් මාසයේ සිට ක්‍රියාත්මක වන පරිදි, අන්තර්ජාල සේවා සඳහා වූ බද්ද අහෝසි කරන ලද අතර, එහි ප්‍රතිඵලයක් වශයෙන් 2016 වසරට සාපේක්ෂව 2017 වසර සඳහා එකතු කරන ලද විදුලි සංදේශ බදුවල අඩුවීමක් සිදු විය. 2018 නොවැම්බර් මාසයේදී විදුලි සංදේශ සේවා සඳහා විදුලි සංදේශ බදු අනුපාතය 25% සිට 15% දක්වා වෙනස් කරන ලදී. 2019 දෙසැම්බර් මාසයේදී, මෙම අනුපාතය තවදුරටත් 11.25% දක්වා අඩු කරන ලද අතර, නැවතත්, 2022 ජූනි මාසයේදී විදුලි සංදේශ බදු අනුපාතය 15% දක්වා වැඩි කරන ලදී.

වර්ෂය	2022	2023*
විදුලි සංදේශ බද්ද (රු. මිලියන)	12,905	13,352

*විගණනය නොකළ

සෙස් බදු

1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ සංශෝධිත පනතේ 22 ඌ වගන්තියේ විධිවිධාන ප්‍රකාරව විදුලි සංදේශ ක්‍රියාකරු සමාගම් වලින් සෙස් බද්ද අය කෙරේ. 2021 සිට 2023 වසර දක්වා සෙස් බදු එකතුව ක්‍රමයෙන් වැඩි වී ඇති බව පහත ප්‍රස්ථාරයේ දැක්වේ.



ජංගම දුරකථන කුලුණු බද්ද (CTL)

2019 ජනවාරි 01 දින සිට බලපැවැත්වෙන පරිදි 2018 අංක 35 දරන මුදල් පනතේ XII කොටස ප්‍රකාරව ජංගම දුරකථන කුලුණු බද්ද පනවන ලදී. ඉහත මුදල් පනතට අනුකූලව, සෑම ජංගම ක්‍රියාකරු සමාගමක් විසින් වාර්ෂිකව එක් කුලුණක් සඳහා රු. 200,000 ගෙවිය යුතුය. තවද, ජංගම දුරකථන ක්‍රියාකරු සමාගම් විසින් භාවිතා කරන නමුත් එම දුරකථන ක්‍රියාකරු සමාගම් වලට අයත් නොවන කුලුණු සඳහා ජංගම දුරකථන කුලුණු බද්ද ගෙවිය යුතුය. එලෙස දුරකථන කුලුනු බෙදා ගන්නා දුරකථන ක්‍රියාකරු සමාගම් විසින් රු. 200,000 මුදල සමානව බෙදා ගත යුතුය. බද්ද කාර්තුමය වශයෙන් විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වෙත ගෙවිය යුතුය. 2023 වසර සඳහා ජංගම දුරකථන කුලුනු බදු එකතුව 2022 වසරට සාපේක්ෂව 5.6% ක වැඩිවීමක් පෙන්නුම් කරයි.

වර්ෂය	2022	2023*	% වෙනස
ජංගම දුරකථන කුලුණු බදු එකතුව (මිලි.)	1,565	1,652	5.6%

**විගණනය නොකළ*

කෙටි පණිවුඩ සේවා බදු

මුලික වශයෙන්, තොග කෙටි පණිවුඩ සේවා සඳහා බද්ද 2018 අංක 35 දරන මුදල් පනතේ XIII කොටස මඟින් පනවන ලද අතර, මෙම බද්ද ක්‍රියාත්මක කිරීම සඳහා වන රෙගුලාසි 2014/16 දරන ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශ කර ඇත. ඒ අනුව ජංගම දුරකථන ක්‍රියාකරු සමාගමකට වාණිජ අරමුණු සඳහා ග්‍රාහකයන් වෙත ජංගම දුරකථන හරහා යවන කෙටි පණිවුඩයකට 0.25 මුදලක් ගෙවීම අවශ්‍ය වේ මෙම බද්ද 2019 ජනවාරි 01 වන දින සිට විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් මාසිකව එකතු කරනු ලැබේ. තවද, 2023 අංක 33 දරන මූල්‍ය පනතේ I කොටසට අනුකූලව 2023 දෙසැම්බර් 13 වන දින සිට ස්ථාවර ප්‍රවේශ දුරකථන ක්‍රියාකරු සමාගම් වෙත මෙම බද්ද ව්‍යාප්ත කරන ලදී. 2023 වසරේ කෙටි පණිවුඩ සේවා බදු එකතුව 2022 වසරට සාපේක්ෂව 23.6% ක වැඩිවීමක් පෙන්නුම් කරයි.

වර්ෂය	2022	2023*	% වෙනස
කෙටි පණිවුඩ සේවා බදු (මිලි.)	231.4	286	23.6

** විගණනය නොකළ*

විදුලි සංදේශ සංවර්ධන ගාස්තුව (TDC)

විදුලි සංදේශ සංවර්ධන ගාස්තුවේ (TDC) එකතුව රු. මිලියන 3,660 (2023 නොවැම්බර් දක්වා) ක් විය.

වර්ෂය	2022	2023
විදුලි සංදේශ සංවර්ධන ගාස්තු (මිලි.)	4,810	3,660

වීසා අයදුම්පත් නිර්දේශ කිරීම

විදුලි සංදේශ ක්ෂේත්‍රයේ තාක්ෂණ ශීඝ්‍රයෙන් වෙනස් වන බැවින්, දුරකථන ක්‍රියාකරු සමාගම් විසින් එම වැඩිදියුණු වන තාක්ෂණන් සමඟ සිය ජාල ප්‍රවර්ධනය කිරීමට අඛණ්ඩව උත්සාහ කරයි. විදුලි සංදේශ ක්‍රියාකරු සමාගම් විසින් ඔවුන්ගේ විශේෂිත ව්‍යාපෘතිවල වැඩ කිරීමට විදුලි සංදේශ කර්මාන්තය පිළිබඳ විදේශීය වෘත්තිකයන් බඳවා ගනී. විදුලි සංදේශ ක්‍රියාකරු සමාගම් වෙනුවෙන්, කොමිෂන් සභාව එවැනි වෘත්තිකයන්ගේ වීසා බලපත්‍ර රේඛීය අමාත්‍යාංශයට නිර්දේශ කරයි. 2023 වර්ෂය තුළදී, මෙම අංශය විසින් වෘත්තිකයන් සඳහා වීසා අයදුම්පත් 20 ක් සකස් කරන ලදී.

විදුලි සංදේශ ක්ෂේත්‍රය ආශ්‍රිත තොරතුරු මෙහෙයවීම

ශ්‍රී ලංකා මහ බැංකුව සහ ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව වැනි රාජ්‍ය ආයතන සඳහා අවශ්‍ය විදුලි සංදේශ කර්මාන්තය ආශ්‍රිත තොරතුරු ඉදිරිපත් කරන ලද අතර ජාත්‍යන්තර සංවිධාන (ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය, ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමය, ආදිය) විසින් ඔවුන්ගේ ප්‍රශ්නාවලිය හරහා ඉල්ලා සිටි සංඛ්‍යාලේඛන තොරතුරු අනෙකුත් අංශ සමඟ සම්බන්ධීකරණයෙන් ලබා දෙන ලදී. එකතු කරන ලද විදුලි සංදේශ කර්මාන්තය ආශ්‍රිත දත්ත ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභා වෙබ් අඩවියේ වරින් වර ප්‍රකාශයට පත් කෙරේ.

අන්තර් සම්බන්ධතාවය මෙහෙයවීම

විදුලි සංදේශ ක්ෂේත්‍රයේ නිරතවූවන් සමඟ සිදු කරන ලද සාකච්ඡා ද ඇතුළුව දීර්ඝ ක්‍රියාවලියකින් පසුව, තරඟකාරිත්ව අංශය විසින් සංශෝධිත අන්තර් සම්බන්ධතා ගාස්තු සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ තීරණය ලබා ගැනීම පිණිස කොමිෂන් සභාවට නිර්දේශ කරන ලදී. ඒ අනුව, කොමිෂන් සභාව නව අන්තර් සම්බන්ධතා ගාස්තු තීරණය කළ අතර, එය පියවර හතරකින් ක්‍රියාත්මක කෙරේ. පළමු පියවර 2022 අප්‍රේල් 15 වැනි දින ආරම්භ වූ අතර සෙසු පියවර 2023, 2024 සහ 2025 වසරවල අප්‍රියෙල් 15 දින සිට බලපැවැත්වෙනු ඇත.

අයක්‍රම නියාමනය

කොමිෂන් සභාව විසින් උත්සව අයක්‍රම, ප්‍රවර්ධන අයක්‍රම සහ ස්ථිර අයක්‍රම යන කාණ්ඩ තුනක් යටතේ අයක්‍රම අනුමත කරයි. වසර තුළදී, උත්සව අයක්‍රම 17 ක්, ප්‍රවර්ධන අයක්‍රම 42 ක් සහ ස්ථිර අයක්‍රම 14 ක් කොමිෂන් සභාව අනුමත කරන ලදී.

පාසල් සඳහා ෆයිබර් සම්බන්ධතාවය ලබා දීම සඳහා රජය විසින් ආරම්භ කරන ලද පාසල් ෆයිබරකරණ ව්‍යාපෘතියට අනුකූලව, දැරිය හැකි මිල සහ ව්‍යාපෘතියේ අඛණ්ඩ පැවැත්ම සැලකිල්ලට ගනිමින් කොමිෂන් සභාව විසින් පාසල් සඳහා

විශේෂ අන්තර්ජාල අයකුම සැලසුම් අනුමත කරන ලදී.

2023 වසර තුළ, දුරකථන ක්‍රියාකරු සමාගම් විසින් ග්‍රාහකයින් සඳහා වඩාත් පහසු කොම්බෝ අයකුම සැලසුම් (හඬ, කෙටි පණිවුඩ සේවා සහ දත්ත ඇතුළුව) ඉදිරිපත් කරන ලදී. තවද, දැඩි තරහකාරීත්වය හේතුවෙන් දැරිය හැකි මිලකට අසීමිත සේවා සහිත පැකේජ ලබා දීමට දුරකථන ක්‍රියාකරු සමාගම් දිරිගන්වනු ලැබේ.

"ගමට සන්නිවේදනය" (Connect Sri Lanka) ව්‍යාපෘතිය

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL) විසින් 100% රටපුරා 4G/Fiber බ්‍රෝඩ්බෑන්ඩ් සේවා ආවරණය සපුරාලීම සඳහා "ගමට සන්නිවේදනය" (Connect Sri Lanka) ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී.

සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශයේ නිර්වචනය කරන ලද රජයේ දැක්ම තුළින් ඩිජිටල් සක්‍රීය රජයක් සහ ඩිජිටල් ආර්ථිකයක් කරා රට ගෙනයාම සඳහා ඩිජිටල් පරිවර්තනය සහ තාක්ෂණ වැලඳ ගැනීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කරමින්, රටේ ඩිජිටල්කරණය සඳහා පවතින යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සම්බන්ධතාවයේ අනිවාර්ය අවශ්‍යතාවයකි. දැරිය හැකි මිල කෙරෙහි අවධානය යොමු කරමින් රට පුරා බ්‍රෝඩ්බෑන්ඩ් සේවා ආවරණය සැපයීම පුරවැසියන්ට විශ්වීය ප්‍රවේශය ලබා දීම සහතික කිරීමේ ප්‍රධාන සාර්ථක සාධකයක් වනු ඇත.

2019 වසරේ දී ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් දියත් කරන ලද ගමට සන්නිවේදනය වැඩසටහන අධිවේගී අන්තර්ජාල සම්බන්ධතාවයේ හිඟකම මහහරවා ගැනීම සඳහා දැන් ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘතියක් වන අතර, සැබෑ ආවරණ ගැටළු පිළිබඳ යතාර්ථයන් අවබෝධ කර ගනිමින් එහි මූලික කටයුතු දිස්ත්‍රික්ක 25 පුරාම සහ ග්‍රාම සේවා පරිපාලන ක්ෂේත්‍ර 14,000 පුරා වසරක් තුළ සිදු කරන ලද සමීක්ෂණයක් සහිතව අවසන් කරන ලදී.

මෙම ව්‍යාපෘතිය යටතේ, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL) විසින් හඳුනාගත් ප්‍රදේශ සඳහා 4G/Fiber බ්‍රෝඩ්බෑන්ඩ් සේවා ආවරණය සැපයීම පිණිස විදුලි සංදේශ සංවර්ධන ගාස්තු (TDC) අරමුදල මඟින් දුරකථන ක්‍රියාකරු සමාගම් වලට මූල්‍ය ආධාර සපයයි. තවද, ප්‍රධාන ජාලය සහ පාරිභෝගිකයා අතර පවත්නා සම්බන්ධතාවය සහ ග්‍රාමීය ප්‍රජාවන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම කෙරෙහි අවධානය යොමු කරමින් අධිවේගී, දැරිය හැකි සහ තිරසාර 4G/Fiber බ්‍රෝඩ්බෑන්ඩ් සේවා ජාලයක් සංවර්ධනය කිරීම සහ ප්‍රවර්ධනය කිරීම එහි අරමුණයි.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් රත්නපුර, කුරුණෑගල, මාතර, අනුරාධපුර, මහනුවර, බදුල්ල කළුතර, කෑගල්ල, යාපනය සහ ත්‍රිකුණාමලය ඇතුළු දිස්ත්‍රික්ක දහයක 4G/ ෆයිබර් බ්‍රෝඩ්බෑන්ඩ් සේවා ව්‍යාප්ත කිරීමේ ව්‍යාපෘතියේ පළමු අදියර සාර්ථකව ක්‍රියාත්මක කරන ලදී. "ගමට සන්නිවේදනය" ව්‍යාපෘතිය යටතේ 4G ආවරණය සම්පූර්ණ කිරීම සඳහා ආසන්න වශයෙන් නව විදුලි සංදේශ කුලුනු වැඩබිම් 276ක් අවශ්‍ය වනු ඇතැයි ගණන් බලා ඇත. ඒ අනුව, රත්නපුර, කුරුණෑගල, බදුල්ල කළුතර සහ කෑගල්ල දිස්ත්‍රික්කවල කුලුනු වැඩබිම් 56 ක් දුරකථන ක්‍රියාකරු සමාගම් විසින් මේ වන විටත් ආරම්භ කර ඇත. තවද, නව කුලුනු ඉදිකිරීමට දුරකථන ක්‍රියාකරු සමාගම් සැලසුම් කර ඇති අතර, ඉතිරි ප්‍රදේශ සහ ශේෂ ඉඩම් අත්පත් කර ගැනීමට සහ අදාළ රජයේ බලධාරීන්ගෙන් අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරමින් සිටී.

2023 වසරේ දී රත්නපුර දිස්ත්‍රික්කයේ විකාශන කුලුනු තුනක්, කුරුණෑගල දිස්ත්‍රික්කයේ එකොළහක් සහ බදුල්ලේ එකක් ඉදි කරන ලදී. මීට අමතරව, ග්‍රාමීය ප්‍රජාවගේ හදිසි අවශ්‍යතා සපුරාලීම සඳහා කෑගල්ල දිස්ත්‍රික්කයේ කුලුනු දෙකක් සහ කළුතර දිස්ත්‍රික්කයේ එක් කුලුනක් තාවකාලිකව ක්‍රියාත්මක වේ.

2022 වසරේ දී රටේ පැවති අභිතකර ආර්ථික තත්ත්වය හේතුවෙන් විදුලි සංදේශ උපකරණ සහ ඉදිකිරීම් පිරිවැය වැඩි විය. කුලුනු ඉදිකිරීමේ පිරිවැය ඉහළ යාම සැලකිල්ලට ගනිමින්, එක් වැඩබිමක් වෙනුවෙන් විදුලි සංදේශ සංවර්ධන අරමුදලේ දායකත්වය රුපියල් මිලියන 27.4 දක්වා වැඩි කිරීමට කොමිෂන් සභාව තීරණය කළේය. තවද, "ගමට සන්නිවේදනය" ව්‍යාපෘතිය යටතේ කුලුනු ඉදිකිරීම් ක්‍රියාවලිය කඩිනම් කිරීම සඳහා මාර්ගෝපදේශ ද සංශෝධන කරන ලදී.

දිස්ත්‍රික්කය	මුළු කුලුනු සංඛ්‍යාව	ඉඩම් හඳුනාගැනීමේ ක්‍රියාවලිය	අනුමැතිය ලබාදීම	ඉදිකිරීම් සිදුකෙරෙමින් පවතී (WIP)	විකාශන කුලුණු සංඛ්‍යාව
රත්නපුරය	35	-	2	2	31
කුරුණෑගල	35	-	9	5	21
මාතර	21	4	10	7	-
මහනුවර	33	20	10	3	-
අනුරාධපුර	31	10	18	3	-
බදුල්ල	34	24	9	-	1
කළුතර	34	8	19	6	1
කෑගල්ල	34	16	8	8	2
යාපනය	11	8	3	-	-
ත්‍රිකුණාමලය	8	8	-	-	-
එකතුව	**276**	**98**	**88**	**34**	**56**

අනුකූලතා සහ විමර්ශන

සේවා ගුණාත්මකභාවය (QoS)

- පොදු ස්විචිකරණ දුරකථන ජාල (PSTN) ක්‍රියාකරු සමාගම් හතකින් (07) ලැබුණු මාසික සේවා තත්ත්ව (QoS) වාර්තා අසූහතර (84) විශ්ලේෂණය කර අවශ්‍ය අවස්ථාවලදී සේවා තත්ත්ව (QoS) පරාමිතිවල වැඩිදියුණු කිරීම් පිළිබඳව ඔවුන් සමඟ සාකච්ඡා කිරීම.
- පොදු ස්විචිකරණ දුරකථන ජාල (PSTN) ක්‍රියාකරු සමාගම් හතක (07) සංසන්දනාත්මක වාර්තා විසිහතර (24) සකස් කර ඒවා තොරතුරු සහ කාර්ය සාධන මිනුම්වල නිරවද්‍යතාවය වැඩි දියුණු කිරීම පිණිස ඔවුන් අතර බෙදා හැරීම.
- ජාල විගණනය: පොදු ස්විචිකරණ දුරකථන ක්‍රියාකරු සමාගම් ජාල කවුළු මඟින් කාර්ය සාධන මිනුම් දත්ත ලබා ගැනීම, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් ලබා දී ඇති සම්මතයට අනුව ගණනය කිරීම, සහ සේවා තත්ත්ව පරාමිතියක ආකාරයෙන් වාර්තාව නැවත ලබා දීම. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් දුරකථන ක්‍රියාකාර සමාගම්වල ජාල නිරීක්ෂණය කිරීම සහ ගණනය කිරීමේ ක්‍රමවේදය නැවත ඇගයීම සහ සේවා තත්ත්ව පරාමිතින් ගණනය කිරීම පිණිස ජාල කවුළු මඟින් සකස් නොකරන ලද දත්ත ලබා ගැනීම.
- කාර්තුමය වශයෙන් පොදු ස්විචිකරණ දුරකථන ජාල (PSTN) ක්‍රියාකරු සමාගම් හතක (07) පමණ හඬ සේවා සහ බ්‍රෝඩ්බෑන්ඩ් සේවාවල පාරිභෝගික සේවා පරාමිතීන් සහ ජාල පරාමිතීන් පිළිබඳ ජාල විගණන විස්සක් (20) සිදු කිරීම.
- කාර්තුමය වශයෙන් පොදු ස්විචිකරණ දුරකථන ජාල (PSTN) ක්‍රියාකරු සමාගම් විසින් අගය එකතු කළ සේවා (VAS) මාර්ගෝපදේශ පිළිපැදීම පිළිබඳ විගණන දහසයක් (16) සිදු කිරීම.


ජංගම දුරකථන ක්‍රියාකරු සමාගම්වල ප්‍රධාන පාරිභෝගික සේවා කාර්ය සාධන දර්ශකවල විශේෂතා

2021.01.18 දිනැති අංක 2211/2 දරන සේවා තත්ත්ව (QoS) පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ (අතිවිශේෂ) ගැසට් පත්‍රය ප්‍රකාරව, දුරකථන ක්‍රියාකරු සමාගම් විසින් පහත සඳහන් පරාමිතීන් මනිනු ලබන අතර ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් විගණනය කර ඇත.

- බිල්පත් නිරවද්‍යතා පැමිණිලි - පසුගෙවුම්
- බිල්පත් නිරවද්‍යතා පැමිණිලි - පෙරගෙවුම්
- පසුගෙවුම් සඳහා බිල්පත් නිරවද්‍යතා පැමිණිලි නිරාකරණය කිරීමේ කාලය (මාස හයක් ඇතුළත නිරාකරණය කරනු ලැබේ)
- පසුගෙවුම් සඳහා බිල්පත් නිරවද්‍යතා පැමිණිලි නිරාකරණය කිරීමේ කාලය (මාස තුනක් ඇතුළත නිරාකරණය කරනු ලැබේ)
- පෙරගෙවුම් සඳහා බිල්පත් නිරවද්‍යතා පැමිණිලි නිරාකරණය කිරීමේ කාලය (වැඩකරන දින පහක් ඇතුළත නිරාකරණය කරනු ලැබේ)
- පෙරගෙවුම් සඳහා බිල්පත් නිරවද්‍යතා පැමිණිලි නිරාකරණය කිරීමේ කාලය (වැඩකරන දින තුනක් ඇතුළත නිරාකරණය කරනු ලැබේ)
- තත්පර 40ක් ඇතුළත මානව ක්‍රියාකරුගේ ප්‍රතිචාර කාලය
- තත්පර 80ක් ඇතුළත මානව ක්‍රියාකරුගේ ප්‍රතිචාර කාලය
- අන්තර්ක්‍රියාකාරී හඬ ප්‍රතිචාර (IVR) ආරම්භක ප්‍රතිචාර කාලය


බිල්පත් නිරවද්‍යතා පැමිණිලි - පසුගෙවුම්

- අගය 0.5% ට වඩා වැඩි නම්, ඉලක්කය සපුරා නැත.
- අගය 0.5% ට වඩා අඩු නම්, ඉලක්කය සපුරා ඇත.




බිල්පත් නිරවද්‍යතා පැමිණිලි - පෙරගෙවුම්

- අගය 0.1% ට වඩා වැඩි නම්, ඉලක්කය සපුරා නැත.
- අගය 0.1% ට වඩා අඩු නම්, ඉලක්කය සපුරා ඇත.




පසුගෙවුම් සඳහා බිල්පත් නිරවද්‍යතා පැමිණිලි නිරාකරණය කිරීමේ කාලය (මාස හයක් ඇතුළත නිරාකරණය කරනු ලැබේ)

- අගය 95% සිට 100% දක්වා පරාසය තුළ නොමැති නම්, ඉලක්කය සපුරා නැත.
- අගය 95% සිට 100% දක්වා පරාසයක පවතී නම්, ඉලක්කය සපුරා ඇත.




පසුගෙවුම් සඳහා බිල්පත් නිරවද්‍යතා පැමිණිලි නිරාකරණය කිරීමේ කාලය (මාස තුනක් ඇතුළත නිරාකරණය කරනු ලැබේ)

- අගය 90% සිට 95% දක්වා පරාසය තුළ නොමැති නම්, ඉලක්කය සපුරා නැත.
- අගය 90% සිට 95% දක්වා පරාසයක පවතී නම්, ඉලක්කය සපුරා ඇත.




පෙරගෙවුම් සඳහා බිල්පත් නිරවද්‍යතා පැමිණිලි නිරාකරණය කිරීමේ කාලය (වැඩකරන දින පහක් ඇතුළත නිරාකරණය කරනු ලැබේ)

- අගය 95% සිට 100% දක්වා පරාසය තුළ නොමැති නම්, ඉලක්කය සපුරා නැත.
- අගය 95% සිට 100% දක්වා පරාසයක පවතී නම්, ඉලක්කය සපුරා ඇත.




පෙරගෙවුම් සඳහා බිල්පත් නිරවද්‍යතා පැමිණිලි නිරාකරණය කිරීමේ කාලය (වැඩකරන දින තුනක් ඇතුළත නිරාකරණය කරනු ලැබේ)

- අගය 85% හෝ ඊට අඩු නොවේ නම්, ඉලක්කය සපුරා නැත.
- අගය 85% හෝ ඊට වැඩි නම්, ඉලක්කය සපුරා ඇත.




තත්පර 40ක් ඇතුළත මානව ක්‍රියාකරුගේ ප්‍රතිචාර කාලය

- අගය 60% ට වඩා අඩු නම්, ඉලක්කය සපුරා නැත.
- අගය 60% ට වඩා වැඩි නම්, ඉලක්කය සපුරා ඇත.




තත්පර 80ක් ඇතුළත මානව ක්‍රියාකරුගේ ප්‍රතිචාර කාලය

- අගය 85% ට වඩා අඩු නම්, ඉලක්කය සපුරා නැත.
- අගය 85% ට වඩා වැඩි නම්, ඉලක්කය සපුරා ඇත.



අන්තර්ක්‍රියාකාරී හඬ ප්‍රතිචාරවල (IVR) ආරම්භක ප්‍රතිචාර කාලය

- අගය 95% ට වඩා අඩු නම්, ඉලක්කය සපුරා නැත.
- අගය 95% ට වඩා වැඩි නම්, ඉලක්කය සපුරා ඇත.



ආවේක්ෂණ

- වෙළඳ බලපත්‍ර ලබාගෙන නොමැති වෙළෙන්දන්ට එරෙහිව නියාමන ක්‍රියාමාර්ග ගැනීම.
- ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද වලංගු වෙළඳ බලපත්‍ර ඔවුන් සතුව තිබේද යන්න පරීක්ෂා කිරීම පිණිස දිස්ත්‍රික්ක 17ක් අතුරින් තෝරාගත් දිස්ත්‍රික්ක 8ක වෙළෙන්දන් පරීක්ෂා කිරීම.
- බලපත්‍ර කොන්දේසි වල 17 වන වගන්තියට අනුකූලව දුරකථන ක්‍රියාකරු සමාගම් කටයුතු කරන්නේද යන්න නිරීක්ෂණය කිරීම පිණිස පරීක්ෂණ දාහතක් (17) සිදු කර ඇත.
- ග්‍රාහක අනන්‍යතා මොඩියුල්පත් (SIM) ගැසට් නිවේදනයට අනුව ග්‍රාහකයින් නැවත ලියාපදිංචි කිරීමට දුරකථන ක්‍රියාකරු සමාගම් පියවර ගෙන තිබේද යන්න තහවුරු කර ගැනීම සඳහා කාර්තුමය වශයෙන් විගණන (16) සිදු කර ඇත.
- ග්‍රාහකයින් වෙත පිරිනමන අයක්‍රම පැකේජ යාන්ත්‍රණය පිළිබඳ පරීක්ෂණ පනස් තුනක් (53) සම්පූර්ණ කර ඇත.
- නීති විරෝධී කේබල් ටීවී මෙහෙයුම් සම්බන්ධයෙන් බණ්ඩාරවෙල මහේස්ත්‍රාත් අධිකරණයේ ගොනු කර ඇති නඩුව සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට සහාය ලබා දීම.
- මහනුවර සහ මාතලේ දිස්ත්‍රික්කවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සහාය ඇතිව ග්‍රාහක අනන්‍යතා මොඩියුල්පත් (SIM) නැවත ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය සඳහා නියමු ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරන ලදී.
- ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සහ පොලිසියේ නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් හතළිහක් (40) පවත්වන ලදී.
- මුද්‍රිත සහ විද්‍යුත් මාධ්‍ය හරහා දැනුවත් කිරීමේ වැඩසටහන් දහයක් (10) පවත්වන ලදී.

විමර්ශන සහ බුද්ධිමය කටයුතු

- ඉල්ලීම් මත විමර්ශන කටයුතු සිදු කිරීම පිණිස පොලිසිය /අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුව වෙත අවශ්‍ය සහාය ලබා දීම.
- විදුලි සංදේශ සේවාවන්හි නීති විරෝධී මෙහෙයුම් පිළිබඳ තාක්ෂණික විමර්ශන සිදු කිරීම.
- ජාත්‍යන්තර ජංගම උපකරණ අනන්‍යතා සත්‍යාපන විසඳුමක් ඇතුළත් ග්‍රාහක අනන්‍යතා මොඩියුල්පත් (SIM) සහිත උපකරණ / සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය විධිමත් කිරීම.
- නීති විරෝධී සෘජු ගෘහස්ථ (DTH) / කේබල් රූපවාහිනී (Cable TV) සේවා සැපයුම්කරුවන් අවම කිරීම.
- සයිබර් හිරිහැර පැමිණිලි කළමනාකරණය කිරීම.
- සමාජ මාධ්‍ය පැමිණිලි 846ක් විසඳීම සඳහා සහාය වීම.

පාරිභෝගික පැමිණිලි සහ මහජනතාව දැනුවත් කිරීම

විදුලි සංදේශ සංශෝධිත පනතේ 09 වන වගන්තිය (1991 අංක 25, 1991) ප්‍රකාරව, දුරකථන ක්‍රියාකරු සමාගමක් විසින් සපයනු ලබන විදුලි සංදේශ සේවා සම්බන්ධයෙන් කොමිෂන් සභාව වෙත පැහැදිලි හේතු සහිතව ලිඛිත පැමිණිලි ඉදිරිපත් කිරීමට ග්‍රාහකයෙකුට හෝ මහජනතාවට ඉඩ සැලසේ. ඒ සම්බන්ධයෙන් අවශ්‍ය පරිදි විමර්ශන කිරීමට සහ සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට කොමිෂන් සභාවට බලය ඇත. 9(2) වගන්තිය මඟින් එවැනි පැමිණිල්ලක් හෝ කරුණක් නිරාකරණය කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීමට දුරකථන ක්‍රියාකරු සමාගමක් වෙත යොමු කිරීමට සහ අවශ්‍ය ඕනෑම විටෙක මූල්‍ය සහන සැලසීමට කොමිෂන් සභාවට විධිවිධාන සලසා ඇත.

අස්ථානගත වූ ජංගම දුරකථන ඉල්ලීම් මෙහෙයවීම

සමාජීය වගකීම්වල කොටසක් වශයෙන්, අස්ථානගත වූ ජංගම දුරකථන සොයා දීමේ ක්‍රියාවලියේ මැදිහත්කරුවෙකු වශයෙන් ශ්‍රී.ල.වි.ස.නි.කොං. සභාව ක්‍රියා කරයි. අපි අන්තර්ජාල විසඳුම (iNeed) හරහා

ලැබෙන පැමිණිලි දෛනිකව ජංගම දුරකථන ක්‍රියාකරු සමාගම් වෙත යොමු කරන අතර, ඒ සඳහා ලැබෙන ප්‍රතිචාර අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම පිණිස අදාළ පොලිස් ස්ථාන වෙත යවනු ලැබේ.

පහත ප්‍රස්ථාරයෙන් 2023 වසරේ ජංගම දුරකථන අස්ථානගතවීම් සම්බන්ධ නව පැමිණිලි සංඛ්‍යාව සහ ඒ සම්බන්ධයෙන් ජංගම දුරකථන ක්‍රියාකරුවන්ගෙන් ලැබුණු ප්‍රතිඵල පෙන්වයි. අස්ථානගත වූ ජංගම දුරකථන සම්බන්ධයෙන් ලැබුණු පැමිණිලි 40,347 න් ජංගම දුරකථන 33,234 ක් පමණ දුරකථන ක්‍රියාකරු සමාගම් විසින් අනාවරණය කරගෙන ඇත. එම අනාවරණය කරගත් ප්‍රතිඵල ඉදිරි කටයුතු සඳහා පොලිස් ස්ථාන වෙත ඉදිරිපත් කරන ලදී.

නව පැමිණිලි සංඛ්‍යාව	අනාවරණය කරගෙන පොලිස් ස්ථාන වෙත ඉදිරිපත් කර ඇති ප්‍රතිඵල සංඛ්‍යාව
40,347	33,234

නැතිවූ/අස්ථානගත වූ ජංගම දුරකථන පිළිබඳ තොරතුරු වාර්තා කිරීමට මාර්ගගත විසඳුමක් හඳුන්වා දී ඇති අතර මහජනතාවට “www.ineed.police.lk” වෙබ් අඩවිය ඔස්සේ එහි සේවාව ලබා ගත හැකිය.

මෙම ඩිජිටල් පහසුකම මඟින් දැන් පොලිස් ස්ථානයට නොගොස් නැතිවූ / අස්ථාන ගත වූ දුරකථනය සොයා දීමේ ක්‍රියාවලිය සම්පූර්ණ කිරීමේ පහසුකම ලබා දෙයි.

මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන්

විදුලි සංදේශ/තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ භාවිතය සහ පාරිභෝගිකයන් ආශ්‍රිත අනෙකුත් ගැටළු පිළිබඳව මහජනතාව දැනුවත් කිරීමේ වැදගත්කම නිරීක්ෂණය විය.

පහත සඳහන් කොට්ඨාශයන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වා ඇත.

1. පොලිසිය, විශේෂ කාර්ය බලකාය සහ යුද හමුදා නිලධාරීන් ජාතික පොලිස් විද්‍යාපීඨය කටාන, කළුතර පොලිස් අභ්‍යාස විද්‍යාලය, සේවාස්ථ මිරිහාන පොලිසිය, කොළඹ විශේෂ කාර්ය බළකාය සහ ශ්‍රී ලංකා යුද හමුදාව සම්පත් දායකයන් වශයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන්/දේශන පවත්වා ඇත.
2. පොදු මහජනතාව සන්නිවේදනයේ සදාචාරාත්මක භාවිතය පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම සඳහා පෝස්ටර්, පත්‍රිකා සහ ස්ටිකර් ප්‍රකාශයට පත් කර ඇත. සියලුම දුම්රිය ස්ථාන, පොලිස් ස්ථාන, පාසල් වෙත පෝස්ටර් ලබා දී ඇති අතර, ස්ටිකර් පොදු ගමනාගමන කොමිෂන් සභාව වෙත ලබා දී ඇත. මූලික තොරතුරු පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම සඳහා රූපවාහිනී/ගුවන්විදුලි වැඩසටහන් සහ සමාජ මාධ්‍ය දැනුවත් කිරීමේ වැඩසටහන් රැසක් පවත්වා ඇත.

පහත වගුව මඟින් වසර තුළ මෙහෙයවන ලද පාරිභෝගික පැමිණිලි සංඛ්‍යාව දක්වයි. පැමිණිලි බහුතරයක් සංඥා ආවරණය සහ බිල්පත් සම්බන්ධයෙන් ලැබී ඇත.

සියලුම පාරිභෝගික පැමිණිලිවලින් 97%ක් නිරාකරණය කර ඇති බව අවධාරණය කෙරේ.

පාරිභෝගික පැමිණිල්ලේ වර්ගය	පැමිණිලි සංඛ්‍යාව		%
	ලැබුණු	නිරාකරණය කළ	
සංඥා/ ආවරණය	142	142	100%
බිල්පත්	428	397	93%
දුරකථන දෝෂ	107	107	100%
දුරකථන සම්බන්ධතා	138	138	100%
අගය ඒකතු කළ සේවා	52	43	83%
දත්ත	252	246	98%
අන්තර්ජාල	236	231	98%
වෙනත්	174	174	100%
එකතුව	**1529**	**1478**	**97%**

දුරකථන ක්‍රියාකරු සමාගම් සහ පැමිණිලිකරුවන් සමඟ සංවිධානය කරන ලද රැස්වීම්

දුරකථන ක්‍රියාකරු සමාගම විසින් ඉදිරිපත් කරන ලද විසඳුම සම්බන්ධයෙන් පැමිණිලිකරු සෑහීමකට පත් නොවූ විට පාරිභෝගික ගැටළු නිරාකරණය කිරීම සඳහා කොමිෂන් සභාව විසින් සේවා සපයන්නන් සහ පැමිණිලිකරුවන් අතර රැස්වීම් සංවිධානය කරන ලදී. දෙපාර්ශ්වය සමඟ සුහද විසඳුමක් ඇති කර ගැනීම පිණිස වසර තුළ රැස්වීම් 35 ක් පවත්වන ලදී.

ප්‍රතිපත්ති සහ ජාත්‍යන්තර සබඳතා

ප්‍රතිපත්ති

විදුලි සංදේශ ක්ෂේත්‍රයේ පර්යේෂණ සහ සංවර්ධනය

ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතේ විධිවිධාන ප්‍රකාරව, විදුලි සංදේශ සහ ඒ ආශ්‍රිත ක්ෂේත්‍රවල පර්යේෂණ සහ සංවර්ධන ප්‍රවර්ධනය සහ නව තාක්ෂණික ක්‍රම භාවිත කිරීමේ වගකීම ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව උසුලයි. ප්‍රතිපත්ති සහ ජාත්‍යන්තර සබඳතා අංශය ශ්‍රී ලංකාවේ රාජ්‍ය විශ්ව විද්‍යාල සහ රජයේ පර්යේෂණ ආයතන මඟින් පවත්වනු ලබන විදුලි සංදේශ ක්ෂේත්‍රය ආශ්‍රිත පර්යේෂණ හා සංවර්ධන කටයුතු සිදුකිරීමට මූල්‍ය ආධාර සැපයීමේ රාජකාරි ඉටු කරයි.

රාජ්‍ය විශ්වවිද්‍යාල විසින් මුළු පර්යේෂණ යෝජනා භයක් ඉදිරිපත් කළ අතර, යාපනය විශ්වවිද්‍යාලය සහ රුහුණු විශ්වවිද්‍යාලය විසින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් පර්යේෂණ යෝජනා සඳහා 2023 වර්ෂයේදී අරමුදල් ප්‍රදානය කරන ලදී. ව්‍යාපෘති යෝජනාවල පර්යේෂණ සංරචක සහ විෂය පථය සමාලෝචනය කිරීම සඳහා පත් කරන ලද අනු කමිටුව විසින් ලබා දී ඇති නිර්දේශයන් සැලකිල්ලට ගැනීමෙන් අනතුරුව, පර්යේෂණ කමිටුවේ අනුමැතිය ඇතිව ව්‍යාපෘති තෝරා ගැනීම සිදු කරන ලදී.

1. යන්ත්‍ර ඉගැනුම් ප්‍රවේශයන් භාවිත කරමින් 5G සහ අනාගත රැහැන් රහිත තාක්ෂණයන් සඳහා සුහුරු ඇන්ටෙනා නිර්මාණය - (Smart Antenna Design for 5G and Future Wireless Technologies Using Machine Learning Approaches) - යාපනය විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨයේ පීඨාධිපති ආචාර්ය කේ.පිරපාකරන් විසින් මෙහෙයවන ලදී.
2. රැහැන් රහිත ජංගම ජාලවල වැඩිදියුණු කරන ලද දත්ත සමුදා යාන්ත්‍රණයක් සහිතව ගුවන්විදුලි සංඛ්‍යාත විකිරණ නිරාවරණ මට්ටම මැනීම - (Blockchain Enabled RF Radiation Exposure Level Measurements in Wireless Mobile Networks) - ආචාර්ය ඩබ්ලිව්.එන්.බී.ඒ. ගීත් ප්‍රියංකර, කථිකාචාර්ය, විදුලි හා තොරතුරු ඉංජිනේරු දෙපාර්තමේන්තුව, ඉංජිනේරු පීඨය, රුහුණු විශ්වවිද්‍යාලය විසින් මෙහෙයවන ලදී.

ඒ සඳහා මූල්‍ය ආධාර ලබාදීම පිණිස දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ - ප්‍රධාන [DPC (Major)] අනුමැතිය ලබා ගැනීමෙන් පසු යාපනය විශ්වවිද්‍යාලය සහ රුහුණු විශ්වවිද්‍යාලය සමඟ ගිවිසුම් අත්සන් කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරන ලදී. රුහුණු විශ්ව විද්‍යාලයේ සහ යාපනය විශ්ව විද්‍යාලයේ පර්යේෂණ කණ්ඩායම්, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ පර්යේෂණ කමිටු සාමාජිකයින්, ක්ෂේත්‍රයේ ප්‍රවීණයන්, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය සහ ජාත්‍යන්තර නියෝජිතයන් ඇතුළු පර්යේෂණ කණ්ඩායම් සාමාජිකයින්ගේ සහභාගීත්වයෙන් MS Teams මෘදුකාංගය ඔස්සේ මූලික ඉදිරිපත් කිරීම් සහ පළමු ප්‍රගති සමාලෝචනය ඉදිරිපත් කරන ලදී. මෙම ඉදිරිපත් කිරීම් සිදු කිරීමේ දී ඔවුන්ගේ අදාළ විශ්වවිද්‍යාලවල ප්‍රධාන පර්යේෂකයන් විසින් පර්යේෂණ කණ්ඩායම් මෙහෙයවීය. අදාළ ප්‍රගති වාර්තා සහ ඉදිරිපත් කිරීම් කිරීමෙන් පසු වාරික පදනම මත පර්යේෂණ ව්‍යාපෘති සඳහා මූල්‍ය ප්‍රදාන ලබා දෙන ලදී. ව්‍යාපෘතිවල දෙවන ප්‍රගති සහ අවසන් ප්‍රගති සමාලෝචනය ඉදිරිපත් කිරීම ලබන වසරේ පැවැත්වීමට නියමිතය.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් සපයනු ලබන මෙම මූල්‍ය ආධාරය හේතුවෙන් අත්‍යවශ්‍ය සම්පත් වෙත ප්‍රවේශ වීමට පර්යේෂකයන්ට හැකියාව ලැබීම සහ අපේක්ෂිත පර්යේෂණ ප්‍රතිඵල සමඟින් ඔවුන්ගේ පර්යේෂණ ව්‍යාපෘති සාර්ථකව අවසන් කිරීමට හැකි වීමත් මත මෙම පර්යේෂණ හා සංවර්ධන වැඩසටහන විශ්වවිද්‍යාල විසින් බෙහෙවින් අගයන ලදී. දේශීය හා ජාත්‍යන්තර පර්යේෂකයන්ගේ අධීක්ෂණය යටතේ සිදු කෙරෙන මෙම පර්යේෂණ ව්‍යාපෘති තුළින් ලද ප්‍රායෝගික අත්දැකීම් උපාධි අපේක්ෂකයින් හට තම දැනුම හා අත්දැකීම් වර්ධනය කර ගැනීමට ප්‍රයෝජනවත් වූ බව වාර්තා විය.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ තොරතුරු සන්නිවේදන තාක්ෂණ ස්වේච්ඡා වැඩසටහන 2023

ග්‍රාමීය ප්‍රදේශවල සිසුන්ගේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අධ්‍යාපනය නංවාලීම පිණිස ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් සිදු කරන ලද ධාරිතා වර්ධන වැඩසටහනක් ලෙස තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ස්වේච්ඡා වැඩසටහන අවධාරණය කෙරේ. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ ජාත්‍යන්තර තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ස්වේච්ඡා වැඩසටහන ප්‍රතිව්‍යුහගත කිරීම මඟින් නියමු ව්‍යාපෘතියක් ලෙස 2019 දී දේශීය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ස්වේච්ඡා වැඩසටහන ආරම්භ කරන ලදී. 2019 සහ 2021 වසර තුළ දිස්ත්‍රික්ක නවයක පාසල් 33 ක සිසුන් 600 කට අධික සංඛ්‍යාවක් මෙම වැඩසටහනෙන් ප්‍රතිලාභ ලබා ඇත.

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ස්වේච්ඡා වැඩසටහන 2023 අධ්‍යාපන අමාත්‍යාංශය, වෘත්තීය පුහුණු අධිකාරිය (VTA) සහ විශ්වවිද්‍යාල සහ විදුලි සංදේශ ක්‍රියාකරු සමාගම්වල සහාය ඇති ව දුෂ්කර ප්‍රදේශවල සිසුන් අතර තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සාක්ෂරතාවය ප්‍රවර්ධනය කිරීම පිණිස සංවිධානය කරන ලදී.

සිසුන්ගේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ධාරිතාව ගොඩනැගීම සඳහා මෙම වැඩසටහන යටතේ දිස්ත්‍රික්ක 5 ක දුෂ්කර පාසල් 13 ක් වෙත ස්වේච්ඡා සේවකයන් පිටත් කර යවන ලදී. රාජ්‍ය විශ්ව විද්‍යාල, විදුලි සංදේශ ක්‍රියාකරු සමාගම් සහ වෙනත් රාජ්‍ය ආයතනවල සම්පත් දායකයින්ගේ සහාය ඇති ව පුහුණු කඳවුරක් මඟින් ස්වේච්ඡා සේවකයන් මාසයක කාලයක් පුහුණු කරන ලදී. මෙම පුහුණුව අතරතුර, ඔවුන්ට ව්‍යවසායකත්වය, ක්‍රමලේඛන සැකසීම්, වෙබ් අඩවි සංවර්ධනය, ජාලකරණය, සුහුරු අධ්‍යාපනය, සයිබර් ආරක්ෂාව පිළිබඳ දැනුවත් කිරීම සහ අධ්‍යාපනික අංශයන් ඉගැන්වූහ. පුහුණු කඳවුරේ ස්වේච්ඡා සේවකයන් පුහුණු කිරීමෙන් අනතුරුව ඔවුන් බදුල්ල, මහනුවර, රත්නපුර, අම්පාර, ගාල්ල සහ කොළඹ දිස්ත්‍රික්කවල පාසල් 13 කට මාස දෙකක ස්වේච්ඡා සේවය සඳහා පිටත් කර යවන ලදී.

ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම් 4 හෝ 5 සමත් (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ජාතික සහතිකය) සහ වෘත්තීය පුහුණු අධිකාරිය විසින් නිර්දේශ කර ඇති සිසුන් ස්වේච්ඡා දායකයින් ලෙස තෝරා ගැනීම පිණිස සම්මුඛ පරීක්ෂණවලට භාජනය විය. ඔවුන්ගෙන් 13 දෙනෙකු මෙම වැඩසටහන සඳහා තෝරා ගන්නා ලදී.

දුර බැහැර දුෂ්කර ප්‍රදේශවල සිසුන්ට ප්‍රතිලාභ ලබා දීමෙන් ඔබ්බට, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ස්වේච්ඡා දායකයන් මෙම වැඩසටහනේ ඉලක්කගත ප්‍රතිලාභීන් ලෙස සැලකේ. මෙම වැඩසටහන හරහා ලබා ගන්නා අත්දැකීම් සහ පළපුරුද්ද මත ස්වේච්ඡා දායකයින්ට අනාගතයේ දී වඩා ප්‍රශස්ත රැකියා අවස්ථා සොයා ගැනීමට හෝ ව්‍යවසායකත්වය කරා යාමට හැකි වනු ඇත. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ස්වේච්ඡා වැඩසටහන රටේ විදුලි සංදේශ සේවා ව්‍යාප්ති පරතරය මැඩලීමේ අරමුණින් ප්‍රධාන පුහුණු වැඩසටහනක් ලෙස සංවර්ධනය කිරීමට අපේක්ෂිතය.

ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය (ITU) / ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමය (APT) / දකුණු කොරියානු ජාතික තොරතුරු සමාජ නියෝජිතායතනය (NIA) ජාත්‍යන්තර තොරතුරු සන්නිවේදන තාක්ෂණ ස්වේච්ඡා වැඩසටහන

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව දකුණු කොරියානු ජාතික තොරතුරු සමාජ නියෝජිතායතනය (NIA), ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය (ITU) සහ ආසියා ශාන්තිකර විදුලි සංදේශ (APT) සංගමයේ සහයෝගීතාවයෙන් 2011 වසරේ සිට රට පුරා ඇති රාජ්‍ය සහ පෞද්ගලික ආයතන වෙත ජාත්‍යන්තර තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ස්වේච්ඡා දායකයන් 100 කට අධික සංඛ්‍යාවක් යැවීම සඳහා සම්බන්ධීකාරක/ පහසුකම් දායකයකු වශයෙන් ක්‍රියා කරයි.

මෙම වසරේ දී, ප්‍රතිපත්ති සහ ජාත්‍යන්තර සබඳතා අංශය විසින් දකුණු කොරියානු තොරතුරු සමාජ නියෝජිතායතනයේ නිලධාරීන්ගේ සම්බන්ධීකරණය ඇතිව "ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමය / දකුණු කොරියානු ජාතික තොරතුරු සමාජ නියෝජිතායතනයේ ජාත්‍යන්තර තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ස්වේච්ඡා වැඩසටහන 2022" සඳහා අදාළ වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන වෙත පරිත්‍යාග බෙදා හැරීමට ඔවුන්ට සහාය විය. මෙම අංශයේ කාර්ය මණ්ඩලය දකුණු කොරියානු ජාතික තොරතුරු සමාජ නියෝජිතායතනයේ නිලධාරීන් සමඟ මහනුවර සහ සීදුව වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන දෙකකට තොරතුරු තාක්ෂණ උපකරණ පරිත්‍යාග කිරීම පිණිස පැමිණියහ. මෙම වැඩසටහන යටතේ ශ්‍රී ලංකාවේ විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඇති සිසුන් අතර තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සාක්ෂරතාව වැඩිදියුණු කිරීම සඳහා මාර්ගගත පුහුණුවක් පවත්වන ලදී. 2022 ජූලි සිට අගෝස්තු දක්වා සීදුව, වත්තේගම සහ කැටවල වෘත්තීය පුහුණු මධ්‍යස්ථානවල විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඇති සිසුන්ට තොරතුරු තාක්ෂණ පුහුණුව ලබා දීම සඳහා දකුණු කොරියානු උපාධි අපේක්ෂකයින්ගේ ස්වේච්ඡා කණ්ඩායම් තුනක් අනුයුක්ත කර ඇත.

මෙම වැඩසටහන සාර්ථකව ක්‍රියාත්මක කිරීම පිණිස ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් සපයන ලද සහයෝගීත්වය දකුණු කොරියානු ජාතික තොරතුරු සමාජ නියෝජිතායතනය විසින් අගයන ලදී. මීට අමතරව, 2022 වසරේ දී කොරියානු ජාත්‍යන්තර තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ස්වේච්ඡා වැඩසටහන ක්‍රියාත්මක කළ රටවල් 11 අතරින් වඩාත් සමෘද්ධිමත් රටවල් අතුරින් එක් රටක් ලෙස ශ්‍රී ලංකාව තේරී පත් විය.

ජාත්‍යන්තර සබඳතා

ශ්‍රී ලංකාව වූ කලී ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය (ITU), ආසියා ශාන්තිකර විදුලි සංදේශ (APT) සහ දකුණු ආසියානු විදුලි සංදේශ නියාමකයින්ගේ සංගමයේ (SATRC) දිගුකාලීන සාමාජිකයෙකි. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL) යනු විදුලි සංදේශ රෙගුලාසි ආශ්‍රිත සියලුම කාරණා සම්බන්ධයෙන් ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය හෝ එහි අනුබද්ධ ආයතන සමඟ සාකච්ඡා කිරීමේ එකම නීත්‍යානුකූල අධිකාරියයි.

ඉහත සඳහන් කළ ජාත්‍යන්තර සංවිධානවල සාමාජිකත්වය ලැබීම තුළින් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට තාක්ෂණික / විශේෂඥ සහාය, සහයෝගීතා ව්‍යාපෘති, වැඩසටහන් සහ විදුලි සංදේශ / තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පිළිබඳ ධාරිතාවය ගොඩනැගීමේ සහයෝගිතා අවස්ථා ලබා ගැනීමට හැකියාව ලබා දෙයි. ඉහත සඳහන් ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම පිණිස ජාත්‍යන්තර සංවිධාන සම්බන්ධීකරණය කිරීමේ කේන්ද්‍රස්ථානය වන්නේ ප්‍රතිපත්ති සහ ජාත්‍යන්තර සබඳතා අංශයයි. තවද, සමීක්ෂණ / ප්‍රශ්නාවලිය හරහා ජාත්‍යන්තර සංවිධානවලට අවශ්‍ය තොරතුරු සැපයීමට සහ ජාත්‍යන්තර සංවිධාන වලින් අදාළ දේශීය සංවිධාන සහ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අනෙකුත් අංශ වෙත තොරතුරු බෙදා හැරීමට මෙම අංශය පහසුකම් සපයයි.

ජාත්‍යන්තර සංවිධාන සහ කලාපීය නියාමකයින් සමඟ සහයෝගීතාවය

1. විශේෂඥ සහාය වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම

ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය (ITU) සහ ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමය (APT) ඇතුළු ජාත්‍යන්තර සංවිධාන විසින් සිය සාමාජික රටවල් වලට ඔවුන්ගේ ඉල්ලීම් මත විදුලි සංදේශ / තොරතුරු හා සන්නිවේදන තාක්ෂණික හෝ විශේෂඥ සහාය ලබා දේ. විශේෂඥ සහාය ක්‍රියාවලියේදී, ප්‍රතිපත්ති සහ ජාත්‍යන්තර සබඳතා අංශය විශේෂඥයින් බඳවා ගැනීම, සාකච්ඡා / රැස්වීම් සඳහා පහසුකම් සැලසීම, මහජන උපදේශන සේවා සංවිධානය කිරීම, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, විදේශීය විශේෂඥයින් වෙනුවෙන් සැපයුම් කටයුතු සඳහා පහසුකම් සැලසීම, අවශ්‍ය ලියකියවිලි සැකසීම යනාදී කටයුතු හා සම්බන්ධ වේ.

ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය සහ ලෝක බැංකුව සමඟ සහයෝගීතාවයෙන් පහත සඳහන් විශේෂඥ සහය වැඩසටහන් දැනට පවත්වනු ලැබේ.

අ. ලෝක බැංකු විශේෂඥ සහාය වැඩසටහන්

ඩිජිටල් සංවර්ධන ප්‍රතිපත්ති මෙහෙයුම් රාමුව යටතේ, ශ්‍රී ලංකාවේ ඩිජිටල් ආර්ථිකය ප්‍රවර්ධනය කිරීම සහ අධිවේගී අන්තර්ජාල සම්බන්ධතාව පුළුල් කිරීම පිණිම ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වෙත විශේෂඥ සහාය ලබා දෙන බවට ලෝක බැංකුව සහතික වී ඇත. ලෝක බැංකුව විසින් සපයනු ලබන විශේෂඥ සහාය යටතේ සංඛ්‍යාත වර්ණාවලිය කළමනාකරණය, තරහකාරීත්වය නියාමනය, විදුලි සංදේශ පනත සංශෝධනය සහ ආයතනික ප්‍රතිව්‍යුහගතකරණය සහ ධාරිතා ගොඩනැගීම යන

ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමු කරයි.

ලෝක බැංකුව විසින් සිදු කරනු ලබන අඛණ්ඩ වැඩසටහන් පහත පරිදි සාරාංශ ගත කර ඇත.

i) 5G ඇතුළුව වැඩිදියුණු කරන ලද බ්‍රෝඩ්බෑන්ඩ් සේවා සඳහා සංඛ්‍යාත වර්ණාවලිය පැවරීම.

උපදේශන පත්‍රිකාව 2023 දෙසැම්බර් මාසයේදී ප්‍රකාශයට පත් කරන ලදී. මහජන අදහස් විමසීම සඳහා ප්‍රතිචාර ලැබෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

ii) විදුලි සංදේශ වෙළඳපොළේ තරහකාරී නියාමනය

උපදේශන පත්‍රිකාවේ නවතම වාර්තාව ලෝක බැංකු උපදේශකයන්ගෙන් ලැබුණු අතර ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් මෙය 2024 වසරේ දෙවන කාර්තුවේ දී සම්පූර්ණ කිරීමට අපේක්ෂා කරයි.

iii) විදුලි සංදේශ පනත සංශෝධනය කිරීම

පනත සංශෝධනය කිරීම පිණිස අමාත්‍ය මණ්ඩල අනුමැතිය අපේක්ෂාවෙන් සිටි අතර මෙය 2024 දෙවන කාර්තුවේ දී සම්පූර්ණ කෙරේ.

iv) ආයතනික ප්‍රතිව්‍යුහගතකරණය සහ ධාරිතාවය ගොඩනැංවීම

ලෝක බැංකු විශේෂඥයා විසින් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සියලුම අංශ සමඟ මූලික රැස්වීම් පවත්වන ලදී.

ආ. ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ විශේෂඥ සහාය වැඩසටහන

ආසියා සහ ශාන්තිකර කලාපයේ විශේෂඥ සහාය වැඩසටහනේ කොටසක් වශයෙන්, "යටිතල පහසුකම් බෙදාගැනීම හරහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සඳහා පහසුවෙන් ප්‍රවේශවීම පිළිබඳ ජාතික කාර්යසාධන විශ්ලේෂණය" සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවට තාක්ෂණික සහාය ලබා දීමට ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය එකඟ විය. යටිතල පහසුකම් බෙදාගැනීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම සඳහා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සමඟ සහයෝගයෙන් මෙම මෙහෙවර සිදු කෙරේ. යටිතල පහසුකම් බෙදාගැනීමේ නියාමන රාමුව සකස් කිරීම පිණිස අධ්‍යක්ෂ ජනරාල් විසින් කමිටුවක් පත් කරන ලදී. ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ යටිතල පහසුකම් බෙදාගැනීමේ කෙටුම්පත් වාර්තාව සමාලෝචනය කිරීමෙන් පසුව, කමිටුව සිය අදහස් ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය වෙත ඉදිරිපත් කළේය. කමිටුව දැනට ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ උපදේශකයින්ගෙන් පිළිතුරු අපේක්ෂාවෙන් සිටී.

2. ඉහළ මට්ටමේ රැස්වීම් සහ සම්මන්ත්‍රණ වෙනුවෙන් රට නියෝජනය කිරීම සම්බන්ධීකරණය කිරීම

විදුලි සංදේශ ක්ෂේත්‍රයේ ජාත්‍යන්තර නියාමන සංවිධාන විසින් සිය සාමාජික රටවලට ඔවුන්ගේ ක්‍රියාකාරී සහභාගීත්වය අඛණ්ඩව කරගෙන යාම පිණිස අදාළ වැඩසටහන් සඳහා ප්‍රායෝගිකව හෝ මාර්ගගතව සහභාගීවීම දිරිමත් කර ඇත. මෙම සන්දර්භය තුළ, අංශය අදාළ ජාත්‍යන්තර සංවිධාන (ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය, ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමය සහ දකුණු ආසියානු විදුලි සංදේශ නියාමකයින්ගේ සංගමය) සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදු කරන ලද අතර ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් සහ විධායක කාර්ය මණ්ඩලයට පහත සඳහන් ඉහළ මට්ටමේ රැස්වීම් / සම්මන්ත්‍රණ සඳහා සහභාගී වීමට අවස්ථාව සලසන ලදී.

- දකුණු ආසියානු විදුලි සංදේශ නියාමකයින්ගේ සංගමයේ 24 වන රැස්වීම (SATRC - 24)

  දකුණු ආසියානු විදුලි සංදේශ නියාමකයින්ගේ සංගමය (SATRC) යනු දකුණු ආසියාතික රටවල් නවයකින් සමන්විතව ඉහළ මට්ටමේ වගකීම් සහිතව ස්ථාපනය කරන ලද ප්‍රධාන උප කලාපීය සංවිධානයකි. දකුණු ආසියානු විදුලි සංදේශ නියාමකයින්ගේ සංගමයේ රැස්වීම් ජාතික මට්ටමේ පොදු විදුලි සංදේශ ගැටළු පිළිබඳ සාකච්ඡා වල නිරතවීම සහ සම්බන්ධීකරණය කිරීමෙහි ලා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ නියාමකයින් සඳහා සංසදයක් ලෙස ක්‍රියා කරයි. සංගමයේ රැස්වීමට ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා සහභාගී විය. රැස්වීමේ ආරම්භක සැසියේදී අධ්‍යක්ෂ ජනරාල්වරයා පොදු ප්‍රකාශයක් සිදු කළ අතර සැසි දෙකක් සඳහා සංවාද කණ්ඩායමේ සාමාජිකයකු වශයෙන් කටයුතු කරමින් රැස්වීමට තවදුරටත් දායක විය.

- ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ (APT) මහා සභා රැස්වීමේ 16 වැනි සැසිවාරය (GA - 16) සහ කළමනාකරණ කමිටුවේ 47 වැනි සැසිවාරය (MC - 47)

  ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ (APT) උත්තරීතර ආයතනය මහා සභාව වන අතර, සෑම වසර තුනකට වරක් සාමාන්‍ය සැසිවාර සහ අවශ්‍ය පරිදි විශේෂ සැසිවාර රැස්වේ. සියලුම සාමාජිකයින් සහ ආශ්‍රිත සාමාජිකයින්ගෙන් සමන්විත කළමනාකරණ කමිටුව වසරකට වරක් රැස්වේ. එහි දී මහා සභා රැස්වීමේ ප්‍රතිපත්ති සහ මූලධර්ම අනුගමනය කරන අතර, ලේකම් කාර්යාලයේ ක්‍රියාකාරිත්වය අධීක්ෂණය කිරීම, වැඩසටහන්, වාර්ෂික අයවැය, ගිණුම් සමාලෝචනය කිරීම සහ අධීක්ෂණය කිරීම සහ රෙගුලාසි සකස් කිරීම සිදු කරයි. ප්‍රතිපත්ති සහ ජාත්‍යන්තර සබඳතා අංශය විසින් ශ්‍රී ලංකාවේ දූත පිරිසට ඉහත වැඩසටහන් සඳහා සහභාගී වීම පිණිස තාක්ෂණ අමාත්‍යාංශය සහ විදේශ කටයුතු අමාත්‍යාංශය (එක්සත් ජාතීන්ගේ අංශය) සමඟ සම්බන්ධීකරණයෙන් අක්තපත්‍ර සකස් කරන ලදී. බැංකොක් හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ නියෝජිතයින්ගේ සහභාගීත්වය

ඇති ව මෙම වැඩසටහන පවත්වන ලද අතර ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ විධායක නිලධාරීන් කිහිප දෙනෙකු අන්තර්ජාලය ඔස්සේ මෙම වැඩසටහන් සඳහා එක් විය.


3. ධාරිතාවය ගොඩනැංවීමේ සහ පුහුණු කිරීමේ වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම

මෙම අංශය විසින් ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය (ITU) සහ ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමය (APT) ඇතුළු ජාත්‍යන්තර සංවිධාන සම්බන්ධීකරණය කරන ලද අතර ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභා කාර්ය මණ්ඩලය සඳහා ධාරිතාවය ගොඩනැංවීමේ වැඩසටහන් සංවිධානය කළේය. එවැනි ධාරිතාවය ගොඩනැංවීමේ වැඩසටහන් වලින් රැස් කරගත් දැනුම සහ අත්දැකීම් හුවමාරු කර ගැනීම සඳහා, ප්‍රතිපත්ති සහ ජාත්‍යන්තර සබඳතා අංශය විසින් පශ්චාත් පුහුණු ඉදිරිපත් කිරීම් පවත්වන ලදී.

උසස් පුහුණු කමිටුවේ (ATC) අනුමැතිය ඇතිව 2023 වසරේ පහත සඳහන් වැඩසටහන් වලට සහභාගී වීමට අදාළ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභා නිලධාරීන් නම් කිරීමට අංශය කටයුතු යොදා ඇත.

වැඩසටහන් කාණ්ඩය	ITU	APT	වෙනත්	මුළු සංඛ්‍යාව
පුහුණුවීම්	-	16	-	16
සම්මන්ත්‍රණ	-	-	01	01
මාර්ගගත වැඩසටහන්	03	01	02	06
සම්මන්ත්‍රණ	-	01	-	01
රැස්වීම්	08	06	-	14
සමුළු	-	02	-	02
වැඩමුළු	02	03	-	05
එකතුව	**13**	**29**	**03**	**45**

අරමුදල් වර්ගය අනුව වැඩසටහන්	ITU	APT	වෙනත්	එකතුව
සහයෝගිතා වැඩසටහන්	08	22	01	**31**
ගාස්තු රහිත වැඩසටහන්	05	07	02	**14**
මුළු ජාත්‍යන්තර වැඩසටහන් සංඛ්‍යාව	13	29	03	**45**



තවද, ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමය (APT), GSM සංගමය (GSMA), ආසියා ශාන්තිකර ජාල මධ්‍යස්ථානය (APNIC), සහ ජාත්‍යන්තර සමාජය (ISOC) සමඟ සම්බන්ධීකරණයෙන් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සහ ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගමේ නිලධාරීන් 30කගේ සහභාගීත්වයෙන් පහත සඳහන් මාතෘකා යටතේ ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමය දේශීය පුහුණු වැඩසටහන් තුනක් සංවිධානය කරන ලදී.

- "මෘදුකාංග ප්‍රකාශිත ජාලකරණය (SDN) හඳුන්වාදීම" පිළිබඳ ආසියා ශාන්තිකර ජාල මධ්‍යස්ථානයේ පුහුණු පාඨමාලාව (ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ පවත්වන ලද පුහුණු පාඨමාලාව), 2023 ඔක්තෝබර් 9 - 13.
- "ඩිජිටල් යුගයේ තරඟකාරිත්ව ප්‍රතිපත්තිය" පිළිබඳ GSMA මාර්ගගත පුහුණු පාඨමාලාව, 2023 ජූනි 29 - අගෝස්තු 25.
- "පරිගණක ජාල සැලසුම් කිරීම සහ යෙදවීම", පිළිබඳ ජාත්‍යන්තර සමාජයේ (ISOC) මාර්ගගත පුහුණු පාඨමාලාව - 2023 අගෝස්තු 17 - සැප්තැම්බර් 17.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් සංවිධානය කරන ලද / සත්කාරකත්වය දරන ලද ජාත්‍යන්තර වැඩසටහන්

සංඛ්‍යාත වර්ණාවලිය පිළිබඳ දකුණු ආසියානු විදුලි සංදේශ නියාමකයින්ගේ සංගමයේ (SATRC) කාර්යය කණ්ඩායමේ 2 වන රැස්වීම, 2023 සැප්තැම්බර් 19 - 21, කොළඹ, ශ්‍රී ලංකාව

ක්‍රියාකාරී සැලැස්ම VIII අදියර (SAP-VIII) යටතේ සංඛ්‍යාත වර්ණාවලිය පිළිබඳ දකුණු ආසියානු විදුලි සංදේශ නියාමකයින්ගේ සංගමයේ (SATRC) කාර්යය කණ්ඩායමේ (WG SPEC) 2 වන රැස්වීම 2023 සැප්තැම්බර් 19 සිට 21 දක්වා ශ්‍රී ලංකාවේ කොළඹ දී පැවැත්විණි. ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමය (APT) විසින් සංවිධානය කරන ලද මෙම වැඩසටහන ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් සංවිධානය කරන ලදී. එම රැස්වීම දෙයාකාරයකින් පැවැත්වීමට කටයුතු කරන ලද අතර නියෝජිතයින් භෞතිකව මෙන්ම මාර්ගගතව ඒ සඳහා සහභාගී විය.

මෙම දකුණු ආසියානු විදුලි සංදේශ නියාමකයින්ගේ රැස්වීමේ දී දකුණු ආසියානු විදුලි සංදේශ නියාමකයින්ගේ කවුන්සිලය විසින් සංඛ්‍යාත වර්ණාවලිය පිළිබඳ දකුණු ආසියානු විදුලි සංදේශ නියාමකයින්ගේ සංගමයේ කාර්යය කණ්ඩායමට පවරා ඇති වැඩ අයිතමවල සම්පාදිත සංඛ්‍යාත වර්ණාවලිය ආශ්‍රිත කරුණු පිළිබඳ සාකච්ඡා කිරීම පිණිස කලාපයේ නියාමන ආයතනවල ඉහළම මට්ටමේ නියෝජිතයින් පොදු වේදිකාවක් වෙත කැඳවන ලදී. මෙම සාකච්ඡාවලට ඇතුළත් වන්නේ:

- දකුණු ආසියානු විදුලි සංදේශ නියාමකයින්ගේ සංගමයේ රටවල 5G සඳහා සංඛ්‍යාත වර්ණාවලි කළමනාකරණයට ප්‍රවේශයන්.
- දකුණු ආසියානු විදුලි සංදේශ නියාමකයින්ගේ සංගමයේ සාමාජික රටවල සංඛ්‍යාත වර්ණාවලි භාවිතය ඇගයීම.

- සංඛ්‍යාත වර්ණාවලිය බෙදා ගැනීම, වෙළඳාම සහ බදු දීම සඳහා නියාමන ප්‍රවේශයන් ගවේෂණය කිරීම.
- දකුණු ආසියානු විදුලි සංදේශ නියාමකයින්ගේ සංගමයේ රටවල මැදිහත්වීම් වල දී දේශ සීමා සම්බන්ධීකරණය කිරීම.
- දකුණු ආසියානු විදුලි සංදේශ සංගමයේ රටවල් තුළ සංඛ්‍යාත වර්ණාවලි කළමනාකරණ යටිතල පහසුකම්, ක්‍රියා පටිපාටි සහ මෙවලම් සංවර්ධනය කිරීම පිණිස දකුණු ආසියානු විදුලි සංදේශ නියාමකයින්ගේ සංගමයේ ක්‍රියාකාරී සැලසුම්.

කොළඹ මැරියට් හෝටලයේ දී මෙම හමුව පැවැත්විණි. ප්‍රතිපත්ති සහ ජාත්‍යන්තර සබඳතා අංශය විසින් මෙම රැස්වීම දෙයාකාරයකින් පැවැත්වීමට පහසුකම් සැලසීම ඇතුළුව, ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ අවශ්‍යතා සහ විධිවිධානවලට අනුකූලව රැස්වීමේ නිසි ප්‍රගතිය සහතික කිරීම පිණිස ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමය සහ මැරියට් හෝටලයේ කළමනාකාරිත්වය සමඟ සහයෝගයෙන් කටයුතු කළේය. තවද, මෙම අංශය විසින් විදේශීය නියෝජිතයන් සඳහා වීසා විධිවිධාන සැලසීම පිණිස අදාළ ආයතන සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදු කරන ලද අතර රැස්වීමේ සැපයුම් අවශ්‍යතා සපුරාලීම සඳහා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අනෙකුත් අංශ සමඟ කටයුතු කරන ලදී.

මෙම දකුණු ආසියානු විදුලි සංදේශ නියාමකයින්ගේ සංගමයේ රැස්වීමට දකුණු ආසියානු විදුලි සංදේශ නියාමකයින්ගේ සංගමයේ සාමාජික රටවල් 9 ක් සහ අසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ අනුබද්ධ සාමාජිකයින් හතරක් නියෝජනය කරමින් සහභාගිවන්නන් 30 දෙනෙකු සහභාගී විය. දකුණු ආසියානු විදුලි සංදේශ නියාමකයින්ගේ සංගමයේ සාමාජික රටවල් 9 ක විශේෂඥයින් 16 දෙනෙකු මෙම රැස්වීමට සහභාගී වූහ.

ලෝක විදුලි සංදේශ සහ තොරතුරු සමාජ දිනය 2023

ලෝක විදුලි සංදේශ සහ තොරතුරු සමාජ දිනය (WTISD) වාර්ෂිකව සමරනු ලබන්නේ සමාජ ආර්ථික සංවර්ධනය සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ භාවිතා කිරීමේ මාර්ග සහ විධි පිළිබඳව ගෝලීය වශයෙන් දැනුවත් කිරීමේ අරමුණ ඇතිවය. 1865 මැයි 17 වන දින ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය (ITU) විසින් ස්ථාපනය කරන ලද පළමු ජාත්‍යන්තර ටෙලිග්‍රාෆ් සම්මුතියට අත්සන් තබා මෙම වසරට වසර 156 ක් සපිරේ.

2023 වසරේ ලෝක විදුලි සංදේශ හා තොරතුරු සමාජ දිනය සැමරීමේ දී, ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය විසින් මෙම වසරේ තේමාව වන "තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයෙන් ඌන සංවර්ධිත රටවල් සවිබල ගැන්වීම" යටතේ දායක වීම සහ දැනුවත් කිරීම උදෙසා සිය සියලුම සාමාජික රටවලට ආරාධනා කර ඇත. මෙම තේමාවෙන් අවධාරණය කරන්නේ ඌන සංවර්ධිත රටවල් 46 (LDCs) පමණ අන්තර්ජාලයට සම්බන්ධ නොවී බිලියන ගණනක ජනතාවක් සිටින බවත් රටක තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය වැඩිදියුණු කිරීමෙන් සමාජ හා ආර්ථික වර්ධනය ඉහළ නැංවිය හැකි බවත්ය. මෙමඟින් ව්‍යාපාර සංවර්ධනයේ දී අඩු වරප්‍රසාද ලත් අයට උපකාර කිරීම, තොරතුරු සහ නව වෙළඳපල වෙත ප්‍රවේශ වීම පහසු කිරීම සහ අධ්‍යාපනය සහ සෞඛ්‍ය සඳහා ප්‍රවේශය පහසු කිරීම සාක්ෂාත් කෙරේ.



ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ මහලේකම්, සභාපති සහ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන් ලෝක විදුලි සංදේශ හා තොරතුරු සමාජ දින විශේෂ පණිවිඩ ලබාගෙන ඒවා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභා වෙබ් අඩවියේ පළ කිරීමට ප්‍රතිපත්ති සහ ජාත්‍යන්තර සබඳතා අංශය අවශ්‍ය කටයුතු සම්පාදනය කළේය. මෙම වසරේ ලෝක විදුලි සංදේශ හා තොරතුරු සමාජ දිනයේ තේමාව කෙරෙහි අවධානය යොමු කරමින් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභා වෙබ් අඩවිය, සමාජ මාධ්‍ය සහ විද්‍යුත් මාධ්‍ය ඔස්සේ මහජනතාව දැනුවත් කිරීමට ද අවශ්‍ය පියවර ගෙන ඇත. තවද, 2023 වසරේ ලෝක විදුලි සංදේශ හා තොරතුරු සමාජ දිනයේ තේමාවේ වැදගත්කම පිළිබඳව අවධානය යොමු කරමින් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයේ සහභාගීත්වයෙන් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභා ශ්‍රවණාගාරයේදී උත්සවයක් සාර්ථකව සංවිධානය කරන ලදී. ඉන් අනතුරුව, "පරිගණක ආරක්ෂාව, තොරතුරු ආරක්ෂාව, සමාජ මාධ්‍යවල හිමිකම් ආරක්ෂණය සහ ආරක්ෂිත භාවිතයේ අවශ්‍යතාවය" පිළිබඳ දැනුවත් කිරීමේ සැසිවාරයක් ශ්‍රී ලංකා පරිගණක හදිසි සුදානම් කණ්ඩායමේ (SLCERT) සම්පත් දායකයෙකු විසින් එම ප්‍රේක්ෂකයින් සඳහා පවත්වන ලදී.

විදුලි සංදේශ නියාමනය ආශ්‍රිත සමීක්ෂණ සහ අනෙකුත් ප්‍රශ්නාවලි

ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ ලෝක විදුලි සංදේශන / තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ දර්ශක ප්‍රශ්නාවලිය 2023

ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය විසින් ප්‍රශ්නාවලි දෙකක් මඟින් සිය සාමාජික රටවලින් විදුලි සංදේශ / තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ යටිතල පහසුකම් සහ ප්‍රවේශය පිළිබඳ වඩාත් පුළුල් සංඛ්‍යා ලේඛන වාර්ෂිකව රැස් කරයි. ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය විසින් කරන ලද ඉල්ලීම මත ඉහත ප්‍රශ්නාවලිය දෙක දුරකථන ක්‍රියාකරු සමාගම්වල සහාය ඇතිව සම්පූර්ණ කරන ලදී. මේ සම්බන්ධයෙන්, දුරකථන ක්‍රියාකරු සමාගම්වලින් ලැබුණු සංඛ්‍යාන දත්ත එකතු කර, සම්පාදනය කර, ලබා දී ඇති කාල සීමාවන් තුළ ඉදිරිපත් කර ඇත. ඇතැම් සංඛ්‍යාන දත්ත සම්බන්ධයෙන් පැහැදිලි කිරීම් අවශ්‍ය අවස්ථාවල දී ඒවා දුරකථන ක්‍රියාකරු සමාගම් වලින් ලබා ගන්නා ලදී. “ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ දර්ශක කෙටි ප්‍රශ්නාවලිය 2023” අවසන් කරන ලද්දේ 2023 අප්‍රේල් මාසයේ දී ය. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ දර්ශක 70 කින් සමන්විත “ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ දර්ශක දිගු ප්‍රශ්නාවලිය 2023” මෙම වසරේ සිව්වන කාර්තුවේදී නිම කරන ලදී.

සමීක්ෂණයේ පරමාර්ථය වූයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සංවර්ධන දර්ශකය ගණනය කිරීම සඳහා ගෝලීය දත්ත එකතු කිරීම / යාවත්කාලීන කිරීමය. ගෝලීය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සංවර්ධනයේ තත්ත්වය පිළිබඳ විශ්ලේෂණය රජයන්, ජාත්‍යන්තර සංවිධාන, සංවර්ධන බැංකු සහ ලොව පුරා සිටින පුද්ගලික අංශයේ විශ්ලේෂකයන් මත පුළුල් ලෙස රඳා පවතී. සපයන ලද දත්ත ලෝක විදුලි සංදේශන / තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ දර්ශක දත්ත සමුදාය, ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ සංඛ්‍යාන ප්‍රකාශන සහ ලෝක බැංකු ප්‍රකාශන ඇතුළු විවිධ ප්‍රකාශන යාවත්කාලීන කිරීමට භාවිත කරන ලදී.

ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය (ITU) / ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමය (APT) ප්‍රශ්නාවලිය සහ අනෙකුත් සමීක්ෂණ

ප්‍රතිපත්ති සහ ජාත්‍යන්තර සබඳතා අංශය විසින් අනෙකුත් අංශ / දුරකථන ක්‍රියාකරු සමාගම් / රාජ්‍ය ආයතන සමඟ සම්බන්ධීකරණයෙන් අදාළ දත්ත ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කර ඇති අතර, එකතු කරන ලද තොරතුරු සම්පිණ්ඩනය කිරීමෙන් පසු පහත සමීක්ෂණ / ප්‍රශ්නාවලිය සම්පූර්ණ කරන ලදී.

- ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ ගෝලීය සයිබර් ආරක්ෂණ දර්ශක මාර්ගගත ප්‍රශ්නාවලිය 2023
- ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මිල ගණන් පිළිබඳ ප්‍රශ්නාවලිය 2023
- ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ ජංගම මූල්‍ය විශේෂ ප්‍රශ්නාවලිය
- ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ කෘතිම බුද්ධි ශක්‍යතා සමීක්ෂණය
- ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ රැහැන් රහිත කණ්ඩායම විසින් අනුමත කරන ලද ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ ප්‍රශ්නාවලිය - 30 (ප්‍රශ්නාවලි පහකින් සමන්විත)
- 2024 වසරේ පුහුණු පාඨමාලා අවශ්‍යතා සමීක්ෂණය පිළිබඳ ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ ප්‍රශ්නාවලිය
- 2024 වසරේ ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ කාර්යය වැඩසටහන් අතර ප්‍රමුඛතාවය පිළිබඳ ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ සමීක්ෂණය
- ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමය / ජාතික තොරතුරු සමාජ නියෝජිතායතනය ලෝක මිත්‍රත්ව කොරියානු තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ස්වේච්ඡා වැඩසටහන පිළිබඳ සමීක්ෂණය 2023
- ලෙව විවිධත්වය පිළිබඳ යෝජිත ජාතික ප්‍රතිපත්තිය සඳහා පාර්ශව කරුවන්ගේ උපදේශනය පිළිබඳ ප්‍රශ්නාවලිය - පරිසර අමාත්‍යාංශය
- ජාතික තරුණ ප්‍රතිපත්තිය පිළිබඳ ප්‍රශ්නාවලිය - තාක්ෂණ අමාත්‍යාංශය

ජාත්‍යන්තර සංවිධානවල වාර්ෂික දායකත්වය

ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය, ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමය, සහ දකුණු ආසියානු විදුලි සංදේශ නියාමකයින්ගේ සංගමය වැනි විදුලි සංදේශ අංශයේ ජාත්‍යන්තර නියාමන සංවිධානවල සාමාජිකයෙකු ලෙස, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව නවීන තාක්ෂණයන් අනුගමනය කිරීම, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සාක්ෂරතාවය ප්‍රවර්ධනය කිරීම අරමුණු කරගත් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට තාක්ෂණික/විශේෂඥ සහාය ලබා ගනී. ඉහත ජාත්‍යන්තර සංවිධානවල සාමාජිකයෙකු වීම නිසා රටේ මානව සහ ආයතනික ධාරිතාව ශක්තිමත් කිරීමට සහ විකාශනය වන විදුලි සංදේශ ක්ෂේත්‍රයකට අනුවර්තනය වීමට ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට පුහුණු සහ ශිෂ්‍යත්ව අවස්ථා ලබා ගැනීමට හැකියාව ලැබේ.

ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය යනු එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ ආශ්‍රිත සියලුම කරුණු සම්බන්ධයෙන් වගකීම දරන විශේෂිත ආයතනයකි. ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය විසින් ගුවන්විදුලි සංඛ්‍යාත වර්ණාවලියේ හවුල් ගෝලීය භාවිතය ප්‍රවර්ධනය කිරීම, වන්ද්‍රිකා කක්ෂ පැවරීමේදී ජාත්‍යන්තර සහයෝගිතාවයට පහසුකම් සැපයීම, ලෝක ව්‍යාප්ත තාක්ෂණික ප්‍රමිතීන් සංවර්ධනය කිරීමට සහ සම්බන්ධීකරණය කිරීමට සහාය වීම, මෙන්ම සංවර්ධනය වෙමින් පවතින විදුලි සංදේශ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමට ක්‍රියා කරයි. ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ සාමාජිකත්වය පවත්වා ගැනීම සඳහා වාර්ෂික පදනම්න් ශ්‍රී ලංකා විදුලි

සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් දායක මුදල් ගෙවනු ලැබේ.

ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමය යනු ආසියා ශාන්තිකර කලාපයේ විදුලි සංදේශ සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සංවර්ධනය සඳහා වන ප්‍රමුඛ අන්තර් රාජ්‍ය සංවිධානයකි. සංවර්ධනය වෙමින් පවතින රටවල් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් ආසියා ශාන්තිකර කලාපයේ විදුලි සංදේශ සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවා සංවර්ධනය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් 1979 ජූලි මාසයේදී UN ESCAP (ආසියාව සහ පැසිෆික් සඳහා එක්සත් ජාතීන්ගේ ආර්ථික හා සමාජ කොමිසම) සහ ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය විසින් ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමය ස්ථාපනය කරන ලදී. කලාපයේ විදුලි සංදේශ සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශවලට ප්‍රයෝජනවත් වන ප්‍රතිපත්ති සංවර්ධනය හා ක්‍රියාත්මක කිරීමේදී රජයේ, ව්‍යාපාර සහ වෙනත් අංශවල තීරණ ගන්නන් සම්බන්ධ කර ගැනීමෙන් ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමය කලාපීය සහයෝගීතාවයට පහසුකම් සපයයි. ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ සාමාජිකත්වය පවත්වා ගැනීම සඳහා වාර්ෂික පදනම්න් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් දායක මුදල් ගෙවනු ලැබේ.

දකුණු ආසියානු විදුලි සංදේශ නියාමකයින්ගේ සංගමය, ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමය සහ ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ ආසියා සහ ශාන්තිකර කලාපීය කාර්යාලයේ මූලපිරීමකින් 1997 දී පිහිටු වන ලදී. දකුණු ආසියානික රටවල විදුලි සංදේශ නියාමකයින් සඳහා පොදුවේ උනන්දුවක් දක්වන විදුලි සංදේශ සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ රෙගුලාසි සම්බන්ධ සියලුම ගැටළු සාකච්ඡා කිරීමේ සහ සම්බන්ධීකරණය කිරීමේ වගකීම දකුණු ආසියානු විදුලි සංදේශ නියාමකයින්ගේ සංගමය දරයි. මෙම ගැටළු වලට ගුවන්විදුලි සංඛ්‍යාත සම්බන්ධීකරණය, ප්‍රමිතීන්, නියාමන ප්‍රවණතා, විදුලි සංදේශ සංවර්ධනය සඳහා උපාය මාර්ග සහ විදුලි සංදේශ ආශ්‍රිත ජාත්‍යන්තර කටයුතු ඇතුළත් වේ. මෙම සංගමය විසින් දකුණු ආසියාතික රටවල් අතර විදුලි සංදේශනයේ ඵලදායී සහයෝගීතා ක්ෂේත්‍ර හඳුනාගෙන ප්‍රවර්ධනය කරන අතර සම්මන්ත්‍රණ, පුහුණු කිරීම් සහ වැඩමුළු වැනි ක්‍රියාකාරකම් ඔස්සේ මෙම ක්ෂේත්‍රවල තොරතුරු හුවමාරු කර ගැනීමට පහසුකම් සපයයි. දකුණු ආසියානු විදුලි සංදේශ නියාමකයින්ගේ සංගමයේ සාමාජිකත්වය පවත්වා ගැනීම සඳහා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් වසර දෙකකට වරක් දායක මුදල් ගෙවනු ලැබේ.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් 2023 මූල්‍ය වර්ෂය තුළ ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය සහ ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමය යන සංවිධාන දෙක වෙනුවෙන් සාමාජික මුදල් ගෙවීමට කටයුතු සම්පාදනය කරන ලදී. ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය වෙත ස්විස් ෆ්‍රෑන්ක් 159,000 ක මුදලක් සාමාජිකත්ව දායක මුදල් වශයෙන් ප්‍රේෂණය කරන ලද අතර ඊට අනුරූපීව 2023 පළමු කාර්තුවේදී ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමය වෙත ගෙවන ලද සාමාජික මුදල ඇමරිකන් ඩොලර් 15,420 කි.

නීති කටයුතු

- පනතේ 17 (2) වගන්තිය ප්‍රකාරව විදුලි සංදේශ පද්ධති බලපත්‍ර, වෙළඳ බලපත්‍ර, ගුවන්විදුලි සංඛ්‍යාත වර්ණාවලිය, ජාල සහ විදුලි සංදේශ ක්‍රියාකරු සමාගම් ආශ්‍රිත ගැටළු සම්බන්ධයෙන් නීති උපදෙස් ලබා දීම.
- පාරිභෝගික පැමිණිලි, ග්‍රාහක අනන්‍යතා මොඩියුලපත් (SIM) ලියාපදිංචිය, වෙබ් අඩවිය ආශ්‍රිත ගැටළු සහ නියාමන අනුකූලතාවයට අදාළ අනෙකුත් ව්‍යාපෘති දක්වා ව අනුකූලතා විෂයය කරුණු පරාසයක් සම්බන්ධයෙන් නීති උපදෙස් සහ සහාය ලබා දීම. එමෙන්ම මෙම අංශය විසින් පාලන හා මානව සම්පත් විෂයය ආශ්‍රිත ගැටළු සම්බන්ධයෙන් ද උපදෙස් ලබා දීම.
- ජංගම දුරකථන අංක ජාල අතර මාරු කිරීමේ පහසුකම, ජාත්‍යන්තර ජංගම උපකරණ අනන්‍යතාවය (IMEI)ලියාපදිංචි කිරීමේ පද්ධතිය සහ පාරිභෝගික පැමිණිලි නිරාකරණය කිරීමේ අභ්‍යන්තර කමිටුව ඇතුළුව ශ්‍රී ලංකා විදුලි සංදේශ සංගමයේ බොහෝ වැඩසටහන් සඳහා සහභාගී වී උපදෙස් ලබා දීම.
- 2023 වර්ෂයේ දී අපරාධ විමර්ශනය සඳහා අවශ්‍ය අධිකරණ නියෝග 554 ක් සකස් කර, අපරාධ විමර්ශනය කිරීමේ දී නීතිය ක්‍රියාත්මක කරන බලධාරීන්ට සහාය වීම.

2023 වසරේ දී මෙම අංශය රටේ ආර්ථික ප්‍රශ්න මධ්‍යයේ වුවද කොමිෂන් සභාවේ පහත සඳහන් නියාමන ක්‍රියාකාරකම් සඳහා ක්‍රියාකාරීව සම්බන්ධ වී දායක විය. සමාලෝචිත 2023 වසර ඉතා ඵලදායී එකක් විය.

(i) විශේෂ ව්‍යාපෘති / කොළඹ නෙළුම් කුලුන ව්‍යාපෘතිය

- කොළඹ නෙළුම් කුලුන (CLT) ඉදිකිරීම, කුලුන පවරා ගැනීම, ණය ගිවිසුම සහ වාණිජකරණය සම්බන්ධ ප්‍රධාන කරුණු සම්බන්ධයෙන් අවශ්‍ය උපදෙස් ලබා ගැනීමට ද කටයුතු කරන ලදී. කොළඹ නෙළුම් කුලුන සඳහා කළමනාකරණ ගිවිසුම අත්සන් කිරීම සහ බදු ගිවිසුම සකස් කිරීම.

(ii) විදුලි සංදේශ පනත සංශෝධනය කිරීම

- 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත සංශෝධනය කිරීම සඳහා සංකල්ප පත්‍රිකාවක් සකස් කිරීම පිණිස නීතිපති දෙපාර්තමේන්තුවේ නියෝජිතයකු ඇතුළු බුද්ධිමතුන් සහ විශේෂඥයන්ගෙන් සමන්විත කමිටුවක් පත් කිරීමට ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වෙත බලය පවරමින්

අමාත්‍ය මණ්ඩලය අනුමැතිය ලබා දී ඇත.

- සංකල්ප පත්‍රිකාව සකස් කිරීම නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමට පියවර ගෙන ඇති අතර, ඔවුන්ගේ උපදෙස් මත එම සංශෝධන පිළිබඳ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව තාක්ෂණ අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කර ඇත.

(iii) නඩු පැවරීම

- ගෙවීම් පැහැර හරින ක්‍රියාකරුවන්ගෙන් ව්‍යවස්ථාපිත හිඟ මුදල් අය කර ගැනීමට නීති අංශය විසින් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමේ කටයුතු ආරම්භ කර ඇත. 2023 වසරේ සමාජ මාධ්‍ය ගැටළු සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ නව නඩු කිහිපයක් ගොනු කරන ලද අතර, මෙම නඩු වෙනුවෙන් අධිකරණමය සහාය ලබා දීමට නීති අංශය සියලු පියවර ගන්නා ලදී.
- නියාමන නඩු: ඩයලොග් ආසියාටා පී.එල්. සී (Dialog Axiata PLC) සමඟ භාරතී එයාර්ටෙල් ලංකා (පෞද්ගලික) සමාගම නැවත වර්ණාවලිය පැවරීම අත්පත් කර ගැනීම සහ ඒකාබද්ධ කිරීමට එරෙහිව සීමාසහිත මොබිටෙල් (පෞද්ගලික) සමාගම විසින් අභියාචනාධිකරණයට රිට් අයදුම්පතක් ගොනු කරන ලදී.
- සීමාසහිත මොබිටෙල් (පෞද්ගලික) සමාගම සමඟ ගුවන්විදුලි සංඛ්‍යාත ඇතුළු ගුවන්විදුලි ප්‍රවේශ ජාල (RAN) බෙදා ගැනීමට එරෙහිව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද නියෝග අභියෝගයට ලක් කරමින් ශ්‍රී ලංකා ටෙලිකොම් පී.එල්.සී අභියාචනාධිකරණයට රිට් අයදුම්පතක් ගොනු කළේය.

විශේෂ ව්‍යාපෘති

කොළඹ නෙළුම් කුලුන ව්‍යාපෘතිය

නගරය කේන්ද්‍රගතව පිහිටි විකාශන කුලුනු ලෝකයේ සියළුම සංවර්ධිත නගරවල දක්නට ලැබෙන පොදු ලක්ෂණයකි. රූපවාහිනී සහ ගුවන් විදුලි විකාශන වැඩසටහන් ඉදිරිපත් කිරීමට සහය වීම සහ විදුලි සංදේශ ජාල සඳහා කේන්ද්‍රීය මධ්‍යස්ථානයක් වශයෙන් ක්‍රියා කිරීම එවැනි ජාලවල ප්‍රධාන අරමුණ වේ.

එක් දිශාවක සිට, තනි ඇන්ටනාවක් භාවිතා කර, විකාශන සංඥා නිසි ලෙස හාර ගැනීම මහජනතාවට සැලසෙන ප්‍රධාන ප්‍රතිලාභයක් වන අතර, එවැනි සංවර්ධනය කිරීම් මඟින් විකාශන සමාගම් වලට සිය යටිතල පහසුකම් හුවමාරු කර ගැනීමට ඉඩ සැලසීමත් සමඟ ඔවුන්ගේ ප්‍රාග්ධනය සහ මෙහෙයුම් වියදම් අඩුවීම විකාශන සමාගම් වලට ලැබෙන ප්‍රතිලාභ අතර ප්‍රධාන වේ.

කොළඹ නෙළුම් කුලුන කොළඹ නගරය කේන්ද්‍රයේ ස්ථාපනය වී ඇති බැවින් ඉඩම් වටිනාකම ඇතුළු සංවර්ධන පිරිවැය සැලකිය යුතු ලෙස ඉහළ ය. මෙම කුලුනු සංකීර්ණයේ මෙහෙයුම්වල තිරසාරභාවය සහ ආයෝජන සහතික කර ගැනීමෙහි ලා ආදායම නිසැක කර ගැනීම මෙන්ම සංකීර්ණයේ උපයෝගීතාවය වැඩි දියුණු කිරීම පිණිස ඉහල උන්නතාංශ නැරඹුම් මැදිරි, අවන්හල්, සාප්පු සංකීර්ණ සහ රථගාල් පහසුකම්, යනා දී බොහෝ ආකර්ෂණීය ස්ථාන එයට ඇතුළත් වේ.

කොළඹ නෙළුම් කුලුනේ ප්‍රධාන ආකර්ෂණීය ස්ථාන

- කොළඹ නගරය සහ ඊට තදාසන්න ප්‍රදේශවල දර්ශන අත්විඳිය හැකි පරිදි නරඹන්නන් සඳහා ඉහල උන්නතාංශයකින් යුතු නැරඹුම් මැදිරි.
- උත්සව ශාලා දෙකක් - මංගල උත්සව, සමාජීය සහ ආයතනික උත්සව කටයුතු සඳහා
- රාජ්‍ය අමුත්තන්ගේ නිවස උත්සව ශාලාවේ ක්‍රියාකාරිත්වයට සහාය වීම, ප්‍රභූ අමුත්තන් සඳහා නවාතැන් පහසුකම් රාජ්‍ය අමුත්තන් සඳහා නවාතැන් පහසුකම් සැපයීම, භෝජනශාලා මෙහෙයුම්වලට සහාය කර ගැනීම පිණිස රජයේ තානායම.
- විශාල සාප්පු සංකීර්ණ සහ ආහාර භෝජනාගාර.
- කැරකෙන අවන්හල
- ඇන්ටෙනා කුලුනු වලින් කොළඹ නගරය සහ එහි තදාසන්න ප්‍රදේශ ආවරණය කරමින් ඩිජිටල් වීඩියෝ විකාශන සේවා, ශ්‍රව්‍ය විකාශනය සහ ප්‍රතිසම විකාශන පහසුකම් සම-ස්ථානගත කිරීමට සහාය වීමට හැකියාව ලබා දේ.
- වාහන නැවැත්වීමේ පහසුකම් සහිත විශාල උද්‍යාන අවකාශයක්.

ව්‍යාපෘති කොන්ත්‍රාත්තුවේ සාරාංශය

සේවාදායකයා (ආයෝජකයා)	ශ්‍රී.ල.වි.ස.නි.කො. සභාව
කොන්ත්‍රාත්කරු	CEIEC සහ ALIT
සම්බන්ධතා වර්ගය	නිර්මාණය සහ ඉදිකිරීම
ව්‍යාපෘති ඉංජිනේරු	මොරටුව විශ්වවිද්‍යාලයේ ව්‍යාපෘති උපදේශන ඒකකය
ගිවිසුම්ගත මිල	මුළු එකතුව ඇමරිකානු ඩොලර් මිලියන 104.3. + 9.3 එකතුව
ව්‍යාපෘතිය ආරම්භ කිරීමේ දිනය	2012 නොවැම්බර් 16
ගිවිසුම්ගත ව්‍යාපෘති අවසන් කිරීමේ දිනය	2017 ඔක්තෝම්බර් 31 (මුල් ඉදිකිරීම් කාලය දින 912 + ශ්‍රී.ල.වි.ස.නි.කො. සභාව විසින් ලබා දී ඇති කාලය දීර්ඝ කිරීම)
ව්‍යාපෘතිය අවසන් කිරීමේ දිනය	2022.02.28

ව්‍යාපෘති සාරාංශය

කොළඹ නෙළුම් කුලුන ව්‍යාපෘතිය		
ක්‍රියාකාරී අයිතමය	**ප්‍රතිඵලය**	**කාර්යසාධනය**
කොළඹ නෙළුම් කුලුන ඉදිකිරීම	• ඉදිකිරීම සහ පරීක්ෂාව / සම්බන්ධීකරණ ය. විමර්ශනය සහ නිෂ්කාශනය / භාරදීමේ ප්‍රතිශතය. • EXIM බැංකු ණය ආපසු ගෙවීම. • දෝෂ නිවැරදි කිරීම් ප්‍රතිශතය. • ගිවිසුම් ගත ලියකියවිලි භාර දීම. • යන්ත්‍රෝපකරණ සහ උපකරණ බැහැර කිරීම / ප්‍රතිඅපනයනය කිරීම.	• අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද සාකච්ඡා සම්මුති කමිටුව / ව්‍යාපෘති කමිටුව නැවත පත් කිරීම. • ප්‍රධාන දෝෂ නිවැරදි කිරීම සහ පරීක්ෂා කිරීම. • ව්‍යාපෘති උපදේශන ඒකකයේ ගෙවුම් ශේෂ පිළිබඳ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව සමාලෝචනය කෙරෙමින් පවතී. • වත්කම් ලේඛනය සම්පාදනය කිරීම. • ඉවත දැමිය හැකි / ප්‍රතිඅපනයන උපකරණ සඳහා බදු ගෙවීම පිළිබඳ ව ශ්‍රී ලංකා රේගුවේ සහය ඇති ව ක්‍රියාවලිය ආරම්භ කිරීම.
කොළඹ නෙළුම් කුලුන සංකීර්ණය වාණිජකරණය කිරීම	• රක්ෂණ ආවරණය ලබා ගැනීම • කළමනාකරණ සමාගම විසින් දේශීය නියෝජිතයන්/සැපයුම්කරුවන් සමඟ නඩත්තු ගිවිසුම්වලට එළැඹීම. • අලෙවිකරණ ව්‍යාපාරය • විකාශන යටිතල පහසුකම් වලින් මුදල් ඉපැයීම.	• ඩිජිටල් විකාශනය සඳහා කොළඹ නෙළුම් කුලුනේ යටිතල පහසුකම් භාවිතය සඳහා ජනමාධ්‍ය සමඟ සාකච්ඡා ආරම්භ කිරීම. • අවශ්‍ය රක්ෂණ ආවරණ ලබා ගැනීම. • කොළඹ නෙළුම් කුලුනේ කළමනාකරණ කමිටුව සමඟ බදු ගිවිසුම අත්සන් කිරීම. • කොළඹ නෙළුම් කුලුනේ කැරකෙන අවන්හලේ මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීම.
කුලුනු ශීර්ෂය භාවිත කිරීම	• කොළඹ නෙළුම් කුලුන මඟින් ඩිජිටල් වීඩියෝ විකාශන සේවා ලබා ගැනීම සහ කොළඹ නෙළුම් කුලුන ශ්‍රී ලංකාවේ විකාශන මධ්‍යස්ථානය බවට පත් කිරීම. • ආරක්ෂක අමාත්‍යාංශයේ අවශ්‍යතා සඳහා පහසුකම් සැලසීම. • අගය එකතු කළ සේවාවන් සඳහා කොළඹ නෙළුම් කුලුනේ ශීර්ෂය භාවිත කිරීම.	• කොළඹ නෙළුම් කුලුනේ සිට ඩිජිටල් වීඩියෝ විකාශන (DVB) සම්ප්‍රේෂණයට සහය වන කොළඹ නෙළුම් කුලුනේ ඇති පහසුකම් අධ්‍යයනය කිරීම සඳහා ජපන් ජාත්‍යන්තර සහයෝගීත්ව ඒජන්සිය, ජනමාධ්‍ය අමාත්‍යාංශය, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව, සහ කොළඹ නෙළුම් කුලුන පිළිබඳ ව්‍යාපෘති උපදේශන ඒකකයේ පිරිසකගෙන් සමන්විත කණ්ඩායම ඇතුළත් ඒකාබද්ධ සංචාරයක් සඳහා පහසුකම් සැලසීම. • ආරක්ෂක අවශ්‍යතා සංවිධානය කිරීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශය සමඟ සාකච්ඡා ආරම්භ කිරීම. • කුලුනු ශීර්ෂයේ මහල් දෙකක භූමි ප්‍රමාණය තක්සේරු කිරීමට පියවර ගෙන ඇත.
නෙළුම් කුලුන අදියර 02 ව්‍යාපෘතිය	• මිශ්‍ර සංවර්ධනය සඳහා වාහන නැවැත්වීමේ පහසුකම.	• ඉඩම අත්පත් කර ගෙන සංවර්ධන කටයුතු සිදු කෙරෙමින් පවතී.
ව්‍යාපෘතියේ පරිපාලන ප්‍රගතිය	• වැඩබිම නිම කිරීම, පරීක්ෂා කිරීම සහ ඉදිකිරීම සඳහා ගිවිසුම් ක්‍රියාවලිය අනුගමනය කිරීම. • එක්සිම් බැංකු ණය ලබා දීම.	• මුදල් අමාත්‍යාංශයේ උපදෙස් මත 2023 වසරේ ණය ප්‍රාග්ධනය සහ පොලී ගෙවීම අත්හිටුවීම. • එක්සිම් බැංකු ණය ආපසු ගෙවීම පිළිබඳ සංශෝධිත ගිවිසුම සමාලෝචනය කරන ලදී.

වෙනත් සංවර්ධන ව්‍යාපෘති		
ව්‍යාපෘතිය	ප්‍රතිඵලය	**කාර්යසාධනය**
ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ නව ගොඩනැගිල්ල ඉදිකිරීම	• නිම කිරීමේ ප්‍රතිශතය. • ව්‍යාපෘති සංරචක භාර දීමේ අගයන්.	• අභ්‍යන්තර නිර්මාණය සඳහා කමිටුවක් පත් කිරීම. • ව්‍යාපෘතිය නිම කිරීම සඳහා අත්‍යවශ්‍ය අමතර කාර්යයන් හඳුනා ගැනීම. • පරීක්ෂාව සහ ඉදිකිරීම හැර වෙනත් භෞතික කාර්යයන් සම්පූර්ණ කිරීම. • අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද පවතින ගොඩනැගිල්ල සංවර්ධනය කිරීම වෙනුවට නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම පිළිබඳ ව අමාත්‍ය මණ්ඩලයට දැනුම් දීමේ ක්‍රියාවලිය ආරම්භ විය.
තොරතුරු තාක්ෂණ උද්‍යානය - හම්බන්තොට	• හම්බන්තොට තොරතුරු තාක්ෂණ උද්‍යානයේ ආයෝජනය සඳහා අභිලාෂය ප්‍රකාශ කිරීම කැඳවීම.	• අභිලාෂය ප්‍රකාශ කිරීම කැඳවීම සඳහා අභ්‍යන්තර කමිටුවක් පත් කිරීම.
කදිරාන ප්‍රතිසංස්කරණය, නවීකරණය සහ අලුත්වැඩියා කිරීමේ ව්‍යාපෘතිය	• නිම කිරීමේ ප්‍රතිශතය. ව්‍යාපෘති සංරචක සැපයීමේ අගයන්. • ව්‍යාපෘතිය සම්පූර්ණයෙන් නිම කිරීම සඳහා අවශ්‍ය අමතර වැඩ.	• අමතර වැඩ හඳුනා ගැනීමත් සමඟ ව්‍යාපෘතිය නැවත සැලසුම් කිරීම. • අතිරේක කාර්යයන් හඳුනා ගැනීම සඳහා අභ්‍යන්තර කමිටුවක් පත් කිරීම.

පාලන සහ ආයතනික කටයුතු

සේවක සංඛ්‍යා ස්ථාපන කටයුතු සහ සේවක සංඛ්‍යා කළමනාකරණය

පුද්ගලික ලිපිගොනු නඩත්තු කිරීම, බඳවා ගැනීම, ස්ථිර කිරීම, උසස්වීම්, නිවාඩු වාර්තා, පැමිණීම, සේවකයින්ගේ කාර්යසාධනය ඇගයීම, විනය පරීක්ෂණ වැනි ආයතනයේ සංස්ථාපන කාර්යයන් පාලන අංශය විසින් සිදු කරනු ලබයි.

2023 දෙසැම්බර් 31 දිනට මුළු කාර්ය මණ්ඩලය 222 කි. සමස්ත කාර්ය මණ්ඩලයෙන් 53 ක් ජ්‍යෙෂ්ඨ කළමනාකාර තනතුරුවල, 24 ක් මධ්‍ය කළමනාකාර තනතුරුවල, 100 ක් යටත් ශ්‍රේණිවල සහ 45 ක් සුළු ශ්‍රේණිවල සිටී. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සඳහා අනුමත සේවක සංඛ්‍යාව 298 කි.

අභ්‍යන්තර උසස්වීම් යෝජනා ක්‍රමය යටතේ කළමනාකරණ සහකාර 01 ක් කෙනෙකු, කාර්යාල කාර්ය සහායකයින් 04 දෙනෙකු සහ සහකාර අධ්‍යක්ෂ 01 දෙනෙකු II ශ්‍රේණියේ සිට I ශ්‍රේණිය දක්වා උසස් කරන ලදී.

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරුන් 03 දෙනෙකු, අධ්‍යක්ෂවරුන් 09 දෙනෙකු, කොමිෂන් සභා ලේකම්වරයෙකු, සහකාර අධ්‍යක්ෂවරුන් 17 දෙනෙකු, විගණන සහකාරවරුන් 02 දෙනෙකු, කළමනාකරණ සහකාරවරුන් 02 දෙනෙකු සහ රියදුරන් 08 දෙනෙකු බඳවා ගෙන ඇත. ප්‍රශස්ත කාර්ය සාධනය සහ බඳවා ගැනීමේ සුදුසුකම් සපුරාලීම මත කොන්ත්‍රාත් සේවකයින් 02 දෙනෙකුට කළමනාකරණ සහකාරවරුන් ලෙස ස්ථිර රැකියා ලබා දෙන ලදී.

රජයේ විශ්ව විද්‍යාල සහ වෘත්තීය පුහුණු ආයතනවල සිසුන් 19 දෙනෙකු මාස 06 ක පුහුණු කාලයක් සඳහා අභ්‍යාසලාභීන් ලෙස බඳවා ගන්නා ලද අතර එමඟින් ඔවුන්ට විදුලි සංදේශ ක්ෂේත්‍රයේ අත්දැකීම් ලබා ගැනීමට හැකි විය.

2023 වර්ෂයේ දී සේවකයින් සඳහා කාර්ය සාධන ඇගයීම් සකස් කිරීමට සහ ස්ථිර කාර්ය මණ්ඩලයේ නිලධාරීන් 194 දෙනෙකු සඳහා වැටුප් වර්ධක ලබාදීමට මෙම අංශය මඟින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලදී. මීට අමතරව, සේවක ප්‍රගති සමාලෝචන වාර්තා සකස් කිරීම, නිලධාරීන් ස්ථිර කිරීම හා උසස් කිරීම සම්බන්ධයෙන් වැටුප් පරිවර්තන සකස් කිරීම, සේවක අර්ථසාධක අරමුදලේ නිලධාරීන් ලියාපදිංචි කිරීම වැනි කටයුතු මෙම අංශය විසින් සිදු කරන ලදී. 2023 වසර තුළ සිදු කරන ලද මූලික විමර්ශන සංඛ්‍යාව 01 කි.

2023 වසර සඳහා මෙම අංශය විසින් ණය පොළියෙන් 2/3 ප්‍රතිපූරණය කිරීම, ආපදා ණය සහ වාහන ණය පිළිබඳ නව ඉල්ලීම් පිළිවෙළින් 258, 51 සහ 01 මුළු සංඛ්‍යාවක් සම්බන්ධයෙන් කටයුතු කරන ලදී. විශ්‍රාමික සේවකයින් 06 දෙනෙකු සඳහා පාරිතෝෂික දීමනා ලබා දීම ද සිදු කෙරිණි.

මෙම වසර තුළ අංශය විසින් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ කොමිෂන් සභා උපදෙස් සහ මහජන්වීම යටතේ යෝජිත බඳවා ගැනීම් යෝජනා ක්‍රමය (SOR) පිළිබඳ සිය කටයුතු අඛණ්ඩව සිදු කරන ලදී. ඒ අනුව අදාළ අංශ සඳහා යෝජිත සංවිධාන ව්‍යුහය සැකසුම් සත්‍යාපනය කිරීමේ සාකච්ඡා අඛණ්ඩව සිදු කරන ලදී.

කාර්ය මණ්ඩලයේ නිලධාරීන් සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාගය මෙම අංශය විසින් සාර්ථකව පවත්වන ලදී.

වාර්ෂික වාර්තාව 2022

වාර්ෂික වාර්තාවක් යනු විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ සමඟින් සිය මෙහෙයුම් කාර්ය සාධනය සහ මූල්‍ය තත්ත්වය විස්තර කරමින් පාර්ලිමේන්තුවට වාර්ෂිකව සැපයිය යුතු ප්‍රකාශනයකි. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් 2022 වාර්ෂික වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශය 2023.05.02 දින විගණකාධිපති කාර්යාලය සහ අනෙකුත් අදාළ ආයතන වෙත ඉදිරිපත් කරන ලදී. 2023.08.22 දින විගණකාධිපති වාර්තාව කෙටුම්පත් කිරීමෙන් පසු 2022 වාර්ෂික වාර්තාව සඳහා අනුමැතිය ලබා ගැනීමේ කොමිෂන් සභා පත්‍රිකාව ඉදිරිපත් කරන ලදී. කොමිෂන් සභාවේ අනුමැතිය 2023.09.14 දින ලැබී ඇති අතර, වාර්තාව පිළියෙල කිරීමේ අවසන් කාර්යයන් සූදානම් කෙරෙමින් පවතී. වසර අවසාන වන විට වාර්තාව පරිවර්තනය කිරීමේ අදියරේ පැවතිණි. කෙසේ වෙතත්, වාර්තාවේ පරිවර්තන කාර්යය නිම කිරීමෙන් පසු ඉදිරිපත් කිරීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම පිණිස අමාත්‍ය මණ්ඩල පත්‍රිකා සහ අදාළ ආධාරක ලේඛන සකස් කර ඇත.

ආයතනික සැලැස්ම 2024-2026 සහ ක්‍රියාකාරී සැලැස්ම 2024

ආයතනික සැලසුම් ක්‍රියාවලිය මඟින් සම්පත් ප්‍රශස්ත ලෙස භාවිත කිරීම සහතික කරන අතරම එහි අරමුණු සාක්ෂාත් කර ගැනීම සහතික කිරීම පිණිස ආයතනයට ශක්තිමත් ඉදිරි මාවතක් සැකසේ.

විදුලි සංදේශනය යනු තාක්ෂණයේ ශීඝ්‍ර වෙනස්කම් සහිත සක්‍රීය කර්මාන්තයකි. අපගේ ඉලක්ක සාක්ෂාත් කර ගැනීමේ දී පාරිභෝගිකයින් සහ කර්මාන්තය, මූල්‍යය, අභ්‍යන්තර ක්‍රියාවලිය මෙන්ම ආයතනික ධාරිතා ඇගයීම් ප්‍රතිලාභ ලබයි. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කළ යුතු උපාය මාර්ග ආයතනික සැලැස්මේ ඇතුළත් කර ඇති අතර එමඟින් ඵලදායී නියාමන පරිසරයක් නිර්මාණය කිරීමෙහි ලා දිරි ගන්වයි. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ආයතනික සැලැස්ම 2024 සිට 2026 දක්වා වසර තුනක් සඳහා යාවත්කාලීන කරන ලදී.

ආයතනික සැලැස්ම සහ ක්‍රියාකාරී සැලැස්ම 2024 අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අධීක්ෂණය යටතේ අංශ ප්‍රධානීන්ගේ උපදෙස් ඇතිව සකස් කරන ලදී. එය ක්‍රියාත්මක කිරීම සඳහා 2023 දෙසැම්බර් 22 දින කොමිෂන් සභා අනුමැතිය ලබාගෙන ඇති අතර, එම වාර්තා / ක්‍රියාකාරී සැලැස්ම අදාළ අමාත්‍යාංශ සහ අධිකාරීන් වෙත ඉදිරිපත් කරන ලදී.

ක්‍රියාකාරී සැලැස්මේ කාර්තුමය සමාලෝචනය 2023

ක්‍රියාකාරී සැලැස්ම සමාලෝචනය කිරීම පිණිස සෑම කාර්තුවකටම එක බැගින් ප්‍රගති සමාලෝචන රැස්වීම් 04 ක් පවත්වන ලදී. ආයතනයේ කාර්තුමය ප්‍රගතිය ඉදිරිපත් කිරීමට මාර්ගෝපදේශ සකස් කර ඇති බැවින්, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් නියමිත වේලාවට රේඛීය අමාත්‍යාංශය, රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව සහ ජාතික විගණන කාර්යාලය වෙත ප්‍රගතිය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කර ඇත.

ආයතනයේ පෙර ආයතනික සමාජ වගකීම් කටයුතු සම්බන්ධීකරණය කිරීම

කොමිෂන් සභා තීරණ ක්‍රියාත්මක කරන අතරම ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව පෙර ආයතනික සමාජ වගකීම් (CSR) ක්‍රියාකාරකම්වලට සහභාගී විය. කොමිෂන් සභාවේ තීරණය ප්‍රකාරව අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් කෙටුම්පත් කර තාක්ෂණ අමාත්‍යාංශය (MoT) වෙත යොමු කරන ලදී. තාක්ෂණ අමාත්‍යාංශය විසින් අමාත්‍ය මණ්ඩල සංදේශය අමාත්‍ය මණ්ඩල කාර්යාලයට යොමු කළේය. අමාත්‍ය මණ්ඩල කාර්යාලය විසින් මුදල් අමාත්‍යාංශයෙන් නිරීක්ෂණ කැඳවා ඇති අතර, නීති අංශයේ එකඟත්වය ඇතිව ඉල්ලා සිටි තොරතුරු මුදල් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත.

අමාත්‍ය මණ්ඩල තීරණය වූයේ තාක්ෂණ අමාත්‍යවරයා වශයෙන් අතිගරු ජනාධිපතිතුමාගේ උපදෙස් ඇතිව ත්‍රිපුද්ගල කමිටුවක් පත්කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට තාක්ෂණ අමාත්‍යාංශයේ ලේකම්වරයාට උපදෙස් ලබා දීමයි. ඒ අනුව, අමාත්‍ය මණ්ඩල තීරණය ක්‍රියාත්මක කිරීම පිණිස අතිගරු ජනාධිපතිවරයාගේ උපදෙස් ඇතිව ත්‍රිපුද්ගල කමිටුවක් පත් කරන ලෙස ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් තාක්ෂණ අමාත්‍යාංශයේ ලේකම්වරයාගෙන් ඉල්ලා සිටින ලද අතර එම අමාත්‍ය මණ්ඩල තීරණය ක්‍රියාත්මක කිරීමේ අපේක්ෂාවෙන් පසුවේ. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව අයත් වන අමාත්‍යාංශය කෙටි කාලයක් තුළ කිහිප වතාවක් වෙනස් විය. යෝජිත කමිටු පත්කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය දැනුවත් කිරීම් සිදු කර අදාළ අමාත්‍යාංශ වෙත හඳුන්වා දෙන ලදී. එබැවින් අමාත්‍යාංශ මට්ටමින් මෙම වැඩසටහනේ කටයුතු සම්බන්ධීකරණය කිරීම ප්‍රමාද විය.

ආයතනික කටයුතු පිළිබඳ ලිපි ගනුදෙනු කිරීම්

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් වර්ෂයේ ආයතන ක්‍රියාකාරකම්වල ක්‍රියාකාරිත්වයට අදාළව ජනාධිපති ලේකම් කාර්යාලය, අමාත්‍ය මණ්ඩල ලේකම් කාර්යාලය, භාණ්ඩාගාරය, අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ අනෙකුත් ව්‍යවස්ථාපිත අධිකාරීන් සම්බන්ධීකරණය කර කටයුතු මෙහෙයවන ලදී. තවද, ජාතික විගණන කාර්යාලය, රේඛීය අමාත්‍යාංශය, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව (කෝප්) සහ අනෙකුත් පාර්ලිමේන්තු කමිටු වලට අදාළ කරුණු සම්බන්ධයෙන් වසර තුළදී සහභාගී විය.

පුහුණුව

කාර්ය මණ්ඩලයට සිය දැනුම, කුසලතා සහ ධනාත්මක ආකල්ප වැඩිදියුණු කිරීමට සහ කාර්යාලයීය පරිසරය තුළ ඒවා අදාළ කර ගැනීමට ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් විසින් දේශීය සහ විදේශීය පුහුණු අවස්ථා ලබා දෙන ලදී. රාජ්‍ය වියදම් පාලනය කිරීමේ රජයේ ප්‍රතිපත්තිය හේතුවෙන් වසර තුළ දේශීය පුහුණුව ලබාදීම දැඩි ලෙස සීමා වී ඇත. නිලධාරීන් 83 දෙනෙකු දේශීය පුහුණුව සඳහා සහභාගී වූ අතර, නිලධාරීන් 38 දෙනෙකු පූර්ණ අරමුදල් සහිත විදේශීය පුහුණු සහ අනෙකුත් වැඩසටහන් සඳහා සහභාගී වී ඇත.

2023 වසරේ දී විදේශීය සහ දේශීය පුහුණු වැඩසටහන් සඳහා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභා කාර්ය මණ්ඩලයේ සහභාගීත්වය

අංකය	විදේශීය වැඩසටහන	අරමුදල් වර්ගය	කාලය		සහභාගී වූ නිලධාරීන් සංඛ්‍යාව
			සිට	දක්වා	
01	දකුණු ආසියානු විදුලි සංදේශ නියාමකයින්ගේ සංගමයේ (SATRC) සංඛ්‍යාත වර්ණාවලිය පිළිබඳ වැඩමුළුව	ශිෂ්‍යත්ව	2023.01.31	2023.02.02	2
02	සයිබර් ආරක්ෂණ තාක්ෂණයන් පිළිබඳ ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ පුහුණු පාඨමාලාව - නවතම අවදානම් ප්‍රවණතා සහ එහි ප්‍රතිවිරෝධතා	ශිෂ්‍යත්ව	2023.02.13	2023.02.17	1
03	APG23-5 සඳහා සාමාජිකත්වය	ශිෂ්‍යත්ව	2023.02.20	2023.02.25	1
04	ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ - T අධ්‍යයන කණ්ඩායම් 17 හි 5G භාවිතයන් පිළිබඳ සයිබර් ආරක්ෂාව සඳහා රැස්වීම්	ශිෂ්‍යත්ව	2023.02.21	2023.03.03	1
05	ජාත්‍යන්තර සම්මන්ත්‍රණ සඳහා සූදානම් වීම පිළිබඳ ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ පුහුණු පාඨමාලාව	ශිෂ්‍යත්ව	2023.03.07	2023.03.10	1
06	ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ - T අධ්‍යයන කණ්ඩායම් 03 රැස්වීම	ශිෂ්‍යත්ව	2023.03.01	2023.03.10	1
07	ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ 35 වන ප්‍රමිතිකරණ වැඩසටහන් සමුළුව (ASTAP-35) සහ WTSA-24 සඳහා ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ 1 වන පූර්ව කණ්ඩායම් රැස්වීම	ශිෂ්‍යත්ව	2023.04.17	2023.04.21	1
08	ඉන්දියාවේ ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ ප්‍රාදේශීය කාර්යාලයේ සමාරම්භක උත්සවය	ශිෂ්‍යත්ව	2023.03.21	2023.03.24	1

09	ප්‍රතිපත්ති, නියාමනය සහ සේවා පිළිබඳ දකුණු ආසියානු විදුලි සංදේශ නියාමකයින්ගේ සංගමයේ වැඩමුළුව	ශිෂ්‍යත්ව	2023.05.08	2023.05.10	2
10	ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ T අධ්‍යයන කණ්ඩායම 11	ශිෂ්‍යත්ව	2023.05.10	2023.05.19	1
11	ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ - T අධ්‍යයන කණ්ඩායම 9	ශිෂ්‍යත්ව	2023.05.09	2023.05.18	1
12	ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ රැහැන් රහිත කණ්ඩායමේ 31 වන රැස්වීම	ශිෂ්‍යත්ව	2023.05.22	2023.05.26	1
13	දත්ත, ජාලය සහ AI මඟින් ආර්ථික හා සමාජීය ගැටලු නිරාකරණය කිරීම පිළිබඳ ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමය - විදුලි සංදේශනය පිළිබඳ ජාතික ආයතනය පුහුණු වැඩසටහන	ශිෂ්‍යත්ව	2023.05.22	17.06.2023	1
14	"නව විකාශන මාධ්‍ය ප්‍රවේශයන් නිර්වචනය කරන තාක්ෂණයන්" පිළිබඳ ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ වැඩමුළුව	ශිෂ්‍යත්ව	2023.05.22	2023.05.26	1
15	ඉහළ මට්ටමේ නිලධාරීන් සඳහා ප්‍රතිපත්ති සම්පාදනය පිළිබඳ ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ පුහුණු වැඩමුළුව	ශිෂ්‍යත්ව	2023.06.26	2023.06.29	1
16	අල්ට්‍රා අධිවේගී අන්තර්ජාල තාක්ෂණය සහ විසඳුම් පිළිබඳ ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ පුහුණු පාඨමාලාව	ශිෂ්‍යත්ව	2023.08.14	2023.08.18	1
17	23 වන ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ 23 වන ප්‍රතිපත්ති සහ නියාමන සමුළුව (PRF-23)	ශිෂ්‍යත්ව	2023.06.20	2023.06.22	1
18	ප්‍රතිපත්ති නියාමනය සහ සේවා පිළිබඳ දකුණු ආසියානු විදුලි සංදේශ නියාමකයින්ගේ කාර්ය කණ්ඩායමේ රැස්වීම	ශිෂ්‍යත්ව	2023.07.04	2023.07.06	2
19	WRC-23 සඳහා ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ 06 වන පූර්ව සමුළු කණ්ඩායම් රැස්වීම	ශිෂ්‍යත්ව	14.08.2023	19.08.2023	1
20	Blockchain, Cybersecurity සහ Cyber Forensic සවිබල ගැන්වීම පිළිබඳ ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ පුහුණු පාඨමාලාව	ශිෂ්‍යත්ව	2023.09.01	2023.09.06	1
21	අනාගත ජාල යටිතල පහසුකම් සහ ඩිජිටල් පරිවර්තනය ක්‍රියාත්මක කිරීම පිළිබඳ ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ පුහුණු පාඨමාලාව	ශිෂ්‍යත්ව	2023.09.04	2023.09.08	1
22	කෘතිම බුද්ධිය සහ 5G තාක්ෂණය පිළිබඳ ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ පුහුණු පාඨමාලාව	ශිෂ්‍යත්ව	2023.09.17	2023.09.26	1
23	Whole-of-Government (WoG) and Gov Stack පිළිබඳ ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ ජ්‍යෙෂ්ඨ විධායක ධාරිතාව ගොඩනැගීමේ වැඩමුළුව	ශිෂ්‍යත්ව	2023.09.21	2023.09.22	1
24	කෘතිම බුද්ධියේ නවෝත්පාදන, භාවිතයන් සහ පාලන අභියෝග පිළිබඳ ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ පුහුණු පාඨමාලාව	ශිෂ්‍යත්ව	2023.09.23	2023.09.27	1
25	දකුණු ආසියානු විදුලි සංදේශ නියාමකවරුන්ගේ කවුන්සිලයේ 24 වැනි රැස්වීම	ශිෂ්‍යත්ව	2023.10.03	2023.10.05	1
26	ඩිජිටල් ව්‍යාජ්ති පරතරය අවම කිරීම සඳහා කලාපීය ප්‍රජාවන් තුළ මූලික ජාල සැලසුම් කුසලතා වර්ධනය කිරීම පිළිබඳ ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ පුහුණු පාඨමාලාව	ශිෂ්‍යත්ව	2023.10.11	2023.10.20	1
27	LTE සහ 5G පිළිබඳ ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ පුහුණු පාඨමාලාව: රැහැන් රහිත සන්නිවේදනයේ ඊළඟ පරම්පරාව	ශිෂ්‍යත්ව	2023.10.09	2023.10.14	1
28	5G ජංගම සන්නිවේදන තාක්ෂණය සහ AIBO භාවිතයන් පිළිබඳ උසස් සම්මන්ත්‍රණය	ශිෂ්‍යත්ව	2023.11.11	2023.11.24	2
29	ස්ත්‍රී පුරුෂ පරතරය අවම කිරීම සහ දේශීය ගැටළු සඳහා ජංගම විසඳුම් ශිල්පීන් පුහුණු කිරීමේ ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ වැඩමුළුව	ශිෂ්‍යත්ව	2023.11.13	2023.11.17	1
30	ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ අධ්‍යයන කණ්ඩායම 02 - සේවා සැපයීමේ මෙහෙයුම් අංශ සහ විදුලි සංදේශ කළමනාකරණය	ශිෂ්‍යත්ව	2023.11.06	2023.11.19	1

31	අනාගත තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය සඳහා ප්‍රකාශ තන්තු හා රැහැන් රහිත ජාල තාක්ෂණය පිළිබඳ ආසියා පුහුණු පාඨමාලාව, NTT උසස් තාක්ෂණ සහයෝගීත්වය	ශිෂ්‍යත්ව	2023.11.06	2023.11.14	1
32	2022-2025 සඳහා ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ - D අධ්‍යයන කණ්ඩායමේ දෙවන රැස්වීම	ශිෂ්‍යත්ව	2023.10.30	2023.11.03	1
33	විශේෂිත පාරිභෝගික පදනමක් ඉලක්ක කරගත් කර්මාන්තයක් සැපයීම පිණිස 5G සහ IoT ජාල යටිතල පහසුකම් සම්බන්ධයෙන් ජාතික ගණනය කිරීම් පිළිබඳ ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ පුහුණු පාඨමාලාව, NT ඇකඩමිය	ශිෂ්‍යත්ව	2023.11.20	2023.11.24	2

දේශීය පුහුණු වැඩසටහන් වලට සහභාගී වීම

දේශීය වැඩසටහන	ආයතනය	කාල සීමාව	සහභාගී වූ නිලධාරීන්ගේ සඛ්‍යාව
ලංසු ඇගයීම පිළිබඳ අභ්‍යන්තර පුහුණු වැඩසටහනක් පැවැත්වීම	ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය	දින 02	30
රාජ්‍ය ආයතනයේ විගණන ගැටළු අවම කරන ආකාරය	ශ්‍රී ලංකා නිපුණතා සංවර්ධන අරමුදල	දින 01	01
ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ 44 වන ජාතික සමුළුව	ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය	දින 01	03
නව බදු නීතිය සහ ආදායම් බදු වගකීම් ගණනය කිරීම	සීමාසහිත දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය	දින 01	02
නව සහකාර අධ්‍යක්ෂවරුන් සඳහා අභිප්‍රේරක පුහුණුව		දින 02	17
ලිඛිත සන්නිවේදනය පිළිබඳ වැඩමුළුව	රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව	දින 02	30

ප්‍රසම්පාදන කටයුතු

මෙම අංශය විසින් කොමිෂන් සභාව සඳහා විවිධ භාණ්ඩ, වැඩ සහ සේවා සැපයීමේ කටයුතු සම්බන්ධීකරණය කරන ලදී. මෙම ක්‍රියාකාරකම්වලට ලංසු ලේඛන සකස් කිරීම, ප්‍රකාශන දැන්වීම් සහ තාක්ෂණික ඇගයීම් කමිටු (TECs) සහ ප්‍රසම්පාදන කමිටු (PCs) පත් කිරීම ඇතුළත් වේ. මීට අමතරව, අවශ්‍ය අනුමැතිය ලබා ගැනීම සඳහා වාර්තා සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම, අදාළ පාර්ශ්ව වෙත තීරණ දැනුම් දීම, නීති අංශය සමඟ සහයෝගයෙන් සේවා ගිවිසුම් සකස් කිරීම, සේවා සපයන්නන්ගේ වැඩ කටයුතු අධීක්ෂණය කිරීම සහ සේවා ගිවිසුම් වලින් බැහැරවීම් නිරීක්ෂණය වූ විට, නිසි ක්‍රියාමාර්ග ගැනීම සඳහා මෙම අංශය සහභාගී වේ.

මෙම සියලුම ප්‍රසම්පාදන ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශවල විධිවිධාන ප්‍රකාරව සිදු කර ඇත. සමාලෝචිත කාල සීමාව තුළ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ (ප්‍රධාන) රැස්වීම් 15ක් සහ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ (සුළු) රැස්වීම් 04ක් සාර්ථකව පවත්වන ලදී.

වසර තුළ ප්‍රසම්පාදන තිස් නවයක් සම්පූර්ණ කරන ලද අතර, 20 ක් ඊළඟ වසර දක්වා ගෙන යන ලදී.

වාහන සංචිතය නඩත්තු කිරීම

2023 වසරේ දී, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ වාහන සංචිතය කාර් එකොළහකින්, ඩබල් කැබ් රථ දෙකකින්, ජීප් හතරකින්, වෑන් රථ පහකින්, බස් රථයකින් සහ යතුරුපැදි දෙකකින් සමන්විත විය. පරීක්ෂණ වාරිකා, කාර්ය මණ්ඩලයේ නිල රාජකාරි සහ සුඛසාධන කටයුතු සඳහා ප්‍රවාහන පහසුකම් යනාදිය සැපයීම සඳහා මෙම වාහන වෙන් කර ඇත.

වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය

2022 වසර සඳහා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය 2023 ජනවාරි මාසයේ දී සිදු කරන ලදී. සමීක්ෂණය සිදු කිරීම සඳහා සාමාජිකයින් හය දෙනෙකුගෙන් යුත් මණ්ඩලයක් පත් කරන ලදී. බැහැර කළ යුතු ද්‍රව්‍ය හඳුනාගෙන, සම්මත ක්‍රමවේදයකට අනුව එම ද්‍රව්‍ය බැහැර කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලදී. 2022 වසර සඳහා භාණ්ඩ වෙන්දේසිය 2023.11.10 දින ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභා ප්‍රධාන කාර්යාලයේදී පැවැත්විණි. වෙන්දේසියෙන් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට ලැබුණු මුළු ආදායම රු. 279,600.00 කි.

උපස්ථම්භක සහාය

පරිපාලන අංශය විසින් රැස්වීම්, වැඩමුළු, සම්මන්ත්‍රණ, නිරීක්ෂණ වාරිකා, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම යනාදිය වැනි ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අනෙකුත් අංශවල ක්‍රියාකාරකම් සඳහා සැපයුම් සහාය ලබා දුන්නේය.

ගෙවීම් නිර්දේශ කිරීම/අනුමත කිරීම

වැටුප් වර්ධක, අතිකාල, හිඟ වැටුප්, ගමන් බිමන් සහ යැපුම් දීමනා, විනය පරීක්ෂණ ගාස්තු, වාහන අලුත්වැඩියාව, පරිහරණ භාණ්ඩ මිලදී ගැනීම, උපකරණ සහ යන්ත්‍ර සූත්‍ර, පොත්පත්, වාර සහරා සැපයීම මෙන්ම සේවා සැපයීම (ආරක්ෂක, සනීපාරක්ෂක, ජලය, දූරකථන, විදුලිය, ආදිය) සම්බන්ධ විවිධ ගෙවීම් සඳහා අනුමැතිය ලබා දීම පාලන අංශය විසින් සිදු කරන වැදගත් ක්‍රියාකාරකමකි. මෙම අංශය විසින් ගෙවීම් වවුචර් සුපරීක්ෂාකාරීව පරීක්ෂා කර ගෙවීම්/මූල්‍ය අධිකාරී

සීමාවේ ස්වභාවය අනුව නිර්දේශ හෝ අනුමැතිය ලබා දෙන අතර ප්‍රමාදයකින් තොරව ගෙවීම් සිදුකිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ.

පුස්තකාලය

විදුලි සංදේශ කර්මාන්තයේ නියැලී සිටින්නන්ට සහ විදුලි සංදේශ ක්ෂේත්‍රය පිළිබඳ උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ට ඔවුන්ගේ දැනුම යාවත්කාලීන කිරීමට උපකාර කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ පුස්තකාලය ස්ථාපනය කර ඇත. එහි විදුලි සංදේශ කර්මාන්තය ආශ්‍රිත පොත්පත් සහ සඟරා විශාල එකතුවක් ඇත. පරිශීලකයන්ගේ අවශ්‍යතා සපුරාලීම සඳහා පුස්තකාල පහසුකම් අඛණ්ඩව වැඩිදියුණු කරමින් පවතී. පුස්තකාලය මඟින් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට පමණක් නොව පර්යේෂකයන්, විශ්ව විද්‍යාල සිසුන්, පාසල් සිසුන් වැනි බාහිර පාර්ශ්වයන්ට පුස්තකාල විමර්ශන පහසුකම් සපයයි.

මාධ්‍ය ආශ්‍රිත ක්‍රියාකාරකම්

මාධ්‍ය ඒකකය විසින් මාධ්‍ය ආවරණය ලබා දුන් අතර ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් සංවිධානය කරන ලද දේශීය හා ජාත්‍යන්තර වැඩසටහන් පැවැත්වීම සඳහා සහාය විය. මීට අමතරව, ආයතනයේ විදුලි සංදේශ නියාමන වැඩසටහන් පිළිබඳව මහජනතාව දැනුවත් කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කෙරේ.

- වැඩසටහන් ආවරණය: මාධ්‍ය ඒකකය විසින් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ වැදගත් වැඩසටහන් සහ අවස්ථා සංස්කරණය සහ සුරක්ෂිතව ගබඩා කිරීම පිණිස අති නවීන තාක්ෂණය භාවිත කරමින් ජායාරූපගත කිරීම මෙන්ම වීඩියෝගත කිරීම සිදු කරයි.

- අන්තර්ගත නිර්මාණය: ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අදාළ අංශ සමඟ සහයෝගයෙන්, මාධ්‍ය ඒකකය විසින් විදුලි සංදේශ නියාමන ක්‍රියාකාරකම්වලට අදාළ සජීවිකරණ සහ දැනුවත් කිරීමේ වීඩියෝ නිෂ්පාදනය කරයි. මෙම වීඩියෝ නිල සමාජ මාධ්‍ය නාලිකා සහ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභා වෙබ් අඩවිය ඔස්සේ බෙදා හරිනු ලැබේ.

තොරතුරු තාක්ෂණය

පූර්ණ ඩිජිටල්කරණය වූ රාජ්‍ය ආයතනයක් කරා, වැඩබලන අධ්‍යක්ෂ / තොරතුරු තාක්ෂණ නායකත්වය යටතේ තොරතුරු තාක්ෂණ අංශයේ කාර්යයන් ක්‍රියාත්මක වේ.

ආරම්භ කරන ලද ප්‍රධාන සංවර්ධන ක්ෂේත්‍ර පහත පරිදි වේ:

1. යටිතල පහසුකම් සංවර්ධනය
2. පද්ධතිය සහ ක්‍රියාවලි සංවර්ධනය
3. තොරතුරු තාක්ෂණ පාලනය
4. සේවක දැනුවත් කිරීම සහ පුහුණුව

යටිතල පහසුකම් සංවර්ධනය

පහසු සන්නිවේදන සහ සහයෝගී කාර්යය භාවිතයන් ස්ථාපිත කිරීමේ අරමුණින් වෙළඳපොලේ පවතින නවීනතම තාක්ෂණය භාවිත කරමින් ජාල ශක්‍යතාවය වැඩිදියුණු කිරීමේ කාර්යය ආරම්භ කරන ලදී.

පද්ධතිය සහ ක්‍රියාවලි සංවර්ධනය

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවියේ 01 වන අදියර ප්‍රතිනිර්මාණය කිරීම 2023 දී අවසන් කරන ලද අතර, එය ක්ලවුඩ් භාවිතාවක් මත හඳුන්වා දී ඇති අතර වැඩිදුර සංවර්ධන කටයුතු සිදු කෙරෙමින් පවතී. මහජනතාව සහ අදාළ පාර්ශ්ව සමඟ සන්නිවේදනය සඳහා සම්බන්ධතාවයේ ආරක්ෂාව වැඩි දියුණු කිරීම පිණිස ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවි ඩොමේන් නාමය SSL සහතිකය ක්‍රියාත්මක කිරීමත් සමඟ සුරක්ෂිත වී ඇත.

තොරතුරු තාක්ෂණ අංශය විසින් අදාළ ප්‍රතිලාභීන් වෙත ලබා දිය යුතු ඩිජිටල්කරණ සේවාවන් වැඩිදියුණු කිරීම සඳහා පද්ධති සහ ක්‍රියාවලි වර්ධනයන් කිහිපයක් ආරම්භ කරන ලදී.

තවද, මෙම අංශය විසින් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ තෝරාගත් අංශවල කාර්යය ක්‍රියාවලිය ස්වයංක්‍රීයකරණය කිරීම සහ ක්‍රියාකාරී පරිවර්තනය සඳහා කටයුතු සම්පාදනය කරන ලදී. මූල්‍ය අංශය ස්වයංක්‍රීයකරණ ක්‍රියාවලිය ආරම්භ කර ඇත.

තොරතුරු තාක්ෂණ පාලනය

තොරතුරු තාක්ෂණ අංශය තොරතුරු සහ සයිබර් ආරක්ෂණ ප්‍රතිපත්තියට සමගාමීව තොරතුරු ආරක්ෂණ මාර්ගෝපදේශ සකස් කිරීමේ ක්‍රියාවලියක් ආරම්භ කරන ලදී. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් තොරතුරු සහ සයිබර් ආරක්ෂණ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා උපදේශන සේවා ලබා ගැනීම පිණිස ශ්‍රී ලංකා පරිගණක හදිසි ආපදා සූදානම් කණ්ඩායම (SLCERT) සමඟ කටයුතු කරයි. මේ සඳහා ශ්‍රී ලංකා පරිගණක හදිසි ආපදා සූදානම් කණ්ඩායම (SLCERT) සමඟ අවබෝධතා ගිවිසුමක් (MOU) සකස් කරමින් පවතී. සයිබර් ආරක්ෂණ ප්‍රතිපත්තිය ප්‍රකාරව, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පද්ධති භාවිත කිරීමේදී ප්‍රශස්ත භාවිතයන් යොදා ගැනීමට මාර්ගෝපදේශ සකස් කෙරේ. අවබෝධතා ගිවිසුම අත්සන් කළ පසු, තොරතුරු තාක්ෂණ පොදු පාලන සමාලෝචන සහ විශ්ලේෂණ තාක්ෂණික සමාලෝචන, සහ ක්‍රියාවලි මත පදනම් වූ තොරතුරු තාක්ෂණ අවදානම් තක්සේරු කිරීම් ක්‍රියාත්මක කෙරේ.

තොරතුරු තාක්ෂණ පාලන රාමුව ආරම්භ කරන ලද අතර, තොරතුරු තාක්ෂණය ආශ්‍රිත ක්‍රියාවලීන් විධිමත් කිරීම සඳහා අංශය විසින් අභ්‍යන්තර කාර්ය මණ්ඩලය වෙත තොරතුරු තාක්ෂණ ප්‍රතිපත්ති කිහිපයක් හඳුන්වා දෙන ලදී. මෙමඟින් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය පරිගණක පද්ධති සහ සන්නිවේදන භාවිතයන් සහිතව ඔවුන්ගේ දෛනික වැඩ කටයුතු වැඩිදියුණු කිරීම පිණිස ප්‍රශස්ත තොරතුරු තාක්ෂණ භාවිතයන් අනුගමනය කිරීම සිදු වනු ඇත.

සේවක දැනුවත් කිරීම සහ පුහුණුව

තොරතුරු තාක්ෂණ අංශය විසින් නවතම තොරතුරු තාක්ෂණ ආශ්‍රිත තාක්ෂණයන් සහ සයිබර් ආරක්ෂණ ප්‍රශස්ත භාවිතයන් පිළිබඳව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය දැනුවත් කිරීමේ අරමුණින් තොරතුරු තාක්ෂණ දැනුවත් කිරීමේ සැසි කිහිපයක් සහ පුහුණුවක් වසර පුරා වරින් වර පවත්වන ලදී.

මූල්‍ය

වාර්ෂික අයවැය / මූල්‍ය බලතල පැවරීම / මූල්‍ය ප්‍රකාශය

කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගැනීමෙන් පසු 2023 වාර්ෂික අයවැය, 2023 මූල්‍ය බලතල පැවරීමේ ප්‍රකාශය සහ 2022 වාර්ෂික මූල්‍ය ප්‍රකාශනය සම්බන්ධ වාර්තා සම්පූර්ණ කර ඉදිරිපත් කරන ලදී.

ආදායම් බදු

“රාජ්‍ය සංස්ථාවක් වන ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව, ඒකාබද්ධ අරමුදලට අරමුදල් ප්‍රේෂණය කරයි. 2020.02.18 දිනැති අංක PN/IT/2020-03, ප්‍රකාරව (දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් සංශෝධනය කරන ලද 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත සඳහා යෝජිත වෙනස්කම් ක්‍රියාත්මක කිරීම) ඒකාබද්ධ අරමුදලට කරන ලද සුදුසුකම්ලත් ගෙවීම් සැලකිල්ලට ගනිමින් 2019.04.01 දින සිට බලපැවැත්වෙන පරිදි ආදායම් බදු අඩු කිරීමක් ලබා දෙන ලදී ”.

	2021/22 රු. මිලි.	2022/23 රු. මිලි.
තක්සේරු කළ හැකි ආදායම	16,449	14,872
අඩුකළා: සුදුසුකම්ලත් ගෙවීම (ඒකාබද්ධ අරමුදලට අරමුදල් ප්‍රේෂණය කරන ලදී)	8,500	13,200
බදු කළ හැකි ආදායම	7,949	1,672
අවසාන බදු වගකීම	**1,908**	**502**

විදුලි සංදේශ බදු පනත සහ මුදල් පනත යටතේ මාසික ව්‍යවස්ථාපිත එකතුව

විදුලි සංදේශ බදු පනත සහ මූල්‍ය පනත යටතේ මාසික ව්‍යවස්ථාපිත එකතු කිරීම් පහත සඳහන් පරිදි නියමිත කාල සීමාව තුළ එකතු කර මහා භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කරන ලදී.

- 1 වන කාර්තුව - රු. මිලි. 9,330
- 2 වන කාර්තුව - රු. මිලි. 3,753
- 3 වන කාර්තුව - රු. මිලි. 7,086
- 4 වන කාර්තුව - රු. මිලි. 7,786

(මුළු ඒකතුව මිලියන 27,956)

තවද, 1996 අංක 27 දරන පනතින් සංශෝධිත 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත ප්‍රකාරව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ආදායමෙන් ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කරන ලද අරමුදල් පිළිබඳ විස්තර ඉහත වගුවේ දක්වා ඇත.

සෘජු මුදල් / වෙක්පත් තැන්පතු / මාර්ගගත ගනුදෙනු කිරීම් භාර ගැනීම

කොවිඩ්-19 වසංගතය හේතුවෙන්, මූල්‍ය අංශය සෘජු තැන්පතු සහ මාර්ගගත ගනුදෙනු කිරීම් භාර ගැනීම ආරම්භ කර ඇති අතර ලදුපත් පරීක්ෂා කිරීම පිණිස පියවීම් සිදු කළ වහාම නාමමාත්‍ර (proforma) ඉන්වොයිස් විස්තර / අදාළ දැන්වීම් වැනි අදාළ සියලු තොරතුරු විද්‍යුත් තැපෑලෙන් එවන ලෙස ඉල්ලා සිටින ලදී.

එහි ප්‍රතිඵලයක් වශයෙන්, රට කිහිප වරක් අගුලු දමා තිබිය දීත්, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ නිසි මුදල් ප්‍රවාහය සහ ආදායම් එකතු කිරීම සම්බන්ධ ක්‍රියාකාරකම් වලට බාධාවක් සිදු නොවීය.

මූල්‍ය අංශයේ කාර්ය ක්‍රියාවලිය ස්වයංක්‍රියකරණය කිරීම

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව තොරතුරු තාක්ෂණ අංශය සමඟ සහයෝගයෙන් මූල්‍ය අංශයේ කාර්යයන්වල ගුණාත්මකභාවය සහ නිරවද්‍යතාවය ඉහළ නැංවීම සහ කාර්ය සාධනය වැඩිදියුණු කිරීම පිණිස අංශයේ ක්‍රියාකාරකම් ස්වයංක්‍රීයකරණය කිරීමට පියවර ගෙන ඇත.

එහි සියලුම මූලික සාකච්ඡා සහ තොරතුරු තාක්ෂණ අවශ්‍යතා සම්පූර්ණ කර ඇති අතර, ප්‍රසම්පාදන කටයුතු සිදු කෙරෙමින් පවතී.


1996 අංක 27 දරන විදුලි සංදේශ පනත යටතේ ආදායම

1996 අංක 27 දරන විදුලි සංදේශ පනත ප්‍රකාරව කොමිෂන් සභාවේ ආදායම් ඉපැයීමට සහ එකතු කිරීමට ව්‍යවස්ථාපිත බලය පැවරී ඇත. ඒ අනුව, ගුවන් විදුලි බලපත්‍ර ගාස්තු, සෙස් ගාස්තු, පද්ධති ක්‍රියාකරු බලපත්‍ර ගාස්තු, වෙළඳ බලපත්‍ර ගාස්තු සහ පොදු ස්විච්චිකරණ දුරකථන ජාල (PSTN) ක්‍රියාකරුවන්ගෙන් සහ ගුවන්විදුලි සංඛ්‍යාත භාවිතා කරන්නන්ගෙන් ලැබෙන වෙනත් අදාළ ගාස්තු වශයෙන් කොමිෂන් සභාව ආදායම් උපයයි / රැස් කරයි. කොමිෂන් සභාවේ ආදායම පහත දැක්වේ.

ආදායම් ප්‍රභවය	2023 (රු. ‘000)
පද්ධති ක්‍රියාකරු බලපත්‍ර ගාස්තු	5,011,857
සෙස් ගාස්තු	5,637,770
ගුවන්විදුලි සංඛ්‍යාත බලපත්‍ර ගාස්තු	8,329,845
සංඛ්‍යාත පූර්ව ගෙවීම් ගාස්තු	6,106,230
වෙළඳ බලපත්‍ර ගාස්තු	15,793
ආධුනික ගුවන්විදුලි බලපත්‍ර ගාස්තු	86
නාවික මධ්‍යස්ථාන බලපත්‍ර ගාස්තු	-
ගුවන් යානා බලපත්‍ර ගාස්තු	-
රැහැන් රහිත දුරකථන බෙදාහරින්නන්ගේ ගාස්තු	71,589
විභාග ගාස්තු	360
මාදිලි අනුමැති ගාස්තු	23,407
අයදුම්පත් සැකසුම් ගාස්තු	2,320
කෙටි සංකේත අංක ගාස්තු	55,200
අන්තර්ජාල සේවා සැපයුම්කරුවන්ගේ බලපත්‍ර ගාස්තු	-
ලේබල් ගාස්තුව	44,189
වෙනත් ආදායම් (ස්ථාවර තැන්පතු, කාර්ය මණ්ඩල ණය ආදියෙන් ලැබෙන පොලී ආදායම)	3,759,145

විදුලි සංදේශ බදු එකතු කිරීම

2011 අංක 21 දරන විදුලි සංදේශ බදු පනතේ විධිවිධාන ප්‍රකාරව විදුලි සංදේශ බද්ද අය කෙරේ. 2019 නොවැම්බර් 01 වන දා වන තෙක් විදුලි සංදේශ බදු අනුපාතිකය 15%ක් විය. බදු හඳුන්වා දීමෙන් පසු 2019 දෙසැම්බර් 1 වැනිදා සිට බලපැවැත්වෙන පරිදි රජය 11.25%ක විදුලි සංදේශ බදු අනුපාතිකය පනවන ලදී. මෙය පෙර බදු අනුපාතයට වඩා 25% ක අඩුවීමකි. 2022.06.04 දින සිට බලපැවැත්වෙන පරිදි විදුලි සංදේශ බද්ද 11.25% සිට 15% දක්වා වැඩි කිරීමට රජය තීරණය කර ඇත.



මුදල් පනත යටතේ රැස් කිරීම

ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරුවන්ගේ බදු

ඉහත ආදායමට අමතරව, 2009 අංක 13 දරන මුදල් පනත මඟින් සංශෝධිත 2004 අංක 11 දරන මුදල් පනත ප්‍රකාරව, කොමිෂන් සභාව විසින් ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරු සමාගම් වලින් ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරුගේ බද්ද අයකර ගන්නා ලදී.

එලෙස කොමිෂන් සභාව විනාඩියකට ඇමරිකන් ඩොලර් 0.06 ක් ලැබෙන දේශීය ප්‍රවේශ ගාස්තු ලෙස එකතු කර ඇති අතර, එයින් 50% ක් ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කර ඉතිරි 50% විදුලි සංදේශ සංවර්ධන ගාස්තු ලෙස රඳවා තබා ගන්නා ලදී.

තවද, කොමිෂන් සභාව විසින් පිටතට යන දේශීය ප්‍රවේශ ගාස්තු ලෙස පිටතට යන ජාත්‍යන්තර ඇමතුම්වලින් විනාඩියකට රු. 3.00 බදු මුදලක් අය කිරීම 2019 ජූලි 01 වන දින සිට අහෝසි කරන ලදී.

ජංගම කුලුනු බදු

මෙම බද්ද නව බද්දක් ලෙස 2019 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි හඳුන්වා දෙන ලද අතර එය ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් කාර්තුමය වශයෙන් එකතු කර ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කෙරේ.


කෙටි පණිවුඩ සේවා බදු

මෙය නොග කෙටි පණිවුඩ සේවා වශයෙන් අය කරනු ලබන අතර එක් කෙටි පණිවුඩයකට රු. 0.25 ක් වශයෙන් 2019 අප්‍රේල් 01 දින බලපවත්වන පරිදි හඳුන්වා දී ඇත. 2018 අංක 35 දරන මුදල් පනතේ 48 වැනි වගන්තිය ප්‍රකාරව ස්ථාවර දුරකථන මාර්ගයක් ඔස්සේ එවන ලද වෙළඳ දැන්වීම් රැසක් මත 2023.12.13 දින සිට මෙම බද්ද අය කෙරේ.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ මුළු ආදායම

කොමිෂන් සභාවේ මුළු ආදායම පහත සඳහන් ප්‍රභවයන් යටතේ එකතු කරන ලද ආදායමෙන් සමන්විත වේ.

i. 1996 අංක 27 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතින් සංශෝධිත 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත
ii. 2011 අංක 21 දරන විදුලි සංදේශ බදු පනත
iii. 2009 අංක 13 දරන මුදල් පනතින් සංශෝධිත 2004 අංක 11 දරන මුදල් පනත



ඒකාබද්ධ අරමුදල් සඳහා ප්‍රේෂණ

පහත සඳහන් පරිදි 2023 වසරේ දී රජයේ ආදායම ශක්තිමත් කිරීම සඳහා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් රුපියල් බිලියන 44.05 ක් රජයේ භාණ්ඩාගාරයට ප්‍රේෂණය කරන ලදී.


විස්තර	2022 රු. බිලි.	2023 රු. බිලි.
විදුලි සංදේශ පනත/ කොමිෂන් සභා අරමුදල්	13.2	25.0
විදුලි සංදේශ බදු	12.9	13.25
විදුලි සංදේශ සංවර්ධන ගාස්තු 50%	2.4	1.9
පිටතට යන දේශීය ප්‍රවේශ ගාස්තු මත බදු	-	-
කෙටි පණිවුඩ සේවා බදු	0.23	0.28
කුලුනු බදු	1.56	1.62
භාවිතයට නොගත් විදුලි සංදේශ සංවර්ධන ගාස්තු භාණ්ඩාගාරය	-	1.87
එකතුව	**30.30**	**44.05**

දේපළ, පිරියත සහ උපකරණ

2023 වසර තුළ දේපළ, පිරියත සහ උපකරණ යටතේ අමතර වශයෙන් පරිගණක සහ අනෙකුත් කාර්යාල උපකරණ මිල දී ගැනීමට මිලියන 2.5 ක් වැය කරන ලදී.

මුදල් වෙළෙඳපොළ ගනුදෙනු

කොමිෂන් සභාව දෛනික ගනුදෙනු සඳහා මහජන බැංකුවේ මුදල් වෙළෙඳපොළ ඉතුරුම් ගිණුම පවත්වාගෙන යන අතර සමාලෝචිත වර්ෂය තුළ මුදල් වෙළෙඳපොළ ගනුදෙනු හරහා උපයා ගන්නා ලද පොලී ආදායම රුපියල් මිලියන 1,125 කි.



අභ්‍යන්තර විගණනය


- ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ පවතින ගිණුම්කරණ සහ වාර්තාකරණ පද්ධති වැඩිදියුණු කිරීමේ අරමුණින් ඒවා සමාලෝචනය කිරීම සහ ඇගයීම.
- ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට බාධා වන හේතු සහ බලපෑම් (ඇත්නම්) විමර්ශනය කිරීම.
- ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ වත්කම් අලාභ හා වංචා වලින් ආරක්ෂා කිරීම සහතික කිරීම.
- ගනුදෙනු වල අවශ්‍යතාවයන්, ගනුදෙනු වල ප්‍රතිලාභ විමර්ශනය කිරීම සහ නාස්තිය සහ අතිරික්තය ඉවත් කිරීම මඟින් පිරිවැය අඩු කිරීමේ ක්ෂේත්‍ර අධ්‍යයනය කිරීම.
- ඉහත සඳහන් කළ කාර්යයන්හි තීරණ මත පදනම්ව විගණන කමිටුවට වාර්තා ඉදිරිපත් කිරීම සහ විගණන කමිටු රැස්වීම් සංවිධානය කිරීම.
- විගණන කමිටුවේ තීරණ සකස් කිරීම සහ අදාළ ක්‍රියාමාර්ග ගැනීම පිණිස එම විගණන කමිටු තීරණ අංශ ප්‍රධානීන් වෙත බෙදා හැරීම.
- අර්ධ වාර්ෂික වාර්තා විගණකාධිපති දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.
- අධ්‍යක්ෂ ජනරාල් / කොමිෂන් සභා සාමාජිකයින් විසින් ඉල්ලා සිටින විට විශේෂ විමර්ශන සිදු කිරීම.
- අධ්‍යක්ෂ ජනරාල් / කොමිෂන් සභාව විසින් වරින් වර පත් කරන ලද විවිධ කමිටුවලට සහාය වීම සහ නිර්දේශ ඉදිරිපත් කිරීම.


අභ්‍යන්තර විගණන අංශය විසින් 2023 වසරේ දී පහත සඳහන් ක්‍රියාකාරකම් සිදු කරන ලදී.


#	විස්තරය	සම්පූර්ණ කරන ලද /සිදු කෙරෙමින් පවතින /වෙනත්
1	ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ලදුපත් (මුදල්, චෙක්පත් සහ මුදල් ඇණවුම්)	අභ්‍යන්තර විගණන වාර්තාව සම්පූර්ණ කර ඉදිරිපත් කරන ලදී.
2	ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ගෙවීම් (වැටුප් සහ අදාළ ගෙවීම්, ණය සහ සේවක අත්තිකාරම් හැර)	අභ්‍යන්තර විගණන වාර්තාව ඉදිරිපත් කරන ලදී.
3	1996 අංක 27 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතින් සංශෝධිත 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතේ 22 වගන්තිය ප්‍රකාරව නව බලපත්‍ර නිකුත් කිරීම සහ බලපත්‍ර අලුත් කිරීම.	අභ්‍යන්තර විගණන වාර්තාව සම්පූර්ණ කර ඉදිරිපත් කරන ලදී.
4	1996 අංක 27 දරන පනතින් සංශෝධිත 1991 අංක 25 දරන විදුලි සංදේශ පනතේ 21 වගන්තිය යටතේ වෙළඳ බලපත්‍ර නිකුත් කිරීම.	අභ්‍යන්තර විගණන වාර්තාව සම්පූර්ණ කර ඉදිරිපත් කරන ලදී.
5	විදුලි සංදේශ පද්ධති ක්‍රියාකරුගෙන් ලැබෙන ආදායම (1996 අංක 27 දරන පනතින් සංශෝධිත 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතේ 17 වගන්තිය යටතේ නිකුත් කරන ලද බලපත්‍රය.)	අභ්‍යන්තර විගණන වාර්තාව සම්පූර්ණ කර ඉදිරිපත් කරන ලදී.
6	විවිධ ආදායම්	සම්පූර්ණ කරන ලදී.
7	ධාවන සටහන් පවත්වා ගෙන යාම	අභ්‍යන්තර විගණන වාර්තාව සම්පූර්ණ කර ඉදිරිපත් කරන ලදී.
8	වැටුප් සහ වේතන ගෙවීම	අභ්‍යන්තර විගණන වාර්තාව සම්පූර්ණ කර ඉදිරිපත් කරන ලදී.
9	ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අත්තිකාරම් ප්‍රදානය කිරීමේ සහ පියවීමේ ක්‍රියාවලිය	අභ්‍යන්තර විගණන වාර්තාව සම්පූර්ණ කර ඉදිරිපත් කරන ලදී.
10	ස්ථාවර වත්කම් ලැයිස්තු නඩත්තු කිරීම	අභ්‍යන්තර විගණන වාර්තාව ඉදිරිපත් කිරීමේ කටයුතු සිදු කෙරෙමින් පවති.
11	ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ප්‍රසම්පාදනය	අභ්‍යන්තර විගණන වාර්තාව සම්පූර්ණ කර ඉදිරිපත් කරන ලදී.
12	බැංකු සැසඳුම් නහවුරු කිරීම	අභ්‍යන්තර විගණන වාර්තාව සම්පූර්ණ කර ඉදිරිපත් කරන ලදී.
13	සංඛ්‍යාත සඳහා ණයගැති ශේෂය	අභ්‍යන්තර විගණන වාර්තාව සම්පූර්ණ කර ඉදිරිපත් කරන ලදී.


14	ආපදා ණය ප්‍රදානය කිරීමේ සහ අය කර ගැනීමේ ක්‍රියාවලිය	අභ්‍යන්තර විගණන වාර්තාව සම්පූර්ණ කර ඉදිරිපත් කරන ලදී.
15	සියලු ම විගණන විමසුම් සහ පිළිතුරු සම්බන්ධයෙන් ජාතික විගණන කාර්යාලය සම්බන්ධීකරණය කිරීම. විගණන වාර්තා - 03 විගණන විමසුම් - 54 කොරතුරු ඉල්ලීම - 17	සම්පූර්ණ කරන ලදී.
16	කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව සම්බන්ධීකරණය කිරීම	සම්පූර්ණ කරන ලදී.


අපගේ සේවක පැතිකඩ



සේවක විශ්‍රාම විශ්ලේෂණය
9
8
7
6
5
4
3
2
1
0
4
1
8
2
2
4
3
3
2024
2025
2026
2027
පුරුෂ
ස්ත්‍රී


සේවා කාණ්ඩ සහ ස්ත්‍රී පුරුෂ භාවය අනුව සේවකයින්
70
35
0
34
19
13
11
39
61
43
2
ජෙෂ්ඨ
තෘතියික
ද්විතියික
ප්‍රාථමික
පුරුෂ
ස්ත්‍රී


වයස් කාණ්ඩය සහ ස්ත්‍රී පුරුෂ භාවය අනුව සේවකයින්
60
50
40
30
20
10
0
1
0
12
14
35
19
55
38
26
22
අවුරුදු 18 - 24
අවුරුදු 25 - 34
අවුරුදු 35 - 44
අවුරුදු 45 - 54
අවුරුදු 55ට වැඩි
පුරුෂ
ස්ත්‍රී


රැකියා ස්ථානය සහ ස්ත්‍රී පුරුෂ භාවය අනුව සේවකයින්
120
80
40
0
126
93
1
0
2
0
ප්‍රධාන කාර්යාලය
කදිරාන
කොකවිල්
පුරුෂ
ස්ත්‍රී


විදේශ නිවාඩු මත සේවකයින්
4.5
4
3.5
3
2.5
2
1.5
1
0.5
0
4
0
2023
පුරුෂ
ස්ත්‍රී


ධුර කාලය විශ්ලේෂණය
45
40
35
30
25
20
15
10
5
0
40
22
23
10
8
2
26
34
16
14
17
10
0
0
අවුරුදු 5 ට අඩු
අවුරුදු 06-10
අවුරුදු 11-15
අවුරුදු 16-20
අවුරුදු 21-25
අවුරුදු 26-30
අවුරුදු 30ට වැඩි
පුරුෂ
ස්ත්‍රී

විගණන කමිටු යාවත්කාලීන කිරීම

2023 වර්ෂය තුළ විගණන කමිටු රැස්වීම් හතරක් (04) පවත්වන ලද අතර, එම රැස්වීම්වල දී පහත සඳහන් කරුණු සාකච්ඡා කරන ලදී.

1. 2023 මැයි 30 වැනි දින පැවැත්වූ විගණන කමිටු රැස්වීම.

1.1 වාර්තා / කරුණු සාකච්ඡා කරන ලද අතර, පහත පරිදි තීරණ/ක්‍රියාමාර්ග ගන්නා ලදී.

විෂයය ක්ෂේත්‍රය	ගන්නා ලද ක්‍රියාමාර්ගය / තීරණය
කොළඹ නෙළුම් කුලුන සහ විශේෂ ව්‍යාපෘති අභ්‍යන්තර විගණනය	කොළඹ නෙළුම් කුලුනේ තාක්ෂණික විගණනය සඳහා විගණකවරයෙකු තෝරා ගැනීමේ ක්‍රියාවලිය පිළිබඳ යෝජනාවක් ඉල්ලා ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය (IESL) වෙත ලිපියක් යැවීම.
වාහන ණය පරීක්ෂා කිරීම	ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් කරන ලද විමසීම් පිළිබඳ ව මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව (RMV) වෙත ලිපියක් යැවීමට සහ අවසන් කරන ලද වාහන ණය වක්‍රලේඛය ඉදිරිපත් කිරීම.
විගණකාධිපතිගෙන් ලැබුණු විමසුම් විදුලි සංදේශ කුලුනු පිළිබඳ භෞතික සත්‍යාපනය අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල හෝ පළාත් පාලන ආයතනවල සහාය ඇතිව සිදු කිරීම.	• විදුලි සංදේශ කුලුනු පිළිබඳ භෞතික සත්‍යාපනය අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල හෝ පළාත් පාලන ආයතනවල සහාය ඇතිව අඛණ්ඩව සිදු කෙරේ. • අනුමත කුලුනු සංඛ්‍යාව, ලබා දී ඇති සංඛ්‍යාත බලපත්‍ර සහ අදාළ අංශ විසින් අය කරනු ලබන කුලුනු බද්ද අතර සැසඳුම් අවසන් කිරීම.
2023 වර්ෂය සඳහා භාණ්ඩාගාරයට ප්‍රේෂණය කළ මුදල, තථ්‍ය ආදායමට සාපේක්ෂව අයවැය ගත ආදායම් පිළිබඳ වාර්තාව	2023 වර්ෂය සඳහා භාණ්ඩාගාරයට ප්‍රේෂණය කළ මුදල ඉදිරිපත් කිරීම.
2022 වසර සඳහා අභ්‍යන්තර විගණන සැලැස්ම	අභ්‍යන්තර විගණන අංශය සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩලය බඳවා ගැනීම.
ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අත්තිකාරම් ප්‍රදානය කිරීමේ සහ පියවීමේ ක්‍රියාවලිය පිළිබඳ විගණනය	සෑම කාර්තුවක් අවසානයේ ම නිරවුල් නොකළ අත්තිකාරම් ඉදිරිපත් කිරීම.
ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ප්‍රසම්පාදනය පිළිබඳ අභ්‍යන්තර විගණනය	ප්‍රසම්පාදන පටිපාටියේ අනවශ්‍ය ප්‍රමාදයන් පිළිබඳව කළමනාකාරීත්ව ප්‍රතිචාර ඉදිරිපත් කිරීම.
බැංකු සැසඳුම් පිළිබඳ විගණනය	හඳුනා නොගත් තැන්පතු සැසඳුම් කඩිනම් කිරීම.
වැටුප් හා වේතන ගෙවීම පිළිබඳ විගණනය	මූදල් රෙගුලාසිවල නියමයන් ප්‍රකාරව වැටුප් පත්‍රයේ අත්සන් තබන ලෙස සියලුම කාර්ය මණ්ඩල සාමාජිකයින් වෙත අභ්‍යන්තර සිහිකැඳවීමක් යොමු කිරීම.
විකාශන මධ්‍යස්ථාන බලපත්‍ර (රූපවාහිනී - TV) සහ විකාශන මධ්‍යස්ථාන බලපත්‍ර (සංඛ්‍යාත මුහුර්ජන - FM) පිළිබඳ අභ්‍යන්තර විගණනය	බලපත්‍ර ගාස්තු ගෙවීම ප්‍රමාද වීමට හේතු දැක්වීම.
ධාවන සටහන නඩත්තු කිරීම පිළිබඳ විගණනය	අතිකාල ගෙවීම් නිර්දේශ කිරීමට පෙර ධාවන සටහනේ සම්පූර්ණත්වය පරීක්ෂා කිරීම.
විදුලි සංදේශ පද්ධතිය ක්‍රියාත්මක කිරීම සඳහා බලපත්‍ර ලබා දීම පිළිබඳ අභ්‍යන්තර විගණනය	ගෙවීම් ප්‍රමාදයට හේතු දැක්වීම.
විගණකාධිපතිගෙන් ලැබුණු විමසුම් කොළඹ නෙළුම් කුලුනේ උපදේශන ගාස්තු පිළිබඳ ගැටළුව	කෙටුම්පත් අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව ඉදිරිපත් කිරීම.

2. 2023 ජූනි 22 දින පැවති විගණන කමිටු රැස්වීම

2.1 වාර්තා / කරුණු සාකච්ඡා කරන ලද අතර, පහත පරිදි තීරණ/ක්‍රියාමාර්ග ගන්නා ලදී.

විෂයය ක්ෂේත්‍රය	ගත් ක්‍රියාමාර්ගය / තීරණය
කොළඹ නෙළුම් කුලුන සහ විශේෂ ව්‍යාපෘති පිළිබඳ අභ්‍යන්තර විගණනය	කොළඹ නෙළුම් කුලුන සඳහා තාක්ෂණික විගණනය සඳහා විගණකවරයා තෝරා ගැනීමේ ක්‍රියාවලිය පිළිබඳ යෝජනාවක්/මතයක් ඉල්ලා ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය (IESL) වෙත ලිපියක් යැවීම.
වාහන ණය පරීක්ෂා කිරීම	වාහන ණය වක්‍රලේඛ කෙටුම්පත සමාලෝචනය කිරීම සහ නීතිමය මතය සහ එකඟතාව ලබා ගැනීම.
විගණකාධිපතිගෙන් ලැබුණු විමසුම්	• දිවයින පුරා විදුලි සංදේශ කුලුනු පිළිබඳ භෞතික සත්‍යාපනය අඛණ්ඩව සිදු කිරීම. • අනුමත කුලුනු සංඛ්‍යාව, ලබා දී ඇති සංඛ්‍යාත බලපත්‍ර සංඛ්‍යාව සහ අදාළ අංශ විසින් අය කරනු ලබන කුලුනු බද්ද අතර සැසඳුම් අවසන් කිරීම.
2023 වසර සඳහා භාණ්ඩාගාරයට ප්‍රේෂණය කරන ලද මුදල	2023 වර්ෂය සඳහා භාණ්ඩාගාරයට ප්‍රේෂණය කළ මුදල වාර්තා කිරීම.
2022 වසර සඳහා අභ්‍යන්තර විගණන සැලැස්ම	රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අනුමැතිය ලබා ගැනීමෙන් පසු විගණන සහකාරවරුන් 02 දෙනෙකු බඳවා ගැනීම.
ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අත්තිකාරම් ප්‍රදානය කිරීමේ සහ පියවීමේ ක්‍රියාවලිය පිළිබඳ විගණනය	සෑම කාර්තුවක් අවසානයේ දී නිරවුල් නොකරන ලද අත්තිකාරම් ඉදිරිපත් කිරීම.
ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ප්‍රසම්පාදනය පිළිබඳ විගණනය	CCTV කැමරා පද්ධතිය ගිවිසුම්ගත ප්‍රසම්පාදනය යටතේ සැපයීම, ගිවිසුම අවලංගු කරන ලදී.
බැංකු සැසඳුම් පිළිබඳ විගණනය	2020 සිට 2022 දක්වා බැංකු සැසඳුම් ප්‍රකාශයන්හි හඳුනා නොගත් තැන්පතු ඉදිරිපත් කිරීම.
වැටුප් හා වේතන ගෙවීම පිළිබඳ විගණනය	මුදල් රෙගුලාසිවල නියමයන් අනුව වැටුප් පත්‍රයේ අත්සන් තබන ලෙස සියලුම කාර්ය මණ්ඩල සාමාජිකයින් වෙත අභ්‍යන්තර සිහිකැඳවීමක් යොමු කිරීම.
විගණකාධිපතිගෙන් ලැබුණු විමසුම් කොළඹ නෙළුම් කුලුනේ උපදේශන ගාස්තු පිළිබඳ ගැටළුව	උපදේශන ගාස්තු ගණනය කිරීම සහ අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම.
තාක්ෂණ අමාත්‍යාංශයේ නිරීක්ෂකයකුගෙන් පැන නැගුණු කාරණය	ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සාමාජිකයෙකු වශයෙන් කටයුතු කිරීම පිණිස භාණ්ඩාගාර නියෝජිතයෙකුට ඉඩ ලබාදීම පිළිබඳ විගණන විමසුම / පොදු ව්‍යාපාර කාරක සභාවේ (COPE) වාර්තා පදනම් කරගෙන කොමිෂන් සභා පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම.
ගෙවීම් (සේවක වැටුප් සහ අදාළ ගෙවීම්, ණය සහ අත්තිකාරම් හැර)	අභ්‍යන්තර විගණන නිරීක්ෂණ සඳහා පිළිතුරක් ඉදිරිපත් කිරීම.
මුදල් අමාත්‍යාංශයේ නිරීක්ෂකයකුගෙන් පැන නැගුණු කාරණය	භාණ්ඩාගාරයට ලැබෙන ආදායම් ප්‍රේෂණ සහ මූල්‍ය ප්‍රකාශනවල සඳහන් ආදායම සැසඳීම.

3. 2023 සැප්තැම්බර් 21 දින පවත්වන ලද විගණන කමිටු රැස්වීම

3.1 වාර්තා / කරුණු සාකච්ඡා කරන ලද අතර, පහත පරිදි තීරණ/ක්‍රියාමාර්ග ගන්නා ලදී.

විෂයය ක්ෂේත්‍රය	ගන්නා ලද ක්‍රියාමාර්ගය / තීරණය
කොළඹ නෙළුම් කුලුන සහ විශේෂ ව්‍යාපෘති අභ්‍යන්තර විගණනය	• ඉංජිනේරු ආයතනය සමඟ තාක්ෂණික විගණනයේ විෂය පථය සාකච්ඡා කිරීම සඳහා රැස්වීමක් සැලසුම් කිරීම. • තාක්ෂණික විගණනය පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා තෝරාගත් විගණකවරයෙකු සමඟ රැස්වීමක් සැලසුම් කිරීම.
වාහන ණය පරීක්ෂා කිරීම	නීති අංශයේ නිරීක්ෂණ සහ නිර්දේශ ඇතුළත් කර වාහන ණය වක්‍රලේඛ කෙටුම්පත ඉදිරිපත් කිරීම.
විගණකාධිපතිගෙන් ලැබුණු විමසුම්	• දිවයින පුරා විදුලි සංදේශ කුලුනු පිළිබඳ භෞතික සත්‍යාපනය අඛණ්ඩව සිදු කිරීම. • අනුමත කුලුනු සංඛ්‍යාව, ලබා දී ඇති සංඛ්‍යාත බලපත්‍ර සංඛ්‍යාව සහ අදාළ අංශ විසින් අය කරනු ලබන කුලුනු බද්ද අතර සැසඳුම් අවසන් කිරීම.
2023 වර්ෂය සඳහා භාණ්ඩාගාරයට ප්‍රේෂණය කළ මුදල පිළිබඳ වාර්තාව	2023 වසර සඳහා භාණ්ඩාගාරයට ප්‍රේෂණය කළ මුදල වාර්තා කිරීම.
2022 වසර සඳහා අභ්‍යන්තර විගණන සැලැස්ම	රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අනුමැතිය ලබා ගැනීමෙන් පසු විගණන සහකාරවරුන් 02 දෙනෙකු බඳවා ගැනීම.
ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අත්තිකාරම් ප්‍රදානය කිරීමේ සහ පියවීමේ ක්‍රියාවලිය පිළිබඳ විගණනය	සෑම කාර්තුවක් අවසානයේම දිගු කාලීන හිඟ ශේෂයන් ඇතුළුව සියලුම අත්තිකාරම් ශේෂයන් සමඟ නිරවුල් නොකරන ලද අත්තිකාරම් ඉදිරිපත් කිරීම.
ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ප්‍රසම්පාදනය පිළිබඳ විගණනය	CCTV කැමරා පද්ධතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තාක්ෂණික වාර්තාවක් සැපයීම.
විගණකාධිපතිගෙන් ලැබුණු විමසුම කොළඹ නෙළුම් කුලුනේ උපදේශන ගාස්තු සම්බන්ධ ගැටළුව	උපදේශන ගාස්තු ගණනය කිරීම සහ අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම.
තාක්ෂණ අමාත්‍යාංශයේ නිරීක්ෂකයකු වෙතින් පැන නැගුණු කාරණය	ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සාමාජිකයෙකු වශයෙන් කටයුතු කිරීමට භාණ්ඩාගාර නියෝජිතයෙකුට ඉඩ ලබා දීම පිළිබඳ විගණන විමසුම/පොදු ව්‍යාපාර කාරක සභාවේ (COPE) වාර්තා මත පදනම්ව කොමිෂන් සභා පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම.
මුදල් අමාත්‍යාංශයේ නිරීක්ෂකයකු වෙතින් පැන නැගුණු කාරණය	භාණ්ඩාගාරයට ලැබෙන ආදායම් ප්‍රේෂණ සහ මූල්‍ය ප්‍රකාශනවල සඳහන් ආදායම සැසඳීම.
බැංකු සැසඳුම් පිළිබඳ අභ්‍යන්තර විගණනය	මහජන බැංකු ගිණුමට අදාළව හඳුනා නොගත් තැන්පතු සැසඳුම් පසු විපරම් කිරීම.

4. 2023 දෙසැම්බර් 21 දින පැවැත්වුණු විගණන කමිටු රැස්වීම.


4.1 වාර්තා / කරුණු සාකච්ඡා කරන ලද අතර, පහත සඳහන් පරිදි තීරණ/ක්‍රියාමාර්ග ගන්නා ලදී.

විෂයය ක්ෂේත්‍රය	ගන්නා ලද ක්‍රියාමාර්ගය / තීරණය
කොළඹ නෙළුම් කුලුන සහ විශේෂ ව්‍යාපෘති අභ්‍යන්තර විගණනය	කොළඹ නෙළුම් කුලුන ව්‍යාපෘතියේ තාක්ෂණික විගණනය පිළිබඳ කොමිෂන් සභා පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම.
වාහන ණය පරීක්ෂා කිරීම	පැන නැගුණු සියලුම ගැටළු ඇතුළත් කර වාහන ණය චක්‍රලේඛ කෙටුම්පත ඉදිරිපත් කිරීම.
විගණකාධිපතිගෙන් ලැබුණු විමසුම	• දිවයින පුරා විදුලි සංදේශ කුලුනු පිළිබඳ භෞතික සත්‍යාපනය අඛණ්ඩව සිදු කිරීම. • අනුමත කුලුනු සංඛ්‍යාව, ලබා දී ඇති සංඛ්‍යාත බලපත්‍ර සංඛ්‍යාව සහ අදාළ අංශ විසින් අය කරනු ලබන කුලුනු බද්ද අතර සැසඳුම අවසන් කිරීම.
ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අත්තිකාරම් ප්‍රදානය කිරීමේ සහ පියවීමේ ක්‍රියාවලිය පිළිබඳ විගණනය	සෑම කාර්තුවක් අවසානයේම දිර්ඝ කාලීන හිඟ ශේෂය ඇතුළුව සියලුම අත්තිකාරම් ශේෂය සමඟ නිරවුල් නොකරන ලද අත්තිකාරම් ඉදිරිපත් කිරීම.
ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ප්‍රසම්පාදනය පිළිබඳ විගණනය	CCTV කැමරා පද්ධතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තාක්ෂණික වාර්තාවක් සැපයීම.
බැංකු සැසඳුම් පිළිබඳ විගණනය	මහජන බැංකු ගිණුමට අදාළ ව හඳුනා නොගත් තැන්පතු සැසඳුම් පසු විපරම් කිරීම.
ආපදා ණය ක්‍රියාවලිය පිළිබඳ අභ්‍යන්තර විගණනය	පොදු ලෙජරය සහ ණය ලේඛනය සමඟ නිරන්තර සැසඳුම් සහතික කිරීම.
වැටුප් හා වේතන ගෙවීම් පිළිබඳ විගණනය	• මුදල් රෙගුලාසිවල නියමයන් ප්‍රකාරව වැටුප් පත්‍රිකාවේ අත්සන් තබන ලෙස සියලුම කාර්ය මණ්ඩල සාමාජිකයින් වෙත අභ්‍යන්තර සිහිකැඳවීමක් කිරීම. • වැටුප් පාලන ගිණුමේ දිර්ඝ කාලීන හිඟ ශේෂයන් නිරවුල් කිරීම.
ආයතනික සැලැස්ම, වාර්ෂික වාර්තාව, ක්‍රියාකාරී සැලැස්ම, අයවැය, ප්‍රසම්පාදන සැලැස්ම සහ භාණ්ඩ සමීක්ෂණය	• පාර්ලිමේන්තුව වෙත 2022 වර්ෂයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීම. • 2024 වසරේ ප්‍රසම්පාදන සැලැස්ම සහ 2023 වසරේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව ඉදිරිපත් කිරීම.

ආයතනික පාලනය

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විශිෂ්ට ආයතනික පාලනය වැදගත් ආයතනික අවශ්‍යතාවයක් වශයෙන් පිළිගන්නා ව්‍යවස්ථාපිත ආයතනයකි. කොමිෂන් සභාව සිය මෙහෙයුම්වල දී සෑම අංශයක් උදෙසාම, සියලුම ව්‍යවස්ථාපිත සහ නියාමන අවශ්‍යතාවලට අනුකූලව කටයුතු කිරීමට කැපවී සිටී. පාරදෘශ්‍යභාවය, විශ්වාසනීයත්වය සහ අනුකූලතාවය කොමිෂන් සභාව තම අරමුණු සාක්ෂාත් කර ගැනීම පිණිස භාවිත කරන මාර්ගෝපදේශක මූලධර්මයන් වේ.

ආයතනික පාලන රාමුව



කොමිෂන් සභාව

උසස් පාලන ප්‍රමිතීන් ආරක්ෂා කිරීමට දැඩි ලෙස කැපවී සිටින කොමිෂන් සභාව, ශක්තිමත් ආයතනික පාලන භාවිතයන් සාර්ථක විදුලි සංදේශ පසුබිමක පදනම බව තරයේ විශ්වාස කරයි. මෙම පරිවයන් රෙගුලාසි වල වැදගත්කම වැඩි දියුණු කිරීමට පමණක් නොව, පාරිභෝගිකයින්ගේ සහ පාර්ශවකරුවන්ගේ අත්‍යවශ්‍ය අවශ්‍යතා සුරක්ෂිත කිරීම සහතික කරයි. මෙම වැදගත් පරමාර්ථය සාක්ෂාත් කර ගැනීම පිණිස කොමිෂන් සභාව සම්පූර්ණ පාලන මූලධර්ම මාලාවක් සවිස්තරාත්මකව සකස් කර ඇත. විස්තරාත්මක පාලන පටිපාටිවල සිට ස්ථාවර විනිවිදභාවය සහ ශක්තිමත් වගවීම දක්වා වූ , මෙම මූලධර්ම තුලින් කොමිෂන් සභාවේ කාර්යයන්හී සෑම පැතිකඩකම ගුණාත්මකභාවයට ප්‍රමුඛත්වය ලබා දෙයි. එපමණක් නොව, සදාචාරාත්මක සහ වගකිවයුතු පාලනයක් ඇති කිරීමෙහි ලා කොමිෂන් සභාවේ කැපවීම ශක්තිමත් කරමින් අදාළ වන සියලු ම නීති සහ රෙගුලාසි දැඩි ලෙස පිළිපැදීම ඉතා වැදගත් වේ.

- 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත
- 1996 අංක 27 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධන) පනත
- කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද රෙගුලාසි
- ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ පත් කිරීම් කාණ්ඩය සහ විනය කාණ්ඩය
- ආයතන සංග්‍රහය
- මුදල් රෙගුලාසි
- රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශ
- ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන ප්‍රමිති
- ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ
- අදාළ රජයේ චක්‍රලේඛ

කොමිෂන් සභාව සඳහා පත්කිරීම්

රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයා නිල බලයෙන් කොමිෂන් සභාවේ සභාපතිවරයා ලෙස කටයුතු කරන අතර රජයේ ඉදිරි දැක්ම පිළිබඳ ගැඹුරු අවබෝධයක් සහ නායකත්වය ලබා දෙයි. අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ සෙසු ගරු සාමාජිකයින් තිදෙනා පත් කරනු ලබන්නේ අමාත්‍යවරයා විසිනි. අධ්‍යක්ෂ ජනරාල්වරයා කොමිෂන් සභාවේ ප්‍රධාන විධායක නිලධාරියා වන අතර කොමිෂන් සභාවේ කටයුතු සහ ගනුදෙනු මෙහෙයවීම, කොමිෂන් සභාවේ බලතල සහ රාජකාරි ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම පිළිබඳ වගකීම දරයි. මනාව විස්තර කරන ලද උපාය මාර්ගික අරමුණු සාක්ෂාත් කර ගැනීම කරා කාර්ය මණ්ඩලයට මෙන්ම කොමිෂන් සභාවට ද නායකත්වය ලබා දෙමින් ඔහු ප්‍රධානියා වශයෙන් කටයුතු කරයි .

නීති, මූල්‍ය සහ කළමනාකරණ යන ක්ෂේත්‍ර නියෝජනය කරමින් සාමාජිකයින් තිදෙනෙකු පත් කෙරේ. ආයතනය යහපාලනයේ ඉහළම මට්ටම් කරා ගෙන යාමට සහ විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට අවශ්‍ය දැනුම, කුසලතා සහ පළපුරුද්ද කොමිෂන් සභා සාමාජිකයින් සතුව ඇත. ඔවුන් දැක්ම, නායකත්ව කුසලතා, නිපුණතාවය සහිත ගෞරවනීය පුද්ගලයින් වේ. මෙම වාර්තාවේ පිටුව 08 සිට 09 දක්වා කොමිෂන් සභා සාමාජිකයින්ගේ පුද්ගලික පැතිකඩ පිළිබඳ සංක්ෂිප්ත සටහනක් ඇතුළත් වේ.

කොමිෂන් සභාවේ වගකීම්

කොමිෂන් සභාව යනු කළමනාකාරිත්වයට උපාය මාර්ගික නායකත්වය සපයන ආයතනයේ ඉහළම තීරණ ගැනීමේ අංශයයි. ආයතනයේ මෙහෙයුම් අධීක්ෂණය කිරීම සඳහා කොමිෂන් සභා සාමාජිකයින් වගකිව යුතුය. කොමිෂන් සභාවේ මෙහෙයවීම යටතේ මෙහෙයුම් කළමනාකරණය කෙරේ. විදුලි සංදේශ අංශය නියාමනය කිරීම සඳහා කොමිෂන් සභාව සිය බලතල අධ්‍යක්ෂ ජනරාල්වරයාට සහ අනෙකුත් ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය වෙත පවරයි.

කොමිෂන් සභාව,

- ආයතනයේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට උපාය මාර්ග සුදුසු බව නිසැක කිරීම.
- වැදගත් ආයතනික කටයුතු සමාලෝචනය කිරීම සහ අනුමත කිරීම.
- කළමනාකරණ උපාය මාර්ගික සැලසුම් ක්‍රියාත්මක කිරීම සමාලෝචනය කිරීම සහ අධීක්ෂණය කිරීම.
- ක්‍රියාකාරී සැලැස්ම, ආයතනික සැලැස්ම, ප්‍රසම්පාදන සැලැස්ම සහ වාර්ෂික අයවැය සමාලෝචනය කිරීම සහ අනුමත කිරීම.
- උපාය මාර්ගික සැලසුම් සහ අනෙකුත් දිගු කාලීන අරමුණු වලට සාපේක්ෂව කාර්ය සාධනය නිරීක්ෂණය කිරීම සහ ප්‍රතිඵල ඇගයීම.
- මූල්‍ය පාලනයන් සහ වාර්තාකරණ පද්ධති සමාලෝචනය කිරීම.
- මූල්‍ය ප්‍රකාශන සහ මූල්‍ය වාර්තාකරණය සමාලෝචනය කිරීම සහ අනුමත කිරීම.
- නීතිමය අනුකූලතාවය සඳහා ප්‍රතිපත්ති සහ පටිපාටි සමාලෝචනය කිරීම.

කොමිෂන් සභා රැස්වීම්

කොමිෂන් සභාවේ රැස්වීමක් සඳහා ගණපූරණය සාමාජිකයින් තිදෙනෙකු විය යුතු අතර, ඔවුන්ගෙන් එක් අයෙකු කොමිෂන් සභාවේ සභාපතිවරයා විය යුතුය. සභාපතිවරයා නොමැති අවස්ථාවක දී, කොමිෂන් සභාවේ සෑම රැස්වීමකම මුලසුන දැරිය යුත්තේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසිනි. කොමිෂන් සභා රැස්වීමකට පැමිණ සිටින සාමාජිකයින්ගේ බහුතර ඡන්දය මත එම රැස්වීමේදී ගනු ලබන තීරණ අනුමත කරයි.

කොමිෂන් සභාව සාමාන්‍යයෙන් සෑම මසකම සහ අවශ්‍ය පරිදි රැස්වේ. මෙම වසර මුළුල්ලේ, කොමිෂන් සභාව රැස් වූ වාර ගණන 10 ක් වේ. කොමිෂන් සභා රැස්වීම්වල ඵලදායීතාවය වැඩි කිරීම පිණිස, රැස්වීමට පෙර කොමිෂන් සභා පත්‍රිකා බෙදා හරිනු ලැබේ. කොමිෂන් සභා සාමාජිකයින්ට කොමිෂන් සභා පත්‍රිකා පරීක්ෂා කිරීමට ප්‍රමාණවත් කාලයක් ඇති බවට වග බලා ගනු ඇත.

2023 වසරේ දී පවත්වන ලද කොමිෂන් සභා රැස්වීම්වලට පැමිණීම පහත දැක්වේ.

නම	සහභාගි වූ රැස්වීම් සංඛ්‍යාව
මහාචාර්ය එන්.ඩී ගුණවර්ධන, සභාපති	10
ආර්.ජී.එච්.කේ. රණතුංග මහතා, අධ්‍යක්ෂ ජනරාල් (වැඩබලන) *2023.08.11 දින සිට විශ්‍රාම ගියේය*	04
ඩී.එම්.එම් දිසානායක මහතා, අධ්‍යක්ෂ ජනරාල් *2023.08.11 දින සිට බලපැවැත්වෙන පරිදි පත් කරන ලදී*	05
ඒ. බිමල් රාජසිංහ මහතා, සාමාජික *2023.02.16 දින සිට බලපැවැත්වෙන පරිදි පත් කරන ලදී*	09
නන්දසිරි පොන්නම්පෙරුම මහතා, සාමාජික *2023.06.13 දින සිට බලපැවැත්වෙන පරිදි පත් කරන ලදී*	05
එරූෂ කාලිදාස මහතා, සාමාජික *2023.06.28 දින සිට බලපැවැත්වෙන පරිදි පත් කරන ලදී*	04

කොමිෂන් සභා ලේකම්වරයාගේ කාර්යභාරය

- කොමිෂන් සභා රැස්වීම් කැඳවීම.
- කොමිෂන් සභා රැස්වීම් වාර්තා සකස් කිරීම සහ අදාළ ලේඛන පවත්වා ගෙන යාම.
- කොමිෂන් සභා තීරණ සහ වාර්තා සකස් කිරීම.
- කොමිෂන් සභාවේ තීරණ බෙදා හැරීම සහ පසු විපරම් කටයුතු සිදු කිරීම.
- කොමිෂන් සභාවේ මුද්‍රාව තබා ඇති උපකරණ සහ ලේඛනවල නාම ලේඛනයක් පවත්වා ගෙන යාම.
- අවශ්‍ය විටෙක කොමිෂන් සභාවේ සහ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ මගපෙන්වීම් ඇතිව නියාමන කටයුතු සඳහා සහාය ලබා දීම.

ප්‍රධාන පාලන භාවිතයන්

වගවීම

මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී සහ වාර්තා කිරීමේදී කොමිෂන් සභාව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව කටයුතු කරයි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනත සමඟ කියැවෙන 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව විගණකාධිපතිවරයා විසින් කොමිෂන් සභාවේ ක්‍රියාකාරකම් පිළිබඳ මූල්‍ය හා කළමනාකරණ විගණන සිදු කරයි.

වගකීම

ආයතනයේ දීර්ඝ කාලීන තිරසාර බව සහතික කරමින් කොමිෂන් සභාව විසින් සැලසුම් කර ඇති පරිදි සහ මෙහෙයවන පරිදි කොමිෂන් සභාවේ මෙහෙයුම් කටයුතු අධීක්ෂණය කිරීම සහ සහතික කිරීම සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අඛණ්ඩව ප්‍රගති සමාලෝචන සහ කළමනාකරණ රැස්වීම් පවත්වයි.

කොමිෂන් සභාවේ ක්‍රියාකාරී සැලැස්මේ ක්‍රියාකාරකම්වල ප්‍රගතිය කොමිෂන් සභාව වරින් වර සමාලෝචනය කරයි.

පාරදෘශ්‍යභාවය

කොමිෂන් සභාවේ කටයුතු විනිවිදභාවයෙන් යුතුව සිදු කිරීම සහතික කිරීම පිණිස කොමිෂන් සභාව විසින් නීති රීති, මාර්ගෝපදේශ සකස් කර ඇත.

අභ්‍යන්තර විගණන අංශය ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අභ්‍යන්තර විගණක යටතේ ක්‍රියාත්මක වන අතර කොමිෂන් සභාව සහ අධ්‍යක්ෂ ජනරාල් වෙත සෘජුව වාර්තා කරයි. කොමිෂන් සභාවේ අභ්‍යන්තර පාලන ඇතුළු සියලුම පද්ධති සහ ක්‍රියාවලීන් ක්‍රමානුකූලව ක්‍රියාත්මක වන බව සහතික කිරීම අංශයේ වගකීම වේ.

විගණන කමිටුව විසින් කොමිෂන් සභාවේ ප්‍රධාන ක්‍රියාකාරකම් වරින් වර සමාලෝචනය කරයි.

මූල්‍ය ප්‍රකාශනය
2023 වර්ෂය සඳහා

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව
මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය
2023 දෙසැම්බර් 31 දිනට
(ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශිතය)

	සටහන්	2023.12.31 දිනට	2022.12.31 දිනට
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	4	3,445,580,151	240,632,259
දේපළ, පිරියත හා උපකරණ - කොළඹ නෙළුම් කුලුන	4.1	61,450,235,494	23,613,421,995
අස්පෘශ්‍ය වත්කම්	4.2	1	6,841,125
කෙරිගෙන යන වැඩ	5	1,025,916,186	970,347,921
ආයෝජන	6	7,551,394,125	11,563,722,603
මුළු ජංගම නොවන වත්කම්		**73,473,125,957**	**36,394,965,903**
ජංගම වත්කම්			
ලැබිය යුතු ගිණුම්	7	2,791,140,497	3,104,691,601
පූර්වගෙවුම් සහ අත්තිකාරම්	8	205,833,705	77,629,209
ණය සහ අනෙකුළුහ් ලැබීම්	9	1,835,537,864	1,305,304,693
මුදල් සහ මුදල් සමානුපාත	10	10,294,093,663	2,691,954,967
මුළු ජංගම වත්කම්		**15,126,605,730**	**7,179,580,469**
මුළු වත්කම්		**88,599,731,687**	**43,574,546,372**
සම කොටස් සහ වගකීම්			
සම කොටස්			
රජයේ දායක මුදල්	11	22,737,646,792	526,214,744
සමුච්චිත අතිරික්තය		32,428,417,564	31,137,553,343
ප්‍රත්‍යාගණන අතිරික්තය	12	19,572,379,054	37,380,000
මුළු සම කොටස්		**74,738,443,410**	**31,701,148,087**
ජංගම නොවන වගකීම්			
ව්‍යාපෘති ණය - එක්සිම් බැංකුව (නෙළුම් කුලුන)		2,234,220,795	5,105,962,811
රඳවා ගැනීම	13	17,448,766	17,448,766
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්	14	44,790,264	38,665,062
මුළු ජංගම නොවන වගකීම්		**2,296,459,825**	**5,162,076,639**

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව
මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය
2023 දෙසැම්බර් 31 දිනට
(ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශිතය)

	සටහන්	2023.12.31 දිනට	2022.12.31 දිනට
ජංගම වගකීම්			
ගෙවිය යුතු ගිණුම්	15	3,116,819,143	51,419,723
අත්තිකාරම්, තැන්පතු සහ වෙනත් ගෙවීම්	16	3,432,320,334	1,109,071,697
භාණ්ඩාගාරය සඳහා ගෙවිය යුතු මුදල්	17	1,637,168,956	1,763,592,926
නෙළුම් කුලුනේ ප්‍රමාද හානි වගකීම්		3,378,520,019	3,787,237,300
මුළු ජංගම වගකීම්		**11,564,828,453**	**6,711,321,646**
මුළු වගකීම්		**13,861,288,277**	**11,873,398,285**
මුළු සම කොටස් සහ වගකීම්		**88,599,731,687**	**43,574,546,372**

මෙම ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් සමස්ථ මූල්‍ය ප්‍රකාශනයේ කොටසකි. කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශනය මගින් 2023 දෙසැම්බර් 31 දක්වා කාලපරිච්ඡේදය තුළ සිදු කරන ලද කාර්යයන් පිළිබඳව සත්‍ය හා සාධාරණ සමාලෝචනයක් කර ඇති බවත් කාලපරිච්ඡේදය සඳහා අතිරික්ත එතැන් සිට අවසන් වන බවත් සහතික කරමි.

.....

එම්.කේ. ජයන්ත

අධ්‍යක්ෂ - මූල්‍ය

මෙම මූල්‍ය ප්‍රකාශය පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීමේ වගකීම කොමිෂන් සභාව සතුවේ. කොමිෂන් සභාව වෙනුවෙන් අනුමත කර අත්සන් කරන ලදී.

.....	.....	.....
ආචාර්ය ධර්මසිරි කුමාරතුංග	**මධුෂන්ක දිසානායක**	**නන්දසිරි පොනන්පෙරුම**
සභාපති	**අධ්‍යක්ෂ ජනරාල්**	**කොමිෂන් සභා සාමාජික**

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව
ලාභ හෝ අලාභ හා වෙනත් විස්තීර්ණ ආදායම් පිළිබඳ ප්‍රකාශය
2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා
(ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශිතය)

	සටහන්	2023.12.31 දිනට	2022.12.31 දිනට
ආදායම			
ආදායම	**18**	48,235,966,865	38,414,628,131
මුළු මෙහෙයුම් ආදායම		**48,235,966,865**	**38,414,628,131**
*අඩු කළා: **නියාමන වියදම්***	**19**	(469,955,508)	(209,596,429)
මුළු ශුද්ධ මෙහෙයුම් ආදායම		**47,766,011,357**	**38,205,031,702**
අඩු කළා: වෙනත් වියදම්			
පරිපාලන හා ස්ථාපිත කිරීම	**20**	2,226,677,789	1,822,878,544
මූල්‍ය සහ වෙනත් වියදම්	**21**	120,438,179	119,961,363
විදේශ විනිමය ගනුදෙනු (ලාභය)/අලාභය		(384,645,157)	4,565,034,424
මුළු වියදම		**1,962,470,811**	**6,507,874,331**
අඛණ්ඩ මෙහෙයුම් තුළින් වර්ෂය සඳහා ලාභය ආදායම් බදු ගෙවීමට පෙර		**45,803,540,546**	**31,697,157,371**
අඩු කළා: ආදායම් බදු - වර්ෂය සඳහා ගාස්තු		0	0
පසුගිය වර්ෂය වැඩි වෙන්කිරීම් ගැළපීම		(501,617,700)	(159,117,368)
අඛණ්ඩ මෙහෙයුම් තුළින් වර්ෂය සඳහා ලාභය ආදායම් බදු ගෙවීමට පසු		**45,301,922,846**	**31,538,040,003**
වෙනත් විස්තීර්ණ ආදායම			
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් මත ලාභය/(අලාභය)		101,443	4,796,706
වර්ෂය සඳහා මුළු වෙනත් විස්තීර්ණ ආදායම		**101,443**	**4,796,706**
බදු ගෙවීමෙන් පසු වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම		**45,302,024,289**	**31,542,836,709**
අඩු කළා: ඒකාබද්ධ අරමුදලට දායකත්වය	**22-1**	(43,055,632,587)	(29,308,503,882)
ඒකාබද්ධ අරමුදලට දායක කිරීමෙන් පසුව වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම		**2,246,391,702**	**2,234,332,827**
එකතු කරන්න:			
ඉදිරියට ගෙනා මුළු විස්තීරණ ආදායම		**31,182,025,862**	**29,903,220,516**
අඩු කළා: ඒකාබද්ධ අරමුදලට දායකත්වය	**22-2**	(1,000,000,000)	(1,000,000,000)
		30,182,025,862	**28,903,220,516**
ඉදිරියට ගෙන ගිය මුළු විස්තීරණ ආදායම		**32,428,417,564**	**31,137,553,343**

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව
මුදල් ප්‍රවාහ ප්‍රකාශය
2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා
(ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශිතය)

	සටහන්	2023.12.31 දිනට	2022.12.31 දිනට
මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් උත්පාදනය වූ මුදල් ප්‍රවාහ			
මෙහෙයුම් තුළින් උත්පාදනය වූ මුදල්	23	45,711,556,178	32,732,275,082
බදු ගෙවීම්		(815,318,475)	(2,517,398,705)
ගෙවන ලද අධිභාර බදු		0	(1,593,707,018)
විශ්‍රාම ප්‍රතිලාභ ගෙවීම්		(10,636,780)	(1,720,250)
මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් උත්පාදිත ශුද්ධ මුදල් ප්‍රවාහය		**44,885,600,923**	**28,619,449,110**
දේපළ, පිරියත හා උපකරණ මිලදී ගැනීම		(2,505,689)	(35,567,482)
කෙරිගෙන යන වැඩ යටතේ ඇති ව්‍යාපෘති		(55,568,265)	(46,431,042)
ස්ථාවර තැන්පතුවල ශුද්ධ ආයෝජනය හා භාණ්ඩාගාර බැඳුම්කර		3,900,000,000	(2,787,671,522)
ස්ථාවර තැන්පතු වලින් ලැබෙන පොළී ආදායම		1,783,165,651	1,341,809,605
ස්ථාවර තැන්පතුවල ආයෝජන - පාරිතෝෂික බැඳීම්		(4,680,000)	(910,000)
ස්ථාවර තැන්පතු වලින් ලැබෙන පොළී ආදායම - පාරිතෝෂික බැඳීම්		9,262,419	13,057,820
දේපළ, පිරියත් සහ උපකරණ අළෙවි කිරීම්		279,600	4,650,111
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා යෙදවූ ශුද්ධ මුදල		**5,629,953,715**	**(1,511,062,510)**
මූල්‍ය ක්‍රියාකාරකම් මඟින් උත්පාදනය වූ මුදල් ප්‍රවාහ			
අත්තිකාරම් ගෙවීම ලියාපදිංචි කිරීම	24	17,450,122	157,081,430
කොටස් වෙළඳපොල ගණුදෙනු වලින් පොළී අදායම		1,124,766,523	493,775,933
ඒකාබද්ධ අරමුදල සඳහා ප්‍රේෂණ		(44,055,632,587)	(30,308,503,882)
ව්‍යාපෘති ණය - එක්සිම් බැංකුව (නෙලුම් කුලුන)		0	(452,549,828)
රඳවා ගැනීම්		(0)	(46,152,801)
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා යෙදවූ ශුද්ධ මුදල්		(42,913,415,942)	(30,156,349,149)
මුදල් හා මුදල් සමානුපාත වල ශුද්ධ (අඩුවීම්)/වැඩිවීම		**7,602,138,696**	**(3,047,962,550)**
මුදල් හා මුදල් සමානුපාතවල වෙනස්වීම			
2023 ජනවාරි 01 දිනට		2,691,954,967	5,228,410,528
(අඩුවීම්)/වැඩිවීම්		7,602,138,696	(2,637,962,550)
මුදල් හා මුදල් සමානුපාතවල විනිමය අනුපාතය (අලාභය)/ලාභය		0	101,506,989
2023 දෙසැම්බර් 31 දිනට	**10**	**10,294,093,663**	**2,691,954,967**

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව
සමානුපාතවල වෙනස්කම් ප්‍රකාශය
2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
(ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශිතය)

	සටහන්	රාජ්‍යාදායකවීම්	ප්‍රත්‍යාගණන අතිරික්තය	සමුච්චිත අතිරික්තය / (හිඟය)	මුළු සමානුපාත
2022 ජනවාරි 01 දිනට ශේෂය		526,214,744	37,380,000	31,496,927,534	**32,060,522,278**
2020 වසර සඳහා අධිභාර බදු		-	-	(1,593,707,018)	**(1,593,707,018)**
		526,214,744	**37,380,000**	**29,903,220,516**	**30,466,815,260**
අඩු කළා: ඒකාබද්ධ අරමුදලට මාරු කිරීම්		-	-	(1,000,000,000)	**(1,000,000,000)**
		526,214,744	**37,380,000**	**28,903,220,516**	**29,466,815,260**
2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම		-	-	2,234,332,827	**2,234,332,827**
තුඩාවේ බ්‍රදර්ස් (පුද්ගලික) සමාගම	**25**	-	-	44,472,519	**44,472,519**
2022 දෙසැම්බර් 31 දිනට ශේෂය		**526,214,744**	**37,380,000**	**31,182,025,862**	**31,745,620,606**
2023 ජනවාරි 01 දිනට ශේෂය		526,214,744	37,380,000	31,182,025,862	**31,745,620,606**
අඩු කළා: ඒකාබද්ධ අරමුදලට මාරු කිරීම්		-	-	(1,000,000,000)	(1,000,000,000)
		526,214,744	**37,380,000**	**30,182,025,862**	**30,745,620,606**
රජයේ ප්‍රදාන	**11**	22,211,432,048	-	-	**22,211,432,048**
ප්‍රත්‍යාගණන අතිරික්තය	**12**	-	19,534,999,054	-	**19,534,999,054**
2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම		-	-	2,246,391,702	**2,246,391,702**
2023 දෙසැම්බර් 31 දිනට ශේෂය		**22,737,646,792**	**19,572,379,054**	**32,428,417,564**	**74,738,443,410**

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2023.12.31
(මෙම සටහන්වල සියළුම විටිනාකම් වෙනත් ආකාරයකින් සඳහන් නොවන්නේ නම් මිස ශ්‍රී ලංකා රුපියල් වලින් දැක්වේ)

1. පොදු තොරතුරු

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව 1996 අංක 27 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතින් සංශෝධිත 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත ප්‍රකාරව විදුලි සංදේශ ක්ෂේත්‍රය නියාමනය කිරීම සඳහා ස්ථාපනය කරන ලද ස්වාධීන ආයතනයකි.

කොමිෂන් සභාවේ ලියාපදිංචි කාර්යාලය අංක 276, ඇල්විටිගල මාවත, කොළඹ 08 පිහිටා තිබේ.

උක්ත පනතේ සඳහන් පරිදි කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යයන් පහත සඳහන් වේ:

කොමිෂන් සභාව විසින් පනත යටතේ තමා සතු බලතල ජාතික යහපත ප්‍රවර්ධනය කිරීම සඳහා තමා වඩාත් ම යෝග්‍ය යයි තමා සලකන ආකාරයට සහ විශේෂයෙන්,

(අ) ශ්‍රී ලංකාවේ ජාතික හා අන්තර්ජාතික විදුලි සංදේශ සේවාවක් සැපයීම සඳහා සියලුම සාධාරණ ඉල්ලීම් ඉටු කළ හැකි වන පරිදි විශ්වාසය තැබිය හැකි සහ කාර්යක්ෂම සේවාවක්, (එවැනි සේවාවක් සැපයීම ප්‍රායෝගික නොවන අවස්ථාවල හැර) හදිසි සේවා, පොදු දුරකථන කුටි සේවා, නාමාවලි තොරතුරු සේවා, සමුද්‍රීය සේවා, ග්‍රාමීය සේවා සහ වෙනත් ප්‍රදේශවල ජාතික යහපත පිණිස අවශ්‍ය යයි සළකනු ලබන සේවා ඇතුළුව, සපයනු ලබන බවට වගබලා ගැනීම.

(ආ) (අ) ඡේදයේ ව්‍යාප්තියට හානියක් නොමැතිව, සෑම ක්‍රියාකරුවකුගේම බලපත්‍රයේ සඳහන් කර ඇති සේවාවන් සපයනු ලැබීම නිසැක කිරීම සඳහා, එකී සෑම ක්‍රියාකරුවෙකුටම අවශ්‍ය තාක්ෂණික, මූල්‍ය සහ කළමනාකරණ සම්පත් ඇති බවට සහ ඔහු විසින් ඒවා යොදා ගනු ලබන බවට වග බලා ගැනීම.

(ඇ) අය කරනු ලබන ගාස්තු සහ සපයනු ලබන විදුලි සංදේශ සේවාවන් සහ විදුලි සංදේශ උපකරණ වල තත්වය හා විවිධත්වය සම්බන්ධයෙන් පාරිභෝගිකයන්ගේ, ගැනුම්කරුවන්ගේ සහ වෙනත් පාවිච්චි කරන්නන්ගේ සම්බන්ධතාවයන් හා පොදුවේ මහජන යහපත ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම.

(ඈ) විදුලි සංදේශ සේවා හා සම්බන්ධ වාණිජ කටයුතු වල නිරත තැනැත්තන් අතර ඵලදායී තරහකාරිත්වයක් පවත්වා ගෙන යාම සහ ප්‍රවර්ධනය කිරීම සහ ඒ තැනැත්තන්ගේ කාර්යක්ෂමතාවය සහ පිරිමැසුම්දායක බව ප්‍රවර්ධනය කිරීම.

(ඉ) අභ්‍යන්තර සහ ජාත්‍යන්තර විදුලි සංදේශ පහසුකම් පිළිබඳ සීඝ්‍ර සහ අඛණ්ඩ සංවර්ධනයක් ප්‍රවර්ධනය කිරීම.

(ඊ) අත්‍යාවශ්‍ය ප්‍රමාදයන් හෝ බාධාවන් හෝ අවහිරවලින් තොර විශ්වාසදායක සහ කාර්යක්ෂම සේවාවක් සැපයීම තම වගකීම ඉටු කිරීමට ක්‍රියාකරුවන්ට හැකිකම ඇති බවට නිසැක කිරීම.

(උ) විදුලි සංදේශ සහ ඒ හා සම්බන්ධ ක්ෂේත්‍ර ගැන නව තාක්ෂණික ක්‍රම පිළිබඳ පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම සහ ඒ නව තාක්ෂණික ක්‍රම වැඩිදියුණු කිරීම සහ ඒ ක්‍රම භාවිත කිරීම.

(ඌ) ශ්‍රී ලංකාවෙන් පිටත සිය ව්‍යාපාරික ස්ථාන ඇති, විදුලි සංදේශ සේවා බහුල වශයෙන් පාවිච්චි කරන්නන් ශ්‍රී ලංකාව ඇතුළත ව්‍යාපාරික ස්ථාන පිහිටුවීම පිණිස දිරිගැන්වීම සහ

(එ) ජාත්‍යන්තර සංක්‍රාන්ති සේවා සඳහා ශ්‍රී ලංකාව යොදා ගැනීම ප්‍රවර්ධනය කිරීම.

2. අනුකූලතා ප්‍රකාශනය

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (“SLFRS”සහ “LKAS”) සහ 1995 අංක 19 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති පනත සහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයිය ගිණුම්කරණ ප්‍රමිති (SLPSAS’s) අවශ්‍යතා අනුව කොමිෂන් සභාව සිය මූල්‍ය ප්‍රකාශන සකස් කරයි.

3. විශේෂ ගිණුම්කරණ ප්‍රතිපත්ති පිළිබඳ සාරාංශය

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී යොදා ගන්නා ප්‍රධාන ගිණුම්කරණ ප්‍රතිපත්ති පහත දැක්වේ.

මෙම ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනත් ආකාරයකින් සඳහන් නොවන්නේ නම් මිස ඉදිරිපත් කළ වර්ෂය සඳහා නිත්‍ය වශයෙන් අදාළ වී ඇත.

3.1 පිළියෙල කිරීමේ පදනම

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට (“SLFRS”සහ “LKAS”) අනුකූලව පිළියෙල කර ඇති මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය සම්මුතිය යටතේ පිළියෙල කර ඇත. මෙම ගිණුම්වලට බලපාන උද්ධමනකාරී සාධකයන් සඳහා ගැලපීම් කර නැත.

3.1.1 විදේශ විනිමය පරිවර්තනය කිරීම

ගනුදෙනු සිදු වූ අවස්ථාවේ පැවති විදේශ විනිමය අනුපාතය සියලු විදේශ මුදලින් වූ ගනුදෙනු සඳහා යොදා ගෙන ඇත. ශේෂ පත්‍ර දිනට පවතින විනිමය අනුපාතිකය අනුව විදේශ මුදලින් ඇති වත්කම් සහ වගකීම් පරිවර්තනය කරයි. ප්‍රතිඵල ලෙස ඇති වන ලාභය හෝ අලාභය ආදායම් වියදම් ගිණුමේ දක්වා ඇත.

3.2 වත්කම් සහ ඒවායේ තක්සේරු පදනම

3.2.1 දේපළ, පිරියත සහ උපකරණ

(අ) හඳුනාගැනීමේ මිනුම

I. දේපළ, පිරියත සහ උපකරණ

සියලු ම දේපළ, පිරියත සහ උපකරණ සමුච්චිත ක්ෂය පිරිවැය හෝ හානි කරන අලාභය මත සටහන් කරනු ලැබේ. දේපළ, පිරියත සහ උපකරණ පිළිබඳ පිරිවැය එහි ගැනුම් මිල සහ පරිහරණය කිරීමට අපේක්ෂිත වත්කම්වල සේවා තත්ත්වය මත සෘජු ආරෝපිත පිරිවැයෙන් සමන්විත වේ.

කොමිෂන් සභාව වෙත අයිතමය හා සම්බන්ධ අනාගත ආර්ථික ප්‍රතිලාභ ගෙන යාමට හෝ ගලා ඒම සඳහා ස්ථිර ස්වභාවයේ වත්කම් අත්පත් කර ගැනීම, දීර්ඝ කිරීම හෝ වැඩිදියුණු කිරීම සඳහා දරන ලද පසුකාලීන පිරිවැය ප්‍රාග්ධන වියදම් ලෙස සලකනු ලැබේ. ප්‍රතිස්ථාපනය කරන ලද කොටස් රැගෙන යන ප්‍රමාණය හඳුනා නොගනී. අනෙකුත් සියලුම අළුත්වැඩියා කිරීම් සහ නඩත්තු කිරීම් ඔවුන් දරනු ලබන මූල්‍ය කාල සීමාව තුළ විස්තීරණ ආදායමට අය කෙරේ.

විගණන කමිටුවේ උපදෙස් පරිදි, පසුගිය වසරේ විගණකාධිපති දෙපාර්තමේන්තුවේ එකඟතාවය ලබා ගැනීම පිණිස ඉදිරිපත් කරන ලද ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ප්‍රත්‍යාගණන ප්‍රතිපත්ති කෙටුම්පත සඳහා විගණකාධිපතිගේ මතය ලැබෙන තුරු, මූල්‍ය අංශය විසින් එම ක්‍රියාවලිය ආරම්භ කරන ලද අතර එම ප්‍රත්‍යාගණන ක්‍රියාවලිය සම්බන්ධ කටයුතු තක්සේරු දෙපාර්තමේන්තුව සම්බන්ධීකරණය කර සකස් කරන මෙන් පාලන අංශයෙන් ඉල්ලා සිටින ලදී.

II. ආයෝජන දේපළ - කොළඹ නෙළුම් කුලුන

ආයෝජන දේපළ පිරිවැය අඩු සමුච්චිත ක්ෂයවීම් වල සඳහන් වේ.

(ආ) ක්ෂයවීම්

ඉඩම් ක්ෂය කිරීමට නොහැකිය. සෙසු වත්කම් ක්ෂයකිරීමේදී ලාභය හෝ අලාභය දේපළ, පිරියත සහ උපකරණ අයිතමවල එක් එක් කොටස්වල ඵලදායී ජීවිත කාලය පුරා ක්ෂය කිරීමේ සරල රේඛීය ක්‍රමය මත හඳුනාගනු ලැබේ. අත්පත් කර ගන්නා වර්ෂයේදී ක්ෂය කිරීම වත්කම පරිහරණයට ගන්නා ලද මාසයේ සිට සමානුපාතික පදනම මත ගණනය කරනු ලබන අතර අදාල වත්කම ඉවත් කරන මාසයේදී ක්ෂය කිරීම සිදු නොකරයි.

(ඇ) දේපළ, පිරියත සහ උපකරණවල ඇස්තමේන්තු කළ ඵලදායී ජීවිත කාලය (ආයෝජන දේපළ ඇතුළත්ය)

නෙලුම් කුලුන ගොඩනැගිල්ල සහ ව්‍යුහය	වසර 50 වැඩි
වෙනත් ගොඩනැගිලි	වසර 20 වැඩි
විදුලි සංදේශ කුලුනු	වසර 10 වැඩි
ලී බඩු සහ සවි කිරීම්	වසර 10 වැඩි
කාර්යාල උපකරණ	වසර 10 වැඩි
ගිනි ආරක්ෂණ පද්ධතිය	වසර 10 වැඩි
මුළුතැන්ගෙයි උපකරණ	වසර 10 වැඩි
වායුසමීකරණ යන්ත්‍ර	වසර 10 වැඩි
විදුලි උත්පාදන යන්ත්‍ර	වසර 10 වැඩි
විදුලි සෝපාන යන්ත්‍ර	වසර 10 වැඩි
කාර්යාල දුරකථන	වසර 10 වැඩි
තාක්ෂණික උපකරණ	වසර 10 වැඩි
මෝටර් රථ	වසර 08 වැඩි
පරිගණක	වසර 04 වැඩි
වෙබ් සර්වර්	වසර 04 වැඩි
කාය වර්ධන උපකරණ	වසර 04 වැඩි
මාධ්‍ය ඒකකයේ උපකරණ	වසර 04 වැඩි

(ඈ) අස්පෘශ්‍ය වත්කම්

අත්පත් කරගත් පරිගණක මෘදුකාංග බලපත්‍ර ප්‍රාග්ධනීකරණය කරනු ලබන්නේ නිශ්චිත මෘදුකාංගයක් අත්පත් කර ගැනීමට සහ ඒවා භාවිත කිරීමට දරන පිරිවැය මත ය. එම වියදම් වසරක කාලයක් තුළ පියවනු ලැබේ.

(ඉ) කෙරිගෙන යන ප්‍රාග්ධන වැඩ

කෙරිගෙන යන ප්‍රාග්ධන වැඩවල පිරිවැය සඳහන් වේ. මෙය ප්‍රාග්ධනය අපේක්ෂාවෙන් ගොඩනැගිලි ඉදිකිරීම සහ පද්ධති සංවර්ධනයෙහිලා සෘජුවම වැය කරන ප්‍රාග්ධන ස්වභාවයේ වියදම් වේ.

(ඊ) ශේෂපත්‍රයෙහි වත්කම් හෝ වගකීම් ඉවත් කිරීම

දේපළ, පිරියත සහ උපකරණ අයිතමයක ප්‍රකාශ කරන වටිනාකම් එහි පරිහරණය මත තවදුරටත් හඳුනාගනු නොලැබේ. දේපළ, පිරියත සහ උපකරණවල ප්‍රකාශ කරන වටිනාකම් සමඟ පරිහරණය කිරීමේ ලාභ ප්‍රයෝජන සැසඳීමෙන් දේපළ, පිරියත සහ පාඩුව තීරණය වන අතර "වෙනත් ආදායම්" ලාභය හෝ පාඩුව තුලින් ශුද්ධ ලාභය හඳුනා ගනු ලැබේ.

3.2.2 තාවකාලික අරමුදල් කළමනාකරණය / ආයෝජන

කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද තාවකාලික අරමුදල් කළමනාකරණ මාර්ගෝපදේශයට අනුකූලව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් සියලුම ආයෝජන කටයුතු සිදු කරනු ලැබේ.

ගමට සන්නිවේදනය නම් ජාතික ව්‍යාපෘතිය සඳහා වෙන් කර ඇති රු. 7,400,000 ස්ථාවර තැන්පතු මුදලින් ආයෝජන ශේෂය දැක්වේ. එමෙන්ම රජයේ භාණ්ඩාගාරයේ හදිසි අරමුදල් අවශ්‍යතාවයක් හේතුවෙන් රජයේ භාණ්ඩාගාර බැඳුම්කරවල ආයෝජනයක් කිරීමට සිදුවී තිබිණි. ඒ අනුව, භාණ්ඩාගාර ලේකම් විසින් යෝජනා කරන ලද පරිදි, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් භාණ්ඩාගාර බැඳුම්කරය සමඟ තැන්පතුවක් වශයෙන් කල් පිරෙන විට මුදල් බවට පත් වනු ලබන රුපියල් මිලියන 4000ක අරමුදල ප්‍රේෂණය කරන ලදී. එම අරමුදල ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කරන සෙසු ජාතික ව්‍යාපෘති සඳහා මූලිකව වෙන් කර යොදවන ලදී.

මෙම බැඳුම්කරය වට්ටමක් සහිතව නිකුත් කර ඇති අතර එම නිසා එම බැඳුම්කරයේ පියවීමේ වටිනාකම රු. 4,276,051,080 ක් වන අතර එහි මුහුණත වටිනාකම රු.4,000,000,000. ඉතිරි වට්ටම් මුදල රු. 163,722,603 ආයෝජනයට එකතු කර ඇති අතර එය කල් පිරෙන තෙක් බැඳුම්කර ජීවන චක්‍රය පුරා ක්‍රමක්ෂය කරනු ලැබේ. සමාලෝචිත කාල සීමාව වෙනුවෙන් වට්ටම් ක්‍රමක්ෂය කිරීම සඳහා අදාළ වන රු. 112,328,477 වටිනාකම් මූල්‍ය පිරිවැය ලෙස වර්ගීකරණය කර ඇත.

ඉහත ස්ථාවර තැන්පතුවලින් ලැබෙන පොලී ආදායම සහ භාණ්ඩාගාර බැඳුම්කරයෙන් ලබාගත් ආයෝජනය කරන ලද අරමුදල් මත ලැබෙන පොලී ආදායම් අංක 18 A (1) විවිධ ආදායම් සටහන් යටතේ සටහන් කර ඇත.

3.2.3 ලැබිය යුතු ගිණුම්

ලැබිය යුතු ගිණුම් හඳුනාගෙන පවත්වාගෙන යනු ලබන්නේ එක්රැස් කර ගත නොහැකි සියළුම වටිනාකම් සඳහා වන සියළුම දීමනා අඩුකිරීමෙන් පසුව මුල් බිල්පත් වටිනාකම් මතය. සම්පූර්ණ වටිනාකම රැස්කිරීම තවදුරටත් අපේක්ෂා කල නොහැකි විට අඩමාන ලැබීම් පිළිබඳ ඇස්තමේන්තු පිළියෙල කරනු ලැබේ.

3.2.4 මුදල් සහ මුදල් සමානුපාත

මුදල් සහ මුදල් සමානුපාත අතැති මුදල් සහ බැංකු තැන්පතු වලින් සමන්විත වේ.

3.3 වගකීම් සහ වෙන් කිරීම්

ශේෂපත්‍ර දිනට පවතින සියලුම ප්‍රමාණාත්මක වගකීම් මූල්‍ය ප්‍රකාශනයේ ඇතුලත් කර ඇති අතර ශේෂපත්‍ර දිනට පවතින නමුත් වටිනාකම නිවැරදිවම අගය කළ නොහැකි වගකීම් සඳහා ප්‍රමාණවත් වෙන් කිරීමක් සිදු කොට ඇත.

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සඳහන් දින සිට වසරක් ඇතුලත ඉල්ලුම් මත ගෙවිය යුතු බැඳීම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වගකීම් වශයෙන් සැලකේ. මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දින සිට වසරකට පසු ගෙවිය යුතු වගකීම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනවල ජංගම නොවන වගකීම් වශයෙන් සැලකේ.

3.3.1 ප්‍රාග්ධන බැඳියාවන් සහ අසම්භාව්‍ය බැරකම්

මූල්‍ය තත්ත්වය ප්‍රකාශනයේ දිනට ඇති ප්‍රාග්ධන ව්‍යදම් බැඳියාවන් සහ අසම්භාව්‍ය බැරකම් ගිණුම් සඳහා සටහන් ලෙස අංක 3. 8 යටතේ හෙළිදරව් කර ඇත.

3.3.2 කාර්ය මණ්ඩල ප්‍රතිලාභ

(අ) විශ්‍රාම ගැනීමේ පාරිතෝෂික වෙන් කිරීම

වර්ෂය තුල විශ්‍රාම ගැනීමේ පාරිතෝෂික වෙන් කිරීම පහත දැක්වේ.

	2023 (රු.)	**2022 (රු.)**
මූල්‍යය වර්ෂය ආරම්භයේදී ශේෂය	**117,674,290**	**99,939,358**
ජංගම සේවා පිරිවැය	3,942,155	3,771,394
පොළී පිරිවැය	7,851,356	7,422,674
විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ වෙනත් ආදායම් ලෙස අයකිරීම්	**129,467,801**	**111,133,426**
තථ්‍ය අලාභ / (ලාභ)	(101,443)	(4,796,706)
ගෙවන ලද ප්‍රතිලාභ	(10,636,780)	(1,720,250)
එකතු කළා: පාරිතෝෂික බැඳීම් ආවරණය කිරීමට ආයෝජන මත උපයාගත් පොලිය	18,622,933	13,057,820
මූල්‍යය වර්ෂය අවසානයේදී ශේෂය	**137,352,511**	**117,674,290**

සුදුසුකම් ලත් සියලුම සේවකයින් සඳහා 1983 අංක 12 දරන පාරිතෝෂික පනත යටතේ අවශ්‍ය පරිදි විශ්‍රාම ප්‍රතිලාභ සැලැස්ම කොමිෂන් සභාව විසින් සම්මත කර ඇත.

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් මගින් සේවකයෙකු විශ්‍රාම ගැනීම මත ලබාගන්නා ප්‍රතිලාභවල වටිනාකම විස්තර කෙරේ. නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් පිළිබඳ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනවල හඳුනාගත් වගකීම් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති - LKAS 19: සේවක ප්‍රතිලාභවල නියම කර ඇති පරිදි පුරෝකථනය කළ ඒකක බැර ක්‍රමය භාවිතා කරමින් කොමිෂන් සභාව විසින් වාර්ෂිකව ගණනය කරනු ලැබේ.

පසුගිය වර්ෂයේ අධි හෝ ඌන වෙන් කිරීම් නිසා සිදුවන වෙනස්කම් මගින් පැන නගින ලාභය හෝ අලාභය එය සිදුවන කාලපරිච්ඡේදයේ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය සඳහා අය කිරීම හෝ බැර කිරීම කරනු ලැබේ. විස්තීර්ණ ආදායම් ප්‍රකාශනවල වර්ෂය සඳහා පාරිතෝෂික අය කිරීම ක්ෂණිකව හඳුනාගනු ලැබේ. කොමිෂන් සභාව විසින් පාරිතෝෂික බැඳීම් සඳහා සමාන වටිනාකම ස්ථාවර තැන්පතුවල ආයෝජනය කරනු ලැබේ.

පහත සඳහන් ප්‍රධාන තථ්‍ය උපකල්පනයන් සැලකිල්ලට ගෙන කොමිෂන් සභාව විසින් පාරිතෝෂික වෙන් කිරීම සිදු කරනු ලැබේ.

වට්ටම් අනුපාතය	-	වසරකට 10.25%
වැටුප් වර්ධක අනුපාතය	-	1% - 6.7%
විශ්‍රාම ගැනීමේ වයස	-	අවුරුදු 60 යි

(ආ) නිශ්චිත දායකත්ව සැලසුම්

නිශ්චිත සහභාගී සැලසුමක් සඳහා සහභාගිත්වය පිළිබඳ බැඳීම් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ සිදු කරන ලද වියදමක් වශයෙන් හඳුනාගනු ලැබේ.

(ඇ) සේවක අර්ථසාධක අරමුදල (EPF) සහ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල (ETF)

කොමිෂන් සභාවේ සියළුම සේවකයන් සේවක අර්ථසාධක අරමුදලේ හා සේවා නියුක්තයන්ගේ භාර අරමුදලේ සාමාජිකයන් වේ.

කොමිෂන් සභාව සේවකයින්ගේ මූලික වැටුපෙන් 15%ක් සහ 3%ක් සේවක අර්ථසාධක අරමුදලට (EPF) සහ සේවක භාරකාර අරමුදලට (ETF) පිළිවෙළින් දායක වන අතර සේවකයා සේවක අර්ථසාධක අරමුදලට 10%ක් දායක වේ.

3.4 ආදායම හඳුනා ගැනීම

3.4.1 සිට 3.4.11 දක්වා සටහන් වල ආදායම් අයිතම හැර, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය - LKAS 18 අනුව ආදායම හඳුනාගෙන ඇත.

3.4.1 සංඛ්‍යාත බලපත්‍ර ගාස්තු

1996 අංක 27 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතින් සංශෝධිත 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතේ 22 වන වගන්තිය ප්‍රකාරව, සංඛ්‍යාත බලපත්‍ර ගාස්තු යනු යම් කිසි ගුවන් විදුලි සංඛ්‍යාතයක් හෝ ගුවන් විදුලි සංඛ්‍යාත විමෝචන උපකරණයක් පරිහරණය කිරීම සඳහා සංඛ්‍යාත පරිහරණය කරන්නකු විසින් ගෙවිය යුතු බලපත්‍ර ගාස්තුවකි. එබැවින්, 2019 වර්ෂයේ සිට, නැව් මධ්‍යස්ථාන ගාස්තු සහ ගුවන් යානා බලපත්‍ර ගාස්තු ගුවන් විදුලි සංඛ්‍යාත බලපත්‍ර ගාස්තු යටතේ වර්ගීකරණය කර ඇත.
වර්ෂය තුළ එකතු කරන ලද කිසියම් සංඛ්‍යාත බලපත්‍ර ගාස්තුවක බලපත්‍ර කාලය ලබන වසර දක්වා ක්‍රියාත්මක වන්නේ නම්, ඊළඟ වසර සඳහා අදාළ සමානුපාතික මුදල අත්තිකාරම් ආදායම ලෙස හඳුනා ගෙන අත්තිකාරම්, තැන්පතු සහ ගෙවිය යුතු වෙනත් ශීර්ෂ යටතේ වර්ගීකරණය කෙරේ.

3.4.2 ක්‍රියාකරු බලපත්‍ර ගාස්තුව

1996 අංක 27 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතින් සංශෝධිත 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතේ 17 වන වගන්තිය ප්‍රකාරව විදුලි සංදේශ ක්‍රියාකාර සමාගම් වලට නව බලපත්‍ර නිකුත් කිරීමේදී හෝ පවතින බලපත්‍ර වසර 10ක් හෝ අවුරුදු 05ක් සඳහා අලුත් කිරීමේදී මුදල් පදනම මත ක්‍රියාකරු බලපත්‍ර අලුත් කිරීමේදී මුදල් පදනම මත හඳුනාගනු ලැබේ.

3.4.3 වෙළඳ බලපත්‍ර ගාස්තු/රැහැන් රහිත දුරකථන බෙදාහරින්නන්ගේ ගාස්තු/කෙටි සංකේත අංක ගාස්තු/බලපත්‍ර සකස් කිරීමේ ගාස්තු

1996 අංක 27 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතින් සංශෝධිත 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතේ 21 වන වගන්තිය ප්‍රකාරව කිසියම් තැනැත්තෙකුට බලපත්‍ර නිකුත් කිරීමේදී වෙළෙඳ බලපත්‍ර ගාස්තු මුදල් පදනම මත හඳුනාගනු ලැබේ.

3.4.4 සෙස් ගාස්තු

1996 අංක 27 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතින් සංශෝධිත 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතේ 22 (උ) කොන්දේසි ප්‍රකාරව සෙස් ගාස්තු හඳුනාගනු ලැබේ.

සීමාසහිත ලංකා බ්‍රෝඩ්බෑන්ඩ් නෙට්වර්ක්ස් (පෞද්ගලික) සමාගම විසින් නොගෙවූ සෙස් ගාස්තු අයකර ගැනීමේ ක්‍රියාවලිය සිදු කෙරෙමින් පවතී.

3.4.5 විදුලි සංදේශ බදු

2011 අංක 21 දරන විදුලි සංදේශ බදු පනත යටතේ විදුලි සංදේශ ක්‍රියාකාර සමාගම්වලින් ලැබෙන විදුලි සංදේශ බදු ආදායමක් වශයෙන් හඳුනාගෙන පසුව රජයේ ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කර ඇත.

විදුලි සංදේශ සේවා මත විදුලි සංදේශ බදු අනුපාතය 2018.11.05 දින සිට බලපැවැත්වෙන පරිදි සියයට 25 සිට සියයට 11.25 දක්වා අඩු කරන ලද අතර 2019.11.27 දින පවත්වන ලද අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී තීරණය කරන ලද පරිදි 2001 අංක 21 දරන විදුලි සංදේශ බදු පනතේ සංශෝධනයක් සහිතව 2019.12.01 දින සිට බලපවත්වන පරිදි එය නැවත සියයට සියයට 15 සිට සියයට 11.25 දක්වා අඩු කරන ලදී. එබැවින් 2022 ජූනි 4 වන දින සිට විදුලි සංදේශ බද්ද 11.25% සිට 15% දක්වා වැඩි කිරීමට යෝජිතය.

2011 අංක 21 දරන විදුලි සංදේශ පනතේ විධිවිධාන අනුව ලංකා කේබල් සැටලයිට් නෙට්වර්ක් (පෞද්ගලික) සමාගම විසින් නොගෙවන ලද විදුලි සංදේශ බදු අයකර ගැනීමේ ක්‍රියාවලිය සිදු කෙරෙමින් පවතී.

3.4.6 විදුලි සංදේශ සංවර්ධන ගාස්තු

2004 අංක 11 දරන මුදල් පනතේ iii කොටස සහ වැඩිදුරටත් 2010 ජූලි 12 දිනැති අංක 1662/1 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කළ රීති යටතේ, බාහිර ප්‍රවේශ ක්‍රියාකරුවන්ගෙන් ලැබෙන විදුලි සංදේශ සංවර්ධන ගාස්තු ආදායමක් වශයෙන් හඳුනාගෙන, මෙම ආදායමෙන් සියයට 50 ප්‍රතිශතයක් ගෙවිය යුතු නියමිත දිනයට හෝ එදිනට පෙර රජයේ ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කරනු ලැබේ.

3.4.7 ජාත්‍යන්තර පිටතට යැවෙන ඇමතුම් බදු

2004 අංක 11 දරන මුදල් පනතේ iii කොටස සහ 2011 දෙසැම්බර් 29 වන දිනැති අංක 1738/15 අතිවිශේෂ ගැසට් නිවේදනයේ ප්‍රසිද්ධ කර ඇති රීති යටතේ බාහිර ප්‍රවේශ දුරකථන ක්‍රියාකාර සමාගම්වලින් ලැබෙන ජාත්‍යන්තර පිටතට යැවෙන ඇමතුම් බදු ආදායමක් වශයෙන් හඳුනාගෙන ඇති අතර ගෙවිය යුතු නියමිත දිනයට හෝ එදිනට පෙර රජයේ ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කරනු ලැබේ.

2004 අංක 11 දරන මුදල් පනත යටතේ 2019 මැයි 14 දින අතිවිශේෂ ගැසට් අංක 2123/19 මගින් ප්‍රසිද්ධ කරන ලද 2019 අයවැය තීරණය ප්‍රකාරව 2019.06.01 දින සිට බලපවත්වන පරිදි පිටතට යැවෙන දේශීය ප්‍රවේශ ගාස්තු (OLAC) අවලංගු කරන ලදී.

3.4.8 කෙටි පණිවුඩ සේවා (SMS) ප්‍රමාණය මත බදු

2018 අංක 35 දරන මුදල් පනතේ xiii කොටස යටතේ 2019.01.01 දින සිට බලපවත්වන පරිදි කෙටි පණිවුඩ සේවා (SMS) ප්‍රමාණය මත බදු පනවන ලද අතර අතිවිශේෂ ගැසට් අංක 2104/1 හි රීති ප්‍රසිද්ධ කරන ලදී.

3.4.9 ජංගම දුරකථන කුලුනු බදු

2018 අංක 35 දරන මුදල් පනතේ xii කොටස යටතේ 2019.01.01 දින සිට බලපවත්වන පරිදි ජංගම දුරකථන කුලුනු බදු පනවන ලද අතර අංක 2104/16 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ රීති ප්‍රසිද්ධ කරන ලදී.

3.4.10 මාදිලි අනුමැති ගාස්තු

2020 ඔක්තෝම්බර් 09 දිනැති අංක 2196/51 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය යටතේ ගුවන්විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ (RTTE) මාදිලි අනුමැති රීති 2020 ලෙස හඳුන්වා දෙන ලද මෙම මාදිලි අනුමැති ගාස්තු නව ආදායම් මූලාශ්‍රයකි. ශ්‍රී ලංකාව තුළ ආනයනය කිරීමට, අලෙවි කිරීමට, නිෂ්පාදනය කිරීමට හෝ භාවිත කිරීමට අදහස් කෙරෙන සියලුම මාදිලියේ ගුවන් විදුලි සහ විදුලි සංදේශ පර්යන්ත උපකරණ සම්බන්ධයෙන් අදාළ වන සියලුම ගාස්තු මෙමගින් ප්‍රකාශ වේ.

මාදිලි අනුමැති පද්ධතිය ක්‍රියාත්මක කිරීම සහ පරිපාලනය කිරීම ඇතුළුව මාදිලි අනුමත කිරීමේ අයදුම්පත් තක්සේරු කිරීම සහ වෙළඳපල ආවේක්ෂණ කටයුතු සඳහා කොමිෂන් සභාව විසින් දරනු ලබන පරිපාලන වියදම් ආවරණය කිරීම මාදිලි අනුමැති ගාස්තුව මගින් අදහස් කෙරේ. මෙම රීතිවල උපග්‍රන්ථය ඇ හි දක්වා ඇති පරිදි, එක් එක් ගුවන් විදුලි හා විදුලි සංදේශ පර්යන්ත උපකරණය සඳහා මාදිලි අනුමැති ගාස්තුව අය කෙරේ. කොමිෂන් සභාව විසින් අවශ්‍ය පරිදි කලින් කල මාදිලි අනුමැති ගාස්තු සමාලෝචනය කළ හැක.

3.4.11 අනෙකුත් ආදායම

කල් පිරෙන දිනට ලාභ හෝ අලාභ ලැබෙන විට පොලී ආදායම හඳුනා ගැනේ. අනෙකුත් ආදායම කෙටිකාලීන ස්ථාවර තැන්පතු සහ කොටස් වෙළඳපල තැන්පතු ගිණුම, භාණ්ඩාගාර බැදුම්කර, කොකාවිල් බදු කුලී, මඩුකන්ද බදු කුලී යනාදියෙහි ආයෝජනය කරන ලද අරමුදල් මත ලැබෙන පොලී ආදායමෙන් සමන්විත වන අතර කල්පිරීමේ දිනයේ දී ලාභ හෝ අලාභ එකතු වන බැවින් පොලී ආදායම හඳුනා ගැනේ.

3.5 වියදම

වැයවූ පිරිවැය සහ ආදායමේ නිශ්චිත අයිතමයක් උපයා ගැනීම අතර වන සෘජු සම්බන්ධතාවයක පදනම මත විස්තීර්ණ අදායම් ප්‍රකාශය තුළ වියදම් හඳුනාගැනේ. කොමිෂන් සභාව පවත්වාගෙන යාමේදී සහ කාර්යක්ෂම තත්වයෙන් ප්‍රාග්ධන වත්කම් නඩත්තු කිරීමේදී දරණ ලද සියලු වියදම් වසර සඳහා වන අතිරික්ත ආදායමෙන් අය කරගෙන ඇත.

3.5.1 ආදායම් බදු

පෙර 2022 මූල්‍ය වර්ෂයේ දී ආදායම් බදු ගෙවිය යුතු ගිණුමේ රු. 501,617,700 මුදලක් වෙන් කර ඇති අතර,එය වසර තුළ ආදායම් බදු වියදම්වල ගළපා ඇත. වත්මන් වර්ෂය සඳහා වැඩිපුර ගෙවන ලද ආදායම් බදු ප්‍රමාණය රු. 670,131,114 කි.

දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විසින් අනුමත කරන ලද පරිදි ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ බදු කාලය ජනවාරි 1 සිට දෙසැම්බර් 31 දක්වා වේ. ඒ අනුව, 2023 වසරේ බදු වගකීම පහත දැක්වේ.

	2023 (Rs.)
බදුකරණයට පෙර ගිණුම් ලාභය	**43,934,531,465**
එකතු කළා: බදු අයකළ හැකි ආදායම / (අලාභය) තීරණය කිරීමේදී අනුමත කළ නොහැකි වියදම්වල බදු බලපෑම	333,593,121
අඩුකළා: බදු අයකළ හැකි ආදායම / (අලාභය) තීරණය කිරීමේදී බදු මත ආදායම, මුළු අනුමත කළ හැකි වියදම් සහ පොලී ආදායම	(25,250,205,073)
ආදායම් බදු සඳහා අය කළ හැකි ගැළපුම් කළ ගිණුම් ලාභය / (අලාභය)	**19,017,919,513**
පොලී ආදායම	3,563,373,942
තක්සේරු කළ හැකි ආදායම	**22,581,293,456**
අඩුකළා: සුදුසුකම්ලත් ගෙවීම් (භාණ්ඩාගාරය සඳහා ප්‍රේෂණ)	(25,000,000,000)
මුළු බදු අය කළ හැකි ආදායම	**(2,418,706,544)**
වර්ෂය සඳහා බදු අනුපාතය	30%
වර්ෂය සඳහා බදු බලපෑම	-
ගෙවන ලද ස්වයං - තක්සේරු බදු වාරික	
2023 මැයි මාසයේදී ගෙවන ලද ආදායම් බදු ගෙවීම (පළමු වන කාර්තුව)	55,923,663
2023 නොවැම්බර් මාසයේදී ගෙවන ලද ආදායම් බදු ගෙවීම (තුන් වන කාර්තුව)	**614,207,451**
ගෙවිය යුතු/ලැබිය යුතු බදු මුදල	**(670,131,114)**

3.6 ආයෝජන දේපළ - කොළඹ නෙළුම් කුලුන

නීතිඥ සහ නොතාරිස් නීතිඥ සොනාලි කේ.එම්. පෙරේරාගේ අංක 33 දරන බදු ගිවිසුම ප්‍රකාරව, කොළඹ නෙළුම් කුලුන 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ විධිමත් ලෙස සංස්ථාපිත පූර්ණ රජය සතු සමාගමක් වන සමාගම් අංක PV 00252719 දරන සීමාසහිත කොළඹ නෙළුම් කුලුන කළමනාකරණ (පුද්ගලික) සමාගම (බදුකරු) වෙත 2022 මාර්තු 1 වන දින සිට 2072 පෙබරවාරි 29 දක්වා වසර 50 ක කාලයක් සඳහා බදු දී ඇති අතර, 320, D R විජේවර්ධන මාවත, කොළඹ 10 යන ලිපිනයේ ලියාපදිංචි කාර්යාලය ඇත.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වෙනුවෙන් කොළඹ දිස්ත්‍රික් ප්‍රසිද්ධ නොතාරිස් නිලූෆර් ජෙහාන් මහතා විසින් සහතික කරන ලද 2022 ජනවාරි 10 දිනැති අංක 2004 දරන ස්ථාන මාරු ඔප්පුව ක්‍රියාත්මක කර රුපියල් මිලියන දෙදහස් දෙසිය පනහක (රු. 2,250,000,000/=) මුදල් වටිනාකමින් යුතු අක්කර 4 රූඩ් 3 පර්චස් 24.47 ඉඩම් ප්‍රමාණය සඳහා බලපත්‍රලාභී මිනින්දෝරු පී.එම් . සුනිල් මහතා විසින් සාදන ලද 2015 නොවැම්බර් 5 දිනැති අංක 3115 දිනැති පිඹුරේ දැක්වෙන කැබලි අක්ෂර බී, සී, ඩී, ඊ, ඕ සහ එස් ලෙස සලකුණු කර ඇති ඉඩමේ හිමිකම පවරා දී ඇත. කෙසේ වෙතත්, එම පිඹුරු අංක

3115 හි දැක්වෙන කැබලි අක්ෂර එස් ලෙස සලකුණු කර ඇති ඉඩම ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වෙත පැවරීමට නාගරික සංවර්ධන අධිකාරිය තවමත් කටයුතු කර නොමැත.

3.7 රජයේ ප්‍රදාන

3.7.1 නෙළුම් කුලුන

ඉඩම් ආඥාපනතේ 6(1) වගන්තියට අනුව, මිනින්දෝරු දෙපාර්තමේන්තු මූලික සැලැස්ම අංක 9956 හි දැක්වෙන හෙක්ටයාර් 1.1372 ක ප්‍රමාණයකින් යුත් ඉඩමේ කැබලි අංක 1 ලෙස සලකුණු කර ඇති කොටස, අංක 4/10/66549 දරන නිදහස් ප්‍රදානය මත සහ මිනින්දෝරු දෙපාර්තමේන්තු මූලික සැලැස්ම අංක 9401 හි දැක්වෙන හෙක්ටයාර් 1.1372 ක ප්‍රමාණයකින් යුත් ඉඩමේ කැබලි අංක 1- 6 ලෙස සඳහන් කර සලකුණු කර ඇති කොටස, අංක 4/10/66549 දරන නිදහස් ප්‍රදානය මත ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වෙත ප්‍රදානය කර ඇත. මෙම ප්‍රදාන දෙකෙහිම මුළු ප්‍රමාණය (හෙක්ටයාර 2.3513) වෙනුවෙන් ප්‍රත්‍යාගණනය කළ මුදල රු. 22,167,432,048 කි.

3.7.2 තොරතුරු තාක්ෂණ උද්‍යානය හම්බන්තොට සූරියවැව

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය (BOI) වෙනුවෙන් කොළඹ නොතාරිස් ඩී. සුනන්ද රණසිංහ මහතා විසින් සහතික කරන ලද 2014 සැප්තැම්බර් 3 දිනැති අංක 92 දරන ප්‍රදාන ඔප්පුව ක්‍රියාත්මක කර ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය (BOI) විසින් ලියාපදිංචි බලපත්‍රලාභී මිනින්දෝරු සහ තලමිනිකකරු ජී.ජී.එල්. පත්මසිරි මහතා විසින් සාදන ලද 2013 මැයි 4 දිනැති අංක 65/2013 පිඹුරුපත්වල දැක්වෙන කැබලි අක්ෂර J ලෙස සලකුණු කර ඇති ඉඩමේ හිමිකම පවරා ඇත.

රජයේ තක්සේරුකරු විසින් ඉඩමේ වටිනාකම තක්සේරු කරන විට සූරියවැව ඉඩම් පිරිවැය ප්‍රාග්ධනීකරණය කළ යුතුය.

3.8 අවිනිශ්චිත වියදම්

